# අද්භූත ආගන්තුකයා



හදිසි මරණ පරීක්ෂක තුමනි,

අද සවස 2.30 ට හන්ටිංඩන් වනය හරහා
යැමට මම නිවසින් පිටත් වෙමි. වනය මැද,
පොකුණ අසලදී මා හමුවන බව රොබින්
ලොරාබි මහතා මට දන්වා ඇත. ඊයේ රාත්‍රී ඔහු
මා සමඟ ඉතා දරුණු රණ්ඩුවකට පැටලිණේය.
ඔහු කළ වංචාවක් ගැන අන් අයට දැනුම්
දුන්නොත් නිසැකවම මා මරා දමන බවට
ඔහු තර්ජනය කළේය. අද දින මා මරා දමනු
ලැබුවහොත් ඊට වගකිවයුත්තා රොබින් ලොරාබි
බව දිවුරා ප්‍රකාශ කරමි.

- සැමුවෙල් මෝගන්

SB 21277
රු 375 .00

විෂ්ණුගේ අක්ෂිය
මේබර්ලි ගැවලුව
අද්භූත ආගන්තුකයා
ෂීබා රැජිනගේ අභිරහස
හන්ටිංඩන් මිනීමැරුම
බ්ලැක්විච් අභිරහස

ISBN 978-955-1262-23-5

මිල රු. 375/-

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන

ෂර්ලොක් හෝම්ස්ගේ
රහසිගත ලිපිගොනු 12



පරිවර්තනය චන්දන මෙන්ඩිස්

# අද්භූත ආගන්තුකයා

## සහ තවත් ෂර්ලොක් හෝම්ස් කථා

මෙම පොතේ ඇතුළත් වන්නේ පහත සඳහන් කථාවල පරිවර්තනය.

1. The Mystery of Queen Sheeba
2. The Huntingdon Murder Case
3. The Adventure of the Queen's Messenger
4. The Mysterious Visitor
5. The Adventure of the Remington Diamond
6. The Blackwitch Mystery



# පටුන


| | | |
|---|---|---|
| 1. | ෂීබා රැජිනගේ අභිරහස | 9 |
| 2. | හන්ටිංඩන් උද්‍යානයේ මිනීමැරුම | 46 |
| 3. | මේබර්ලි ගැටලුව | 72 |
| 4. | අද්භූත ආගන්තුකයා | 91 |
| 5. | විෂ්ණුගේ අක්ෂිය | 139 |
| 6. | බ්ලැක්විච් අභිරහස | 172 |




## ෂර්ලොක් හෝම්ස් මහතා

මේ 1887 වසරේ සැප්තැම්බර් මාසයයි. හෝම්ස් සහ මම යෝක්ෂයරයේ සිට ලන්ඩනයට පැමිණෙමින් සිටියෙමු. අපට එහි යාමට සිදුවූයේ රාජකීය නාවික හමුදාවේ නිලධරයකු වූ අද්මිරාල් රොබින්සන්ගේ හදිසි ඛේදජනක මරණය ගැන අබිරහස විසඳීමටයි. මෙම පරීක්ෂණයේදී නියම අපරාධකාරයා පෙන්වා දීමට හෝම්ස්ට හැකිවූයේ, නිවසේ මෙහෙකාරියගේ ඇස් පෙනීමේ දුර්වලතාවය නිසා, ඇය ඔරලෝසුව බලා කියූ වේලාව වැරදි බැව් වටහා ගැනීමෙනි.

රාත්‍රී කාලය පුරා ගමනේ යෙදීමට සිදුවූ නිසා අපි ඇඩි වෙහෙසකට පත් වී සිටියෙමු. යූස්ටන් පාරේ සහ මැරිල්බෝන් පාරේ ගමන් කරමින් සිටියදී පවා අප අතර කිසිදු කතා බහක් සිදු නොවීය. එහෙත් අප ගමන්ගත් කුලීරිය බේකර් වීදිය දෙසට හැරෙද්දී එක්වරම අප දෙදෙනා අතර සුහද කතාබහක් ඇරඹිණි. අප දෙදෙනාගේ නිවහන ලෙස හැමවිටම හදවතට දැනුණු බේකර් වීදියේ 221 B වෙත ළඟාවීමෙනුයි එම ප්‍රබෝධය ඇතිවූයේ.

හෝම්ස් නිවසේ ජීවත්වූයේ කොතරම් අපිළිවෙළට වුවත්, ඔහුගේ එම ස්වභාවය නිසා මොන තරම් දුක් ගැහැට විඳීමට සිදුවුවත්, ගෙහිමි කාන්තාව-හඩ්සන් මහත්මිය සෑම විටකම පාහේ අප පිළිගත්තේ කාරුණික එමෙන්ම ප්‍රසන්න සිනාවකිනි. තරප්පු දහහතකින් සමන්විත ඒ පියගැටපෙළ පාමුල ඇය බලාසිටියේ විඳීමට සිදුවූ කරදර අමතක කරමිනි.

අප නිවසෙන් පිටවී ගොස් බොහෝ දිනක් ගතවී තිබුණේ නැත. සැමවිටම අවුල් සහගත තැනක් වන අපගේ විසිත්ත කාමරයට ළඟාවීමට ලැබීම සිතට විශාල සැනසුමක් විය. තම දුක්ගැනවිලි හෙළි කිරීමට ගැහැනු පිරිමි දෙපක්ෂයෙන්ම මෙතැනට ආ ගණන අප්‍රමාණය. තමන්ට සිදුවූ අසාධාරණකම්, මුහුණ දුන් ගැටලු, භීතිය, සංත්‍රාසය ගැන ඔවුන් හෙළිකළේ හෝම්ස්ගේ වදන්වලින් සැනසුමක් ලබමිනි.

ගමනට යොදාගත් ඇඳුම් අපි මාරු කළෙමු. ගිනි උදුන දීප්තිමත්ව දැල්වෙමින් තිබිණ. ගල් අඟුරු තබාගැනීම සඳහා තිබූ නොගැඹුරු බඳුන ඒ අසලම විය. හෝම්ස්ගේ සුරුට්ටු පෙට්ටිය තිබුණේද එය තුළමය. ගැටලුවක් විසඳීම සඳහා ගැඹුරු කල්පනාවකට වැටී සිටි හෝම්ස්, ගල් අඟුරු යයි සිතමින් උදුනට දැමීමට, සුරුට්ටු පෙට්ටිය අතට ගත්තේ වරක් දෙවරක් නොවේ. ඒ අසලම දක්නට ලැබුණේ දුම්කොළ අසුරා තැබීම සඳහා මගේ මිත්‍රයා යොදාගත් පර්සියානු පාවහනය.

මීළඟට මගේ දෙනෙත් යොමු වූයේ රතු පැහැති විල්ලුද කවරයක් යොදා තිබූ හෝම්ස්ගේ හාන්සි පුටුව වෙතය. අප හමුවීමට ආ අමුත්තන් හිඳගත් සැපපහසු කවිච්චිය තිබුණේ ඒ අසලමය. එයට කථා කිරීමට හැකියාවක් තිබුණා නම්, යළි කීමට හැකි පුදුමාකාර කතන්දර සංඛ්‍යාව අප්‍රමාණ නොවේද?

විසිත්ත කාමරය මධ්‍යයේ තිබුණේ විශාල මේසයයි. එහි කෙළවරක් සමීපයේ හෝම්ස් රසායන විද්‍යා පරීක්ෂණ සඳහා යොදා ගත් රසායන ද්‍රව්‍ය, ප්‍රතිකාරක, පරීක්ෂණ නළ සහිත රාක්ක රැසක් විය. පරීක්ෂණ වලදී ඔහුට නැතිවම බැරි වූ හයිඩ්‍රජන් සල්ෆයිඩ් වායුව නිෂ්පාදනය කරන උපකරණය තිබුණේ, කාමරයේ කෙළවරක ජනේලයක් සමීපයේය. සෝඩා වතුර නිෂ්පාදනය කළ ගැසොජීන් නම් උපකරණය සයිඩ් බෝඩය මත තිබිණ. මේසය මත සිදුකළ රසායනික පරීක්ෂණ වලදී උතුරා ගිය අම්ලවලින්, මේස ලෑල්ල දැවී ගොස් ඇති වූ පැල්ලම්, මේසය සෑම තැනකම දක්නට ලැබිණි. එහෙත් විටෙක අපේ කෑම මේසය වූයේද, මේ මේසය ම ය. බේකර් වීදිය දැකිය හැකි ජනෙල් පේළිය අසලම වූයේ ඔහුගේ පොත් රාක්ක පේළියයි. ශත වර්ෂ ගණනක් ලොව පුරා සිදුවූ අපරාධවල තොරතුරු අඩංගු පොත්වලින් රාක්ක තුනක්ම පිරී තිබිණි. ඒවා බිම් මට්ටමේ සිට සිවිලිම දක්වා විහිදුණු ඒවා විය. නොයෙකුත් අසාමාන්‍ය හා අද්භූත තොරතුරු පුවත්පත් වල පළවූ විට, ඒවා කපා "ස්ක්‍රැප්" පොත්වල අකාරාදි පිළිවෙළට අලවා තැබීම මගේ මිත්‍රයාගේ පුරුද්දක් විය. ඒවා තිබුණේ මගේ හාන්සි පුටුව අසලින්ම වූ රාක්කයේ ය. පුද්ගල තොරතුරු රැසක් අඩංගු වූ විටේකර්ගේ කෝෂ ග්‍රන්ථය, බ්‍රිතාන්‍යය තුළ පමණක් නොව සමීප රටවලට ද යා හැකි දුම්රිය ගමන් කාල සටහන් ඇතුළත්



වූ බ්‍රැඩ්ෂෝගේ කෝෂ ග්‍රන්ථය, ආදී කෝෂ ග්‍රන්ථලින් පිරුණු රාක්කය නිතර ප්‍රයෝජනවත් වූ එකකි. හෝම්ස් ඉතා ආදරය කළ වස්තුවක් වූ ඔහුගේ ස්ට්‍රැඩිවේරියස් වයලීනයට නම් ස්ථිර තැනක් නොමැති විය. විටෙක එය කාමරයේ මුල්ලක බිත්තියට හේත්තු කොට තිබුණු අතර තවත් විටෙක මේසය යට, ඔහුගේ හාන්සි පුටුව යට ආදී නොයෙක් තැන්වල තබා තිබිණ.

"මහත්වරුනි. ඔබට ලැබුණු ලියුම් මං තැබුවා ගිනි උදුන් පඩිය මත" හඩ්සන් මහත්මිය කීවේ මා කිම්දෙමින් සිටි සිතිවිලි සයුරෙන් මා අවදි කරමිනි.

"හෝම්ස් මහත්මයා" හඩ්සන් මහත්මිය කීවාය. "ඔබ රෑ කෑමට ගෙදර එන බව මට විදුලි පුවතකින් දන්වා එව්වා නම් කොයි තරම් හොඳ ද? එහෙම නම් ඔබට රෑ කෑමට මට තිබුණා පාත්තයෙකු රෝස් කර තබන්න"

"මගේ හිතවත් හඩ්සන් මහත්මිය" හෝම්ස් කීවේ ඇය දෙස හැරී බලමින් වත් නොවේ. "අපරාධකාරයන් කියන ජාතිය කොයි වෙලේ කොහෙන් මතු වෙනවද, කොයි වෙලේ කොහෙන් පැන යනවද කියල කාටවත් කියන්න බෑ. ඒක හරියට උන් හිටි ගමන් හෙම්බිරිස්සාව වැලඳිලා නොහිතන මොහොතක හොඳ වෙනවා වගේ"

මගේ මිත්‍රයාගේ උපහාසාත්මක කථාවෙන් හඩ්සන් මහත්මිය මවිතයට පත් වූවාය. කෙසේ වෙතත් මේ කරුණාවන්ත තැනැත්තිය ඔහුට පිළිතුරක් නොදුන්නාය. අප ගෙන ආ ගමන්මලු අපගේ නිදන කාමර තුළට ගෙන ගොස්, ඒවායේ තිබූ බඩු ඉවත් කොට ඒවා අල්මාරිවල ඇසිරීමට ඇය සූදානම් වූවාය.

ගිනි උදුන් පඩිය මත වූ ලියුම් වලින් මා නමට තිබූ ලොකු කවරයක් තෝරාගෙන මම එය විවෘත කළෙමි.

"හෝම්ස්" මට සතුටින් කෑගැසිණ. "මෙන්න ලබන සතියේ නිකුත් කරන්න තියෙන ස්ට්‍රෑන්ඩ් සඟරාවෙ පිටපතක්, ඔවුන් කල් ඇතුව මට එවලා. මේ සැරේ ඔවුන් ඉදිරිපත් කරල තියෙන්නේ "රතු හිසකෙස් ගැටලුව" කතන්දරය.

මම එම සඟරා පිටපත මගේ මිත්‍රයා වෙත දිගු කළෙමි. එහෙත් එය මගේ අතින් ගැනීමට ඔහු උත්සාහයක් දැරුවේ නැත. "ඔබ කැමති නැද්ද මං ඒ කතන්දරය ඉදිරිපත් කර ඇති ආකාරය කියවල බලන්න?" මම ඇසීමි.

ගමනට යොදාගත් ඇඳුම් අපි මාරු කළෙමු. ගිනි උදුන දීප්තිමත්ව දැල්වෙමින් තිබිණ. ගල් අඟුරු තබාගැනීම සඳහා තිබූ නොගැඹුරු බඳුන ඒ අසලම විය. හෝම්ස්ගේ සුරුට්ටු පෙට්ටිය තිබුණේද එය තුළමය. ගැටලුවක් විසඳීම සඳහා ගැඹුරු කල්පනාවකට වැටී සිටි හෝම්ස්, ගල් අඟුරු යයි සිතමින් උදුනට දැමීමට, සුරුට්ටු පෙට්ටිය අතට ගත්තේ වරක් දෙවරක් නොවේ. ඒ අසලම දක්නට ලැබුණේ දුම්කොළ අසුරා තැබීම සඳහා මගේ මිත්‍රයා යොදාගත් පර්සියානු පාවහනය.

මීළඟට මගේ දෙනෙත් යොමු වූයේ රතු පැහැති විල්ලූද කවරයක් යොදා තිබූ හෝම්ස්ගේ හාන්සි පුටුව වෙතය. අප හමුවීමට ආ අමුත්තන් හිඳගත් සැපපහසු කවිච්චිය තිබුණේ ඒ අසලමය. එයට කථා කිරීමට හැකියාවක් තිබුණා නම්, යළි කීමට හැකි පුදුමාකාර කතන්දර සංඛ්‍යාව අප්‍රමාණ නොවේද?

විසිත්ත කාමරය මධ්‍යයේ තිබුණේ විශාල මේසයයි. එහි කෙළවරක් සමීපයේ හෝම්ස් රසායන විද්‍යා පරීක්ෂණ සඳහා යොදා ගත් රසායන ද්‍රව්‍ය, ප්‍රතිකාරක, පරීක්ෂණ නළ සහිත රාක්ක රැසක් විය. පරීක්ෂණ වලදී ඔහුට නැතිවම බැරි වූ හයිඩ්‍රජන් සල්ෆයිඩ් වායුව නිෂ්පාදනය කරන උපකරණය තිබුණේ, කාමරයේ කෙළවරක ජනේලයක් සමීපයේය. සෝඩා වතුර නිෂ්පාදනය කළ ගැසොජීන් නම් උපකරණය සයිඩ් බෝඩය මත තිබිණ. මේසය මත සිදුකළ රසායනික පරීක්ෂණ වලදී උතුරා ගිය අම්ලවලින්, මේස ලෑල්ල දැවී ගොස් ඇති වූ පැල්ලම්, මේසය සෑම තැනකම දක්නට ලැබිණි. එහෙත් විටෙක අපේ කෑම මේසය වූයේද, මේ මේසය ම ය. බේකර් වීදිය දැකිය හැකි ජනෙල් පේළිය අසලම වූයේ ඔහුගේ පොත් රාක්ක පේළියයි. ශත වර්ෂ ගණනක් ලොව පුරා සිදුවූ අපරාධවල තොරතුරු අඩංගු පොත්වලින් රාක්ක තුනක්ම පිරී තිබිණි. ඒවා බිම් මට්ටමේ සිට සිවිලිම දක්වා විහිදුණු ඒවා විය. නොයෙකුත් අසාමාන්‍ය හා අද්භූත තොරතුරු පුවත්පත් වල පළවූ විට, ඒවා කපා "ස්ක්‍රැප්" පොත්වල අකාරාදි පිළිවෙළට අලවා තැබීම මගේ මිත්‍රයාගේ පුරුද්දක් විය. ඒවා තිබුණේ මගේ හාන්සි පුටුව අසලින්ම වූ රාක්කයේ ය. පුද්ගල තොරතුරු රැසක් අඩංගු වූ විටේකර්ගේ කෝෂ ග්‍රන්ථය, බ්‍රිතාන්‍යය තුළ පමණක් නොව සමීප රටවලට ද යා හැකි දුම්රිය ගමන් කාල සටහන් ඇතුළත්



වූ බ්‍රැඩ්ෂෝගේ කෝෂ ග්‍රන්ථය, ආදී කෝෂ ග්‍රන්ථලින් පිරුණු රාක්කය නිතර ප්‍රයෝජනවත් වූ එකකි. හෝම්ස් ඉතා ආදරය කළ වස්තුවක් වූ ඔහුගේ ස්ට්‍රැඩිවේරියස් වයලීනයට නම් ස්ථිර තැනක් නොමැති විය. විටෙක එය කාමරයේ මුල්ලක බිත්තියට හේත්තු කොට තිබුණු අතර තවත් විටෙක මේසය යට, ඔහුගේ හාන්සි පුටුව යට ආදී නොයෙක් තැන්වල තබා තිබිණ.

"මහත්වරුනි. ඔබට ලැබුණු ලියුම් මං තැබුවා ගිනි උදුන් පඩිය මත" හඩ්සන් මහත්මිය කීවේ මා කිම්දෙමින් සිටි සිතිවිලි සයුරෙන් මා අවදි කරමිනි.

"හෝම්ස් මහත්මයා" හඩ්සන් මහත්මිය කීවාය. "ඔබ රෑ කෑමට ගෙදර එන බව මට විදුලි පුවතකින් දන්වා එව්වා නම් කොයි තරම් හොඳ ද? එහෙම නම් ඔබට රෑ කෑමට මට තිබුණා පාත්තයෙකු රෝස් කර තබන්න"

"මගේ හිතවත් හඩ්සන් මහත්මිය" හෝම්ස් කීවේ ඇය දෙස හැරී බලමින් වත් නොවේ. "අපරාධකාරයන් කියන ජාතිය කොයි වෙලේ කොහෙන් මතු වෙනවද, කොයි වෙලේ කොහෙන් පැන යනවද කියල කාටවත් කියන්න බෑ. ඒක හරියට උන් හිටි ගමන් හෙම්බිරිස්සාව වැලඳිලා නොහිතන මොහොතක හොඳ වෙනවා වගේ"

මගේ මිත්‍රයාගේ උපහාසාත්මක කථාවෙන් හඩ්සන් මහත්මිය මවිතයට පත් වූවාය. කෙසේ වෙතත් මේ කරුණාවන්ත තැනැත්තිය ඔහුට පිළිතුරක් නොදුන්නාය. අප ගෙන ආ ගමන්මලු අපගේ නිදන කාමර තුළට ගෙන ගොස්, ඒවායේ තිබූ බඩු ඉවත් කොට ඒවා අල්මාරිවල ඇසිරීමට ඇය සූදානම් වූවාය.

ගිනි උදුන් පඩිය මත වූ ලියුම් වලින් මා නමට තිබූ ලොකු කවරයක් තෝරාගෙන මම එය විවෘත කළෙමි.

"හෝම්ස්" මට සතුටින් කෑගැසිණ. "මෙන්න ලබන සතියේ නිකුත් කරන්න තියෙන ස්ට්‍රෑන්ඩ් සඟරාවෙ පිටපතක්, ඔවුන් කල් ඇතුව මට එවලා. මේ සැරේ ඔවුන් ඉදිරිපත් කරල තියෙන්නේ "රතු හිසකෙස් ගැටලුව" කතන්දරය.

මම එම සඟරා පිටපත මගේ මිත්‍රයා වෙත දිගු කළෙමි. එහෙත් එය මගේ අතින් ගැනීමට ඔහු උත්සාහයක් දැරුවේ නැත. "ඔබ කැමති නැද්ද මං ඒ කතන්දරය ඉදිරිපත් කර ඇති ආකාරය කියවල බලන්න?" මම ඇසීමි.

"මං තියුණු නිරීක්ෂණ මගින් සොයාගත් කරුණු විශ්ලේෂණය කරලා, බොහොම දුරට සිතා බලලා, නිගමනයන්ට එළඹෙනවා." හෝම්ස් කීය. "නමුත් ඔබ මොකක්ද කරන්නෙ? ඒවා අතිශයෝක්තියෙන් වර්ණනා කර අරාබි නිසොල්ලාසයේ කථා වැනි අද්භූත කතන්දර නිර්මාණය කරනවා. මං ඔය වැඩේට කැමති නෑ. මං ඒ බව ඔබට මීට කලිනුත් කියල තියෙනවානෙ. මේවා ලස්සන කතන්දර බව ඇත්තයි. නමුත් අපරාධ පරීක්ෂණය විද්‍යානුකූලව හදාරන්න උත්සාහ කරන කෙනෙකුට මේවායින් ලැබෙන ප්‍රයෝජනය අල්පයි"

"මං මේ කතා ලියන්නෙ මේවා අගය කරන සාමාන්‍ය පාඨකයන්ට. ඒ මිස ඔබේ ඔය කියන ශිෂ්‍යයනට නෙමෙයි. ඒ නිසා ඔබේ ඔය චෝදනාව මං ප්‍රතික්ෂේප කරනවා"

"මා ගැන විස්තර කරද්දී ඔබ කියල තිබුණා වොට්සන් මගේ උස අඩි හයයි අඟල් හතරක් කියල. මං කොහොමද එච්චර උස වුණේ? මගේ උස නිවැරදිව අඩි හයයි අඟල් එකයි කාලයි"

"ඒ තමයි යමක් අලංකාරව විස්තර කිරීමට කවියෙකුට ඇති අයිතිය"

"මං නිරතුරුවම අඳින ඇඳුම කියලා වොට්සන්, ඔබ විස්තර කරල තියෙන ඇඳුම බලන්න. ඕක මනුස්සයෙකුට හැමදාමත් හැමතැනකටමත් අඳින්න පුළුවන් ඇඳුමක්ද?"

"ඒ ගැන නම් මට දොස් කියන්න එපා හෝම්ස්. ඕකට බණින්න ඕන නම් සිඩ්නි පැජට්ට. එයා තමයි ඔබේ ඔළුවට "ඩියර් ස්ටෝකර්" හිස්වැස්මක් දාලා අසාමාන්‍ය ඇඳුමක් ඇන්දුවේ. ඒකට මං මොනවා කරන්නද?"

"ඔබ විස්තර කරල තියෙනවා මං අසාමාන්‍ය කුසලතා ඇති විශිෂ්ට ගණයේ වයලින් වාදකයෙක් කියල"

"ඉතිං?"

"ඉතිං නෙමෙයි. මේ ලියුම අරගෙන කියවලා බලන්න" හෝම්ස් තමා නමට ලැබී ඔහු විවෘත කළ ලියුමක් මා වෙත දිගු කළේය. "ලිවර්පූල් ෆිල්හාමොනික් සංගීත කණ්ඩායම, මෙන්ඩල්සන් සංධ්වනි ප්‍රසංගය නමින් මහා සංගීත ප්‍රසංගයක් පවත්වනවලු. ඒකෙ වයලීන වාදනයක් ඉදිරිපත් කරන්න කියලා මට ආරාධනා කරලා"



"ඔබේ දක්ෂකම් ප්‍රචාරය වෙනවට, මං ඒව නිතර කියනවට ඔබ කොහොමටවත් කැමති නැහැනෙ හෝම්ස්. ඔබ උත්සාහ කරන්නෙ නිරහංකාර වෙන්න"

"ඔබ ඔබේ පාඨකයන්ට මා ගැන දක්වා ඇති එක අදහසක් නම් මම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා"

"ඒ මොකක්ද?"

"මං කාන්තා පක්ෂයට කැමති නැහැ කියනවා වගේ අදහසක් තමයි, ඔබ සමහර කථා වලදී දීල තියෙන්නෙ. ඒක එහෙම් පිටින්ම වැරැදියි......."

"....... එහෙනම්?"

"මං කාන්තාවන්ට අකමැතිත් නෑ. ඔවුන් අප්‍රිය කරන්නෙත් නෑ. ඇත්ත තත්ත්වය නම් මං ඔවුන් ගැන විශ්වාසය තබනවා අඩුයි."

"ඇත්තම කියනවා නම් හෝම්ස්, ඔබට වැඩියෙන්ම කැමැත්තක් දක්වන්නේ කාන්තා පක්ෂය. ඔබේ අභිරහස් පරීක්ෂණ නොඉවසිල්ලෙන් නැවත නැවතත් කියවන වැඩිදෙනා කාන්තාවන්. ඔබේ හපන්කම් ගැන මං ලියන කතන්දර ප්‍රමාණය හොඳටම මදි කියලා මට සතියකට එන ලියුම් ගණන සියයකට අධිකයි. එයින් හතරෙන් තුනක්ම ගැහැනු. විශේෂයෙන් අවුරුදු දහ හතර සිට තිස්හතර දක්වා තරුණ ළමයි. මං මේවා ලියන එක කවදා හරි දවසක හදිසියේ නැවැත්තුවොත්, ඔවුන් මට විරුද්ධව මොන සටනක් කරාවිද මං දන්නෙ නෑ"

"හෝම්ස් මහත්මයා" හඩ්සන් මහත්මිය යළි ඉදිරියට පැමිණියේ දූවිලි ඉවත් කිරීමට යොදා ගන්නා බුරුසුවක් ද අතැතිවය. "ඔබේ එක රාක්කයක තිබිලා මං ඉවත් කළ දූවිලි තට්ටුව මෙන්න මෙච්චර ගනකමයි." ඇය කීවේ තම දකුණු අතේ දබරැඟිල්ල හා මහපටඟිල්ල එකිනෙකට අඟලක පමණ පරතරයක් තබා පෙන්වමිනි.

"යම් යම් ලිපි ගොනුවල කාල නිර්ණය සඳහා දූවිලි තට්ටුවේ ගනකම හුඟක් වැදගත් වෙනවා. ඔබ ඔය කියන තරම් දූවිලි තට්ටුව ගනකම් නම් ඒ 1883 මාර්තු විය යුතුයි"

හෝම්ස් හා හඩ්සන් මහත්මිය අතර සණ්ඩුව පසුව යළිත් වරක් ඇවිළිණි. ඒ අපේ රාත්‍රී භෝජනයෙන් පසු ඇය ඉඳුල් පිඟන් හා අනෙක් භාජන ඉවත් කරගෙන යාමට පැමිණි වෙලේය.

රෑ කෑම අවසන් කළ වහාම මා කළේ අප යෙදුණු අලුත්ම පරීක්ෂණය ගැන විස්තර ලිවීම ඇරඹීමය. මගේ මිත්‍රයා කළේ

ඔහුගේ "දුම්බීමේ යන්ත්‍රය" ක්‍රියාත්මක කිරීමයි. ඉතා සංකීර්ණ ඇටවුමක් වූ එහි ප්‍රධාන කොටස වූයේ "මයිනහම" නමින් හැඳින්වෙන, කම්හල්වල දැල්වෙන ගින්නට "පිඹීමට" යොදාගන්නා උපකරණයයි. හෝම්ස් එය කකුලෙන් පාගමින් ක්‍රියාත්මක කළේය. එයට සම්බන්ධව රබර් ටියුබ් ගණනාවක් විය. රසායන විද්‍යාගාරවල දක්නට ලැබෙන ආධාරකවලට මේවා එක මට්ටමකට සවිකොට තිබුණේ ඒවායේ "කටවල්" එකම දිශාවට පිහිටන අයුරෙනි. මේ රබර් ටියුබ් "කටවලට" සිගරට්ටුවක්, සුරුට්ටුවක් හෝ පයිප්පයක් සවිකොට ඒවා දල්වන ලදී. මයිනහම ක්‍රියාත්මක කළ විට අනුකරණය කෙරුණේ පුද්ගලයන් කිහිප දෙනෙකු දුම්පානය කරන විලාසයයි. එවිට අපේ විසිත්ත කාමරය දුමෙන් පිරී ගියේය. ඒ ගල් අඟුරු කෝච්චියක් ගමන්ගත් උමගක ආකාරයෙනි.

මයිනහම පාගන අතර සුරුට්ටු හා සිගරට් වලට වීදුරු කැබලි ළං කළ හෝම්ස්, දුම්කොළ දැවීමෙන් ඇතිවූ අළු එකතු කර ගත්තේය. ඒ අතරම ඒවා ගැන යම් සටහන් තබා ගනිමින් අණ්වීක්ෂයෙන් ඒ අළු පරීක්ෂා කර බැලීය.

විසිත්ත කාමරය දුමෙන් වැසී යද්දී හඩ්සන් මහත්මිය නොනවත්වාම කහින්නට පටන් ගත්තාය. මීළඟට අත තිබූ බන්දේසිය මේසය මත තැබූ ඇය මා දෙසට දුව ආවාය.

"වොට්සන් මහත්තයා....... ඔබ කොහොමද මේ දේවල් තවත් ඉවසගෙන ඉන්නෙ?" අතරින් පතර තදින් කහිමින් ඇය විමසුවාය. "හුස්ම ගන්න පුළුවන් වෙන්න මේ ජනෙල් ටිකවත් අරිමු"

"ෂ්! හඩ්සන් මහත්මිය එපා!" මම ඇයට අනතුරු ඇඟවීමි. "හෝම්ස් මහත්තයා දුම්කොළ අළු ගැන පර්යේෂණයක් කරනවා."

"මේ වෙලාවෙ එහෙම එකක් කරන්නේ අහවල් හදිසියකටද?"

"සිගරට් හා සුරුට්ටු අළු එකසිය හතළිහකට අධික ප්‍රමාණයක් හෝම්ස් මහත්තයා අධ්‍යයනය කරල තියෙනවා. ඔහු ඒවා වර්ගීකරණය කරල තියෙනවා. ඔහු ඒවා වර්ගීකරණය කර පොත් පිංචක් ලියා තිබෙන්නේ අපරාධ පරීක්ෂණය ඉගෙන ගන්නා අයගේ ප්‍රයෝජනයට. ඉන්දියානු ලුංකා සුරුට්ටුවක අළු වලින් එක්සත් ජනපදයේ ඩන්හිල් සිගරට්ටුවක අළු වෙන්කර හඳුනාගන්න මගේ මිත්‍රයාට තත්පර ගණනයි ගත වෙන්නේ. දුම්කොළ වර්ග එකසිය හතළිහක අළු........."



"ඒවායින් වැඩිහරිය තැන්පත් වුණේ මගේ බුමුතුරුණු උඩ!" හඩ්සන් මහත්මිය කීවේ මගේ කථාවට බාධා කරමිනි.

"හොඳයි හොඳයි. හුස්ම හිරවෙලා මැරෙන්න ඔබට උවමනා නම්..........." කී හඩ්සන් මහත්මිය තරප්පු පෙළ බැස වහා පහළ තට්ටුවට බැස්සාය.

තම කටයුත්ත නවත්වා දැමූ මගේ මිත්‍රයා වයලීනය අතට ගත්තේය. අනතුරුව තම හාන්සි පුටුවේ වැතිරී එය වාදනය කිරීමට පටන් ගත්තේය.





## ෂීබා රැජිනගේ අභිරහස

සරත් සෘතුවේ එක්තරා දීප්තිමත් උදෑසනක මම බේකර් වීදියේ අපේ නිවහනට ගොඩ වැදුණෙමි. මගේ හිත මිත්‍ර ෂර්ලොක් හෝම්ස් ජනේලය අසලට වී ඔහුගේ ප්‍රබල කාචයක් උපයෝගී කරගෙන යම් වස්තුවක් පරීක්ෂා කරමින් සිටියේය. අසුනක හිඳගන්නා මෙන් මට සංඥා කළ ඔහු, දිගටම තම කටයුත්තේ නිරත විය. ඒ මා හා වචනයක්වත් කථා නොකරමිනි. ඔහු මෙසේ පරීක්ෂා කරමින් සිටියේ සුරුට්ටු අසුරා ගෙන යාමට භාවිත කරන, ලෝහමය මංජුසාවක් බැව් මම දුටුවෙමි. එය විවෘත කොට ඇතුළත තිබූ සුරුට්ටු මේසය උඩින් තබා, මංජුසාවේ ඇතුළත ද හෝම්ස් ඉතා උනන්දුවෙන් පරීක්ෂා කළේ ය.

"ඔබ දන්නවනේ වොට්සන් මේක මගේ පොඩි විනෝදාංශයක් බව" ඔහු කීවේ ඉවතින් තැබූ සුරුට්ටු, යළිත් මංජුසාව තුළට අසුරා එය වසා දමමිනි. "යම්කිසි පුද්ගලයෙකු දිගු කලක් භාවිත කළ උපකරණයක් පරීක්ෂා කොට, ඔහුගේ චරිත ස්වභාවය නිශ්චය කිරීමේ කටයුත්තට, මං එදා ඉඳලම කැමතියි. කිසිම මනුස්සයෙකුට බෑ යම්කිසි වස්තුවක්, තමන්ගේ ගති ලක්ෂණ දුර්වලකම් එහි සටහන් නොකොට භාවිත කරන්න. මේ ක්ෂේත්‍රය තුළ මං සෑහෙන තරම් ප්‍රවීණත්වයක් ලබා තිබෙන බව මට සතුටින් කියන්න පුළුවනි"

"ඒක නම් සම්පූර්ණ ඇත්ත" මම කීවෙමි. "ඔබ ඒ විජ්ජාව කරනවා මං නොයෙක් වර දැකල තියෙනවා. එයින් ඔබ සාර්ථක වෙන ආකාරය දැකලා මං මවිතයට පත්වුණා"

"වොට්සන් ඔබ දන්නවානේ මං යොදාගන්නා ක්‍රම" ඔහු කීවේ කාචය හා සුරුට්ටු මංජුසාව මා අතට දෙමිනි. "බලන්න ඔබට මේකෙන් කියන්න පුළුවන් මොනවාද කියලා?"

මම එය පරීක්ෂා කිරීමට පටන් ගත්තෙමි. එය තඹ වැනි ලෝහයකින් සාදා රිදී ආලේප කළ එකක් විය. එහි පිටපැත්තේ එක් කෙළවරක R C යන අකුරු දෙක මල් මෝස්තරයක් සමග කැටයම් කොට තිබිණි. එයට ආලේප කර තිබූ රිදී, මංජුසාවේ බොහෝ තැන්වලින් ඉවත් වී ගොස් තිබුණේ රළු පාවිච්චිය නිසා

බැව් මම තේරුම් ගතිමි. මීට අමතරව එහි පිටත සීරීම්, කැපීම් හා තැළීම් රාශියක් විය. මංජුසාවේ පියන විවෘත වෙද්දී එහි සරනේරු ක්‍රියා කළේ ඉතා අපහසුවෙනි. කුමන හෝ හේතුවක් නිසා එහි එක් කෙළවරක් කලකට පෙර නැමීගොස් තිබී ඇත. ඒ නිසා එය යථා තත්ත්වයට පත් කිරීමට මංජුසාවට මිටියකින් පහරවල් කිහිපයක් එල්ල කර තිබූ බවද මම නිරීක්ෂණය කළෙමි. එය ඇතුළත කුඩා සුරුට්ටු පහක් හෝ හයක් විය.

"ඔබට කොහෙන්ද මේක හම්බවුණේ?" මම ඇසීමි.

"ඔබ ඔය හිඳගෙන ඉන්න පුටුවෙ තිබුණා" හෝම්ස් කීය. "ඒක දමල ගිහින් තිබුණෙ මං එළියට ගිය වෙලාවෙ ආව මහත්මයෙක්. ඔහු මැදිවියේ කෙනෙක් කියලයි මට අහන්න ලැබුණේ. ඔහුගේ ආගන්තුක පත්‍රය මේසය උඩ තිබෙනවා"

මම එය අතට ගෙන කියවා බැලීමි.

"රේමන්ඩ් කැම්බල්
73 C නෝෆෝක් වීදිය."

ක්‍රීම් පැහැති බ්‍රිස්ටල් බෝඩ්වල එය එම්බොස්-එනම් අකුරු උඩට මතුවී සිටින සේ මුද්‍රණය කොට තිබිණි. ඊට අමතරව කාඩ් පතේ දාරයට ද අලංකාර පෙනුමක් ලබාදී තිබූ බැව් මම දුටුවෙමි.

"එකොළහමාරට යළිත් වරක් එන බවට ඔහු පණිවුඩයක් තියල ගිහින් තිබුණා" හෝම්ස් කීවේ ඔරලෝසුව දෙස බලමිනි. "ඔහු ගැන තොරතුරු මොනවා හරි මේවායින් නිශ්චය කරන්න, අපට යන්තමට වෙලාව තියෙනවා. වොට්සන් කැමතිද පටන්ගන්න?"

"ඔහු පදිංචිව ඉන්නේ රීජන්ට් උද්‍යානය කිට්ටුව වැදගතුන් ජීවත්වෙන ප්‍රදේශයක. ආගන්තුක පත්‍රය මුද්‍රණය කරන්න ලොකු මුදලක් වියදම් කරල තියෙනවා. නමුත් සුරුට්ටු මංජුසාව බොහොම අබලන්. ඒකට තියෙන්නේ හරිම කනගාටුදායක පෙනුමක්"

"ඔය නිරීක්ෂණ වලින් ඔබට ගත හැකි නිගමන මොනවාද?"

"මංජුසාවෙ පෙනුමත් කාඩ්පතේ පෙනුමත් අතර විශාල වෙනසක් තිබෙනවා නෙ" මම කීවෙමි. "ඔහු සැහෙන ධනවතෙකු වෙන්න ඇති කියා බැලූ බැල්මට පෙනුණට, දැන් මට හිතෙනවා ඔහු දුප්පතෙකු විය යුතුයි කියා. ඒකයි මේ තරම් අබලන් සුරුට්ටු මංජුසාවක් පාවිච්චි කරන්නේ. මිල අධික කාඩ්පත ඔහුට රැකියාව කරන ආයතනයෙන් ලැබෙන්න ඇති"





"ඔහු යෙදෙන රැකියාව ගැන මොනම ආකාරයක සඳහනක් වත් කාඩ් පතේ නැහැ නේ" හෝම්ස් කීය. "කොහොම වුණත් කැම්බල් මහත්මයා දුප්පතෙකු නම් නෙමෙයි. මේ සුරුට්ටු බලන්න. මේවා ග්‍රේට් ඔමොන්ඩ් වීදියේ කිංස්ටන් ජෝජ් සමාගම කියුබාවෙන් ගෙන්වන මිල අධික ඒවා"

"එහෙම නම් මේ සුරුට්ටු මංජුසාව ගැන මට හිතාගන්න පුළුවන් එක දෙයයි. කොයි තරම් අබලන් වුණත් ඔහු මේක පාවිච්චි කරන්නේ, එය ඔහුට පෞද්ගලිකව වටිනා නිසා වෙන්න ඇති. ඒකට හේතුව ඔහුට මේක තෑගි ලැබෙන්න ඇත්තේ සමීපතම ඥාතියෙකුගෙන් හෝ මිත්‍රයෙකුගෙන්. ඔබට පුළුවන්ද ඊට වඩා කාරණා මොනවා හරි කියන්න?" මම ඇසීමි.

"කාරණා කිහිපයක් කියන්න මට පුළුවනි." හෝම්ස් කීය. "රේමන්ඩ් කැම්බල් මහත්මයා හොඳට වත් පොහොසත් කම් තියෙන කෙනෙක්. ඔහු අවිවාහකයෙක්. ඒ නිසා ඔය වයසේ විවාහකයෙකුට තරම් වියහියදම් ඔහුට නෑ. ඔහු දැන් පොහොසතෙකු වෙලා තියෙන්නේ, පහුගිය අවුරුදු තිහක පමණ කාලයක් හුඟක් වෙහෙස මහන්සිවෙලා වැඩ කිරීමෙන්. අනික ඉතා පරෙස්සමෙන් මුදල් ඉතිරි කරගෙන, වියදම් කිරීමේදී අර පරෙස්සම ගැන සිතීමෙන්. මොහු අනවශ්‍ය තැන්වලදී මුදල් වියදම් කරන කෙනෙකු නෙමෙයි. ඒකට හේතුව සමහර විට මුදල් නැති නාස්ති කළ තමන්ගේ පියා නිතර සිහිවීම වෙන්නත් පුළුවනි. කැම්බල් මහත්මයා බොහොම සැප පහසුවෙන් ගත කළ ජීවිතය, පහුගිය දවස්වල වෙනසකට භාජනය වුණා. ඔහුට මුහුණ දෙන්න සිදුවුණේ ප්‍රබල කම්පනයකට. අසාමාන්‍ය ඒ වගේම ගැටලු සහගත තත්ත්වයකට ඔහු මුහුණ දුන්නා. ඒ අතරම ඔහු අගය කළ, ඔහුට පෞද්ගලිකව වටිනා යම් භාණ්ඩයක් නැතිවුණා."

"ඔහුගේ පියාගේ නාස්තිකාර ජීවිතය!" මම උපහාසයෙන් කීවෙමි. "ආව අමුත්තා කවුද කියලා ඔබ දන්නෙත් නෑ. ඔහුව දුටුවෙත් නෑ. ඉතින් ඔබ කොහොමද හෝම්ස් ඔහුගේ පියා මුදල් නැති නාස්ති කළ කෙනෙකු කියා කියන්නේ?"

"ඒ තරම් හුඟක් කාරණා මා දන්නෙ නෑ" හෝම්ස් කීය. "ජ්‍යෙෂ්ඨ කැම්බල් තරුණ කාලයේ ඔහුගේ හිතේ දියුණුවීමට ආශාවක් තිබුණා. ඒ අරමුණ සඵල කර ගැනීමට හැකිවුණේ නෑ. අන්තිමේදී ඔහු මත්පැනට වැටුණා. ඉතිරි කරගෙන තිබූ මුදල් පවා

විනාශ වුණා. වාසනාව ඔහු සොයා නො ආ බව ඔහු දකින්න ඇති. ඉතිරි කරගෙන තිබූ මුදලුත් මත්පැන් වලටම වියදම් කරලා දැම්මා මිසක්, තම පුත්‍රයා වෙනුවෙන් ධනයක් ඉතිරි කර තබන්න ඔහුට හැකිවුණේ නෑ."

මෙය විශ්වාසයට ගැනීමට අපහසු වූ මට සිනා පහළ විය.

"ඔය කතන්දර නම් මං කොහොමටවත් විශ්වාස කරන්නෙ නෑ හෝම්ස්" මම කීවෙමි. "ඔව ඔබ අනුමාන කරන ඔබේ සිතේ මවාගත්තා දේවල්. ඔබ කියන දේ බොරුය කියලා, මට ඔප්පු කරන්න විධියකුත් නෑ. ඒ නිසා........."

"......... මං කිසිවිටෙකත් අනුමාන කිරීම් කරලා යමක් ප්‍රකාශ නොකරන බව ඔබ දන්නවා නේ වොට්සන්. මේ හැම දෙයක්ම මගේ නිරීක්ෂණ වලින් කළ නිශ්චිත නිගමන. මෙයින් බොහොමයක් නිවැරදි බවට සැක නෑ"

"එහෙනම් මට තේරුම් කරල දෙන්න. ඔහු අවිවාහකයෙකු බව ඔබ කොහොමද කිව්වේ?"

"පළමුවෙන්ම මේ ආගන්තුක පත්‍රය. විවාහක කෙනෙකුට කළ යුතු වියදම් කොයි තරමක්ද? එහෙම තිබියදී මෙවැනි ආගන්තුක පත්‍රයක් මුද්‍රණය කරවා ගන්න විශාල මුදලක් වියදම් කරාවිද? ඊළඟට ඔහුගේ ලිපිනය බලන්න. අංක 73 C නෝෆෝක් වීදිය. එයින් තේරෙන්නෙ ඔහු එම නිවසේ පදිංචිව ඉන්නේ තුන්වැනි තට්ටුවේ බවයි. අතමිට මුදල් තිබෙන විවාහකයෙක්, තුන්වැනි තට්ටුවක පදිංචියට යාවි කියා හිතන්න අමාරුයි."

"එතකොට නාස්තිකාර පියා ගැන, මොහු වෙහෙස මහන්සි වී වැඩ කළ කෙනෙකු බව, අතමිට සරු බව ඔබ කොහොමද කිව්වේ?"

"ඔබේ නිරීක්ෂණ විශ්ලේෂණය කරද්දී ඔබ නිගමනය කළේ මොනවද වොට්සන්? ඉතාම අබලන් සුරුට්ටු මංජුසාවෙත් ඉහළම තත්ත්වයේ ආගන්තුක පත්‍රයේත් ඇති කැපී පෙනෙන වෙනස. එහෙම නේද? ඒකෙදි ඔබට වැරදුණා"

"වැරදුණා? ඒ කොතනදිද? ඔහුගේ නමේ මුල් අකුරු පවා R. C කියා මේකෙ සඳහන් නේ. ඔහු මෙහේට එද්දී මේ සුරුට්ටු මංජුසාව පාරෙ තිබී අහුළා ගත් එකක් කියලද ඔබ කියන්නේ? නමේ මුල'කුරු R.C. කියා සඳහන් වීම අහම්බෙන් වුණු එකක් කියා ඔබ හිතනවද?"





"කලබල වෙන්න එපා මගේ හිතවත් වොට්සන්. මේක අහඹු සිදුවීමක් කියා මං කොහොමටවත් කියන්නෙ නෑ. බලන්න මේ තරම් අබලන් මංජුසාව ඇතුළෙ තිබුණෙ මිල අධික සුරුට්ටු. ඒක හරියට අර්තාපල් අසුරන ලාභ ගෝනියක තිබී, මිල අධික වයින් බෝතල් කිහිපයක් හමුවීම වගෙයි නේද? මෙතැන තිබෙනවා ලොකු නොගැළපීමක්. ඔහු මිල අධික ආගන්තුක පත්‍ර භාවිත කරන, මිල අධික සුරුට්ටු උරන කෙනෙක්. එහෙම කෙනෙක් ඇයි මේ වගේ බාල, පරණ, අබලන් මංජුසාවක් පාවිච්චි කරන්නේ?

මේ සුරුට්ටු ටික ඉවත් කර මංජුසාව ටිකක් නාසයට ළං කර බලන්න. එතකොට මේකෙන් එනවා බාල වර්ගයේ සැර දුම්කොළ වල ගඳ. ඒකෙන් අපට කාරණා දෙකක් තේරුම් ගන්න පුළුවනි. එයින් පළමුවැනි එක, මේක සෑහෙන කාලයක් තිස්සේ භාවිතයට නොගෙන පැත්තකට කර තිබූ මංජුසාවක්. අනික රේමන්ඩ් කැම්බල් මහත්මයා මේක තමන්ගේ පාවිච්චියට අරගෙන ගතවී ඇති කාලය, පැය විසිහතරකටත් අඩුවිය හැකියි. එතකොට මොකක්ද අපට ගතහැකි නිගමනය? මොකක් හරි හේතුවක් නිසා ඔහුට මේ මංජුසාව පාවිච්චියට නොගෙන බැරිවුණා. අනික මේක ඔහුගේ පවුලෙ සමීප සාමාජිකයෙකුට අයත් එකක්. ඔහුගේ නමට තිබුණෙත් අපේ කැම්බල් මහත්මයාට තිබෙන මුල් අකුරු මයි."

"එහෙම වෙන්නත් පුළුවනි" මම කීවෙමි.

"මේ මංජුසාව ඇතුළත මං පරීක්ෂා කළ බව ඔබ දුටුවා නේ. මේක නිෂ්පාදිත වසර ඉතාම කුඩා ඉලක්කමෙන් මේකෙ සටහන් - ඒ 1840."

"එහෙම දෙයක් මං දුටුවේ නෑ"

"ඔව් මට එහෙම හිතුණා" හෝම්ස් කීය. "අපේ අමුත්තා මැදිවියේ කෙනෙක්. අවුරුදු පනහකට පමණ පෙර නිෂ්පාදනය කළ මංජුසාවක්, ඔහු අලුතෙන්ම මිලදී ගත්තා කියල හිතන්න අමාරුයි. අනික මේකෙ කොටා ඇති නමේ මුල'කුරු බොහොම දුරට කැපී, මැකී ගිහින්. ඒ දීර්ඝ කාලයක් මෙය නොසැලකිලිමත් ලෙස භාවිත කිරීම නිසා. ඒ හින්දා මං නිගමනය කරනවා මේක R. C කියාම නමේ මුල් අකුරු තිබූ, කැම්බල් මහතාගේ පියාට අයත්ව තිබූ එකක් කියා"

"ඔව්. එහෙම හිතන එක සාධාරණයි"

"තඹවලින් තනා රිදී ආලේප කළ මේ සුරුට්ටු මංජුසාව, ඒ කාලයේ බොහොම අලංකාරව තිබෙන්න ඇති. අපේ අනුග්‍රාහකයාගේ පියා මේක ඒ කාලයේ මිල වැඩි වුණත් මිලදී ගන්න ඇති හේතුව මං කියන්නම් වොට්සන්. ඒ කාලයේ ඔහුගේ අතේ යම් තරමකට මුදල් හදල් තියෙන්න ඇති. ඊටත් වඩා ඔහු ඉහළ සමාජයට නගින්න අපේක්ෂා කරන්නත් ඇති.

නමුත් එතැනට යන්න ඔහුට බැරිවුණා. ඔහු අධික ලෙස මත්පැන් බීමට යොමුවුණා. ඒ නිසාම වටිනා මංජුසාව ලක්වුණේ බොහොම දරුණු සැලකීමකට. බිම වැටිලා, තැළිලා, ඉරි ඇඳිලා, පහතටම වැටුණා. ජ්‍යෙෂ්ඨ කැම්බල් මහතා ඔහුට තිබුණු තරම් මුදල් බීමට වියදම් කළා. නමුත් ඔහුගේ පුත්‍රයා ඉහළ තත්ත්වයකට නැග ඇති බව ඔහුගේ ලිපිනයෙන්, ආගන්තුක පත්‍රයෙන් සහ සුරුට්ටු වලින් පෙනෙනවා. දිගු කලක් වෙහෙස මහන්සි වී වැඩ නොකළා නම් මනුස්සයෙක් කොහොමද මේ වයසෙදි එවැනි තත්ත්වයකට එන්නෙ?"

"ඔබ කිව්වා ඔහු අර පරෙස්සමෙන් මුදල් වියදම් කරන කෙනෙක් කියලා?"

"ඔහු සාමාන්‍යයෙන් පාවිච්චි කරන මංජුසාව මොකක් හෝ අවාසනාවන්ත තත්ත්වයක් නිසා අස්ථාන ගත වෙලා. ඔහුට අමතර එකක් ඇත්තෙත් නෑ. නමුත් අස්ථාන ගත වූ එක යළිත් තමන් අතට ලැබෙන බව ඔහුට විශ්වාසයි. ඒ නිසා මුදල් නාස්ති කරමින් අලුත් එකක් මිලදී ගන්න ඔහු උත්සාහ කරන්නේ නෑ. ඉවතට දමා තිබුණු ඔහුගේ පියා භාවිත කළ මේ සුරුට්ටු මංජුසාව ඔහු පාවිච්චියට ගත්තා. ඒ පියවර තාවකාලික එකක් බව අපට සිතිය හැකියි."

"එතකොට ඔහු ඔබ හමුවෙන්න ආවෙ?"

"මොකක් හරි ලොකු ගැටලුවකට මුහුණ දීලා. සුරුට්ටු මංජුසාව නැතිවෙන්න ඇත්තෙත් ඒ ප්‍රශ්නෙදිම වෙන්න පුළුවනි"

"එතකොට හෝම්ස් ඔබ කියන්නේ මේ ධනවතා ඔබ සොයාගෙන ආවෙ, නැතිවුණු සුරුට්ටු මංජුසාව සෙවීම ඔබට භාරදෙන්න කියලද?" මිත්‍රයාගෙන් එසේ අසද්දී මගේ මුවට සිනා රැල්ලක් නැගිණ. එයින් මගේ මිත්‍රයාගේ මුහුණේ නොසතුටේ සේයා මම දුටුවෙමි.





"ඔහොම හිතාවෙන්න එපා වොට්සන්. ඒ අභිරහස හා මේ සිදුවීම යම් ආකාරයකින් එකිනෙකට සම්බන්ධ වෙන්නත් පුළුවනි........ අත්න සීනුව නාදවෙන ශබ්දය ඇහෙනවා. ඒ සමහරවිට ඔහු වෙන්නත් පුළුවනි"

මඳ වේලාවකින් රේමන්ඩ් කැම්බල් මහතා අපේ විසිත්ත කාමරය වෙත කැඳවාගෙන එනු ලැබීය. මධ්‍යම ප්‍රමාණයේ සිරුරක් තිබූ ඔහු, වයස අවුරුදු පනහක පමණ පුද්ගලයෙකු විය. ඔහුගේ මුහුණේ දීප්තිමත් නෙත් යුගලක් හා ප්‍රසන්න පෙනුමක් තිබිණි. හෝම්ස් පෙන්වූ අසුනේ හිඳගත් ඔහු මුලින්ම දෙනෙත් යොමු කළේ මා වෙතය.

"දොස්තර වොට්සන් තමයි අවුරුදු ගණනාවක් තිස්සේ, සංකීර්ණ ගැටලු විසඳීමට මට උදව් කළ මිත්‍රයා" හෝම්ස් කීවේ මා හඳුන්වා දෙමිනි. "මට කියන ඕනෑම දෙයක් ඔහු ඉදිරියේ කීමේ වැරැද්දක් නෑ. මේක ඔබට අයත් එකක් වෙන්න ඇති.........?" හෝම්ස් කීවේ සුරුට්ටු මංජුසාව පෙන්වමිනි.

"ඔබට බොහොමත්ම ස්තූතියි. ඕක කොහේ අමතක වුණාද කියල හිතාගන්න බැරුවයි මං හිටියේ?"

"මෑතකදී ඔබේ අයිතියෙන් මෙවැනි යමක් අස්ථාන ගතවුණා. එහෙම අස්ථාන ගත වුණේ ඔබ ලොකු අපහසුවකට පත් කරමින්. එහෙම නේද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. මගේ සුරුට්ටු මංජුසාව තමයි එහෙම මට නැතිවුණේ. ඒකෙනුයි මගේ පියාට අයිතිව තිබුණු මේ සුරුට්ටු මංජුසාව මගේ භාවිතයට ගන්න සිදුවුණේ. මට අයිති එක ඉක්මනින් හොයාගන්න හැකිවේවි කියන බලාපොරොත්තුව මගේ හිතේ තියෙනවා. ඒ නිසයි අලුත් එකක් මිලට ගැනීමේ අදහසත් මං කල් දැම්මේ"

"ඒක නැතිවුණේ කොහොමද?" හෝම්ස් විමසීය.

"හරිම පුදුමාකාර අත්දැකීමක දී මහත්මයා. ඉතාම පුදුමාකාර එකකදී" අමුත්තා කීය.

"අපේ සම්පූර්ණ අවධානය ඔබට ලැබෙනවා" හෝම්ස් කීය.

"කියන්න මහත්මයා තොරතුරු සියල්ලක්ම"

"ඇත්තෙන්ම ඔව්. මං ඔබට හැම දෙයක්ම කියන්නම්" කැම්බල් මහතා කීය. "වොට්සන් දොස්තර මහත්මයා නම් සමහර විට අපේ සමාගමෙන් ගෙන්වන උපකරණ පාවිච්චි කරනවාත්

ඇති. එංගලන්තයේ වෛද්‍යවරුන් බොහෝ දෙනෙකු පාවිච්චි කරන "ලිට්මාන්" වර්ගයේ ස්ටෙතස්කෝප - එනම් වෛදනලා ජර්මනියෙන් ආනයනය කරන්නේ අපේ සමාගමයි. ටලි සහ කැම්බල් කියන අපේ සමාගම වෛද්‍ය ක්ෂේත්‍රයේ අය අතර ප්‍රසිද්ධයි. ව්‍යාපාරික ක්ෂේත්‍රයේ කෙනෙකු හැටියට එදිනෙදා වැඩ කටයුතු ඉතාම ක්‍රමානුකූලව කිරීමට මං පුරුදු වී සිටිනවා. නමුත් ඊයේ මගේ ඒ ක්‍රමානුකූල පිළිවෙළේ යම් වෙනස්කමක් සිදුවුණා.

මං අවිවාහකයි. මං පදිංචිවෙලා ඉන්නේ නෝෆෝක් වීදියේ අංක 73 C දරන නිවසේ. මං හැමදාමත් ගෙදරින් පිටවෙන්නේ හරියටම උදේ 8.37 ට. ඊළඟට කුලීරියක නැගිලා මගේ කාර්යාලයට යනවා. මගේ මේ ක්‍රමානුකූල දින චරියාව වෙනස් කරන විදියේ සිදුවීමකට මං පෙරේදා රාත්‍රියේ මුහුණ දුන්නා.

පෙරේදා රාත්‍රි එකොළහට පමණ මට තද දත් කැක්කුමක් හැදුණා. දන්ත වෛද්‍යවරයෙකු අල්ලා ගැනීමට ප්‍රමාද වැඩි නිසා මං ඒකට සුළු ප්‍රතිකාරයක් කළා. විස්කි ස්වල්පයකින් කට සෝදා මං විස්කි ස්වල්පයක් පානය කළා. ඒකෙන් වේදනාව අඩුවී ඒ වෙලාවේ මට නින්ද ගියා. නමුත් උදේ පාන්දර පහ පමණ වෙද්දී මං නින්දෙන් ඇහැරුණේ, යළිත් වරක් ඇතිවුණු දතේ තද කැක්කුමෙන්. පැය දෙක තුනක් ගතවුණත් වේදනාව අඩුවුණේ නැහැ. සුපුරුදු දන්ත ශල්‍ය වෛද්‍යවරයා ඉන්නේ මගේ කාර්යාලය සමීපයේ. ඉතින් ඔහුගෙන් ප්‍රතිකාර ලබා ගැනීමට වෙලාවක් ඉල්ලා මම ඔහු වෙත ලියුම් කැල්ලක් යැව්වා. ඔහු මට පිළිතුරු එවා තිබුණා. මා ප්‍රතිකාර සඳහා ගත හැක්කේ උදේ එකොළහමාරට බව වෛද්‍යවරයා සඳහන් කර තිබුණා. ඒ අනුව මට උදේ වරුවේ කාර්යාලයට යාමට ලැබෙන්නේ නෑ. ඉතින් මං මගේ කාර්යාලයට ඒ බව ලියුමකින් දැන්නුවා; මං එන්නේ සවස් වරුවේ බව සඳහන් කළා.

එකොළහමාරට දන්ත වෛද්‍යවරයා හමුවෙන්න කලින් මවිසින් කළ යුතු තවත් රාජකාරි දෙකක් තිබුණා. ඒ නිසා මං තීරණය කළා උදේ දහයට නිවසින් පිටවීමට.

මං තරප්පු පෙළේ පහළට බසිද්දී දෙවැනි තට්ටුවේ තරප්පු දොර විවෘත වුණා. ඒ දොරින් තරප්පුවට ආවේ කබායක් ඇඟලාගෙන තොප්පියක් දමාගත් කෙනෙක්. ඔහු තමයි මගේ තට්ටුවට පහළ තට්ටුවෙ පදිංචි ඔලිවර් අර්නස්ට් මහත්මයා. ඔහු කවුරුවත් ආශ්‍රය නොකරන බොහොම නිශ්ශබ්ද කෙනෙක්. ඔහු මට හමුවුණොත්





ඒ ඉතාමත් කලාතුරකින් තමයි. පහුගිය මාස හයටම ඔහු මට දෙවරක් හමුවුණාද කියන එකත් මට සැකයි. දත් කැක්කුම නිසා මගේ සාමාන්‍ය දින චර්යාව වෙනස්වුණු එකෙන්, මොකක් හරි ප්‍රයෝජනයක් ගත යුතුයි කියා මං හිතුවා. මට හිතුණා ඔහු සමග සුහදව වචන දෙක තුනක් කතා කරන්න.

"සුභ උදෑසනක්!" මං ඔහු දෙස බලා කිව්වේ සිනාමුසු මුහුණකින්.

තමන්ගේ දොර වසා දමමින් ඔහු මා දෙස බැලුවේ මහ සැකයකින් වගේ. "අපි දෙන්නා එච්චර මුණ ගැහෙන්නෙ නෑ නේ" මං කිව්වේ මිත්‍රශීලී හඬකින්.

"ඉතින්.........? මොකක්ද ඒකෙන් දැන් ඔහේට ඇතිවෙලා තියෙන ප්‍රශ්නේ?" ඔහු විමසුවේ රළු හඬකින්. ඊට පස්සේ මාව මග හරින්න උවමනාවෙන්, ආපහු නිවස තුළට ගිහින් මහ සද්දෙට දොර වසා දැම්මා.

ඔහුගේ ආචාරශීලී බවක් නොමැති ඒ අවිනීත හැසිරීම ගැන මගේ සිතේ ඇතිවුණේ තරහක්. මේ වගේ හැඟීමක් හිතේ ඇතිවුණාම, කොහොම හරි උත්සාහයක් දරා ඒක හිතෙන් බැහැර කිරීම මගේ සිරිතක්. නැත්නම් මුළු දවසම අප්‍රසන්න වෙනවා. ඒ මගින් ඔහුව ඉක්මනින් අමතක කර දමන්න මට හැකිවුණා.

මුලින් මම රීජන්ට් උද්‍යානය ළඟින් ඇවිදගෙන ගියා. ඊළඟට ග්‍රේට් ඕමොන්ඩ් වීදියේ කිංස්ටන් ජෝජ් සාප්පුවෙන් සුරුට්ටු කිහිපයක් මිලට ගෙන, මං එතැනින් පිටවුණේ උදේ එකොළහට. යාර දහයක් ඉදිරියට යද්දී මට දකින්න ලැබුණා, හුගක් උස කෙට්ටු පුද්ගලයෙක් මා දෙස බලමින් දොරටුවක් ඉදිරිපිට ඉන්න හැටි. සුදුමැලි මුහුණක් තිබුණු ඔහුගේ උඩු රැවුළ, ඉටි ආලේප කොට අලංකාරව සකස් කර තිබුණා. මං ඔහු පසු කරගෙන ගියා. තමන්ගේ තොප්පිය ඉහළට ඔසවා ඔහු කථා කළේ ආචාරශීලී විදියට.

"මහත්මයා. මම ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ රහස් පරීක්ෂක අංශයේ පරීක්ෂක මැක්ඩොනල්" ඔහුගේ ඉංග්‍රීසි උච්චාරණයේ යම් අමුත්තක් තිබුණා. ඔහු ස්කොට්ලන්ත ජාතිකයෙකු වීම ඊට හේතුව වෙන්නට ඇති කියා මට හිතුණා.

"සමාවෙන්න මහත්මයා. ඔබට කරදර කරන්න සිදුවීම ගැන කනගාටුයි. ඔබට මිනිත්තුවකට මේ පැත්තට එන්න පුළුවන්ද?"

"ප්‍රශ්නයක් නෑ" මං කිව්වා. "මේ මොකක් ගැනද?"

"අපට තිබෙනවා ඔබෙන් දැනගන්න කාරණා කිහිපයක්" ඔහු කිව්වා. "අර පැත්ත වඩාත් නිශ්ශබ්දයි. ඔබට පුළුවන්ද මිනිත්තුවකට ඒ පැත්තට එන්න?" ඔහු ඇසුවා. ඒ පාර අයිනේ නවත්වා තිබූ වටේ ආවරණය කළ අශ්ව කරත්තයක් පෙන්වමින්.

"දැන් එකොළහමාරට දන්ත වෛද්‍යවරයා හමුවෙන්න මං වෙලාවක් වෙන් කරගෙනයි ඉන්නේ" මං කිව්වා. "ඔබ එච්චර වෙලාවක් ගන්නෙ නැහැ නේද?"

ඔහු ඊට පිළිතුරක් දුන්නේ නෑ. අශ්ව කරත්තය තුළට නැගලා මා අසලින් හිඳගත්තා. මේ වෙනකොටත් තවත් මිනිහෙක් කරත්තය තුළ සිටියා. ඔහු මිනිහෙකුට වඩා යෝධයෙක් කිව්ව හැකියි. පීප්පයක් වැනි පපුවක් තිබුණු ඔහුගේ, අත් පා අතිශයින්ම තරබාරුයි. ඔහුගේ බෙල්ල තරම් විශාල බෙල්ලක් ඇති කෙනෙකු මං ජීවිතේටම දැක නෑ. පොලිස් පරීක්ෂක මැක්ඩොනල් රථයේ රියැදුරාට යමක් කිව්වා. එතකොටම රිය ඉදිරියටම ගමන් කරන්න පටන් ගත්තා. "ඔබට ප්‍රශ්න කිහිපයක් අහන්න තියෙනවා කිව්ව නේ. ඒ මොනවද?" මං ඇහුවා.

"ඔබේ නම මොකක්ද?" ඔහු ඇසුවා.

"කැම්බල්"

අර මිනිසුන් දෙදෙනා මුහුණට මුහුණ බැලුවා. ඊළඟට අර පොලිස් පරීක්ෂක වරයා මෙහෙම කිව්වා.

"ඔබ නිශ්ශබ්දව හිටියොත් ඔබට කිසිම කරදරයක් වෙන්නෙ නෑ" ඔහුගේ ඒ කතාවේ තිබුණේ තර්ජනාත්මක බවක්.

"මොකක්ද ඒ කතාවේ තේරුම? මං මොකටද නිශ්ශබ්දව ඉන්නේ?"

එතකොට අර හැඩිදැඩි මිනිහා එක්වරම මගේ දෑත් හා දෙපා තද කරල අල්ලා ගත්තා. මට දැනුණේ ඒවා යකඩ අඬුවලට සිරවුණා වගෙයි. අනිකා දුඹුරු පාට බෝතලයකින් දියර බින්දු කිහිපයක් කුඩා රෙදි කැබැල්ලකට දැම්මා. ඊළඟට ඔවුන් ඒ රෙදි කැබැල්ල මගේ නහයට හා කටට තදවන සේ තබා අල්ලා ගෙන සිටියා. රෙදි කැබැල්ලේ තිබුණේ ප්‍රණීත සැර සුවඳක්. නමුත් එය ආශ්වාස කිරීමෙන් මට දැනුණේ මගේ හුස්ම හිරවෙනවා වගේ. හිස බරවෙන ගතියකුත් ඉක්මනින්ම දැනුණා. ඊළඟට මට සිහිනැති වෙන්න ඇති.

කොයි තරම් වේලාවක් මේ ආකාරයෙන් මං සිහි නැතුව හිටියාද කියන්න මං දන්නේ නෑ. කොහොම වුණත් මට





සිහිය එද්දී කරත්තය නවත්වන්න සූදානම් වෙමින් තිබුණේ. පරීක්ෂක මැක්ඩොනල් කියූ තැනැත්තා අශ්ව කරත්තයේ දොර විවෘත කර එයින් එළියට පැන්නා. ඉන්පසු අර හැඩිදැඩි මිනිහා එළියට බැස්සේ මාවත් එළියට අදිමින්.

මගේ හිස කැරකෙනවා වගේ මට දැනුණා. ඔවුන් මාව ගෙන ගියේ කුණු කසළ දමා තිබූ වත්තක් මැදින්. ඒ අබලන්, අපිරිසිදු ගොඩනැගිල්ලකට. ඔවුන් මා, එහි ලොකු කාමරයකට ගෙන ගියා. බිමට බුමුතුරුණු නොදැමූ ඒ කාමරයත් අපිරිසිදුයි. එහි ජනේල දොරවල් සියල්ල තදින් වසා තිබුණා. ඒ විතරක් නෙමෙයි; එහි ජනේල වලින් පිටත නොපෙනෙන ලෙස ඒවාට ලෑලි තබා ඇණ ගසා තිබුණා. වේලාව පරීක්ෂා කර බැලූ කෙට්ටු මිනිහා කාමරයේ දොර වසා දැම්මා. මීළඟට ඔවුන් දෙදෙනා කතාබහකට වැටුණා. ඒ මං කවදාවත් අසා නැති අමුතුම භාෂාවකින්. ලොකු උනන්දුවකින් ඔවුන් ඒ සාකච්ඡාව කළේ මා ගැන බව මං තේරුම් ගත්තා. ඒ මොකද "කැම්බල්" හා "නෝෆෝක් වීදිය" යන වචන වරින් වර කියූ ඔවුන් කතාබහ කළේ මා දෙස බලමින්.

මගේ හිසේ බරගතිය ක්‍රමක්‍රමයෙන් පහවෙමින් තිබුණේ. මට ලෑලි දොරක් ඉදිරියෙන් සිටගෙන ඉඳීමට අර කෙට්ටු මිනිහා අණ කළා. ඊළඟට ඔහු සාක්කුවෙන් ගත්තේ සිහින් දිගු තලයක් තිබූ පිහියක්. ඔහු එහි තලයෙන් අල්ලා ගෙන එය එහා මෙහා පද්දමින් හිටියා. ඔහු එය මා දෙසට දමා ගසාවි දැයි මගේ සිතේ භයක් ඇතිවුණා. ඒ සිතිවිල්ල නිවැරදි බව පෙන්වමින් එක් ක්ෂණයකින් ඒ පිහිය මා දෙසට දමා ගැහුවා. මාත් ක්ෂණයකින් බිම ඇද වැටුණේ එම පිහියේ ඉලක්කය මඟ හරිමින්. මං බිම වැටී සිටියදීම ඔහු සාක්කුවෙන් තවත් පිහියක් ගත්තා. එය මගේ හිසේ ගෑවී නොගෑවී වගේ ගිහින් පිටුපස දොරේ ඇමිනුණා. මගේ මුළු සිරුරම භයෙන් වෙව්ලා ගියා. එය බලාගෙන සිටි ඔවුන් මහ හඬින් සිනාවුණා. බිම වැටුණු තැන එහෙමම සිටියා මිසක් මං නැගිටින්න උත්සාහ කළේ නෑ.

අන්තිමේදී කෙට්ටු මිනිහා ඔහුගේ ඔරලෝසුව පරීක්ෂා කර බලා අනෙකාට යමක් කිව්වා. ඒ දෙදෙනා මඳ වේලාවක් සාකච්ඡා කළා. ඊටපසු ඔවුන් මාව ඒ කාමරය තුළ සිරකර දමා දොර තදින් වසා යන්න ගියා. ඒ දොර අරින්න මං උත්සාහ කළා. නමුත් ඒක සාර්ථක වුණේ නෑ. ඒ මොකද ඒක පිටතින් තදින්ම අගුළු දමලයි

තිබුණේ. ජනේල වසා තිබුණේ වීදුරුවලට පිටතින් ලෑලි තබා ඇණ ගසා. ඒ නිසා කිසිවක් නොපෙනුණා පමණක් නෙමෙයි. ඒවා විවෘත කිරීමට හැකියාවක් තිබුණෙත් නෑ. දූවිල්ලෙන් පිරුණු එම කාමරයට පිටතින් ඇසුණේ එකම ශබ්දයක් පමණයි. ඒ පිත්තල වාදක භාණ්ඩ කණ්ඩායමක සංගීත රාවයක්. ඒක කාමරය තුළට ආවෙත් ගිනි උදුනට උඩින් තිබූ චිමිනියෙන් බව මට තේරුණා.

බිම වාඩිවෙලා මං කල්පනාවට වැටුණේ ලොකු කලකිරීමකින්. මොවුන් මේ විදියට මාව පැහැරගෙන ආවේ ඇයි? ඒ ඇයි කියන කරුණ මං කල්පනා කළා. ඒ සඳහා කිසිම හේතුවක් මට හිතාගන්න බැරිවුණා. සමහර විට ඒකට හේතුව මාව සිරකරගෙන විශාල කප්පමක් ගැනීමට වෙන්න ඇති. කොහොම වුණත් ඔවුන්ගේ ප්‍රමාදයක් මං දුටුවා. ඒ ඔවුන්ගේ කල්ලියේ ප්‍රධානියාගේ අණ ලැබෙන තුරු වෙන්න ඇති කියා මට හිතුණා. මා ළඟ තිබෙන වටිනා දේවල් මොනවාද කියා මං කල්පනා කළා. ඒ එකම දෙයයි. එය තමා රන් ආලේපිත සුරුට්ටු මංජුසාව. එහි එක් කෙළවරක සැබෑ දියමන්තියක් සවිකර තිබුණා. ඒක මට තෑගි ලැබුණේ මගේ ව්‍යාපාර සහකාර මාක් ටලිගේ පවුලෙන්. ඒ අප දෙදෙනා හවුල් ව්‍යාපාරය පටන් අරගෙන අවුරුදු විස්සක් ගතවීම නිමිත්තෙන් පැවැති උත්සවයේදී. ඒක මේ මැරවරයින් දුටුවොත් ඔවුන් එය පැහැර ගන්නවා නියතයි. ඒ නිසා මෙය කොහේ හෝ සඟවා තැබිය යුතුයි කියා මා සිතුවා. ඒ සඳහා සුදුසු තැනක් සොයමින් මං කාමරය පරීක්ෂා කළා. කාමරයේ කෙළවරක පොළොවට සවිකළ ලෑල්ලක් බාගෙට ගැලවී තිබූ තැනක් මං දුටුවා. එය පරෙස්සමෙන් ඉහළට එසවූ විට කුඩා ඉඩ ප්‍රමාණයක් දැක ගැනීමට හැකිවුණා. මං වහාම මගේ සුරුට්ටු මංජුසාව ඒ ඉඩ තුළ සැඟෙව්වා. මිනිත්තු දෙකක් ගියේ නෑ. කවුදෝ කාමරය දෙසට එන අඩි ශබ්ද එළියෙන් ඇසෙන්නට වුණා.

පිටතින් දමා තිබූ අගුළු ඇරලා දොර විවෘත කෙරුණා. ඇතුළට ආවා තුන් දෙනෙක්. එක් කෙනෙක් තමන් පොලිස් නිලධරයෙකු බව කී කෙට්ටු මිනිහා. දෙවැන්නා අර හැඩිදැඩි මිනිහා. තුන්වැන්නා වුණේ කාන්තාවක්. එක්වරම ඇය මගේ අවධානය දිනාගන්න සමත්වුණා. ඇය ඉතාම ලක්ෂණ කාන්තාවක්. මගේ ජීවිතේටම මං දැක තිබෙන ඉතාම ලක්ෂණ කාන්තාව ඇයද කියාත් මට සිතුණා. ඇගේ වයස අවුරුදු තිහක් පමණ ඇති. කාමරය හරහා ඇවිද ගෙන, ඇය කෙළින්ම ආවේ මා සිටි තැනට. ඊළඟට මිනිත්තු දෙක තුනක්





ඇසිපිය නොහෙළා මා දෙස බලාගෙන හිටියේ පුදුමයෙන් වගේ. ඊළඟට ඇය හිස දෙපසට කරකවමින් හැඟෙව්වේ "නැහැ" කියන වචනය කියලයි මට හිතුණේ. ඇගේ හිසේ කුඩා ඔටුන්නක් නැත්නම් ටියාරාවක් ඇති බව, මං හොඳින් දුටුවේ ඒ විදියට හිස සොලවද්දී.

ඉන්පසු ඇය වේගයෙන් ආපසු හැරී ගමන් කළේ ඇගේ සගයන් සිටි තැනට. ඇය මොකක්දෝ භාෂාවකින් ඔවුනට උස් හඬින් කෑගැසුවා.

ඇයට පිළිතුරු දීමට කෙට්ටු මිනිහා ඉදිරිපත් වුණා. ඔහු යටහත් පහත්ව යමක් කී ආකාරයට මට හිතුණේ, ඔහු ඇයගෙන් සමාව අයදින බවයි. මට හිතුණේ ඔවුන් අතින් මොකක් හරි ලොකු වැරැද්දක් සිදුවී මට මේ ඉරණම අත්වී ඇති බව.

"මොකක්ද ඔබේ නම?" කාන්තාව මගෙන් විමසුවේ ඉංග්‍රීසියෙන්.

"රේමන්ඩ් කැම්බල්"

මීළඟට ඔවුන් තිදෙනා ඔවුන්ගේ භාෂාවෙන් ඉතා වේගයෙන් කථා කිරීමට පටන් ගත්තා. මෙතැන ප්‍රධානියා අර කාන්තාව බව මට තේරුණා. ඒ අනුව ලැබෙන ප්‍රතිඵල යහපත් වීමට ඉඩ ඇති බවත් මට හිතුණා. අන්තිමේදී ඔවුන්ගේ සාකච්ඡාව අවසන් වුණා. ඔවුන් එකඟතාවයකට පැමිණ සිටි බවයි මට පෙනුණේ. කෙට්ටු මිනිසා කියූ දේට, කාන්තාව හිස වනමින් එකඟත්වය පළකළා. අන්තිමේදී ඇය කාමරයෙන් පිටවී යන්න ගියා.

ඇය ගිය පසු අර චණ්ඩීන් දෙදෙනා, ඔවුන්ගේ අවධානය යළිත් වරක් මා වෙතට යොමු කළා. ඒ බව මට වැටහෙද්දී මගේ මුළු ඇඟම සීතල වී ගියා. ඒ වනවිටත් මං හිටියේ බිම හිඳගෙන මයි. අර හැඩිදැඩි මිනිහා මගේ අතින් ඇද මාව නැගිට්ටෙව්වා. මීළඟට අර කෙසඟ මිනිහා රෙදි කැබැල්ලකට දියර බෙහෙත් දමා මගේ මුහුණට තබා තද කළා. යළිත් වරක් දැනුණු ප්‍රසන්න සුවඳ සමග මගේ සිහි විසඥ වුණා.

මට සිහිය ආවේ කවුදෝ මගේ උරහිසෙන් අල්ලා සොලවන බව දැනී. ඒ කැලැඹුණු මුහුණකින් මා දෙස බලා සිටි පොලිස් භටයෙක්. මා සිටියේ හයිඩ් පාක් උද්‍යානයේ බංකුවක් මත. වේලාව බලද්දී සවස දෙකට ළංවී තිබුණා. මං එතැනට ආවේ කොහොමද කියන්න මං දන්නෙ නෑ. ගතවුණු පැය තුනකට කිට්ටු කාලයක් මා විඳි අත්දැකීම බියකරු සිහිනයක් වෙන්න තිබුණා; මගේ සුරුට්ටු

මංජුසාව මගේ සාක්කුවේ තවමත් තිබුණා නම්. ඉතින් මහත්වරුනි, මා මුහුණදුන් පුදුමාකාර අත්දැකීම එයයි."

"සුරුට්ටු මංජුසාව ඇරෙන්න තවත් මොනවා හරි ඔබේ සාක්කුවලින් නැතිවී තිබුණද?"

"නැහැ. මං මගේ සාක්කු පරීක්ෂා කර බැලුවා. එක පැන්සයක් වත් අඩුවී නෑ"

"ඔබ මේ ගැන පොලීසියට දැනුම් දුන්නාද?"

"ඇත්තෙන්ම ඔව්. මේක අතිශයින්ම බරපතළ සිදුවීමක් බවයි ඔවුන් කිව්වේ. ඒ වුණත් මා පැහැරගෙන ගිය පුද්ගලයින් හොයා ගැනීමට ඔවුනට හැකිවේවි කියා මා හිතන්නේ නෑ"

නළල රැළි කරගත් හෝම්ස් මඳ වේලාවක් කල්පනා කළේය. මීළඟට කාමරයේ කෙළවර පරණ පුවත්පත් ගොඩ ගසා තිබූ තැනට ගොස් ඒවා අවුස්සා බැලීමට පටන් ගත්තේය.

"ඔබ බරපතළ අත්දැකීමකට ඉතා සාර්ථක ලෙස මුහුණදීල තියෙනවා" මම කැම්බල් මහතාට කීවෙමි.

"ස්තුතියි දොස්තර මහත්මයා. නියම වෙලාවට ඔහු ළඟට යන්න බැරි වුණත්, ප්‍රමාදවෙලා හරි මට ප්‍රතිකාර කරන්න තරම් දන්ත වෛද්‍යවරයා කාරුණික වුණා. ඊයේ රාත්‍රි හොඳ නින්දක් ලැබුවාට පස්සෙ මට එච්චර අමාරුවක් නෑ. දැන් ඉතින් මට උවමනා කරන්නේ මගේ නැතිවුණු සුරුට්ටු මංජුසාව ආපහු ලබාගන්නයි. ඒකෙ තියෙන වටිනාකම මට කියා නිම කරන්න බෑ. ඒ වුණත් කටයුත්ත සාර්ථක වේවිද කියා මට හිතාගන්න අමාරුයි."

"ඔව් ඒක හරි" මම කීවෙමි. "ඔවුන් ඔබව ගෙන ගියේ කොහේටද කියා නොදන්නා නිසා, මේක හුගක් අමාරු කටයුත්තක් වෙනවා. ලන්ඩනය කියන්නේ වර්ග සැතපුම් එකසිය පනහක් පමණ විශාල ප්‍රදේශයක් නේ. ලන්ඩනයේ තිබෙන වීථි බැලුවොත් ඒවායේ දිග සැතපුම් තුන්දහසක් පමණ ලු!"

"ඔව් ඒක හරි" කැම්බල් මහතා කීවේ ශෝකාකුල ස්වරයකිනි. "ඔබට බලාපොරොත්තුවක සේයාවක් වත් දැකගන්න බැරිද හෝම්ස් මහත්මයා?"

"සේයාවකට වැඩි යමක් තිබෙනවා" හෝම්ස් කීවේ පුවත්පත් ගොඩෙන් තෝරාගත් පුවත්පතක් ද අතැතිව, අප සිටි තැනට පැමිණෙමිනි. "ඔබට හිරිහැර කළ මිනිසුන් දෙදෙනා අල්ලාගෙන, ඔබේ සුරුට්ටු මංජුසාවත් පැය භාගයක් ඇතුළත සොයාගන්න හැකි බව මට විශ්වාසයි"





"මොනවා!" කැම්බල් මහතාට කෑගැසුණේ" සතුටෙන් ඔද වැඩී ගිය හඬකිනි.

"මේ ගිය සඳුදා "මෝනිං ක්‍රොනිකල්" පුවත්පත. බලන්න මේ දැන්වීම"

කපිතාන් ඔලිවේරාගේ

ඇපෝලෝ සර්කස් සංදර්ශනය -

අවසන් සතිය!

ලෝක ප්‍රකට "පියාඹන අශ්වයින්"

කපිතාන් ඔලිවේරාගේම පෞද්ගලික

පරීක්ෂාව හා පුහුණුව යටතේ

පියාඹන අශ්වයින් ගේ නායිකාව!

සර්කස් ලෝකයේ රැජින!

නරඹන්න අසමසම

ෂීබා රැජින

පිහි විසි කිරීමේ යුරෝපා ශූරයා

රිච්ටර්

මහපොළොව මත සිටින ශක්තිමත්ම මනුෂ්‍යයා; කිසිදිනෙක ඔබ නුදුටු විස්කම් පෙන්වන

ගයි ඩිරූට්

බොංගෝ කොංගෝවෙන් ගෙනා සිංහයා

කිං ලෙනාඩෝ!

ඔබ සන්තෝෂයටත් පුදුමයටත්

පත් කරනු නොඅනුමානය

මෙම වසරේ මෙම සර්කස් සංදර්ශනය

නැරඹීමට ඔබට ලැබෙන

අවසන් අවස්ථාව මෙයයි.

හැමර්ස්මිත් දුම්රිය පොළ අසලදී"

"ඔබ පැහැරගෙන ගිය පුද්ගලයන් මේ අය බව, ඔබ කියූ විස්තරය අනුව මට විශ්වාසයි" හෝම්ස් කීය. "ඔබට පිහිවලින් දමා ගැසූ මිනිහා මේ රිචටර් විය යුතුයි. ඔබ කියූ හැඩිදැඩි මිනිසා ගයි ඩිරූට්. රූපශ්‍රීයෙන් ඔබ මවිතයට පත්කළ කාන්තාව මේ ෂීබා රැජින කියා මං විශ්වාස කරනවා. මේ අයගෙන් ඔබට හමුවෙලා නැත්තෙ කිං ලෙනාඩෝ නම් සිංහයා විතරයි. පහුගිය කාලෙ පෙන්වූ ඇපෝලෝ සර්කස් දර්ශන නරඹන්න ඔබ ගියේ නැද්ද?"

"නැහැ මහත්මයා. නමුත් මට අහන්න ලැබුණා එය ඉතා අලංකාර සංදර්ශනයක් බව"

"පහුගිය කාලේ ඔය සර්කස් ගැන පෝස්ටර්, පැඩිංටන් දුම්රියපොළ ළඟ අලවා තිබුණා" මම කීවෙමි. "පහුගිය සති අන්ත දෙකකම ඔවුන් ගැන තොරතුරු පුවත්පත්වල පළවී තිබුණා. ෂීබා රැජින කියන නමෙන් ප්‍රසිද්ධ වුණාට, ඇගේ නියම නම යෙලේනා කැස්ලව්ස්කා. ඇගේ සොහොයුරිය සමග ඇය කළ අශ්වාරෝහක රංගන වලින්, ඇය යුරෝපය පුරා ප්‍රසිද්ධ වුණා. මං හිතන හැටියට ඔවුන් ස්ලොවැක්වරු නැත්නම් පෝලන්ත ජාතිකයො."

"මා පැහැරගෙන ගිය මිනිස්සු මේ අය නම්, ඔවුන් එහෙම කළේ මොන අරමුණකින්ද?" කැම්බල් මහතා විමසුවේය. "ඔවුනට කිසිම ප්‍රයෝජනයක් අත් නොවුණු වැඩක්. මේ මහ දවාලෙ ග්‍රේට් ඕමොන්ඩ් වීදියෙදිම මාව පැහැරගෙන ගියේ මොන උවමනාවකටද?"

"මේක ඔවුනට සිදුවුණු වැරදීමක්. ඒ ගැන මට සැකයක් නෑ" හෝම්ස් කීය. "ඒකට හොඳම සාක්ෂිය තමා, ඔබේ මුහුණ දුටුවාම කාන්තාවගේ ඇතිවුණු වෙනස්වීම. ඇය ඔවුනට බැණ වැදුණේ ඒ හේතුව නිසා. ඔබට කරදරයක් නොකර ඔබ හයිඩ්පාක් උද්‍යානයට ගෙනත් දැම්මෙත් ඒ නිසා. ඔවුන් ඔබේ ලිපිනය දැන සිටියා නම් ගෙදර ළඟටම ඔබව ඇරලන්න තිබුණා"

"මං පදිංචි කොහේද කියලා ඔවුන් මගෙන් ඇහුවෙ නැහැනේ" කැම්බල් කීය.

"ඒ වුණත් ඔවුන් කතාබහ කරද්දී නෝෆෝක් වීදිය කියා සඳහන් කළ බව ඔබට ඇසුණා. ඒ කියන්නේ ඔවුන් ඔබේ ලිපිනය දැනගෙන ඉඳල තියෙනවා. මං හිතන්නේ ඔබ ගෙදරින් එළියට බහින මොහොතේත්, ඔවුන් කොහේ හරි සැඟවිලා බලාගෙන





ඉඳල තියෙනවා. ඊළඟට දිගටම ඔබේ පසුපසින් ආවා. ඔබව රවටාගෙන අශ්ව කරත්තය තුළට නංවාගන්න සුදුසු අවස්ථාව එනතුරු ඔවුන් බලා සිටියා. ඔබේ නිවසට පහළ නිවසේ සිටින පුද්ගලයාගේ නම මොකක් කියාද ඔබ කිව්වේ?"

"ඔහුගේ නම ඔලිවර් අර්නස්ට්. ඒ නමට ලැබුණු ලියුම් බරාදයේ මේසය මත තිබෙනවා මං දැකල තියෙනවා"

"මේ ගෙදර වෙනත් පදිංචි කරුවන් නැද්ද?"

"නැහැ"

"එහෙනම් සැකයක් නෑ. ඔවුන් ගේ අරමුණ වුණේ අර්නස්ට් පැහැරගැනීම. ඔබ සාමාන්‍යයෙන් ගෙදරින් පිටවී යන්නේ උදේ නවයටත් කලින්. නමුත් ඔබ ඊයෙ ගෙදරින් පිටවුණේ දහයට. ඒ නිසයි තරප්පුව බහිද්දී ඔබට අර්නස්ට් හමුවුණේ. නමුත් ඔබ කළ කතාබහෙන් ඔහු කැලඹුණා. ඔහු තැති ගත්තා. පුරුදු වෙලාවට ගෙදරින් පිටනොවී ඔහු ආපහු ගේ ඇතුළටම ගිහිං දොර වසා ගත්තා. උදේ දහයට ගෙදරින් පිටවෙන අර්නස්ට් ගැන සෝදිසියෙන් හිටි පැහැරගන්නන් මොකද කළේ? අර්නස්ට් කියල හිතාගෙන ඔබව පැහැරගත්තා. ඔවුන් ඔලිවර් අර්නස්ට්ගේ ලිපිනය දැනගෙන හිටියා. නමුත් පෙනුමෙන් ඔහු කොයි වගේ කෙනෙකු ද කියා ඔවුන් දැන හිටියේ නෑ. ඒ නිසයි ෂීබා රැජින කැඳවාගෙන ආවේ. මේක පිටුපස තියෙන අභිරහස මොකක්ද කියලා අපි තවමත් දන්නෙ නෑ. නමුත් ඔබේ අසල්වැසියා අර්නස්ට් නම් අවදානමකට මුහුණ දීලා ඉන්න බව ස්ථිරයි. අපරාධකාරයින්ට කලින් සිදුවුණේ වැරැද්දක් නිසා, ඔවුන් තවත් වාරයක් උත්සාහ කරන්න ඉඩ තියෙනවා. ඔබේ සුරුට්ටු මංජුසාව ගැන අවධානය යොමු කරන්න උවමනා බව ඇත්තයි. නමුත් ඊට කලින් නෝෆෝක් වීදියට ගිහිං ඔහුට තිබෙන අවදානම ගැන, අර්නස්ට් මහතා දැනුම්වත් කළ යුතුයි"

"ඔව් ඒක හරි" කැම්බල් ඊට එකඟ විය. "අර්නස්ට් මහතාට අවදානමක් ඇත්නම් ඒ ගැන කටයුතු කරන්න. මගේ මංජුසාව ඒ හැටි වැදගත් නෑ. නමුත් මට පුදුම මේකයි. ඒක ඉක්මනින්ම හොයාගන්න පුළුවන් බව ඔබ හොඳ විශ්වාසයකින් කියන හැටි. ඔවුන් මාව ගෙනගිය ගෙදර තියෙන්නෙ, මේ ලන්ඩන් නගරයේ ඕනෑම තැනක වෙන්න පුළුවන් නේ"

"මං එහෙම කීමට හේතුව මේකයි" හෝම්ස් කීය. "ඔබ අල්ලාගත් දෙදෙනා ගියා නේ අර කාන්තාව කැඳවාගෙන එන්න.

ඔබ කිව්වා ඔවුන් ගිහින් මිනිත්තු කිහිපයකින් ඇය සමග ආපසු ආවා කියා. තමන් යෙදී සිටි කටයුත්තෙන් මිදිලා, ඇය බොහොම කලබලයෙන් ඇවිත් තිබුණේ. ඒකෙන් අපට ගත හැකි නිගමනය මොකක්ද? ඔබ රඳවා සිටි නිවස ඇත්තේ හැමර්ස්මිත්හි සර්කස් ශිල්පීන්ගේ කඳවුරු භූමියෙන් ඈතක නොමෙයි"

මෙසේ කී හෝම්ස් තම හිසවැස්ම අතට ගත්තේ අප පුදුමයට පත් කරමිනි. "ප්‍රමාද වෙන්න කාලයක් නෑ. අපි වහාම පිටත්වෙමු"

මිනිත්තු දෙකක් ගත වෙද්දී අපි කුලී රියකින් තෝරොෆ්ක් වීදිය දෙසට ගමන් කරමින් සිටියෙමු.

අප විගසින් පිටත්ව ආවත් අපට දැනගන්නට ලැබුණේ අප ප්‍රමාද වැඩි බවයි. කැම්බල් මහතාගේ අසල්වැසියා ඔහු හමුවීමට ආ අමුත්තන් සමග උදේ දහයට පිටත් වී ගොස් තිබිණි.

"අමුත්තන් තුන්දෙනෙක් හිටියා" ගෘහ සේවිකාව කිවාය. "ඉතාම ලක්ෂණ තරුණ නෝනා කෙනෙක්, උඩු රැවුලක් තිබුණු කෙට්ටු මිනිහෙක් සහ මහා හැඩිදැඩි මිනිහෙක්"

"අර්නස්ට් මහත්මයා පිටත්වෙලා ගියේ ඔහු හමුවෙන්න ආ අමුත්තන් සමගද?" හෝම්ස් විමසුවේය.

"මට ඒක හරියටම කියන්න අමාරුයි මහත්මයා" සේවිකාව කීවාය. "අපි මෙතැන හිටියෙ නෑ. එයාලම තමයි දොරවල් වහගෙන ගිහින් තියෙන්නේ. ටික වෙලාවකට පස්සේ මං ආවා, අර්නස්ට් මහත්මයාට උදේ කෑම ගෙනාව පිඟන් ගෙනියන්න. එතකොට ඔහු කාමරයේ හිටියෙ නෑ"

"තත්ත්වය එන්න එන්නම නරක අතටයි හැරෙන්නෙ" හෝම්ස් කීය. "අපි වහාම යමු හැමර්ස්මිත් වෙත"

"අපි පොලීසියට දැනුම් දෙන්න උවමනා නැද්ද?" මම ඇසීමි.

"එහෙම කරන්න හිටියොත් අපි තවත් ප්‍රමාද වේවි" මගේ මිත්‍රයා කීය. "අපට ඔහුව උවමනා වෙන වෙලාව ආවම පොලිස් නිලධරයෙක් කැඳවා ගමු"

පාර පුරා දිගටම තිබුණේ ඇඩි වාහන තදබදයකි. හැමර්ස්මිත් වෙත ළඟාවීමට අපට පැය භාගයකට වඩා ගතවිය. සර්කස් කරුවන්ගේ කඳවුර පිහිටි තැන අපේ කුලීරථ රියැදුරා දැන සිටියේය. එහෙත් අප එතැනට ගොස් රියෙන් බසිද්දී හෝම්ස්ට





කෙඳිරි ගෑවිණි. ඊට හේතුව එතැන අවුල් ජාලයක් වී තිබීමය. කූඩාරම් සියල්ල ගලවා තිබූ අතර, ඒවා ඉදිකිරීමට යොදා ගත් කැන්වස් රෙදි හා ඇවැන්ත ලී දඬු, සෑම තැනකම විසිරී තිබිණි. ඒ සර්කස් කණ්ඩායම ඉවත් වී යන බවට සලකුණුය.

"සර්කස් සංදර්ශනය පැවැත්වෙන අන්තිම සතිය මේක බව ඒ දැන්වීමෙ තිබුණා නේන්නං" හෝම්ස් කීය.

අපි සෙනග හා සේවකයන් අතරින් රිංගා, තවමත් ඉවත්කර නොතිබූ කූඩාරම දෙසට ගමන් කළෙමු.

"මේ තක්කඩි හිතන්න ඇති සර්කස් එක ඉවර නිසා, රටෙන් පැන ගන්න හැකිවේවි කියලා. අපට පුළුවන් සම්පූර්ණ උත්සාහය යොදා බලමු" හෝම්ස් කීය.

කූඩාරම් ඉවත් කිරීමට සේවකයන් රැසක් යොදවා තිබිණි. ඔවුනට අණ නිකුත් කරමින් ඔවුන් පාලනය කළේ, සුවිශේෂ හිස්වැස්මක් පැළඳ සිටි හැඩිදැඩි පුද්ගලයෙකි. සර්කස් සමාගමේ කළමනාකරු හමුවිය හැක්කේ කොතැනදී දැයි හෝම්ස් හැඩිදැඩි පුද්ගලයාගෙන් විමසුවේය.

"ඔබට උවමනා කරන්නේ කපිතාන් ඔලිවේරා හමුවෙන්න නම් ඔබ ප්‍රමාද වැඩියි. ඔහු මෙහේ රැඳී හිටියෙ අශ්වයින් ටික ප්‍රවාහණයට උන් දුම්රිය මැදිරිවලට පටවන තුරු විතරයි. ඊට පස්සෙ කැස්ලවිස්කා නෝනයි අනික් අයයි එක්ක කපිතාන් පිටත්වෙලා ගියා. ඉතිරි බඩු ටික අස්පස් කරලා ප්‍රවාහණය කිරීම භාරවෙලා තියෙන්නේ මට"

"ඔවුන් ගියේ කොහේටද?"

"කපිතාන් ඔලිවේරයි අනික් අයයි දවාලේ දුම්රියෙන් ගියේ ඩෝවර් වලට. ඔවුන් බලාපොරොත්තු වෙන්නේ වෝසෝ බලා යන දුම්රිය අල්ලාගන්න" සේවකයා කීය.

ඔහු වෙතින් අප දෙසට හැරුණු හෝම්ස් තම ඔරලෝසුවේ වේලාව පරීක්ෂා කළේය.

"ඔවුන් ගිය දුම්රිය තවමත් ඩෝවර් වෙත ළඟාවෙන්න නෑ" හෝම්ස් කීය. "ඔවුන් බරපතළ අපරාධයක් සම්බන්ධයෙන් අවශ්‍ය අපරාධකරුවන් කියලා, මෙහේ පොලීසියට ඒත්තු ගන්වන්න උත්සාහ කරමු. එතකොට ඔවුනට හැකි වේවි කපිතාන් ඔලිවේරා සහ කණ්ඩායම ගැන, කෙන්ට් පොලීසියට දැනුම් දෙන්න. එවිට

ඔවුන් නැවට නැගලා රටින් පිටවීම නවත්වන්නත් පොලීසියට හැකිවෙන්න ඕන"

අප සමග කථා කරන අතරම හෝම්ස් තම දෙනෙත් වටේටම යොමු කළේය. එක්වරම ඔහුගේ මුවෙන් ජයග්‍රාහී හඬ නිකුත් විය. සර්කස් භූමියට මඳක් එපිටින් පිහිටි ගොඩනැගිලි කිහිපයක්ම අපි දුටුවෙමු. හෝම්ස් තම අතදිගුකොට පෙන්වූයේ අබලන් ගොඩනැඟිල්ලකි. තරමක් විශාල නිවසක් වූ එය, අවුරුදු ගණනාවකින් ප්‍රයෝජනයට නොගත් එකක් බැව් පෙනුණු අතර, එහි ජනේල සියල්ල ලෑලි ගසා ආවරණය කොට තිබිණි. අපි වහාම තණබිම හරහා ගමන් කොට එම නිවසේ පිටුපස දොරටුව වෙත ගියෙමු.

එය වහල කැඩී බිඳී ගොස් බිත්ති පුපුරායාම නිසා, කඩා ඉවත් කිරීමට නියම වූ නිවසක් බැව් අපට තේරුම් ගත හැකි විය. කසළ වලින් පිරී තිබූ එය, දඩාවතේ යන සතුන්ගේ වාස භූමියක් බවට පත්ව තිබූ සලකුණු ද එහි විය. පිටුපස දොරේ අගුළ කැඩී තිබූ අතර එයින් ඇතුළු වූ කැම්බල් දූවිලි පිරුණු කාමරය වෙත අප කැඳවාගෙන ගියේය.

"ටික වේලාවක් යද්දි ඔබේ දෙනෙත් අන්ධකාරයට හුරු වේවි" කැම්බල් කීය.

"කොහොම වුණත් ඔලිවර් අර්නස්ට්ගේ සලකුණක් තවමත් නෑ" මගේ මිත්‍රයා කීවේ සැනසුම් සුසුමක් හෙළමිනි.

"මෙන්න මෙතන තමයි පොළොවේ ලෑල්ලක් බුරුල් වෙලා තිබුණේ" කැම්බල් කීවේය. අප්‍රමාදව එය ඔසවා බැලූ ඔහු තමන් සැඟවූ සුරුට්ටු මංජුසාව ඉවතට ගත්තේ අප්‍රමාණ සතුටකිනි.

"මේ ගැන කියන්න ඔබ හමුවෙන්න ආ වෙලාවෙ" කැම්බල් කීය. "මං කොහොමටවත් හිතුවෙ නෑ ඔබ මේ මංජුසාව මේ තරම් ඉක්මනට මට හොයාදේවි කියල" ඔහු කීවේ එය තම පපුවට තද කර ගනිමිනි. "හෝම්ස් මහත්මයා. මේක සොයා දීම ගැන මං ඔබට සදහටම ණය ගැතියි. ඇත්තම කියනවා නම් මං දැනගෙන හිටියෙ නැහැ ඔබ මේ තරම් දක්ෂයෙක් බව. මේ පුදුමාකාර සිද්ධිය ගැන මගේ කොටස දැන් අවසන්. එහෙම නේද මහත්වරුනි?"

"ඔබට එහෙම යන්න දෙන්න බෑ කැම්බල් මහත්මයා" හෝම්ස් කීය. "අපරාධකාරයන් හඳුනාගැනීම සඳහා ඔබ අප ළඟ සිටිය





යුතුමයි. ඒ සඳහා අප සමග ඔබ ඩෝවර් වෙත යන්න පැමිණෙන්න. අතුරුදන්වී බව අප දැනටමත් දන්න ඔබේ අසල්වැසියා - අර්නස්ට් මහතා සොයා ගැනීම අප කාගේත් වගකීමක්. ඒ ඔක්කොටම කලින් අපි යන්න ඕන ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට"

හිස සෙලවූ කැම්බල් මහතා ඊට තම එකඟත්වය පළ කළේය. හැමර්ස්මිත් පෙදෙසින් පිටත් වී යාමට පෙර, හෝම්ස් ස්කොට්ලන්ඩ්යාඩ් වෙත විදුලි පුවතක් යැව්වේය. අප වෙස්ට්මින්ස්ටර් බ්‍රිජ් දුම්රියපොළෙන් බැස ස්කොට්ලන්ඩ්යාඩ් වෙත යද්දී, අපගේ පැරණි මිත්‍රයෙක් අප එනතුරු එහි බලා සිටියේය. ඒ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක ස්ටැන්ලි හොප්කින්ස් ය. සිද්ධියේ වැදගත්ම කොටස හෝම්ස් ඔහුට ඉක්මනින් තේරුම් කර දුන්නේය.

"මම තේරුම් ගත්තෙ මෙහෙමයි" හොප්කින්ස් කීය. "ඔය කියන ඔලිවර් අර්නස්ට් දැනට අපරාධකාරයන්ගේ ග්‍රහණයේ ඉන්නා බවයි පෙනෙන්නේ. ඔවුන්ගේ බලාපොරොත්තුව තියෙන්නේ ඔහුව හොර රහසේම, යුරෝපා මහාද්වීපයට හංගාගෙන යන්නද කියා අපි දන්නේ නෑ. එහෙමත් නැත්නම් ඔවුනට උවමනා ඉංග්‍රීසි ඕඩයෙන් එතෙර වීමට පෙර, අර්නස්ට්ට මොනවා හරි දරුණු දඬුවමක් දෙන්නද කියන කරුණත් අපි දන්නේ නෑ. නමුත් ඔවුනට ප්‍රංශය බලා යන නැවට නඟින්න ඉඩ දෙන්න නම් බෑ, අප ප්‍රශ්න කරන තුරු. එතෙක් ඔවුන් ඩෝවර් හි රඳවා ගන්නා බවට මං ඔබට සහතික වෙන්නම්"

එසේ කියා කාමරයෙන් පිට වූ ඔහු මඳ වේලාවකින් ආපසු පැමිණ උද්ගත වී ඇති තත්ත්වය ගැන අපට දැනුම් දුන්නේය.

"වරායේ පොලීසිය ඔවුන් අත්අඩංගුවට ගෙන අප එහි එනතුරු පොලිස් භාරයේ රඳවාගෙන ඉන්නවා. චාරිංක්‍රොස් දුම්රිය පොළෙන් දුම්රියක් හවස 2.10 ට ඩෝවර් බලා පිටත්වෙනවා. ඒකෙ ගියොත් හවස පහ වෙන්න කලින්, ඩෝවර් වෙත ළඟාවීමට අපට හැකිවේවි. මේ දුම්රිය චාරිංක්‍රොස්හි අමතර මිනිත්තු පහක් රඳවාගන්න දුම්රිය ස්ථානාධිපතිතුමා කැමති වුණා. එහෙනම් අපි වහාම පිටත්වෙමු!"

අප දුම්රිය ස්ථානයට ළඟාවනවිට දුම්රියට නැඟීම සඳහා, එක් තත්පරයක කාලයක්වත් ඉතිරි වී නොතිබිණි. අප දුම්රිය මැදිරියක් තුළට පැන ගත්තේ දුම්රියේ ගාඩ්වරයා තම නළාව පිඹිද්දීමය.

මිනිත්තු කිහිපයක් ගත වෙද්දී හේමන්ත ඍතුවේ දීප්තිමත් අව් රශ්මිය තුළින් දුම්රිය ගමන් කළේ ඉගිළෙන තරම් වේගයකිනි.

"සමහරවිට මෙහෙම දෙයක් සිදුවෙලා තියෙන්නත් පුළුවනි" හෝම්ස් කීය. "මෙම අද්භූත අර්නස්ට් මහත්මයා, දැනටමත් යම් අනතුරකට මුහුණ පා අවසන් වීමටත් ඉඩ තියෙනවා. මේ විදේශිකයන් අද දවසේ එංගලන්තය හැර යන්නේ ඇයි කියන එකෙන් මොකක්ද පැහැදිලි වෙන්නේ? ඒ තමයි ඔවුන් ක්‍රියාත්මක වෙන්න අන්තිම පැය විසිහතර වෙනතුරු බලාගෙන හිටියෙ ඇයි කියන එක"

"ඔවුන් හිතන්න ඇති සිදුවුණු දේවල් අපි හොයාගනිද්දි, අපට අල්ලාගත හැකි දුර ඔවුන් පහුකරලා ඉඳීවි කියල" ස්ටැන්ලි හොප්කින්ස් කීය. "ඔවුන් මේ අර්නස්ට් පිටුපස එළවන්නෙ ඇයි කියන එක දැනගන්න මං කැමතියි"

"මං ඔහුව දැක තිබෙන්නේත් ඉතාම ස්වල්ප වශයෙන්" කැම්බල් කීය. "පෙනෙන හැටියට නම් ඔහු ලොකු පොහොසතෙක් කියා හිතන්න අමාරුයි"

"ඔවුන්ගේ මේ සටන මුදල් පිළිබඳ ප්‍රශ්නයක් කියල මං හිතන්නේ නෑ" හෝම්ස් කීය. "ඔබ පැහැරගත් පුද්ගලයන් ෂීබා රැජිනව කැඳෙව්වානේ, ඇයට ඔබව පෙන්වන්න. නමුත් ඇය මොකද කළේ? ඔවුන් අතින් සිදුවුණු වැරැද්ද ගැන කෝපයට පත්වෙලා ඔවුනට බැණ වැදුණා. ඒකෙන් තේරුම් ගන්න පුළුවනි, මේක ඒ කාන්තාවට අදාළ පෞද්ගලික ප්‍රශ්නයක් කියල. කොහොම වුණත් ප්‍රමාණවත් තරම් දත්ත නොමැතිව නිගමනයකට ඒම අවදානම් කටයුත්තක්. තව එච්චර වෙලාවක් නෑ. අපට පුළුවනි ඒ තක්කඩින්ගෙන් කෙළින්ම ඒ ගැන ප්‍රශ්න කරන්න"

අප වෙරළ තීරයට ළඟාවනවිට අහස කළු වලාකුළින් බර වී තිබිණ. මුහුදේ සිට ගොඩබිම දෙසට හමා ආ සුළඟේ තිබුණේ තෙතමනය මිශ්‍ර ලුණු සහිත බවකි. කැලැඹීමට පත්ව සිටි මුහුදු ලිහිණියෝ අහස්කුස සිසාරා පියාඹා ගියහ. වරාය අධිකාරීවරයාගේ කාර්යාලය දෙසට අපි පා නැඟුවෙමු. ඩෝවර්හි වරාය පොලීසියේ ප්‍රධානියා වූ ලිවිංස්ටන් මහතා එහිදී අපට හමුවිය.

"ඔවුන් ඉන්නවා අපේ ආරක්ෂාව යටතේ" ඔහු කීය. "මේ කණ්ඩායම අඬුනාගැනීම මට අමාරු වුණේ නෑ. අර යෝධ මිනිහා නම් මුලදී අපට කරදර කරන්නයි සූදානම් වුණේ. නමුත් කාන්තාව





මොකක් හරි උපදෙසක් ඔහුට දුන්නා. ඔහු ඊට පස්සේ නිශ්ශබ්ද වුණා. ඔවුන් මෙහාට කැඳවාගෙන එන්න කියලා මං උපදෙස් දෙන්නම්"

විවෘතව තිබූ ජනේලයෙන් දැකිය හැකිවූයේ නෞකා රාශියකින් තදබද වී තිබූ වරායයි. අහස වැහි බරව තිබුණත් ඒ වෙලාවේ වැස්සක් ඇද හැළුණේ නැත.

විවෘත වූ දොරෙන් රැඳවියන් කාමරය තුළට කැඳවාගෙන එන ලදී. භාරව ආ නිලධරයා ලේඛනයක තිබූ නම් කියවීය. කපිතාන් බැසිල් ඔලිවේරා සිය නම කියවෙද්දී ඉදිරියට ආවේය. පෝස්ටරවල මා දැක තිබූ ඔහුගේ මුහුණේ තිබුණේ විඩාපත් පෙනුමකි. ඔහු අසලින්ම සිටියේ විල්හෙල්ම් රිච්ටර් ය. කෙසඟ පුද්ගලයෙකු වූ ඔහුගේ උඩු රැවුළ ඉටි යොදා සකස් කළ ඉතා අලංකාර එකක් විය. ඔහුට මඳක් ඈතින් යෝධයෙකු වැනි, හැඩිදැඩි ශරීරයක් තිබූ ගයිඩ්රූට් සිකෝස්කි නැගිට සිටියේය. අන් අයගෙන් ඈත්ව සිටියේ කාන්තාවය. "සර්කස් වළල්ලේ ෂීබා රැජින" නමින් හඳුන්වනු ලැබූ ඇය රූමත් යෙලේනා කැස්ලව්ස්කාය.

"මොකක්ද අපෙන් ඇතිවෙලා තිබෙන ප්‍රශ්නේ?" යෙලේනා අපෙන් විමසුවේ විදේශීය උච්චාරණයක් සහිත ඉංග්‍රීසියෙනි.

"මෙන්න මේ මහත්මයා ඔබට විරුද්ධව බරපතළ චෝදනාවක් කරනවා" ස්ටැන්ලි හොප්කින්ස් කීවේ කැම්බල් දෙසට ඇඟිල්ල දිගු කරමිනි. "ඔබ තිදෙනෙක් ඊයේ ඔහුව පැහැරගෙන ගිහින් සිරකරල තබා ගත්තලු. මොනවද ඔබට ඒ ගැන කියන්න තිබෙන නිදහසට කරුණු?"

"අනික් අය වෙනුවෙන් මං කරුණු ඉදිරිපත් කරන්නම්" යෙලේනා කීවාය. "මොවුන් එහෙම ක්‍රියාත්මක වුණේ මා වෙනුවෙන්. මේ මහත්මයාට කිසිම අන්දමකින් හිංසාවක් හිරිහැරයක් කිරීමේ බලාපොරොත්තුවක් අපට තිබුණේ නෑ. මෙතැනදි සිදුවුණේ ඉතාම අවාසනාවන්ත බරපතළ වැරැද්දීමක්. ඒ සිදුවීම ගැන අපි බලවත් ලෙස කණගාටු වෙනවා. ඒ ගැන අපි හැම දෙනාම මේ මහත්මයාගෙන් සමාව අයදිනවා."

"කැම්බල් මහත්මයාට හිරිහැරයක් කරන්න ඔබ නොහිතූ බව ඇත්තයි" හෝම්ස් කීවේ ඇගේ කථාවට බාධා කරමිනි. "ඔබේ මිත්‍රයන් දෙදෙනාට උවමනා වුණේ ඔහුගේ අසල්වැසි ඔලිවර් අර්නස්ට් පැහැරගෙන යන්නයි. එහෙම නේද?"

"ඔහුගේ සැබෑ නම ඔලිවර් අර්නස්ට් නෙමෙයි" ඇය කීවේ කෝපයෙන් දිලිසුණු දෙනෙත් වලිනි. "ඔහු ගැන ඔබ අසා ඇතිවාට සැක නෑ. ඔහු තමයි ලෝරන්ස් කෝල්බර්ග් - ජාත්‍යන්තර පොලීසියට උවමනා කරන හොරා, වංචාකාරයා, තක්කඩියා, මිනීමරුවා. ඉංග්‍රීසි නමක් අරගෙන එංගලන්තයේ සැඟවුණාට ඔහු ජර්මන් ජාතිකයෙක්. ඔහුව පැහැරගෙන යන්න කියල මං උපදෙස් දුන්නේ නෑ. නමුත් ශෝකයෙන් තැවෙන හැම්බර්ග්, වෝසෝ, ප්‍රාග් නගරවල අසරණ මිනිසුන් වෙනුවෙන්, ඔහු යුරෝපයට ගෙන යායුතු යයි මගේ මිත්‍රයන් විශ්වාස කළා. ඔහු ගැන තොරතුරු ඔබ දන්නේ නැතිව ඇති. ඒ නිසා මං කෙටියෙන් කියන්නම්.

ලෝරන්ස් කෝල්බර්ග් තරම් නින්දිත වංචනික පුද්ගලයෙක් පහුගිය අවුරුදු දෙසීයට වත් යුරෝපයේ බිහිවුණාද කියන එක සැකයි. ඔහුගේ නම මතක් කරන කොට අදටත් ඒ ප්‍රදේශවල මිනිස්සු කෙළ ගහනවා.

ඔහු මුලින් කළේ මධ්‍යම පංතිකයන් සඳහා නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියක් පටන් ගැනීමයි. මේ සඳහා අරමුදලක් ගොඩනැගීමට ඔහුට අයත් බැංකුවේ මුදල් තැන්පත් කරන මෙන්, ඔහු පුවත්පත් දැන්වීම් මගින් මහජනයාගෙන් ඉල්ලා හිටියා. මේ තැන්පතු සඳහා සාධාරණ පොලියක් ගෙවන බවට ප්‍රසිද්ධ කළා. මුල් අවුරුදු එකහමාරක කාලයක් මේ විදියට පොලී ගෙවීම, කිව්වාටත් වඩා හොඳින් ඉටු කළා. වෙන කිසිම බැංකුවක නොගෙවූ, කාටවත් අදහාගන්න බැරි පොලියක් ඔහු ගෙව්වේ, මහජනයා මවිතයට පත් කරමින්. සමාජයේ සෑම තරාතිරමකම මිනිස්සු ඔහුගේ උගුලේ අහුවුණා. සමහරු තමන්ගේ දේපළ විකුණා මුදල් ලබාගෙන කෝල්බර්ග් ගේ බැංකුවේ තැන්පත් කළා. සමහරු තම දූ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් තැන්පත් කර තිබූ මුදල්, සමහරු ජීවිත කාලයක් ගල් අඟුරු ආකරවල, නැව්වල දුක් විඳලා උපයා ගත් මුදල් තමයි, මේ විදියට ඔහුගේ වංචනික බැංකුවේ ආයෝජනය කළේ. නමුත් අවාසනාවක මහත! එක් රැයක් එළිවෙද්දී මේ මුළු බැංකුවම බිඳ වැටුණා. මහජනයා තැන්පත් කර තිබූ මුදල් අරගෙන ලෝරි කෝල්බර්ග් රටෙන් පැන්නා.

තමන්ට සිදුවුණු විනාශය වැටහෙද්දී ජනතාවට කළ හැකි දෙයක් තිබුණේ නෑ. වයස්ගත අය විශාල ගණනක් හෘදයාබාධ හා මොළයේ ලේ නහර පිපිරීම් නිසා මියගියා. සමහරු සිය දිවි





නසාගත්තා. පවුල් කඩාකප්පල් වුණා. අසරණයන් හාමතේ මිය යද්දී, මේ දූෂ්‍ය මිනිහා මුදල් රැගෙන ජර්මනියෙන් අතුරුදන් වුණා. ඔහුගේ බැංකු තිබුණු අනෙක් රටවලත් ඔහු සිටියේ නෑ. ඔහු අහුවුණා නම් මිනිසුන් ඔහුව, එක පාරට නොමරණ බවයි කවුරුත් කිව්වේ. ඔහුගේ ඇඟේ පෙති පෙති කපන බවට ඔවුන් දිවුරා කියා සිටියා.

අපේ රටවල පොලිස් සේවා ඉතාම දුර්වලයි. ඉහළ පොලිස් නිලධරයනට අල්ලස් දීලා, ඔහු යුරෝපයෙන් පැන ආවා. ඇවිත් හැංගුණේ ඔබේ රටේ - එංගලන්තයේ. මෙවැනි කාලකණ්ණි පුද්ගලයන්ට මහජනයා තවදුරටත් රැවටීමට ඉඩදිය යුතුද?"

"ඔහුගේ වංචාවට අසුවී ඔබත් මුදල් අහිමි කරගත්තාද?"

"නැහැ මහත්වරුනි. ඔහුගේ වංචනික බැංකුවල මං මුදල් තැන්පත් කළේ නෑ. නමුත් ඔහු නිසා මං මුහුණ දුන්නේ ඊට වඩා දරාගන්න බැරි පාඩුවකට. ඔය යක්ෂයා එක්ක මට තියෙන ගනුදෙනුව හුගක් පෞද්ගලික එකක්.

අශ්වාරෝහක ක්‍රීඩාවල යෙදුණු කැස්ලවිස්කා සොහොයුරියන් ගැන සමහරවිට ඔබ අහලත් ඇති. අවුරුදු ගණනකට කලින් ඒ විදියට මා සමග ඒ ක්‍රීඩාවල යෙදුණේ මගේ නැගනිය අයිරිනා. අපි වෝසෝ, වියනා, බුඩාපෙස්ට්, සොෆියා, ප්‍රාග් ආදී නගරවල එකල සංදර්ශන ඉදිරිපත් කළා. එක් ගිම්හාන කාලයක අපි ජර්මනියේ හැම්බර්ග් වල සංදර්ශන පැවැත්වූවා. ඒ කෝල්බර්ග් ව්‍යාපෘතිය කඩා වැටෙන්න කලින්. ඒ කාලයේ ඔහු හිටියේ ජනප්‍රියත්වයේ හිනි පෙත්තටම නැගලා. ආණ්ඩුකාරතුමා පැවැත්වූ සාදයකදී අපට ඔහු මුණ ගැහුණා.

ඔහුට තිබුණේ මනුෂ්‍යයින් කතාබහෙන් රවටා ගත හැකි කටක් බව මං ඔබට කලින් කිව්වා. ඔහුගේ සුන්දර වචන වලට මගේ නංගී අයිරිනා වශීවුණා. ඒ කාලෙදිත් ඔහු ගැන මගේ හිතේ විශ්වාසයක් තිබුණේ නෑ. ඔහු සර්පයෙකු කියා මට ඉවෙන් වගේ දැනුණා. ඒ බව කියා මං නංගීට අනතුරු ඇඟෙව්වා. නමුත් ඇය ඒවා කනකට ගත්තේ නැහැ. ස්විට්සර්ලන්තයේ ඔහු මිලදී ගෙන තිබූ මන්දිරයකට යන්න ඔහු නංගීව කැමැති කරගෙන තිබුණා.

කෝල්බර්ග් තමන්ගේ කතාවෙන් අයිරිනාව රවටා ගෙන තිබුණේ පුදුමාකාර විදියට. දෙමව්පියන්, පවුලේ සාමාජිකයන්, නෑදැයින්, මිත්‍රයන් ආදී කිසි කෙනෙකුට ඇය කන් දුන්නේ නැහැ.

ඇය ඔවුන්ගෙන් ඈත් වුණා. අපි හැම දෙනෙකුම පත්වුණේ දැඩි කම්පාවකට. ඇයගේ හිත වෙනස් කිරීම ඔහු කොයි තරම් දක්ෂ ලෙස කළාද? ඇය මා සමග කථා කිරීම පවා අත්හැරියා.

ඉතිරි හරිය ඔබට පුළුවන් ඇති හිතාගන්න. ඔහුගේ මූල්‍ය ව්‍යාපාර එක රැයින් බිමට කඩා වැටුණාම ඇයට මොකද වුණේ? ඔහු අයිරිනාව ඉවතට දැම්මේ පරණ සපත්තුවක් ඉවතට විසි කරන තරම් පහසුවෙන්. ඔහු ඇයට දී තිබූ පොරොන්දු වාෂ්ප වෙලා ගියේ හිරු දුටු පිණි වගේ. අන්තිමේදී අයිරිනා ගෙදර ආවා. එක වචනයකින් හෝ දොස් නොකියා අපි ඇයව සාදරයෙන් පිළිගත්තා. නමුත් ඇය මානසිකව විනාශ වෙලයි හිටියේ. ඒ ඇගේ සිතේ ඇතිවූ කම්පාව හා ලැජ්ජාව නිසා.

මහත්වරුනි. ඇය තවත් මාස හයක් ජීවත්වුණේ නෑ. බිඳුණු හදවතක් නිසා කෙනෙකු මියයන්නේ නෑ කියා කවුරු හරි කිව්වොත්, ඒක විශ්වාස කරන්න එපා. ඒ මොකද ඒ දේ මගේ ඇස් දෙකෙන්ම දැකල තියෙනවා. තදින්ම රෝගී වුණු ඇය අප හැර දමා මෙලොවින් සමුගත්තා. ලෝරි කෝල්බර්ග් සමග මට තියෙන කෝන්තරය එයයි"

යෙලේනා කැස්ලවිස්කා කථාව අවසන් කරද්දී, ඇගේ මුහුණ රත්පැහැවී දෙතොල් වෙව්ළමින් තිබිණි.

"ඒ නිසා ඔබට උවමනා වුණා ඔහුව හමුවෙන්න?" හෝම්ස් ඇසීය.

"ඔව්" ඇය කීවේ හිස සලමිනි. "ඔලිවර් අර්නස්ට් නමින් බොරු නමක් අරගෙන ඔහු ලන්ඩනයේ ජීවත් වෙන බව මට දැනගන්න ලැබුණා. දෙවරක්ම මං ඔහුට ලියුම් එව්වා. නමුත් ඒවාට මට පිළිතුරු ලැබුණේ නෑ. ඔහු නිසා මගේ හිතේ ඇති වී තිබූ කලකිරීම මගේ ක්‍රීඩා සංදර්ශන වලටත් බලපෑවා. ඔහුව බලෙන් අරගෙන එන්න මගේ මිත්‍රයන් තීරණය කළේ ඒ නිසයි. කෝල්බර්ග් ගේ පෙනුම ඔවුන් හරිහැටි දැන හිටියේ නෑ. ඒ නිසයි ඔවුන් වැරැදි මිනිහාව අරගෙන ආවේ."

"කෝ කෝල්බර්ග් දැන්?" හෝම්ස් විමසීය.

"දැන්?" ඇය එම වචන ප්‍රතිරාවය කළාය. "ඔහු කොහේ ගියාද කියල මම දන්නේ නෑ. ඒකෙන් මට ඇති වැඩකුත් නෑ!"

"නමුත් අද උදේ ඔහු හමුවීමට ඔහුගේ නිවසට ඔබේ කණ්ඩායම ගියා නේද? ගෙදර සේවිකාව ඒ විස්තරය අපට කිව්වා."





"ඒක ඇත්තයි. මම කතා කරද්දි මේ කාලකණ්ණි බයගුල්ලා හයෙන් වෙව්ළුවා. ඔහු රටවල් තුනක ජනතාවට සහ මගේ නංගීට කළ විනාශය ගැන මම ඔහුට කිව්වා. ඒකට කීමට කිසිදෙයක් ඔහුට තිබුණේ නෑ. ඔහුගේ මුහුණේ ප්‍රකාශ වුණේ භීතිය පමණයි. මං කරන්නේ කාලය නාස්ති කිරීමක් පමණක් බව රිච්ටර් මට කිව්වා. ඔහු මානසිකව කඩා වැටී ඇති බව මටත් තේරුම් ගියා. අනෙක් මිනිසුන්ගේ ජීවිත විනාශ කොට මුදල් වංචාකර ගැනීමෙන්, ඔහුට සතුටක් ලැබිල නෑ. ඉතින් අපි ඔහු හැර දමා ආපසු ආවා. දැන් මගේ එකම ප්‍රාර්ථනය මං ජීවත්ව ඉන්නා තුරු, මේ විෂඝෝර සර්පයා මගේ ඇස් දෙකට දකින්න නොලැබේවා කියලයි"

"ඔබ ඔහුව පැහැරගෙන ආවෙ නැද්ද?"

"කොහොමටවත් නෑ. ඔහුගේ මුහුණ දැකීම පවා මට පිළිකුල් වෙලයි තිබුණේ"

"නමුත් දැන් ඔහු අතුරුදන් වෙලා"

මෙය තමා බලාපොරොත්තු නොවූ බව හඟවමින්, කැස්ලවිස්කා මෙනෙවියගේ මුහුණේ මවිතය ප්‍රකාශ විය.

"ඒක අප කළ දෙයක් නම් නොවෙයි" ඇය කීවාය.

"දැන් ඉතින් ප්‍රශ්නය වඩාත් බැරෑරුම් වෙනවා" හොප්කින්ස් කීය. "එහෙම නම් මට සිදුවෙනවා ලන්ඩනයට කතා කරලා වඩාත් නිපුණ සෝදිසියක යෙදෙන්න කියන්න. ඒ අතරේ......."

දොරට තට්ටු කළ හඬකින් ඔහුගේ කථාවට බාධා සිදුවිය. ඇතුළු වූයේ නිල ඇඳුමකින් සැරසුණු නිලධරයෙකි.

"නෞකාව තවත් මිනිත්තු දහයකින් පිටත්වෙන්නයි සූදානම. ඔලිවේරා කණ්ඩායම ඇතුව හෝ නැතුව නැව පිටත් වේවි. පොලීසියේ ස්ටැන්ලි හොප්කින්ස් මහතා නමට විදුලි පුවතකුත් තියෙනවා" කී නිලධරයා විදුලි පුවත ඔහු වෙත දිගු කළේය.

එය විවෘත කළ හොප්කින්ස් එහි ඇතුළත්ව තිබූ තොරතුරු අපට හෙළි කළේය.

"අතුරුදන්ව හිටි ඔලිවර් අර්නස්ට් ඔවුනට හමුවෙලා"

"ඉතින්?"

"විදේශිකයන් කීප දෙනෙකුගේ ග්‍රහණයට අද උදේ අහුවෙලා හිටි අර්නස්ට් වහාම ගිහින් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ හැංගිලා ඉඳල තියෙනවා. ඒකෙන් ඔහු එළියට ඇවිත් තියෙන්නේ මීට පැය

දෙකකට කලින්. ඔහු ග්‍රේට් ඕමොන්ඩ් වීදියේ ඇවිදගෙන එද්දි පුද්ගලයන් දෙදෙනෙකු ඔහුව පැහැරගෙන, කරත්තයක දමාගෙන ගිහිං. ඒක කරල තියෙන්නේ පාර අයිනේ සිටි පොලිස් භටයකු ඉදිරිපිටදීම. ඊළඟට මීට පැය කාලකට කලින් ඔහුගේ මළසිරුර හමුවුණාලු, බ්ලැක්ෆ්‍රයර්ස් පාලම යට තිබිලා. ඔහු මරණයට පත්වෙලා තියෙන්නේ තියුණු ආයුධයකින් කළ කැපුම් තුවාල රාශියකින්"

"ඔහුට සුදුසු දඬුවම ලැබිල තියෙනවා" කැස්ලවිස්කා මෙනෙවිය කීවාය.

"දැන් ප්‍රශ්නය විසඳිලානේ. දැන් අපට යන්න අවසරද?" කපිතාන් ඔලිවේරා කීවේ තම ඔරලෝසුව දෙස නෙත් යොමු කරමිනි.

"මේ කැම්බල් මහත්මයා පැහැරගෙන ගිහිං බලෙන් රඳවා තබා ගැනීම බරපතළ අපරාධයක්........" පොලිස් නිලධරයා කියද්දී කැම්බල් ඊට බාධා කළේය.

"ඒකට කමක් නෑ" කැම්බල් කීය. "ඔවුන් මට තුවාල සිදු කළෙත් නෑ. ඒ වගේම සමාවත් ඉල්លුවා. ඔවුන් නිදහස් කර යැවීම ගැන මගේ විරුද්ධත්වයක් නෑ"

"ඔව්. එහෙම නම් මේ රටෙන් පිටවී යන්න ඔබට නීතියෙන් අවහිරයක් නෑ"

පියවරක් ඉදිරියට තැබූ කපිතාන් ඔලිවේරා කැම්බල්ගේ සුරත ගෙන ස්තුති කළේය.

"ඔබ සැබෑ මහත්මයෙක්. අපේ මුළු කණ්ඩායම ම වෙනුවෙන් අපේ ස්තුතියත් ගෞරවයත් ඔබට හිමිවෙනවා. තවත් දෙයක් මා ඔබට කිව යුතුයි. මා සමග විවාහ වීමට තම එකඟත්වය පළ කරමින් කැස්ලවිස්කා මෙනෙවිය මට විශාල ගෞරවයක් කළා. අපි දෙන්නා ලබන මාසයේ වෝසෝ නගරයේදී විවාහ වෙනවා. අපේ මංගලෝත්සවයට පැමිණ අපට ආශීර්වාද කරන මෙන් ඔබට ගෞරවයෙන් ආරාධනා කරනවා"

ඔවුහු අපෙන් සමුගෙන පිටත්වී ගියහ.

"මේක අපට ප්‍රීති සාදයක් පවත්වන්න අවස්ථාවක්" හෝම්ස් කීය. "කොහොම වුණත් අපේ දවල් කෑම වේලත් අපට අහිමි වුණානෙ."

"මේ ළඟම තියෙන්නෙ ඉහළ පෙළේ හෝටලයක්" කැම්බල් කීය. "දහවල් භෝජනයට නම් අපි ප්‍රමාද වැඩියි. ඒ වුණත් කුසගිනි





නිවා ගැනීමට මොනවා හරි නැතිවෙන්නෙ නෑ මේ ග්‍රෑන්ඩ් ඉංග්ලිෂ් හෝටලයේ. තවත් පමා නොවී යමු"

හෝටලයේ උඩු මහලේ සඳලුතලයේ සිටි අපි වරාය දෙසට නෙත් යොමු කළෙමු. කපිතාන් ඔලිවේරා සහ ඔහුගේ මිත්‍රයන් රැගත් නැව සෙමෙන් සෙමෙන් එංගලන්ත වෙරළෙන් බැහැරට යාත්‍රා කළේය.

"ඉතාම අසාමාන්‍ය ආකාරයේ සිදුවීමක්" හෝම්ස් කීවේ කෙටි අහර අවසානයේ කෝපි කෝප්පය අතට ගනිමිනි.

"මේ වගේ පුදුමාකාර ගැටලුවක් ලැබුණාම, මුළු ලෝකෙම දෙනවා කිව්වත් ඒක අතාරින්න මං කැමති නෑ. කැම්බල් මහත්මයාට ඔහුගේ වටිනා සුරුට්ටු මංජුසාව ආපසු ලැබුණා. මටයි හොප්කින්ස්ටයි. සැඳෑකාලය මුහුදු වෙරළේ ගත කරන්න අවස්ථාවක් ලැබුණා. මගේ හිතවත් වොට්සන්. ඔබට නමයි කිසිවක් නොලැබුණේ එහෙම නේද?"

"ඇයි නැත්තෙ? මට මගේ පාඨකයන් සඳහා අලුත් කථාවක් ලැබුණා"

## හන්ටිංඩන් උද්‍යානයේ මිනීමැරුම

"විදුහලේ අවුල" නමින් මා ඔබ වෙත ඉදිරිපත් කළ පරීක්ෂණය ගැන ඔබට තවමත් මතක ඇතැයි සිතමි. මෙම පරීක්ෂණයේ යෙදීම සඳහා අපට ලන්ඩනයෙන් බැහැර යාමට සිදුවිය. ඒ දිනවල එක්තරා ප්‍රසිද්ධ පුස්තකාලයක් සමීපයේ පිහිටි නිවසක අපි නේවාසිකව සිටියෙමු.

හෝම්ස් මේ වකවානුවේ පර්යේෂණයක නියැළී සිටියේ ය. ඒ, එංගලන්තයේ පැරැණි රජවරුන් විසින් නිකුත් කරන ලද රාජාඥා හා ප්‍රදාන පත්‍ර පිළිබඳ විමර්ශනයකය. කරුණු ගැඹුරින්ම විමසමින් ඔහු කළ මේ අධ්‍යයනයට, පොත් රැසක් විමර්ශනය කිරීමට ඔහුට සිදුවිණි. ඒ සඳහා ඔහු යොදාගත්තේ මා කලින් කී පුස්තකාලයයි. හෝම්ස් කළ මේ පර්යේෂණයේදී සොයාගත් සමහර කරුණු අතිශයින්ම පුදුම සහගත ඒවා විය. ඒ ගැන තොරතුරු ඇතුළත් කොට ග්‍රන්ථයක් සම්පාදනය කිරීමට හෝම්ස් බලාපොරොත්තු වෙයි. එබැවින් ඒ ගැන තවදුරටත් සඳහන් නොකරමි. අප මේ ප්‍රදේශයේ නේවාසිකව සිටියදී ඔහු වෙත යොමු වූ පරීක්ෂණයක් පාඨකයා වෙත ඉදිරිපත් කිරීම යෝග්‍ය යයි මම සිතමි.

ෂර්ලොක් හෝම්ස් නම් විශේෂඥ රහස් පරීක්ෂකයා මෙම ප්‍රදේශයට පැමිණ සිටින බව නොදැන, ප්‍රාදේශීය පොලිස් නිලධරයන් විසින් මෙහි මූලික විමර්ශන කටයුතු සිදුකොට තිබිණි. පරීක්ෂණයේ කිසිදු ප්‍රගතියක් අත් නොවෙද්දී, ඔවුහු ඒ බැව් ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය වෙත දැනුම් දුන්හ. අනතුරුව මෙම පරීක්ෂණය මගේ මිත්‍රයා වෙත භාරවූයේ ඔවුන්ගේ සම්බන්ධීකරණය නිසා බැව් කිව යුතුය.

මෙම අපරාධය ගැන අපි පුවත්පත් වලින් කියවූයෙමු. දැන් මා ඔබට ඉදිරිපත් කරන්නේ එම පුවත්පත් වාර්තා සම්පිණ්ඩනය කොට සකසා ගත් වාර්තාවකි.

සැප්තැම්බර් 3 වන දා අඟහරුවාදා දවසක් විය. ජොආනා හර්ෂල් සහ කැල්වින් හිගින්ස් නම් තරුණ යුවළ අපර භාගයේ





හන්ටිංඩන් වනය හරහා ඇවිද ගොස් තිබිණ. එම වනෝද්‍යානය මධ්‍යයේ පිහිටි පොකුණ සමීපයේ තණබිම් කඩක් මත, උඩුබැලි අතට වැටී සිටි මිනිසෙකු ඔවුනට හදිසියේ දකින්නට ලැබී ඇත. ඔහු වැටී සිටියේ ලේ විලක් මැදය. මෙය දුටු ජොආනාගේ මුවෙන් එක්වරම නිකුත් වූයේ යටිගිරියෙන් කළ කෑගැසීමකි. තව මොහොතකින් ඇය එතැනින් පැන දුවන්නට ඉඩ තිබිණි. කෙසේ වෙතත් කැල්වින් හිගින්ස් පිරිමියෙකු ලෙස තම හැඟීම් පාලනය කර ගැනීමට සමත් විය. ඔහු වැටී සිටි පුද්ගලයා සමීපයටම ගියේ, ඔහු කවුදැයි හඳුනාගැනීමේ අපේක්ෂාවෙනි.

එම පුද්ගලයා යාබද වෙල්ටන්හැම් නගරයේ සුප්‍රකට පුද්ගලයකු බැව් දුටු හිගින්ස්, මහත් කැලඹීමට පත්විය. නමින් සැමුවෙල් මෝගන් නම් වූ වැටී සිටි තැනැත්තා වෙල්ටන්හැම් හි වැදගත් අයෙකි. කැල්වින් හිගින්ස්ට සිතුණේ වැටී සිටි තැනැත්තා නිසැකවම මියගොස් ඇති බවයි. එහෙත් ප්‍රදේශයේ වෛද්‍යවරයා වූ දොස්තර ලිට්ල් ජෝන් කැඳවීම වඩාත් යෙහෙකැයි හිගින්ස් කල්පනා කළේය. වැටී සිටි පුද්ගලයා අසල රැඳී සිටීමේ කාර්යය භාරගත් හිගින්ස් තරුණයා, පොලීසියට පණිවුඩයක් දීමට හා වෛද්‍යවරයා කැඳවාගෙන ඒමට තම පෙම්වතිය වූ ජොආනා හර්ෂල් යැවිය.

ජොආනා පිටවී ගොස් පැය භාගයක් පමණ ගතවෙද්දී, මෙතෙක් නිශ්චලව සුදුමැලිව තිබූ සිරුරේ යම්කිසි සෙලවීමක් හිගින්ස්ට දකින්නට ලැබී ඇත. ඔහුට පෙනී ගියේ තුවාල ලැබූ පුද්ගලයා යමක් කීමට උත්සාහ දැරූ ආකාරයයි. ඔහු කියන දේ අසා ගැනීම සඳහා තරුණයා මුහුණ පහත්කොට, ඒ දෙසට සවන් යොමු කළේ ය. පශ්චාත් මරණ පරීක්ෂණයේදී තරුණයා දුන් සාක්ෂි වලින් කියැවුණේ, මෝගන් මහතා දෙනෙත් විවෘත කොට, කෙඳිරිලි හඬින් එහෙත් පැහැදිලිවම වචන කිහිපයක් මිමිණූ බවයි.

"ලියුම....... ලෙනාඩ්........ හෙක්ටර්......... රොබින්....... අනික් එක්කෙනා"

මරණාසන්නව සිටි පුද්ගලයාට කීමට හැකි වූයේ එපමණකි. මීළඟට ඔහු අවසන් හුස්ම හෙළා දෙනෙත් සදහටම පියා ගත්තේ ය.

වෙල්ටන් හැම් පොලිස් ස්ථානයෙන් පොලිස් පරීක්ෂකවරයෙකු, පොලිස් භටයන් දෙදෙනෙකු සහ වෛද්‍යවරයා මෙතැනට

පැමිණෙන විට සවස හය පසුවී තිබිණි. මෝගන් යළිත් වරක් කථාකොට නොතිබූ අතර, ඔහු මියගොස් ඇති බැව් වෛද්‍යවරයා සහතික කළේ ය. මෝගන් මහතාගේ මළසිරුර වෙල්ටන්හැම් හි ඔහුගේ නිවස වෙත ගෙන යන ලදී. ඔහු එම නිවසේ පදිංචිව සිටියේ ඔහුගේ සොයුරිය වූ මාජරී මෝගන් මෙනෙවිය සමගය. ඔහුගේ මරණය ගැන සොයුරියට දැනුම් දීමේ වේදනාත්මක කටයුත්තට ජොආනා හර්ෂල් සිය කැමැත්තෙන්ම ඉදිරිපත් වූවා ය.

සුප්‍රකට වයින් වෙළෙන්දන් වූ ලෙනාඩ් සහ සමාගමේ අයකැමිවරයා ලෙස මේ අවාසනාවන්ත සැමුවෙල් මෝගන් මහතා කටයුතු කළේ ය. ඒ අනුව සමාගමේ අධ්‍යක්ෂකවරුන් වූ හෙක්ටර් ලෙනාඩ් සහ රොබින් ලෙනාඩ් යන මහත්වරුනටද, මේ අවාසනාවන්ත මරණය ගැන දැනුම් දෙන ලදි.

මෙම සිදුවීම මේ වනවිට අභිරහසක් බවට පත්ව තිබිණි. ඊට හේතුව සැමුවෙල් මෝගන් යනු, කිසිදු හතුරෙකු නොසිටි පුද්ගලයකු බව අසන්නට ලැබීමය. අනෙක් අතට ඔහු විශාල පොහොසතෙකු ද නොවීය. ඔහුගෙන් මංකොල්ලකෑමට තරම් ලොකු මුදලක් හෝ වෙනත් වටිනා වස්තුවක් ඔහු සතුව නොතිබිණි. පොලීසියට මේ වනවිටත් කිසිදු ආකාරයක හෝඩුවාවක් ලැබී තිබුණේ ද නැත.

මළසිරුර අවට මෙන්ම, මළසිරුරේ සිට පොකුණ දක්වා වූ මෘදු පස් සහිත තණබිමේ, සෑම හැඩයකින්ම හා ප්‍රමාණයකින්ම පා සටහන් සලකුණු රාශියක් තිබුණු බැව්, පොලීසියේ අපරාධ පරීක්ෂකයා දැක තිබිණි. නොයෙක් ප්‍රමාණවල පතරොම් කොපු රාශියක් මරණය සිදුවූ තැනට සමීපයෙන් හා ඈතින් හමුවිය. එහෙත් හන්ටිංඩන් වනාන්තරය යනු, දඩයම් කළ හැකි වන සතුන් පිරී ඉතිරී ගිය තැනකි. විවිධ පළාත්වලින් පැමිණි දඩයක්කරුවෝ මෙහි පක්ෂීන් හා කුඩා සිව්පාවුන් දඩයමේ යෙදුණාහ. වැඩිමහල් හෙක්ටර් ලෙනාඩ් මෙන්ම ඔහුගේ ම මලණුවන් වූ රොබින් ලෙනාඩ් දෙදෙනා, තම මිතුරු කණ්ඩායම් සමග දින ගණනාවක්ම මෙහි දඩයමේ යෙදුණු බැව් අසන්නට ලැබේ.

අසලින් වූ පොකුණේ පතුල පරීක්ෂා කිරීමට පොලීසියට අවශ්‍ය වී තිබිණි. වනාන්තරයේ මෙම කොටස ලෙනාඩ් පවුලේ දේපළක් වූ බැවින් පොකුණු පතුල පරීක්ෂාවට ලෙනාඩ් පවුලේ අවසර ඉල්ලුම් කරන ලදී. එයට ප්‍රතිචාරයක් ඉක්මනින්ම ලැබිණි. ඒ සඳහා තමාගෙන් අවසර ලැබෙන බැව් හෙක්ටර් ලෙනාඩ්ගේ අත්සනින්





යුතු ලිපියක සඳහන් විය. පොකුණේ පතුල පරීක්ෂාවෙන් ලැබෙන ප්‍රතිඵල මහජනයාට දැනගන්නට ලැබෙන්නේ, පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වෙන දිනයට ය. ඒ දිනය උදාවෙන තුරු ගම්මු කවුරුත් නොඉවසිල්ලෙන් බලා සිටියහ.

පශ්චාත් මරණ පරීක්ෂණ විභාගය, දිගු කලකට කාටත් අමතක නොවන අත්දමේ එකක් වූ බැව් අපට අසන්න ලැබිණි. ප්‍රමාණයෙන් කුඩා වෙල්ටන්හැම් නගරයට එක්රොක්ව සිටියේ, කුතුහලයෙන් නොඉවසිලිමත්ව සිටි විශාල ජන සංඛ්‍යාවකි. විශේෂඥ වෝහාරික වෛද්‍යවරුන් ලෙස පශ්චාත් මරණ පරීක්ෂණයේ සාක්ෂි දුන්නේ, වෛද්‍ය ටීඩී ලිට්ල් ජෝන් සහ වෛද්‍ය රසල් වයිවර්ලි දෙදෙනාය. මියගිය පුද්ගලයාගේ මරණයට හේතුව, ඔහුට ඉතා සමීපයේ සිට එල්ල කරන ලද, කුඩා මුණිස්සම් සහිත උණ්ඩ යොදා කරන ලද වෙඩි ප්‍රහාරයක් බැව් ඔවුහු පැවසූහ. මුණිස්සම් සියල්ල හෘදය වස්තුවේ සහ ඒ අවට තැන්පත්ව තිබූ අතර, ඒවා සිරුරට ඇතුළු වූ තුවාලය වටේට සම හා අනෙක් පටක ඇවුණු සලකුණු ද දක්නට ලැබිණ.

මහජනයා විමතියට පත් කරන ආකාරයේ සාක්ෂියක් දෙනු ලැබුවේ පොලිසිය විසිනි. පොකුණේ සෑම තැනකම පත්ල හොඳින් "පීරා" බැලූ බැව්, සාක්ෂි දුන් පොලිස් නිලධරයා පැවසීය. අන්තිමේදී ඔවුනට සොයා ගැනීමට හැකිවී තිබුණේ බල්ලෙකුගේ මළ සිරුරක් පමණි. එහි වැදගත් කම කුමක් වීද?

පළමුවැන්න නම් මේ බල්ලාටද වෙඩි පහරක් එල්ල වී තිබීමය. මරණයට හේතුව රයිෆලයක මිටෙන් උගේ හිසට එල්ල වී තිබූ දැඩි ප්‍රහාරයකි. කෙසේ වෙතත් උගේ ශරීරයේ එක් පැත්තක වෙඩි වැදුණු සලකුණු ද විය. වෛද්‍ය ලිට්ල් ජෝන් සහ වෛද්‍ය වයිවර්ලි විසින් මෙම තුවාලය ද පරීක්ෂා කළ බැව් අපට අසන්නට ලැබිණ. එම තුවාලය සිදු වී තිබුණේ ද, සැමුවෙල් මෝගන් මැරීම සඳහා යොදා ගත් මුණිස්සම් සහිත උණ්ඩ වලින් බැව් ඔවුහු පැවසූහ. ඊට අමතරව එම වෙඩි පහර එල්ල වී තිබුණේ බල්ලා සමීපයේ සිට බැව් ඔවුන්ගේ නිගමනය විය.

විමතියට පත්ව සිටි ජනයා මවිතයට පත් වූයේ බල්ලා කවුරුන්දැයි හඳුනාගත් පසු ය. ඒ රොබින් ලෙනාඩ් මහතා කුරුලු දඩයමේ යද්දී කැඳවාගෙන යන ඔහුට අයත් "බ්‍රැවෝ" නම් කළු

පැහැති සුනඛයාය. මේ බැව් ප්‍රකාශයට පත් කෙරුණු කල රැස්ව සිටි ජනතාව අතර පැතිර ගියේ මීයකට පිම්බාක් වැනි නිහඬතාවයකි. මෙම නිශ්ශබ්දතාවය මධ්‍යයේ ඉදිරියට ආවේ මියගිය තැනැත්තාගේ සොහොයුරිය වූ මාජරී මෝගන් මෙනෙවියයි. තද කළු පැහැති ඇඳුමකින් සැරසී සිටි ඇයගේ අතේ ලිපියක් තිබිණි. ඇය එම ලිපිය මරණ පරීක්ෂක තැන වෙත භාර දුන්නා ය.

"බදාදා උදේ මේක ආවෙ" ඇය කීවා ය. "ලිපිනය ලියා තියෙන්නේ මගේ නමට. නමුත් එය යොමුවිය යුත්තේ ඔබට බව මට පැහැදිලියි. ඒ බව මේ කවරයේ කෙළවරක සඳහන් වෙනවා."

මරණ පරීක්ෂකවරයා එය අතට ගෙන පරීක්ෂා කර බලා ශබ්ද නඟා කියෙව්වේය.

"අඟහරුවාදා අපර භාගයේ මට මරණීය තුවාල සිදුවුණු අනතුරක් වුණොත්....... මා මියගිය හොත්, එවිට පැවැත්වෙන මරණ පරීක්ෂණ විභාගයේ ප්‍රධානියා සහ ජූරියේ මහතුන් වෙත"

මීළඟට ඔහු කවරය ඉරා ඇතුළේ තිබූ ලිපිය එළියට ගත්තේය. එය දිගහැරී ඔහු ලිපිය වෙත තම දෙනෙත් යොමු කළේ ය. ඔහු ඒ දෙස බලා සිටින්නට ඇත්තේ මිනිත්තුවක් නැත්නම් දෙකකි. ඔහුගේ මුහුණ වෙනස් වූයේ බලා සිටීමට පවා අපහසු පරිද්දෙනි. රැස්ව සිටි සෙනග ලියුමේ තිබූ දේට සවන්දීමේ අපේක්ෂාවෙන් බලා සිටියේ නොඉවසිල්ලෙනි. මාජරී මෙනෙවිය තම කුඩය මත දෑත් පටලවාගෙන සිටි අතර ඇගේ මුහුණෙන් කිසිදු හැඟීමක් පළ නොවිණි. අන්තිමේදී මරණ පරීක්ෂකවරයා ජූරියේ සාමාජිකයන් ඇමතීය.

"මහත්වරුනි. මේ ලියුම යොමු කරල තියෙන්නේ මගේ වගේම ඔබේත් අවධානයට. ඒ නිසා මෙහි අඩංගු කරුණු සැම දෙනා වෙතම හෙළි කිරීම මගේ වගකීමක්. කොහොම නමුත් මං ඔබට කල්තියා දැනුම් දීමක් කරන්නට කැමතියි. ඒ තමයි මෙහි අඩංගු කාරණා ඉතා පුදුමාකාර බවක් ඔබට පෙනෙන්නට පුළුවනි. නමුත් ඒවා ඔබේ සිත්වලට, ඔබේ විනිශ්චයට, අසාධාරණ බලපෑමක් වීමට ඉඩ තබන්න එපා.

ලියුම ලියල තියෙන්නේ සැප්තැම්බර් 3 වැනි අඟහරුවාදා දහවල් 12.30 ට. ලියූ ස්ථානය වෙල්ටන්හැම් හි සන්ෆ්ලවර් ලොජ්හිදීය. මේක අත්සන් කරල තියෙන්නේ සැමුවෙල් මෝගන් විසින්. ඒකෙ මේ විදියට කියල තියෙනවා.





"හදිසි මරණ පරීක්ෂක තුමනි; ජූරියේ මහත්වරුනි. මා මෙය ලියන්නේ ඔබ වෙත යම් වැදගත් කාරණයක් දැනුම් දීම සඳහාය. අද දින සවස 2.30 ට මගේ නිවසින් පිටත් වී මම හන්ටිංඩන් වෙත පයින් ඇවිදගෙන යන්නෙමි. ඒ ඉතා වැදගත් ව්‍යාපාර කටයුත්තක් සම්බන්ධයෙන් ටෑඩෝ මහතා සහ හෙක්ටර් ලෙනාඩ් මහතා හමුවීම සඳහාය.

හෙක්ටර් මහතාගේ බාල සොහොයුරු රොබින් මහතාට මා හමුවීමට උවමනා වී තිබිණි. මා හන්ටිංඩන් වෙත යන අතරේ හන්ටිංඩන් වනයේ පොකුණ අසල දී මා හමුවීමට අවශ්‍ය බව ඔහු දන්වා ඇත. ටෑඩෝ සහ හෙක්ටර් මහත්වරුන් හමුවීමට මා හන්ටිංඩන් වෙත යන්නේ ඇයි ද යන කාරණය, රොබින් මහතා ඉතා හොඳින් දනී. ඊයේ රාත්‍රියේ අපේ කාර්යාලය තුළදී ඔහු මා සමග ඉතා දරුණු ආකාරයේ පටළැවිල්ලක් ඇති විය. එම සණ්ඩුවට හේතුව ද මා කලින් කී කාරණයයි. රොබින් මහතාට උවමනා වී ඇත්තේ කෙසේ හෝ, මා එම කාරණය ටෑඩෝ හා හෙක්ටර් දෙදෙනාට දැනුම්දීම වළක්වාලීම ය. යම් හෙයකින් මා එවැනි දැනුම් දීමක් කළොත් මා මරා දැමීමට වුවත් තමන් පසුබට නොවන බව කියමින් ඔහු මට තර්ජනය කළේ ය. මට යම් බරපතළ අනතුරක් සිදුවුණොත් ඊට වගකිව යුත්තා රොබින් ලෙනාඩ් මිස අන් කිසිවෙකු නොවේ."

කොපමණ විශාල සෙනගක් එක් රැස්වී සිටියද, මිනිත්තු කිහිපයක් යනතුරු එතැන පැතිර ගියේ ඇඩි නිශ්ශබ්දතාවයකි. ඉන්පසු ශාප කිරීම් හඬ සෙනග අතරින් අසන්නට ලැබිණ.

අලංකාර ඇඳුමකින් සැරසී සිටි තරුණ රොබින් ලෙනාඩ් මහතා, මළමිනියක් මෙන් සුදුමැලිව තම අසුනෙන් නැගී සිටියේ ය. සෙනග අතරින් ඉදිරියට ආ ඔහු ගමන් කළේ මරණ පරීක්ෂකවරයා වෙතයි. ඔහු අමතා යමක් කීමට රොබින් මහතාට උවමනා විය. එහෙත් ඔහුට නිහඬව සිටින මෙන් මරණ පරීක්ෂකවරයා සංඥා කළේ ය. මේ අතර මාජරී මෝගන් මෙනෙවිය තම සාක්ෂිය අවසන් කළා ය. රොබින් ලෙනාඩ් මහතා සමග තම සොහොයුරා සණ්ඩුවකට පැටළුණු බව තමා දැන නොසිටි බව ඇය කීවා ය. මරණය සිදු වූ සවස් වරුවේ තම සොහොයුරා හන්ටිංඩන් වනය වෙත ගමන් කළ බවද ඇය දැනසිටියේ නැත.

ඇගේ සාක්ෂිය අවසන් වූ පසු රොබින් ලෙනාඩ් මහතා සාක්ෂිය සඳහා කැඳවන ලදී.

මෙම ගැටලුව විසඳීමේ අරමුණෙන් සෑම කෙනෙකු වෙතම ප්‍රශ්න ඉදිරිපත් කිරීමට මරණ පරීක්ෂකවරයා කිසිසේත් පසුබට නොවීය. මෝගන් මහතා ඔහුගේ ලිපියේ සඳහන් කර තිබූ ආරවුල ගැන මරණ පරීක්ෂකවරයා විමසුවේ ය. රොබින් මහතා එය සත්‍යයක් බව පිළිගත්තේය. නමුත් මේ හේතුව නිසා තමා 'නාකි' මෝගන් කෙරෙහි සිතේ තරහක් තබා නොගත් බව අවධාරණය කළේය. ඔහු සදහටම නිහඬ කිරීමට තරම් හේතුවක් තමාට නුවූ බැව් ඔහු කීය.

"මෙහෙම කතා කියන එක ලොකු විහිළුවක්" රොබින් මහතා කීය. "එහෙමත් නැත්නම් ඔය කතා කියන අයට ලොකු වැරැදීමක් වෙලා"

"නමුත් ඔබ දෙදෙනා අතර ඇතිවුණු සණ්ඩුව? ඒ ගැන මොනවද ඔබ කියන්නෙ?"

"මං ඒක නැහැ කියන්නේ නැහැ" රොබින් මහතා කීය. "ඒක ඇතිවුණේ ඇයි කියල මං කියන්නම්. කිසිදු පදනමක් නැති අසත්‍ය බහුබූත චෝදනාවක් මගේ හිස මත පටවන්න මෝගන් උත්සාහ කළා"

"නමුත් ඇයි ඔබ හොර රහසේම කැලෑවේ දී ඔහු හමුවෙන්න යොදාගත්තේ?"

"ඒක රහසිගත හමුවීමක් නෙමෙයි. ඔහු වෙල්ටන්හැම් ඉඳන් හන්ටිංඩන් වෙත යෑමට කැලෑව හරහා වැටුණු අඩි පාරෙන් යන්න ඔහු සැලසුම් කරගෙන සිටී බව මං දැන හිටියා. ඔහුට යාමට තිබෙන මාර්ගයට වැටෙන කෙටි පාරක් තියෙනවා, මගේ ගෙදර ළඟ ඉඳලා. ඔහු සමග කතා කරන්න මට උවමනාව තිබුණා. කැලෑ පාරෙදි හමුවුණොත් මට පහසුයි. ඔහු හමුවීමට වෙල්ටන්හැම් වෙත විශේෂ ගමනක් යෑම මට ඉතිරි වෙනවා. මට ඔහු හමුවුණේ හවස තුනහමාරට. අපි පැය කාලක් විතර කතාබහ කළා. ඊට පස්සෙ මං ඔහුගෙන් වෙන්වෙලා මගේ ගෙදරට ආවා."

"ඔබ ඔහුගෙන් වෙන්වී එන වෙලාව ඔහු මොනවද කරමින් හිටියේ?" මරණ පරීක්ෂකවරයා විමසීය.

"ගසක් කපා ඉවත් කළ තැනක ඉතිරිව තිබුණා, ගසේ මුල කොටස. ඔහු ඒකේ හිඳගෙන තමන්ගේ පයිප්පය බිව්වා"





"ඔහු හමුවෙන්න ගිය ගමනෙදි ඔබ ඔබේ ගිනි අවියත් රැගෙන ගියාද?"

"ඔව්"

"ඒ මොකකටද?"

"මං සතුන් දඩයම් කරන්න ආශා කරන කෙනෙක්. අවුරුද්දේ මේ කාලෙට දඩයම් කළ හැකි සතුන් හුඟක් ඉන්නවා. ඉතින් ගිනි අවිය අතේ නැතිව මං කැලෑව පැත්තට අඩියක් තියන්නෙ නෑ"

"ඔව් ඒක හරියි කියමු" මරණ පරීක්ෂකවරයා කීය. "නමුත් හිසට පහර දී මරා දැමුණු ඔබේ බල්ලාගේ මළකඳ හමුවුණා. ඒක තිබුණේ මෝගන් මහත්මයා මරා දැමුණු තැනට ඉතාම නුදුරින්"

"අනේ මගේ අසරණ බ්‍රැවෝ" රොබින් මහතා කීය. "හිටි ගමන් ඌ ඔළුව හැරුණු අතේ දඩාවතේ යනවා. එහෙම ගියාම දවසකින් දෙකකින් ගෙදර එනවා. ඒ නිසා අපි ඌව හොයන්න මහන්සි ගන්නේ නෑ. එදා උදේම ඌ වත්තෙන් එළියට ගිහින් හිටියා. දවස පුරාම මට බ්‍රැවෝව දකින්න ලැබුණේ නෑ. නාකි මෝගන් හමුවෙන්න මං යද්දි, ඌ කොහොමටවත් මා එක්ක ගියේ නෑ"

ජූරියේ සාමාජිකයන් මෙන්ම රැස්ව සිටි මහජනයාද, ඉක්මනින් ඇසුණු ප්‍රශ්න වලට හා වේගයෙන් සැපයුණු පිළිතුරු වලට, ඉතා උනන්දුවෙන් සවන් දුන්හ. ඔවුන් කිසිදු ශබ්දයක් නොනගා බලා සිටියේ, මෙම කඩවසම් තරුණයා පැවසූ සෑම වචනයක් පාසාම, තමා අපරාධකරු බව තහවුරු වන සාක්ෂි දුන් ආකාරය ගැනයි. දෙදෙනා අතර ඇති වූ සණ්ඩුව, පොකුණ අසලදී හමුවීමට යොදා ගත් සැලසුම, ඔහු අතේ උණ්ඩ පිරවූ ගිනි අවියක් තිබූ බව ආදී සියල්ලම සැබෑ බව ඔහු පිළිගත්තේ ය. ඒ සමගම ඔහු තදින්ම කියා සිටියේ තමා අහිංසකයකු බවත් මේ මිනීමැරුම තමන්ගේ කටයුත්තක් නොවන බවත්ය.

හන්ටිංඩන් වනය අසලින්ම වැටුණු පාරේ ගමන් කළ කිහිප දෙනෙකුටම වෙඩි ශබ්ද ඇසී තිබිණි. එහෙත් ඒ කවර වේලාවේද යන්න පැහැදිලිව කීමට ඔවුනට හැකියාවක් නොවීය. සතුන් දඩයමේ යන්නන් ගේ ජනප්‍රිය දඩබිමක් වූ හන්ටිංඩන් වනයෙන් වෙඩි ශබ්ද නිතර ඇසිණි. එබැවින් එය කිසිවෙකු බැරෑරුම් ලෙස සැලකුවේද නැත. අනෙක් අතට රොබින් ලෙනාඩ් තරුණයාට එරෙහිව තිබූ සාක්ෂියක මෙවැනි පුරස්පර බවක් ද දක්නට ලැබිණි. ඔහු ආයුධයක් අතැතිව වනයට ඇතුළුවෙනු ඇසින් දැක තිබුණේ

එකම සාක්ෂිකරුවෙකු පමණි. එහෙත් එම අවස්ථාවේ රොබින් මහතා සමග ඔහුගේ බල්ලා - බ්‍රැවෝ සිටියා ද නැද්ද යන කරුණ ගැන, දිව්රා සහතික කිරීමට හැකියාවක්, ඉහත කී සාක්ෂිකරුට නොවීය.

අන්තිමේදී අසන්නට ලැබුණේ කුමක්ද? සැමුවෙල් මෝගන් මහතා සැලසුම් සහගත ලෙස ඝාතනය කිරීම ගැන චෝදනාව රොබින් ග්‍රේබියෙල් ලෙනාඩ් මහතා වෙත එල්ල වූ බවය. හන්ටිංඩන්හි හෙක්ටර් ලෙනාඩ් මහතාගේ සොහොයුරා වූ විත්තිකරු හර්ට්ෆඩ්ෂයරයේ මෙන්ම ලන්ඩනයේ ද ජනප්‍රිය චරිතයක් වූ නිසා කවුරුත් පුදුමයටත් භීතියටත් පත්වීම පුදුමයක් නොවේ.

II

පශ්චාත් මරණ පරීක්ෂණ විභාගය සහ රොබින් ලෙනාඩ් අත්අඩංගුවට ගැනීම සිදුවූයේ සිකුරාදා දිනයේය. පසුවදා එනම් සෙනසුරාදා උදේ වරුවේ පුස්තකාලයට ගිය මම, දහවල් දොළහට පමණ ආපසු අපේ නවාතැන වෙත ගියෙමි. එදා වර්ෂාව සහිත තෙත් සීතල දිනයක් වූ නිසාදෝ මගේ මිත්‍රයා - ෂර්ලොක් හෝම්ස් මහතා, ගිනි උදුන අසලට ළං කරගත් තම හාන්සි පුටුවේ වකුටු වී සිටියේය. පුවත්පත් රැසකට මෙම මිනීමැරුම ගැන මට කියවන්නට ලැබුණු තොරතුරු පවසා, ඒ පිළිබඳව මගේ අදහස හෝම්ස්ට කීවෙමි. මා කියූ දේට ඉතා උනන්දුවෙන් කන් දී සිටි ඔහු අන්තිමේදී මෙසේ කීවේය.

"හන්ටිංඩන් උද්‍යානයේ හෙක්ටර් ලෙනාඩ් අද උදේ මා හමුවෙන්න ආවා. ඔහුගෙන් තමයි මට මේ ගැන අමතර තොරතුරු දැනගන්න ලැබුණෙ. ඔහු මෙතැනින් පිටවෙලා ගිහින් එච්චර වෙලාවක් ගතවුණේ නෑ."

මම අතිශයට පුදුමයට පත්වූයෙමි.

"ඔහු එන්න ඇත්තෙ ඔහුගේ මල්ලි රොබින් මහතා පැටළී ඇති මේ මිනීමැරුමෙන්, ඔහු ගලවා ගැනීමට ඇති ක්‍රමයක් ගැන බලන්න වෙන්න ඇති?"

"ඔබේ නිගමනය නිවැරදියි වොට්සන්"

"නමුත් රොබින්ට විරුද්ධව ඇති සාක්ෂි ඉතාම බරපතළයි නේද?" මම ඇසීමි.





"ඇත්තෙන්ම ඔව්" හෝම්ස් කීය. "මේ වගේ අපරාධ නඩුවලට නේ පුවත්පත් වාර්තා කාරයින් කියන්නේ, "විවෘත හා සංවෘත" නඩු කියලා. ඇයි විවෘත? මිනීමැරුම සිදුවුණු තැන, වෙලාව, ආයුධය ගැන කිසිම සැකයක් නෑ. මියගිය තැනැත්තා අන්තිමට හිටියේ තමන් සමග බවත් ඔහු සමග සණ්ඩුවක් ඇතිවුණු බවත් විත්තිකාරයා පිළිගන්නවා. අනික් අතට මේකට වෙනත් කිසිම කෙනෙකුට පටළැවෙන්න බැරි විදියට වැහිලා - සංවෘතයි.

අපි කුලීරියක් කැඳවාගමු වොට්සන්. දවල් කෑමෙන් පස්සේ අපි යමු හන්ටිංඩන් වෙත. රොබින්ට උසාවියෙන් ඇප ලැබිලා තියෙනවා. ඔහු ගෙදර ඇවිත් කියලා හෙක්ටර් කිව්වා. ඔහුගේ ගෙදරදි - ඒ කියන්නේ "ග්‍රීන්සිටි" මැඳුරේදි රොබින්ව හමුවෙන්න පුළුවන් බවත් හෙක්ටර් සඳහන් කළා. මැරුම් කෑ මිනිහා සමග රොබින්ගේ තිබුණු ආරවුල මොකක්ද කියලා, අපි හරිහැටි දැනගත යුතුයි. ඒක තමයි මේ ගැටලුව විසඳීමේ මුල්ම පියවර."

"හෙක්ටර් ඒක දැනගෙන හිටියෙ නැද්ද?"

"දන්නවා ඇති. නොදන්නවා වෙන්න බෑ. නමුත් ඔහු කිව්වෙ මොකක්ද දන්නවද? ඒ ආරවුල ගැන රොබින්ගෙන්ම අසා දැන ගැනීම වැඩිය හොඳයි කියල. රොබින් මුහුණ දී සිටින අවදානම නිසා හෙක්ටර් වගේම ඔහුගේ බිරිඳ ලෙටීෂියා මහත්මියත් ඉන්නෙ හරිම කැලඹීමෙන්. හෙක්ටර් නම් කියන්නෙ තමන්ගේ මල්ලි නරක මිත්‍රයන් ආශ්‍රය නිසා වැරදි මාර්ගයට යොමුවුණු බවයි. ඔවුන් තව දුරටත් කියනවා රොබින් හරිම අවාසනාවන්තයෙක්ලු. වෙනත් කෙනෙක් කරන වැරදිත් යන්නෙ රොබින්ගෙ හිසමතින්ලු"

චූදිතයා සොයා යාමට සිදු වූ බැවින්, තවත් කතාබහ සඳහා අවකාශයක් නොවීය. හන්ටිංඩන් වනයේ පිටත සීමාව අසල පිහිටා තිබූ "ග්‍රීන්සිටි" මැඳුරේදී අපට රොබින් ලෙනාඩ් මහතා හමුවිය. ඔහු හමුවීම සඳහා අප පැමිණීමට ඉඩ ඇති බැව් ඔහුගේ වැඩිමහල් සොහොයුරා විසින් රොබින්ට දැනුම් දී තිබිණි. සැබැවින්ම ඔහු වෙතින් දිස්වූයේ, දැඩි කම්පාවකට හා කලකිරීමකට පත් පුද්ගලයෙකුගේ ස්වභාවයයි. එහෙත් තම නිර්දෝෂීභාවය ගැන හඬ නගා අවධාරණය කිරීමට ඔහු ප්‍රමාද නොවීය.

"හෝම්ස් මහත්මයා. මං හරිම අවාසනාවන්තයෙක්. කාගෙ හෝ කුමන්ත්‍රණයක මං ගොදුරක් වෙලාද කියල මට වෙලාවකට

හිතෙනවා. මං දිවුරා කියන්නම් මහත්වරුනි. ඒ වගේ නින්දිත අපරාධයක් කරන්න මට නම් කොහොමටවත් හැකියාවක් නෑ"

"කෙනෙකුට චෝදනාවක් නැඟුණු පමණින් ඔහු අපරාධකාරයෙක් කියල මං නිගමනය කරන්නෙ නෑ" හෝම්ස් කීය. "කොහොම වුණත් ඔබ සඳහා අධිකරණය හමුවට යායුතුයි නේ. ඊට කලින් ඔබ වෙනුවෙන් කළ යුතු දේවල් කිරීමට, අපි සම්පූර්ණ උත්සාහය යොදන්න පොරොන්දු වෙනවා.

අපට දැනගන්න ලැබුණා ඔහුගේ මරණයට කලින් දා, ඔබ සහ මෝගන් මහතා අතර සණ්ඩුවක් ඇතිවුණු බව. හරියටම සිද්දවුණේ මොකක්ද කියලා ඔබට පුළුවන්ද මට පැහැදිලිව කියන්න?"

"අපේ සමාගමේ බැංකු ගිණුමේ ලොකු අවුලක් ඇතිවෙලාලු" රොබින් මහතා කීය. "ඔහු කිව්වා ඒක මගේ වරදින් සිද්දවුණු දෙයක්; ඒකට සම්පූර්ණයෙන්ම වගකිව යුතු පුද්ගලයා මා කියල. නමුත් ඒ ගැන මං සම්පූර්ණයෙන්ම නිර්දෝෂයි.

ඔබට අහන්න ලැබෙන්න ඇති ටෘඩෝ සමාගමේ ෂැම්පේන් ගැන, එංගලන්තයේ එකම නියෝජිතවරුන් අපේ සමාගම බව. මෝගන් තමයි අපේ සමාගමේ ගණකාධිකාරී වරයා මෙන්ම අයකැමි ලෙස කටයුතු කළේ. අපි ෂැම්පේන් සහ අනෙකුත් වයින් වර්ග ගෙන්වන්නේ පැරිසියේ ටෘඩෝ සමාගමෙන්. අප විකුණන වයින්වලින් අපේ වට්ටම අඩුකරගෙන, අපි මාස හයකට වරක් ඔවුනට මුදල් ගෙවනවා. අපි ඒක කරන්නේ ටෘඩෝ සමාගමේ පැරිසියේ බැංකු ගිණුමට, චෙක්පත් මගින් මුදල් යැවීමෙන්."

"මුදල් පරිපාලනය භාරව තිබෙන්නේ කාටද?"

"අපි දෙන්නටම. ඒ කියන්නේ අයියා හෙක්ටර්ට සහ මට. ඒ කියන්නේ අපේ සමාගම වෙනුවෙන් ලැබෙන චෙක්පත් තැන්පත් කිරීම සඳහා, අප දෙදෙනාම පිටසන් යෙදිය යුතුයි. අපේ ගිණුමෙන් කාටහරි මුදල් ගෙවනවා නම් ඒකටත් අප දෙදෙනාම අත්සන් කළ යුතුයි.

ටෘඩෝ සමාගමට අර්ධ වාර්ෂිකව කරන ගෙවීමක්, තවත් මාසයකින් කළ යුතුයි. අපේ බැංකුව සිටි ඇන්ඩ් කවුන්ටීස් බැංකුවේ වෙල්ටන්හැම් ශාඛාව. මෝගන් මහත්මයා ඒකට සූදානමෙන් බැංකුවට ගිහින් අපේ ගිණුම පරීක්ෂා කළාලු. ලබන මාසේ ටෘඩෝ සමාගමට ගෙවිය යුතු පවුම් 10,000 ක මුදල, දැනටම ගිණුමෙන්





අඩුවෙලාලු. නමුත් ටෘඩෝ සමාගමට හෝ වෙනත් ආයතනයකට එවැනි මුදලක් ගෙවූ බවක්, කාර්යාලයේ පොත්වල සඳහන් වෙලා නැලු.

මං කිව්වා ඔය කතාව මට විශ්වාස කිරීමට අමාරු බව. ඔහු මොකද කළේ? පවුම් 10,000 ක වටිනාකමට අප ලියූ චෙක්පත් එම බැංකුවෙන් අරගෙන ඇවිත් මට පෙන්නුවා. ඒකෙ මගේ අයියාගේ හා මගේ අත්සන් නිවැරදිව තිබුණු ආකාරය දැක මං හරි පුදුමයකට පත් වුණා. මෝගන් කෝපයෙන් මට බැණ වැදුණා. තදින් දෝෂාරෝපණය කළා. ඒ මම අයියාගේ අත්සන හොරට යොදා, සමාගමේ මුදල් වංචාකළ බව කියමින්.

ඔබට කියන්න මහත්මයා. මට වරින් වර ලොකු මුදල් අමාරුකම් ඇතිවී තියෙනවා. සමහර වෙලාවලදී මං ලොකු මුදල් ප්‍රමාණ, පුද්ගලයින්ගෙන් ණයට අරගෙන තියෙනවා. නාකි මෝගන් ඒ කාරණය හොඳට දන්නවා. මට ඒ විදියට මුදල් වියදම් වෙන්නේ, මගේ සමහර විනෝදාංශ නිසා. ඒවා සමහරවිට සමාජයේ සමහර දෙනා අනුමත නොකරන ඒවා වෙන්න පුළුවනි. ඒ විදියේ මුදල් අමාරුකම් නිසා තමයි මට කැලෑබද පෙදෙසක, පැරණි නිවසකට වෙලා ඉන්න සිදුවෙලා තියෙන්නේ. නැත්නම් මටත් තිබුණා මගේ අයියා වගේ, හන්ටිංඩන් උද්‍යාන මාවතේ සුඛෝපභෝගී මන්දිරයක ජීවත් වෙන්න.

කොහොම වුණත් ඔහුගේ ඒ චෝදනාව, ඉතාම දරුණු විදියේ ඒ වගේම අවඥා සහගත එකක්. ඔහුගේ ඒ කතාවට මට යක්ෂ කේන්ති ගියා."

"ඔබ ඒ චෙක්පත් පරීක්ෂා කර බැලුවද?"

"ඔව් මහත්මයා. අයියාගේ සහ මගේ අත්සන් ඒවායේ නිවැරදිව තිබුණා. සමහර තැනක මගේ අත්සනේ අඩුපාඩුවක් ඉඳහිට තිබුණා කියා කෙනෙකුට පෙන්වා දෙන්න පුළුවනි. නමුත් සමහර වෙලාවලදී මගේ අත්සන ඊටත් වඩා අඩුපාඩු සහිතව යෙදෙනවා. මේ චෙක්පත් ලියා තිබුණේ මෝගන්ගේ සුපුරුදු අත් අකුරෙන්. ගෙවීම ලැබිය යුත්තාගේ නම චාල්ස් ටෘඩෝ පුත්‍ර සමාගම කියා ලියා තිබුණා. චෙක්පතේ පිටුපස ඒ නම විදේශීය ආකාරයේ අකුරෙන් යොදා පිටසන් කර තිබුණා"

"මේවා "රේඛනය" කළ චෙක්පත් නෙමෙයි?"

"නැහැ මහත්මයා. මේවා "ඊගෙන එන්නාට ගෙවන්න" යයි ලියූ චෙක්පත්"

"මීළඟට මොකක්ද සිදුවුණේ?"

"නාකි මෝගන්ට පොඩි දේටත් කේන්ති යන සිරිතක් තිබුණා. ඉතින් ඔහු මට දෝෂාරෝපණය කළේ, බොහොම දරුණු නින්දිත වචනවලින්. මං ඔහුගේ ස්වාමියෙකු බව ඔහු අමතක කළා. මාත් තදින්ම කෝපාවිෂ්ඨ වුණා. මං ඔහුට තර්ජනය කළා. ඔහුගේ කට වහාම වහගත්තේ නැත්නම්, ඇතිවෙන ප්‍රතිඵල බොහොම දරුණු විය හැකියි කියලා. ඒකට ඔහු එක්වරම කිව්වේ - ඇයි ඔහේ මට මොනවා කරන්නද? - කියලා. ඒකෙන් මගේ කේන්තිය තවත් වැඩිවුණා. මං කිව්වා මගේ ඇසට නොපෙනී ඉවත්ව නොගියොත් ඔහුට මං ගහන්නේ සිහි නැතිවී වැටෙන්න බව."

"ඉතින්?"

"ඔහු යන්න පිටත්වුණේ මට තර්ජනය කරන ආකාරයට බැණ වදිමින්. ඔහු කිව්වා ඔහු ඊළඟ දවසේ හවස අයියාගේ නිවසට ගිහින්, මා කර ඇති වංචාව හෙළිදරව් කරන බව. ඔහු ඒක කිව්වේ අඩි අටක් දහයක් මා සිටි තැනින් ඉවතට ගිහින්. අප වයින් මිලට ගන්න සමාගමේ චාල්ස් ටෘඩෝ මහත්මයා මේ දවස්වල ඉන්නේ එංගලන්තයේ. ඔහු වළිකුකුලන් දඩයමට එංගලන්තයට ඇවිත් ඉන්නේ අපේ ආරාධනයෙන්. ඔහු නවාතැන් ගෙන ඉන්නේ උද්‍යාන මාවතේ අයියාගේ නිවසේ. මෝගන් මට තර්ජනය කරන ගමන් කිව්වේ, මගේ වංචනික කටයුතු ගැන ටෘඩෝ මහත්මයාටත් පැමිණිලි කරන බව.

ඊළඟට ආපහු හැරිලා මං යන්න ගියා. ගෙදර යන ගමන් මං හිතුවේ, එදා හැන්දෑවේම හන්ටිංඩන් උද්‍යාන මාවතට ගිහිං අයියාව හමුවෙන්න. නමුත් මේ ගැන සිතමින් ගෙදර යද්දී මට තවත් දෙයක් කල්පනා වුණා. ඒ තමයි, මේ වංචාව මෝගන්ටත් කරන්න බැරි දෙයක් නොවන බව. අයියාගේත් මගේත් අත්සන් හොරට යෙදීම ඔහුට දුෂ්කර කටයුත්තක් වෙන්න බැහැ. ඒ නිසා මුලින්ම කළ යුත්තේ කේන්ති නොගෙන, කලබල නොවී, මෝගන් සමග හෙමින් සීරුවේ කතාබහ කිරීම. ඒකෙන් වැඩි යහපතක් සැලසෙන්නේත් ඔහුට. නියම තත්ත්වය හොඳින් වටහාගෙන අයියාව දැනුම්වත් කරන්න ඕන ඊට පස්සේ. කොහොම වුණත් මේ ප්‍රශ්නය ගැන ටෘඩෝ මහත්මයාට දැනගන්න ඉඩ අරින එක





නරකයි. ඉතිං ඒ අදහසින් තමයි මං එදා උදේ මෝගන්ට විදුලි පුවතක් යැව්වේ. ඒ හමුවීමට වෙලාවක් හා ස්ථානයක් සඳහන් කරමින්. ඒක විශාල වැරැද්දක් බව දැන් තමයි පෙනෙන්නේ"

මෙම වංචනික චෙක්පත් තමාගේ අත් අකුරින් ලියා තිබීම ගැන අපමණ කැලඹීමට පත්ව සිටි මෝගන්, එයින් භීතියට පත්ව සිටි බැව් රොබින් ලෙනාඩ් වැඩිදුරටත් කීය. එබැවින් මේ ගැන හෙක්ටර් ලෙනාඩ් මහතාට හා චාල්ස් ටෘඩෝ මහතාට වහාම දැනුම් දීම තමාගේ වගකීමක් බවද රොබින් සමග පවසා ඇත.

"ඔහු සමග කතාකිරීමෙන් වැඩක් වෙන ලකුණක් පෙනුණේ නෑ" රොබින් ලෙනාඩ් කීය. "ඔහු ලී කොටයක් මත වාඩිවෙලා තමන්ගේ පයිප්පය දල්වාගෙන දුම්බොන්න පටන්ගත්තා. ඉතින් මං එතැනින් පිටවෙලා මගේ නිවස දෙසට ඇවිද ආවා"

"එම චෙක්පත් වලට සිදුවුණේ මොකක්ද කියල ඔබ දන්නවද?" හෝම්ස් විමසීය.

"මං එතැනින් පිටවෙලා එද්දිත් ඒ චෙක්පත් තිබුණේ නාකි මෝගන්ගෙ කබා සාක්කුවෙ. නමුත් ඔහුගෙ මළසිරුරෙ ඇඳුම්වල තිබිලා එහෙම දෙයක් හමුවුණු බව පොලිසිය සඳහන් කර තිබුණේ නෑ."

රොබින් ලෙනාඩ් අප සමග කළ විස්තරය, කරුණු සරලව එමෙන්ම සම්පූර්ණ ලෙස කළ අවංක හෙළිදරව්වකි. එබැවින් මට නම් සිතුණේ, එහි සෑම වචනයක්ම විශ්වාස කළ හැකි මෙන්ම විශ්වාසයට ගත යුතු බවයි. එහෙත් මගේ මිත්‍රයාගේ මුහුණෙන් නම් කිසිදු හැඟීමක් ප්‍රකාශයට පත් නොවීය. දැත් එකට පටළවාගෙන ඇඟිලි තුඩු එකට තබාගෙන, හෝම්ස් හාන්සි පුටුවේ වැතිර සිටියේ දෙනෙත් පියාගෙනය. අපේ අනුග්‍රාහකයා ගේ සිතේ හෝම්ස් ගැන තුරුස්සන හැඟීම පහළ වී ඇති සැටියක් මට පෙනිණ.

"ඉතින් ෂර්ලොක් හෝම්ස් මහත්මයා; මොකක්ද ඔබේ අවසන් නිගමනය?" රොබින් විමසුවේ නොඉවසිල්ලෙනි.

"මට නම් හිතෙන්නේ මෙහෙම දෙයක් මහත්මයා" හෝම්ස් කීය. "මියගිය පුද්ගලයා සමග ඔබ ඇතිකරගත් සණ්ඩුව, වන ලැහැබේදී රහසිගතව යොදාගත් හමුවීම, ඔහුගේ මරණයට පෙර ලියා මරණයෙන් පසු මරණ පරීක්ෂක අතට පත්වුණු ලියුම සහ ඔහුගේ මරණාසන්න අන්තිම මොහොතේ කටින් පිට වූ වචන,

ආදිය තමා ජූරියක අවධානයට ලක්වන සාධක. ඒ හැම එකක්ම තියෙන්නේ ඔබට එරෙහිව. ඉතින් රජයේ නීතිඥයා කියන්න ඉඩ තියෙනවා සාක්ෂි සම්පූර්ණයි කියල"

"ඒ කියන්නෙ..........!"

"මගේ හිතවත් රොබින් ලෙනාඩ් මහත්මයා" හෝම්ස් කීය. "ඔබට කරන්න තියෙන්නේ හිත කැලඹීමකට පත් කර ගන්නෙ නැතුව සන්සුන්ව, ඉවසීමෙන් නිහඬව සිටීම පමණයි. ඔබ නිර්දෝෂයි කියා මට හිතෙනවා. නමුත් ඒකම ප්‍රමාණවත් නෑ. කවුරුහරි මහන්සිවෙලා අපරාධකාරයා හොයාගෙන, ඔහු අධිකරණයට ඉදිරිපත් කළ යුතුයි. ඒකට මං මගේ සම්පූර්ණ උත්සාහය යොදනවා"

"ඔබට ස්තූතියි හෝම්ස් මහත්මයා. මං ඔබ ගැන සම්පූර්ණ විශ්වාසය තබාගෙනයි ඉන්නෙ. මට මීළඟට ඔබව දකින්න ලැබෙන්නෙ කවදාටද?"

"සඳුදාට ඔබ මහේස්ත්‍රාත් ඉදිරියට පමුණුවන්න නියමිතයි නෙ. මේ ප්‍රශ්නය ගැන තවදුරටත් කල්පනා කරල එදාට ඔබ හමුවීමට මං බලාපොරොත්තු වෙනවා"

අපි එතැනින් පිටත් වී නවාතැන වෙත ආවෙමු.

"හෝම්ස්. ඔබ කියූ දෙයින් රොබින්ට ඇඟවෙන්නේ, ඔහු මරණීය දණ්ඩනයෙන් ගලවාගන්න, ඔබට හැකිවේවි කියල. එහෙම නේද?"

"මෙහෙමයි වොට්සන්. මගේ හැඟීම ඔහු නිර්දෝෂයි කියල. සත්‍ය තත්ත්වය එය නම් ඔහු බේරගන්න මං මගේ සම්පූර්ණ උත්සාහය යොදනවා. නමුත් අපරාධකාරයා ඔහු නම් රොබින් බේරා ගැනීම ඔහුගේ අධිනීතිඥයාගේ වැඩක්. මං නීතිඥයෙකු නෙමෙයි. මං කරන්නේ සත්‍යය හෙළිකර දීම. ඒකෙන් ඔහුට සිදුවෙන්නේ අවාසියක් නම්, මට ඒකට කරන්න කිසිම දෙයක් නෑ."

III

රොබින් ලෙනාඩ්ට පක්ෂ විපක්ෂ සියලුම සාක්ෂිවලට කන්දීමට තමාට අවශ්‍ය බැව් හෝම්ස් කියා සිටියේය. සඳුදා මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පැවැත්වුණු නඩු විභාගය කන්දීමට අපි ද එහි ගියෙමු.





රොබින් ලෙනාඩ්ට එරෙහිව පොලීසිය විසින් වක්‍ර සාක්ෂි (පරිවේෂණීය සාක්ෂි) ඉතා විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කරන ලදී. ඒවාට සවන්දුන් විට මට පෙනී ගියේ, ඔහු භයානක ගැඹුරු මඩ වගුරක එරෙමින් සිටින බවත්, ඔහුගේ ජීවිතය ගලවා ගැනීමට ෂර්ලොක් හෝම්ස්ට හැකි නොවන බවත්ය.

පොලීසියට ඉතා වැදගත් සාක්ෂියක් බවට පත්ව තිබුණේ රොබින් මහතාට අයත් "බ්‍රැවෝ" නම් සුනඛයා පිළිබඳ සිද්ධියයි. සැමුවෙල් මෝගන් මහතා සහ සුනඛයා ඝාතනය කිරීමට යොදාගන්නා ලද්දේ එකම රයිෆලයක් බවත්, එය සිදුකරන ලද්දේ එකම වේලාවක එකම ස්ථානයකදී බවත් පොලීසිය පැවසීය.

නමුත් රොබින් ලෙනාඩ්ගේ වාසනාවට ද සමහර කරුණු යෙදී තිබිණ. එදා දවසේ ඔහු සමග 'බ්‍රැවෝ' ගැවසුණු බවට දිවුරා සාක්ෂි දියහැකි කිසිවෙකු නොවීය. ඒ බවට ඔහුගේ නිවසේ සේවකයෙකු හෝ ගමේ හෝ වනය අසබඩ පදිංචිකරුවෙකු පොලීසියට හමුවී නොතිබිණ. කෙසේ වෙතත් බල්ලා පිළිබඳ සාක්ෂිය සම්පූර්ණයෙන්ම අමතක කර දැමුවත්, රොබින්ට එරෙහි සාක්ෂි ඕනෑවටත් වඩා ඇතිබැව් මට පෙනී ගියේය.

එදා දහවල් දෙකට පෙර නැෂනල් ඇන්ඩ් කවුන්ටීස් බැංකුව වෙත යාමට හෝම්ස් බලාපොරොත්තු විය. එබැවින් දහවල් ආහාරය ගැනීම කල්දමා අපි කුලීරියකින් එම බැංකුවේ වෙල්ටන් හැම් ශාඛාව වෙත ළඟා වූයෙමු.

එහි සහකාර කළමනාකරු වූ ජෙෆ්රි මහතාගෙන් අපට විශාල සහයෝගයක් ලැබිණ. ඒ අප පැමිණියේ මිනීමැරුමක් සම්බන්ධයෙන් බැංකුවේ සාක්ෂි අවශ්‍ය වන බැව් දැනුම් දුන් විටයි.

"ඔය කියන චෙක්පත්වල කිසිම අඩුපාඩුවක්, සැක සහිත බවක් තිබිල නෑ" ජෙෆ්රි කීය. "චෙක්පත් ලියල තිබෙන්නේ චාල්ස් ටෞඩෝට හෝ ඊගෙන එන්නාට කියල. දින වකවානු කිව්වොත් ජූලි මාසෙ 3 වැනිදා ඉඳල අගෝස්තු 29 වෙන තුරු" ඔහු කීවේ බැංකුවේ පොත්පත් පරීක්ෂා කරමිනි.

"එතකොට ඔය චෙක්පත් ලියා තිබුණෙ කුමන මුදල් ප්‍රමාණ වලට ද?"

පවුම් 1200 සිට පවුම් 3000 දක්වා. සාමාන්‍ය විදියට අත්සන් කර තිබුණු නිසා අපට සැක හිතන්න හේතු තිබුණේ නෑ. මේ

සෑම අවස්ථාවකම චෙක්පත් ඉදිරිපත් කළේ නිල ඇඳුමෙන් සැරසී සිටි නිලධරයෙකුගේ පෙනුම තිබූ අයෙක්. ඔහු සෑමවිටම චාල්ස් ටෘඩෝ සහ සමාගමේ කාඩ්පතක් ගෙන ආවා. සෑම චෙක් පතක් පිටුපසම, පිටසන් සඳහා යෙදූ අත් අකුරෙන්ම මේ විදියට ලියා තිබුණා. "කරුණාකර මෙය රැගෙන එන්නාට පවුම් පහේ මුදල් නෝට්ටුවලින් මුදල් ගෙවන්න"

"මේ නිල ඇඳුමෙන් සැරසුණු නිලධරයාගේ පෙනුම ඔබට විස්තර කරන්න පුළුවන්ද?" හෝම්ස් ඇසීය.

"ඔව්. නමුත් මටත් වඩා ඔහුව හොඳ මතක ඇත්තේ කවුන්ටරයේ සේවය කළ, අයකැමි හා ටෙලර් වරුන්ට. මං එයින් කෙනෙක් කැඳවන්නම්"

මෙසේ කී ජේෆ්රි මහතා චෙක් නිෂ්කාෂණ ගනුදෙනු පොත පරීක්ෂා කොට නම් දෙකක් ශබ්ද නඟා කියෙව්වේය. "හෙන්රි වුඩ්වඩ්, කෙන් හැරිසන්" ඒ ඉල්ලීම අනුව ඉදිරියට ආවේ තරුණ බැංකු සේවකයන් දෙදෙනෙකි.

"චාල්ස් ටෘඩෝ සමාගමට හෝ රැගෙන එන්නාට කියා සඳහන් කොට මුදල් ලබාගත් චෙක්පත් සිද්ධිය ඔබට මතකනේ. එම චෙක්පත් දහයකින් අටකම ගනුදෙනුව කර තියෙන්නේ ඔබ දෙදෙනා. මුදල් භාර ගැනීමට ආව පුද්ගලයා ගැන ඔබට මතක ඇති. මේ මහත්මයා අපරාධ පරීක්ෂකයෙක්. අර පුද්ගලයාගේ පෙනුම සහ තවත් තොරතුරු දැනගන්න මෙතුමා කැමතියි"

"ඔහු අඩි හයක් පමණ උස කෙනෙක්" වුඩ්වඩ් කීය. "ඔහුට තිබුණා විදේශික පෙනුමක්. කොණ්ඩය තද කළු ගොරෝසු එකක්. කළු පාට රැවුල නම් උඩු හා යටි රැවුළු දෙකම කෙටියට කපා තිබුණා."

"ඔහු ඇඳ සිටි ඇඳුම?"

"අළු පාටට හුරු නිල ඇඳුමක්. පීක් කැප් වර්ගයේ කැප් තොප්පියක් පැළඳ හිටියා. ඒකෙ "ලෙනාඩ් සහ සමාගම" යනුවෙන් එම්බ්‍රොයිඩර් කර තිබුණා."

"ඔහුගේ හැසිරීමේ විශේෂ යමක් දුටුවද? සුහදශීලි කාරුණික බවක්? නැත්නම් සැර පරුෂ කලබලකාරී බවක්?"

"එහෙම යමක් අප දුටුවේ නෑ"

"මුදල් භාරගනිද්දී ඔහු අත්සන් කළේ දකුණු අතින් ද, වමතින් ද?"





"මං හිතන්නේ දකුණු අතින්. ඒ තරම් දුරට බැලුවේ නෑ" එකෙක් කීය.

"මාත් හිතන්නේ දකුණු අතින්" අනෙකා කීය. "මට හරියටම මතක නෑ. කොහොම වුණත් මට හොඳට මතක ඔහු ගේ විදේශික උච්චාරණය"

"වෙන මොනවද ඔබට ඔහු ගැන කියන්න පුළුවන්?"

"ඔහු මුදල් දමා ගැනීම සඳහා පසුම්බිය අදිද්දී, සාක්කුවෙන් වැටෙන්න ඇති කියා අපට හිතුණු දෙයක්, පසුව දකින්න ලැබුණා. ඒක ලිපිනයක් ලියූ කඩදාසි කැබැල්ලක් පමණයි."

"එය දැනට ඔබ ළඟ තියෙනවාද?"

"නැහැ. අප එය ඔහුට ඊළඟ දවසේ ආපසු දුන්නා. නමුත් එහි සඳහන්ව තිබූ දේ ඔබට අවශ්‍ය නම් කිව හැකියි."

"ඔබට එය කට පාඩම්ද?"

"සෑහෙන තරම් මතකයි. ඒක රේස් ඔට්ටු නියෝජිතයෙකුගේ ලිපිනයක්. මෙහෙමයි තිබුණේ -

"වැන් ටිවෙස්ට්
රේස් ඔට්ටු නියෝජිත
රොටර් ඩෑම්
ඕලන්දය"

බැංකුවෙන් අපට තොරතුරු දැනගන්නට ලැබුණේ එපමණකි. ඔවුනට ස්තුති කොට අපි එතැනින් පිටත් වී ආවෙමු.

"ඔහු කවුරු වුණත් බොහොම දක්ෂ හොර තක්කඩියෙක්" හෝම්ස් කීවේ කුලිරියක් කැඳවා ගැනීමට සංඥා කරමිනි.

"ඔබ කොහොමද හෝම්ස් එහෙම කියන්නෙ?"

"එහෙම කියන්නෙද? අංක එක තමයි බැංකුවේ නිලධරයන්ගේ සිත්වල සැකයක් ඇති නොවන විදියට, "ලෙනාඩ් සහ සමාගම" කියලා එම්බ්‍රොයිඩර් කළ කැප් තොප්පියක් පැළඳ ගෙන ඒම. ඔහු විදේශිකයෙකු නොමෙයි; ඉංග්‍රීසි ජාතිකයෙක්. අර විදේශික උච්චාරණය යොදා ගැනීම මගින් ඔහු තම අනන්‍යතාවය සඟවා ගත්තා. එපමණක් නොවෙයි. එයින් කට හඬේත් වෙනසක් ඇතිවුණා.

මට කිසිම සැකයක් නෑ. ඔහු කැප් තොප්පියක් පැළඳුවේ තවත් අරමුණකින්"

"ඒ මොකක්ද?"

"ඔහු තම හිසකෙස් ආවරණය වෙන්න බොරු කොණ්ඩයක් පැළඳුවා. ඒකෙන් ඇහිබැම වසාගන්න හැකිවුණා. ඊළඟට මෙය බොරු කොණ්ඩයක් බව හඳුනාගැනීමට බැරිවෙන්න, උඩින් කැප් තොප්පියක් පැළඳ ගත්තා. ඒ වගේමයි මුහුණේ අලවාගත් ව්‍යාජ රැවුලක් මගින් නිකට හා උඩු තොල වසාගෙන, වෙස් වළා ගැනීම සම්පූර්ණ කර ගත්තා."

"එතකොට හෝම්ස් ඔබ කියන්නේ මුදල් ගෙනයාමට ආ මෙම හොරා, බැංකුවේ අය හඳුනන කෙනෙක් කියාද?"

"ඔබ කිව්වා හරියටම හරි වොට්සන්. එපමණක් නොවෙයි. ලෙනාඩ් සහ සමාගමේ මුදල් වංචා කළ ඔය පුද්ගලයාම තමයි සැමුවෙල් මෝගන්ට වෙඩි තබා මරා දැම්මේ. ඒ මගින් ඔහුට හැකිවුණා සාර්ථක ලෙස මෝගන්ව නිහඬ කරවන්න. අර වංචනික චෙක්පත් සියල්ල මෙලහකටත් විනාශ කරලා ඇති. වෙන්න තිබුණේ මොන වගේ දෙයක් කියලද ඔබට හිතෙන්නේ වොට්සන්?"

"මට මොකුත් හිතාගන්න බෑ"

"මෝගන්ගේ මරණය අබිරහසක් වෙලා, මේ සියල්ල කාලයේ වැලිතලාව මගින් වසා දැමෙන්න ඉඩ තිබුණා. නමුත් එය වැළකී ගියේ කාරණා දෙකක් නිසා. එයින් පළමුවැනි එක තමයි මෝගන් ලියූ ලියුම. තමාගේ අවසානය බිහිසුණු එකක් වේවි කියල ඔහුට සැක හිතෙන්න ඇති. තමා මියගියත් අපරාධකාරයාට නිසි දඬුවම් ලබාදෙන්න තමා ඔහු ඒ ලියුම ලියුවේ."

"එතකොට දෙවැනි එක?"

"ඒ තමයි මෝගන් මරණාසන්නව කියූ වචන. ලියුම........ හෙක්ටර්......... ලෙනාඩ්......... රොබින්.......... අනික් එක්කෙනා"

එක්වරම කථාව නැවැත්වූ හෝම්ස් තම නළල රැළි කරගෙන කල්පනා කළේය. අනතුරුව ඔහු යමක් කියා ගත්තේ තමාටමය.

"....... අර යක්ෂ බල්ලා බිරුවෝ....... ඒ ඉරණමට මුහුණ පෑවෙ....... කොහොමද? ඒක මට හිතාගන්න අමාරුයි. ඒ කියන්නේ අන්තිමට රොබින්......... ලෙනාඩ්........."

මිනිත්තු කිහිපයක් නිහඬව කල්පනා කරමින් සිටි හෝම්ස් එක්වරම පුටුවෙන් උඩට පැන්නේ සතුටෙන් කෑ ගසමිනි.





"මට තේරුණා වොට්සන්! මට තේරුණා! කොහොමද ඒක මට මේ තරම් වෙලා නොපෙනී ගියේ? නිදාගන්න මිත්‍රයා. ඉතිරි ටික හෙට උදේට"

IV

මා උදේ අවදිවන විටත් හෝම්ස් බිම හිඳගෙන සිටියේ අසාමාන්‍ය ඉරියව්වකිනි. කොට්ට කිහිපයක් බිම දමා ඒ මත එරමිණිය ගොතා ඔහු වාඩිගෙන සිටියේ, ඉන්දියානු මුනිවරුන් භාවනා කරන විලසිනි. දෙනෙත් පියාගෙන සිටි ඔහු ක්‍රමානුකූලව හුස්ම ඉහළ පහළ ගත්තේය. මම නිහඬවම ඒ දෙස බලා සිටියෙමි. අන්තිමේදී සියල්ල නිම කොට මා ඇමතුවේය.

"මේ ප්‍රශ්නය විසඳන්න අපට තව එක් හෝඩුවාවක් අඩුයි" හෝම්ස් කීය. "ඒක හෝඩුවාවකට වඩා සාක්ෂියක් කිව්වොත් නිවැරදියි. අපට උවමනා කරන පුද්ගලයා ළඟ ඒ සාක්ෂිය තියෙනවා. එහි වටිනාකම ඔහු හෝ ඇය දන්නේ නැහැ. ඒකෙ වටිනාකම දන්නේ මං විතරයි. නමුත් ඒක ලබාගන්න තරම් මං වාසනාවන්ත වේවිද? කමක් නෑ. අපි උත්සාහයක් යොදල බලමු"

"ඒ පුද්ගලයා කවුරු වුණත් ඔහු හමුවීමට උදෙන්ම යන එක නේද හොඳ?" මම ඇසීමි. "අපි ප්‍රමාද වුණොත් ඔහු ගෙදරින් බැහැර ගිහින් සිටීමට ඉඩ තියෙනවා"

"අපට අවශ්‍ය පුද්ගලයා නම් මේ වෙලාවේ ගෙදරින් බැහැර යාවි කියා මං හිතන්නේ නෑ. නමුත් ඉතින් ඒක හරියටම කියන්නත් අමාරුයි. අපි පිටත් වෙමු උදේ දහයට"

"කොහේටද අප යා යුත්තේ?"

"හන්ටිංඩන්හි උද්‍යාන මාවතට"

"ඔබ කියන්නේ හෙක්ටර් ලෙනාඩ්ගේ නිවසටද?"

"ඔව්"

කුලීරථ රියැදුරා වේගයෙන් ගමන් කිරීමට උත්සාහ කළේය. එහෙත් හෝම්ස් උපදෙස් දුන්නේ අප මඳ වේගයෙන් යා යුතු බවයි. අන්තිමේදී අපි හෙක්ටර් ලෙනාඩ් මහතාගේ නිවස වෙත ළඟාවිමු.

ඉදිරියට පැමිණි ප්‍රධාන ගෘහ සේවකයා පැවසුවේ, හෙක්ටර් ලෙනාඩ් මහතා මීට පැය භාගයකට පමණ පෙර, නිවසෙන් බැහැර ගිය බවයි. තම ආගන්තුක පත්‍රය අතට ගත් හෝම්ස් එය සේවකයා

අතට දී, ලෙනාඩ් මහත්මිය වෙත එය ගෙනගොස් දෙන මෙන් ඉල්ලා සිටියේය.

මිනිත්තු කිහිපයකින් එළියට පැමිණි සේවකයා, නිවසේ පුස්තකාල කාමරය වෙත පැමිණ අසුන් ගන්නා මෙන් ඉල්ලා සිටියේය. එහි ගිය අපට දකින්නට ලැබුණේ එම පුස්තකාලය ඉතා අලංකාර ස්ථානයක් බවයි. පොත් හා සඟරා පිරවූ වීදුරු අල්මාරි ශාලාව පුරා විසිරී තිබුණු අතර, ඒ අතරින් තැබූ මල්බඳුන් වල විවිධ වර්ගවල අලංකාර මල් පිරී තිබිණ. ප්‍රංශ මාදිලියේ විශාල ජනේල විවෘත වූයේ, දර්ශනීය ලෙස සැකසූ මිදුලකටය. වැඩි පමාවක් නොවී ගෙහිමි කාන්තාව එහි පැමිණියාය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මා හමුවෙන්න ඔබ කැමැත්ත පළකිරීම ගැන මට හුඟක් සතුටුයි. මගේ මස්සිනා පත්වී තිබෙන තත්ත්වය මගේ හිතට ලොකු බරක්. මං පත්තර කියවනවාට වත් හෙක්ටර් දැන් කැමති නැහැ. ඔහු දැන් පුවත්පතක් දිග හරින්නවත් මට ඉඩ දෙන්නේ නැහැ. රොබින්ට මුහුණ දෙන්න වෙන්නේ භයානක ඉරණමකටද? ඒ ගැන කල්පනා කරලා මං ලෙඩෙක් වෙව්. රොබින් විනෝදකාමී ජීවිතයක් ගත කරන තරුණයෙකු බව ඇත්තයි. නමුත් ඔහු මෘදු හිතක් තියෙන අහිංසක කෙනෙක්. ඔහු කවදාවත් මේ වගේ අපරාධයක් කරන කෙනෙකු නෙමෙයි. ඔබ දන්නෙ නැහැනෙ ඔහු ගැන. ඔහුගේ ස්වභාවය මං හොඳට දන්නවා. ඒ නිසයි මං මෙහෙම කියන්නෙ"

"ඔබ කියන දේ මං විශ්වාස කරනවා ලෙනාඩ් මහත්මිය" හෝම්ස් කීය. "නමුත් අවාසනාවක හැටි! ලැබී තිබෙන සෑම සාක්ෂියක්ම යොමුවෙලා තියෙන්නෙ රොබින් මහත්මයාට එරෙහිව. බලන්න ඔහුගේ මියගිය සුනඛයා. කිසිදු හඬක් නැගීමට නොහැකි වුණත් උගේ සාක්ෂිය තිබෙන්නේත් රොබින් මහතාට එරෙහිව"

"බ්‍රැවෝ!" ඇයට කෑගැසුණේ මවිතය පළ කරමිනි. "මේ අවාසනාවන්ත ඛේදවාචකයට උගේ තියෙන සම්බන්ධය මොකක්ද? අනේ අසරණ සතා! මේක සිදුවුණු දවසෙම උදේ තමයි ඌට පාර වැරැදිලා ගියේ. එදා අපේ හිතවත් ටෲඩෝ මහත්මයා මෙහේ නැවතිලා නේ හිටියේ. ඉතින් දවල් කෑම වෙලාවට කලින් බැරී-ස්ටෙගෝල් උද්‍යානය බලන්න ටෲඩෝ මහත්මයාට උවමනා වුණා. ඉතින් අපේ අශ්ව කරත්තයෙන් මං ඔහුව එහි කැඳවාගෙන





ගියා. අපි ආපහු ගෙදර එද්දී මං දුටුවා බ්‍රැවෝ, බොහොම කනගාටුවෙන් වගේ පාර අයිනේ ඉඳගෙන ඉඳපු හැටි. මං ඌව කරත්තෙට දමාගෙන මේ ගෙදරට අරගෙන ආවා.

ඔහුගේ ස්වාමියා - රොබින්ට වගේම අපේ ගෙදර අයටත් බ්‍රැවෝ හරි හිතවත්. එදා මට යන්න තිබුණා ටෲඩෝ මහත්මයාත් කැඳවාගෙන තේපැන් සංග්‍රහයකට. දවල් කෑමෙන් පස්සේ හෙක්ටර් තුවක්කුවත් අරගෙන දඩයමේ ගියානේ. ඒ වෙලාවෙ බ්‍රැවෝත් ගියා හෙක්ටර්ගෙ පිටිපස්සෙන්"

"බ්‍රැවෝට ඊට පස්සෙ මොකද වුණේ?" හෝම්ස් විමසුවේය.

"මහත්මයා. ඔබට ඇත්තම කියන්නම්. අර ඛේදජනක සිදුවීම නිසා, බ්‍රැවෝව මට සම්පූර්ණයෙන්ම අමතක වුණා. ඊළඟ දවසේ ටෲඩෝ මහත්මයා ආපසු පැරිසිය බලා ගියා. ඒක අපට ලොකු සහනයක් වුණා. එතකොට තමයි මට අහන්න ලැබුණේ, ඒ අසරණ සතා පොකුණේ ගිලී මියගොස් ඇති බව. මොනවා වුණත් උගෙන් උගේ ස්වාමියාට යහපතක් වුණා කියන්න බෑ. ඌ හැමදාමත් රොබින්ට ගෙන ආවෙ කරදරම තමයි"

ලෙනාඩ් මහත්මිය හිඳගෙන සිටියේ ජනේල දෙසට පිටුපස හරවාගෙනය. ඒ නිසා ඇගේ සැමියා නිවස දෙසට එන ආකාරය අප දුටුවත්, ඇය ඒ බව නොදකින්නට ඇත. ඔහුගේ බිරිඳ කියමින් සිටියේ කුමක්ද යන්න හෙක්ටර් මහතාට ඇසුණාද නැද්ද යන්න අපි නොදනිමු. එහෙත් ඔහුගේ මුහුණ සුදුමැලි වී තිබූ බවට සැකයක් නොවිය.

"ඇනුයි මට මතක් වුණේ" ලෙනාඩ් මහත්මිය කීවේ අහිංසක අයුරෙනි. "බ්‍රැවෝගේ බෙල්ලෙ බඳින්න යොදාගත්තු පටිය පහුවදා හෙක්ටර් එයාගෙ ලාච්චුවකට දැම්ම නේ. මේ අවාසනාවන්ත කලබල කාලය අවසන් වුණාම අපි ඒක රොබින්ට දෙන්න ඕන. ඔහු කැමැතිවෙව් සිහිවටනයක් හැටියට ඒක ළඟ තියාගන්න. ඔබට රොබින්ව හමුවුණොත් කියන්න ඒක පරෙස්සම් සහිතව අපේ ළඟ තිබෙන බව"

විමතියට පත් මගේ කටෙන් පිටවීමට ගිය ශබ්දය මම උත්සාහයෙන් වළක්වා ගතිමි. මේ තරුණ බිරිඳ දැන් නොදැනුවත්වම කරන්නේ කුමක්ද? ඒ ඇගේ මුවෙන් පිටවෙන සෑම වචනයකින්ම තම සැමියා නීතියේ රැහැනට කොටුකර දීමය. ජනේලය අසල

එයට පිටින් නිශ්චලව බලා සිටි පුද්ගලයා දෙස බැලීමි. හෙක්ටර් ලෙනාඩ් මහතා නිහඬව පසුබැස ගියේ ඉදිරියට එද්දී තිබූ නිහඬතාවයෙනි.

මිනිත්තු දෙකකට පසු ඔහු අප සිටි පුස්තකාලයට ඇතුළු වූයේ ප්‍රධාන දොරටුවෙනි. ඔහුගේ තිබුණේ සන්සුන් නිහඬබවකි. මගේ මිත්‍රයා වෙත සුරත දිගු කළ ඔහු අතට අත දුන්නේය. මීළගට තම බිරිඳ දෙසට හැරුණු හෙක්ටර් ලෙනාඩ් මෙසේ කීය.

"මං මේ මහත්වරු දෙන්නා මගේ කන්තෝරු කාමරය ඇතුළට එක්ක යනවා. ඒකට කමක් නැහැනේ. අපි සුරුට්ටුවක් උරමින් කතා කරමු. මට තියෙනවා කාරණාවක් දෙකක්, මේ මහත්වරු එක්ක කතාබහ කරලා පැහැදිලි කරගන්න"

"ආ කමක් නෑ" ඇය කීවාය. "දිවා භෝජන සංග්‍රහයට මම හැඳ පැළඳ ගන්නත් ඕන. ෂර්ලොක් හෝම්ස් මහත්මයා වොට්සන් මහත්මයා. ඔබ දවාලට කෑම ටිකක් කාල යන්න ඉන්නවා නේද? මොනවා? ඉන්නෙ නෑ? ඒ ගැන මට කනගාටුයි. එහෙනම් ඔබට ආයුබෝවන්. මීළග සැරේ එද්දි මීට වඩා සතුටුදායක ආරංචි අරගෙන එන්න"

ඇය කාමරයෙන් පිටවී ගියාය. කාමරයේ ඉතිරි වූයේ හෙක්ටර් මහතා, හෝම්ස් සහ මා පමණි.

"හෝම්ස් මහත්මයා. මං දන්නවා. අද ඔබ මෙහේ එන්න ඇත්තෙ උගුලක් අටවලා මගේ බිරිඳගෙන් කරුණු හෙළිකර ගන්න. මේ ගෑනි ඒ උගුලේ වැටුණා. කිසි දෙයක් නොදැන මේ අසරණ ගෑනි කළේ, තමන්ගේ සැමියාව එල්ලුම් ගහ දෙසට තල්ලු කිරීමයි. ඔබට දොස් කියන්න බෑ. ඔබ ඔබේ අනුග්‍රාහකයා වෙනුවෙන් යුතුකම, වගකීම ඉටුකළා. මොකක්ද ඔබේ ඊළඟ පියවර?"

"මට කනගාටුයි හෙක්ටර් මහත්මයා" හෝම්ස් කීය. "ඔබ කිවූ අයුරින් මගේ අනුග්‍රාහකයා වෙනුවෙන් මං ඉදිරි පියවර ගත යුතුයි. පළමුවෙන්ම ඔබේ බිරිඳ සාක්ෂි කූඩුවට කැඳවීමට සිදුවේවි. දැන් අපට කියූ කතන්දරේ යළිත් වරක් කීමට ඇයට ඉඩ සලස්වනවා"

"ඊට පස්සෙ?"

"දැන් ආපසු පැරිසියට ගිහින් ඉන්න ටෘඩෝ මහත්මයාත් සාක්ෂි සඳහා කැඳවීමට සිදුවේවි. ඔබේ බිරිඳගේ සහ ඒ මහත්මයාගේ සාක්ෂි තමා මෙතැනදී ප්‍රධාන තැනක් ගන්නේ.





පැමිණිල්ලේ ප්‍රධානම චෝදනාව වුණේ, මෝගන් මහත්මයාට සහ බල්ලාට වෙඩි වැදුණේ එකම දවසෙ, එකම වෙලාවක, එකම රයිෆලයකින් බවයි. නමුත් අර දෙදෙනාගේ සාක්ෂි වලින් පැහැදිලි වෙනවා මිනීමැරුම සිදුවුණු වෙලාවෙ, බල්ලාට වෙඩි තබන්න රොබින් මහත්මයාට හැකියාවක් තිබුණෙ නෑ කියල. ඒ මොකද එදා හවස් වරුව පුරාම බල්ලා ගැවසුණේ ඔබ සමග බව සාක්ෂිකරුවන් කියන නිසා. ඊට අමතරව අපරාධයට පසුවදා බල්ලාගේ කරේ දමා තිබූ පටිය ඔබ සන්තකයේ තිබුණා. මේ කාරණා සැලකිල්ලට ගත්තාම රොබින් ලෙනාඩ් මහත්මයා නිදොස් කොට නිදහස්වීම සහතිකයි"

මගේ මිත්‍රයා කරුණු ඉදිරිපත් කරද්දී හෙක්ටර් මහතා ඊට නිහඬව සන්සුන්ව සවන් දුන්නේය. ඔහු හැඟීම් බරවී කැලඹුණු බවක් මම නුදුටුවෙමි. ඔහු කථාව ඇරඹුවේ ඉන්පසුවය.

"ඔබට ස්තූතියි හෝම්ස් මහත්මයා. මේ තත්ත්වය මට පුළුවනි තේරුම් ගන්න. සමහර අවස්ථාවලදී කෙනෙකුගේ ජීවිතය, විඳ දරාගන්න බැරි තරම් දරුණු වධ හිංසා සහ වේදනාවලින් පිරී යනවා. මට අත්වී තිබෙන ඉරණම සමග සටන් කරන්න මගේ හිතේ තවදුරටත් ශක්තියක් ඉතිරි වී නෑ. මගේ හිතේ ඇතිවුණු භීතිය හා කෝපය දරාගන්න බැරිවුණු එක් මොහොතක මං මෝගන් මරා දැම්මා. ඊළඟට බිරුවෝටත් වෙඩි තබන්න මට සිදුවුණා. ඒ ඌ නොනවත්වාම බුරන්න පටන් ගත් නිසා.

මගේ මල්ලී අපරාධකාරයා ලෙස කොටුවේවි කියල මං කොහොමටවත් හිතුවේ නෑ. ඔහුගේ ජීවිතය ගලවාගන්න ඔබ සොයා ගියේ ඒ නිසයි. ඔබගේ දක්ෂකම් වලින් ඔබ ඔහුව බේරාගන්නා බව මං දැන හිටියා. නමුත් එක් පැත්තකින් මට වැරදුණා. ඒ තමයි මං හිතුවා මගේ දක්ෂකම නිසා, මාව වැරැදිකාරයා කරන කිසිම හෝඩුවාවක් මං ඉතිරි කළේ නැහැ කියල."

මොහොතක් නිහඬව කල්පනා කළ ඔහු යළිත් කථාව ඇරඹුවේය.

"රේස් පිටියේ මං බොහොම දරුණු විදියට පරාජය වුණා මහත්මයා. අශ්වයිනට ඔට්ටු අල්ලා මං මුදල් නැතිකරගත් තරමක්. ඒ අඩුපාඩු මං හරිගස්සා ගත්තේ, අපේ සමාගමේ මුදල් වංචා කිරීමෙන්. මේක මං සැලසුම් කළේ දීර්ඝ කාලයක ඉඳල. චෙක්පත් ලිවීමේදී මෝගන් ලියූ අකුරු අනුකරණය කිරීම අමාරු වුණේ

නෑ. මගේ මල්ලීගේ අත්සනත් අපහසුවකින් තොරව යෙදුවා. ඔය අතරෙදි තමයි සමාගමේ පරණ අල්මාරියක තිබිල මට තිල ඇඳුමක් හමුවුණේ. මේක ඒ කාලේ මගේ පියා සේවයට බඳවාගෙන හිටි කාර්යාල සහායකයකුගේ තිල ඇඳුමක්. ඒකෙ ප්‍රමාණය මගේ ඇඟට හොඳට ගැලපුණු නිසයි, මට වෙස්වළාගැනීමක් කරන්න හිතුණේ. ඒ මගින් බැංකුවේ සේවකයන් රැවටීම මට පහසු කරුණක් වුණා.

නමුත් පහුගිය අඟහරුවාදා මෝගන්ගෙන් ලියුමක් මට ලැබුණා. ඒක දුටුවාම මට දැනුණේ මගේ හිසට හෙණයක් පහත්වුණා වගෙයි. මොකක්ද ඔහු කියා තිබුණේ? අපේ සමාගමේ ගිණුම් වල සිදුවුණු විශාල වංචාවක් තමන් හෙළිකරගෙන ඇති බවත්, ඒ ගැන ටෘඩෝ මහත්මයාට සහ මට දැනුම් දීමට, අපර භාගයේ අපේ නිවසට එන බවත් ඔහු සඳහන් කර තිබුණා.

ඔහු අපේ නිවසට එන්නේ හන්ටිංඩන් වන ලැහැබ මැදින් බව මං දැන හිටියා. මං අඩිපාර දිගේ ඉදිරියට ඇවිදගෙන ගියා. ඔහු වන ලැහැබේ පොකුණ අසල ලී කොටයක් මත හිඳගෙන, දුම්බොන ආකාරය මට දකින්න ලැබුණා. මේ අවස්ථාවේ කාටවත් කිසිත් නොකියා නිශ්ශබ්දව සිටීමට ඔහුව කැමැති කරවා ගන්නයි මං උත්සාහ කළේ.

මෝගන් මහ මුරණ්ඩු මිනිහෙක්. කට වහගෙන ඉන්න ඔහු කොහොමටවත් කැමති වුණේ නෑ. ඔහුට උවමනා වුණා ඔහු කළ සොයාගැනීම ගැන ටෘඩෝ මහත්මයාටත් කියන්න. මං ඒකට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. මල්ලිට කිව්වත් ටෘඩෝ මහත්මයාට නොකියන මෙන් මං මෝගන්ට ආයාචනා කළා. ඔහු මගේ බැගෑපත් ආයාචනය තඹ කාසියකට මායිම් කළේ නෑ. මේ හොර චෙක් ලිවීම මගේ වැඩක් කියලා ඔහු සොයාගෙන තිබුණා. මේ හැම දෙයක්ම එළි කරන බවට ඔහු නැවත නැවතත් තර්ජනය කළා. එතකොට ඔහු මරා දමනවා ඇරෙන්න මට වෙනත් විකල්පයක් තිබුණේ නෑ. මං ඒක කළේ මගේ ආත්මාරක්ෂාවට."

එදා සැන්දෑවේ අපි ආපසු ලන්ඩනය බලා පැමිණියෙමු. පසුවදා උදෑසන අප තේ පානය කරමින් සිටියදී ලැබුණ පුවත්පත් සිරස්තල වල හෙක්ටර් ලෙනාඩ් නාමය යළිත් සඳහන් විණි.

හන්ටිංඩන් උද්‍යාන මාවතේ පිහිටි තම සුඛෝපභෝගී නිවසේදී හෙක්ටර් ලෙනාඩ් සිය දිවිනසා ගත්බැව් පුවත්පත් වල පළ විය.





කලින්දා රාත්‍රියේ ඔහු ලියූ දිගු පාපෝච්චාරණයක්ද, ඔහුගේ කාර්යාල කාමරයේ මේසය මත තිබී හමුවී තිබිණි.

හන්ටිංඩන් වනයේ දඩයමේ යද්දී අතරමගදී මෝගන් හමු වූ බවත්, ඔහු සමග කතාබහ කරමින් සිටියදී අත් වැරැද්දීමකින් ගිනිඅවිය පත්තු වී එයින් මෝගන් ජීවිතක්ෂයට පත්වූ බවත් හෙක්ටර් සඳහන් කර තිබිණි. තමා අතිශය භයකට පත්වූ නිසා මේ ගැන පොලිසියට හෙළි නොකර නිහඬ වූවත්, තම සොහොයුරා ඊට නිකරුණේ පැටළුණු විට පාපෝච්චාරණයක් කොට වරද පිළිගැනීම හැර වෙනත් විකල්පයක් නොතිබුණු බවත් ඔහුගේ පාපෝච්චාරණයේ සඳහන් විය.

# මේබර්ලි ගැටලුව

ෂර්ලොක් හෝම්ස් මහතා කළ පරීක්ෂණ ඉදිරිපත් කරද්දී ත්‍රිගේබල්ස්* වික්‍රමය නමින් ගැටලුවක්ද මම ඔබ වෙත ඉදිරිපත් කළෙමි. එම ගැටලුව විසඳීම සඳහා අප වෙත භාර දෙන ලද්දේ මේරි මේබර්ලි මහත්මිය විසිනි.

"........... මගේ මියගිය ස්වාමිපුරුෂයා වූ මෝටිමර් මේබර්ලි, ඔබේ මුල් කාලයේ අනුග්‍රාහකයෙකු වූ බව මගේ විශ්වාසයයි.........." ඇය අප වෙත එවූ ලිපියක සඳහන් කළාය.

"ඔබේ ස්වාමිපුරුෂයා ගැන මට හොඳට මතකයි නෝනා. ඔහු මගෙන් උදව් ඉල්ලාගෙන ආවේ අවුරුදු ගණනකට කලින්........" හෝම්ස් කීවේ ඇයගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙනි. නමුත් මෝටිමර් මේබර්ලි මහතා සම්බන්ධ ගැටලුව පාඨකයා වෙත ගෙන ඒමට එකල හෝම්ස්ගෙන් මට අවසර නොලැබිණි. එය වාර්තාගත කොට මගේ අතිශය රහසිගත ලිපිගොනුවේ තැන්පත් කළ යුතු බවට එකල ඔහු අවධාරණය කළේය. එයට හේතුව මේ සිද්ධිය ප්‍රචාරය වුවහොත් එයින් "මේබර්ලි" නාමයට අපකීර්තියක් ඇති වීමට ඉඩකඩ තිබූ නිසාය.

"වොට්සන් මං කියන මේ කාලෙ මට ඔබව හමුවෙලා තිබුණෙ නෑ. මං නේවාසිකව හිටියෙ බ්‍රිතාන්‍ය කෞතුකාගාරය ළඟ මොන්ටේගු වීදියෙ. මොනම ආකාරයක හෝ ගැටලුවක් විසඳීමට මට ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින් මං බලාගෙන හිටියා. පුවත්පත් මුල සිට අගට කියවමින් ඒවායේ තිබූ අබිරහස් සටහන් කර ගත්තා. ඔය අතරෙ තමා මගේ සහෝදරයා මයික්‍රොෆ්ට් එක දවසක් මා හමුවෙන්න ආවෙ"

"ඔබට විසඳීම සඳහා ගැටලු මොකක්වත් හම්බවුණේ නැද්ද ෂර්ලොක්?" ඔහු ඇසුවේ කනගාටුවෙන්.

"එකක් දෙකක් ලැබුණා. මං ඒවා සාර්ථක ලෙස විසඳුවා. නමුත් තරමක ප්‍රචාරයක් ලැබෙන තුරු අනුග්‍රාහකයන් මා සොයාගෙන ඒවි කියල මගේ විශ්වාසයක් නැහැ."

* මහ රෑ ආ මාරයා පොතේ ඇතුළත් කතාවකි.





"හොඳයි" මයික්‍රොෆ්ට් කිව්වා. "මෙන්න තියෙනවා ඔබට හොඳ අවස්ථාවක්. මේක ඔබට ලොකු අභියෝගයක් කියන්න පුළුවනි. ඔබ කැමතිද භාරගන්න?"

මොකුත්ම වැඩක් නැතුව හිටි මම, ඕන අභියෝගයක් බාරගන්න කැමැත්තෙනුයි හිටියෙ. මං ඒ බව ඔහුට කිව්වා.

"හැබැයි ඔබට වහාම ප්‍රංශයේ පැරිස් නුවර බලා යන්න වෙනවා. එතැනින් තව කොහේ කොහේ යන්න වේවිද මට කියන්න බෑ. කැමතිද?"

"මං කැමතියි" මං කිව්වා. "නමුත් ගැටලුව මොකක්ද කියා මට කියන්න."

"ඒ මෙන්න මේකයි." මයික්‍රොෆ්ට් කිව්වා. "පළමුවෙන්ම මතක තියාගන්න මේක රාජ්‍ය රහසක්. තවත් අවුරුදු දහයක් යනතුරු වත් මහජනයාට හෙළි නොකළ යුතුයි.

ඔබ දන්නව නේ යුරෝපයේ විවිධ රට රටවල ඉන්නා රජ පවුල් වල සාමාජිකයන්, එකිනෙකා සමඟ ඥාති සම්බන්ධකම් ඇති බව. බරපතළ ආකාරයේ ලෝක යුද්ධ ඇති නොවී තිබෙන්නත් එක් හේතුවක් එයයි. ඊළඟට මෙයාලගෙ උත්සව අවස්ථාවලදීත් හුවමාරු කරගන්නා තෑගිබෝගවල කෙළවරක් නෑ. දැන් ගැටලුවක් මතුවෙන්න හේතු වුණෙත් එවැනි කටයුත්තක්.

රුසියාවේ සාර් රජ කුමරාගේ රාජාභිෂේකය ළඟදීම පැවැත්වීමට නියමිතයි. ඒකට ලොව පුරා රජවරුන්ට ඇරයුම් කරනවාලු. ඒ වෙනුවෙන් අපේ මහ රැජින දෙන තෑග්ග මොකක්ද දන්නවද? ඉතාම අලංකාර දියමන්ති හයකින් සෑදුණු දියමන්ති මාලයක්."

"ඔබ එය දුටුවද?"

"ඔව්. මං දුටුවා විතරක් නෙමෙයි. එය මගේ අතටත් අරගෙන බැලුවා. මං එය අල්ලන්නවත් කැමැති වුණේ නැහැ. නමුත් රජතුමා මට කිව්වා එය අතට අරගෙන පරීක්ෂා කරල බලන්න කියල. දියමන්ති එකින් එක අමුණලා තිබුණේ ඉතාම සිහින් කෙටි රත්රන් දම්වැල් කැබලි මගින්. විශ්වාස කරන්න ෂර්ලොක්. කෙනෙකුට පුළුවනි ඒ මුළු මාලයම එළියට නොපෙනෙන ආකාරයට අතේ මිට මොළොව ගන්න"

"එහෙනම් දියමන්ති ප්‍රමාණයෙන් හුඟක් කුඩා ඒවා වෙන්න ඇති?"

"ඔව් එච්චර ලොකු නෑ තමයි" කී මයික්‍රොෆ්ට් තමන්ගේ අතේ සුළැඟිල්ල පෙන්නුවා. "එක දියමන්තියක ප්‍රමාණය වැඩිහිටියෙකුගේ සුළැඟිල්ලේ නියපොත්තටත් වඩා මඳක් කුඩායි කියන්න පුළුවනි."

"ඉතින්?"

"උත්සවයට කලින් මේ මාලය සාර් රජ බිසවට යවන්න අපේ මහරැජිනට උවමනා වුණා. ඔබ දන්නවානේ ඇගේ හැටි. කිව්වොත් කිව්වා. කෙනෙක් මේකත් අරගෙන එංගලන්තයේ සිට රුසියාවේ මොස්කව් දක්වා ගෙනයාම හරිම අවදානම් කටයුත්තක්. දුම්රියෙන් ගියත්, පෞද්ගලිකව අශ්ව කරත්තවල ගියත් අවදානම වැඩියි. ඒ නිසා අගමැතිතුමා මෙහෙම යෝජනාවක් කළා. ප්‍රංශයේ පැරිස් නුවර ඉන්නවා රුසියානු තානාපතිවරයෙක්. ඔහු රාජාභිෂේක උත්සවය සඳහා අනිවාර්යයෙන්ම මොස්කව් බලා යාමට නියමිතයි. ඉතින් අපි පැරිසියට ගිහින් මාලය රුසියානු තානාපති තුමාට භාර දුන්නොත්, ඔහු ඒක නොවරදවාම රුසියානු රජපවුල වෙත ගෙනගොස් භාරදේවි. ඒකයි පහසුම පිළිවෙළ. ඒ නිසා මාලය රැගෙන අපේ නියෝජිතයෙක් පැරිසියට එන බව, රුසියානු තානාපතිතුමාට දන්වා යවමු කියලා. මේ යෝජනාවට කවුරුත් එකඟ වුණා. මාලය අරගෙන පැරිසියට යන්නෙ කවුද කියන එක බරපතළ ප්‍රශ්නයක් වුණේ නෑ. ඒ මොකද දීර්ඝ කාලයක ඉඳලා තානාපති සේවයේ මෙවැනි කටයුතු වලට යොදවන විශ්වාසවන්ත කෙනෙකු ඉන්නවා. ඒ තමයි මෝටිමර් මේබර්ලි. ඔබ අහලත් ඇති ඔහු ගැන?"

"නම නම් මං අහල තියෙනවා. නමුත් කවදාවත් මට ඔහුව හමුවෙලා නෑ"

"වයසින් අවුරුදු තිස් අටක් හතළිහක් වන ඔහු භාෂා ගණනාවක් කථා කරන්න පුළුවන්, කාර්යශූර බුද්ධිමත් කෙනෙක්. ඔහුගේ පියාත් රජපවුල වෙනුවෙන් තානාපති සේවයේ යෙදුණු කෙනෙක්. ඉතින් දින පහකට කලින් ඔහු මාලයත් රැගෙන පැරිසිය බලා පිටත් වී ගියා. මං හිතුවේ සියල්ලම හරි කියලයි. නමුත් ඊයේ හවස ඔහුගෙන් ලිපියක් රැගත් පණිවිඩකරුවෙකු මා හමුවෙන්න ආවා. මෙන්න ඒ ලියුම"

මයික්‍රොෆ්ට් තමන්ගේ කබා සාක්කුවෙන් ගත් ලියුම් කැබැල්ලක් මා අතට දුන්නා.





"මයික්‍රොෆ්ට් හෝම්ස් මහතාණනි,

අතිශයින්ම සංකීර්ණ ගැටලුවකට මුහුණ දී සිටිමි. මට පැරිස් නුවරින් පිටවීමට නොහැකියි. ඔබට වහාම මෙහි පැමිණිය හැකිද? අපහසු නම් ඉතා විශ්වාසවන්ත රහස් පරීක්ෂකයකු එවන්න. මං ඉන්නේ ෂාමොනි හෝටලයේ.

මේබර්ලි."

"මොකක් සිද්ධවෙලා කියලද මයික්‍රොෆ්ට්ට හිතන්නෙ?" මං ඇහුවා.

"මට මොකුත් හිතාගන්න අමාරුයි ෂර්ලොක්. වෙන්න පුළුවන් එකම දේ, මේ යකා දියමන්ති මාලය නැති කරගෙන වීමට පුළුවන්. නමුත් එහෙම දෙයක් සිදුවුණේ කොහොමද? අන්න ඒකයි මට හිතාගන්න අපහසු"

"මයික්‍රොෆ්ට්. මොනවද ඔබ මෙතැනදි මගෙන් බලාපොරොත්තු වෙන්නෙ?" මං ඇහුවා.

"ලියුම් කැල්ල කියෙව්වාම ඔබ ඒක තේරුම් ගන්න ඇති ෂර්ලොක්. මේ වෙලාවේ මට කොහොමටවත් රටෙන් පිටවෙන්න අමාරුයි. ඉන්දියානු කලාපයේ ප්‍රශ්න ගොඩක් ඇති වී ඒ පළාතම උණුසුම්ව තිබෙන කාලයක්. ඉන්දියාව කිට්ටුව දූපතක් පාලනය කරන්න අපි යවල ඉන්න ආණ්ඩුකාරයා නොම්මර එකේ මෝඩයෙක්. ඒ රටේ ස්වදේශිකයන්ගේ ආගමික පෙරහැරක් පාරෙ යන අතරේ, කෝලාහලයක් ඇතිවෙලා. මේක සාමකාමීව විසඳා ගතයුතු වෙලාවෙ, ආණ්ඩුකාරයා ක්‍රියාකරල තියෙන්නෙ මොළේ නැති බූරුවෙක් වගේ. ඔහු ස්වදේශිකයන් මරා දමන්න පොලීසියට අණදීලා. රැජින මේ කිසිදෙයක් දන්නෙ නෑ. එයා දැනගත්තත් ඇති වැඩකුත් නෑ. ඒක නෙමෙයි. ඔබ වහාම ලන්ඩනයෙන් පිටත් වී යා යුතුයි. මේ අවුල විසඳන්න පුළුවන් එකම පුද්ගලයා ඔබ බව මට විශ්වාසයි. ඒක සාර්ථකව කළොත් ආණ්ඩුවෙන් ලොකු මුදලකුත් ලැබේවි."

"කොයි වෙලාවටද මං යන්න ඕන?"

"මේ දැන් ෂර්ලොක්! මේ දැන්! අපි දැනටමත් ප්‍රමාද වැඩිද මං දන්නෙ නෑ. මෝටිමර් මේබර්ලි ඉන්නෙ ෂාමොනි හෝටලයේ බව ලියා තිබුණා නෙ"

එහෙම කියූ මයික්‍රොෆ්ට් යන්න පිටත් වුණේ මගේ අතේ ලොකු මුදලක් තබමින්. පැය කිහිපයක් ගත වෙද්දී මට හැකිවුණා,

පැරිසියේ ෂාමොනි හෝටලයේදී මෝටිමර් මේබර්ලි හමුවෙන්න. ඔහුට කියන්න තිබුණු කතාව, ඔහු කියූ ආකාරයෙන්ම, නමුත් කෙටියෙන් මං කියන්නම්.

"මං පැරිසියට ඇවිත් රුසියන් තානාපතිතුමාගේ මන්දිරයට ගියා. ඒ දියමන්ති මාලය ඔහුට භාරදීලා ආපසු එන බලාපොරොත්තුවෙන්. නමුත් සිදුවී තිබුණෙ මං කිසිසේත් නොහිතූ දෙයක්.

"තානාපතිතුමාද? එතුමා දින කිහිපයක නිවාඩුවකට නිස් නගරයට ගියා. සතියක කාලයකට ආපහු එන එකක් නැහැ" තානාපති කාර්යාලයේ අය කිව්වා.

"මං ආවේ ලන්ඩන් නුවර සිට. අපේ මහ රැජින ඔබේ සාර් රැජිනට තෑග්ගක් යවනවා. ඒක තානාපතිතුමා අතේ යවන්නයි අපේ රජ පවුල බලාපොරොත්තු වුණේ. ඒ බව දන්වා අපේ රජ මාලිගයෙන් එවූ ලියුම එතුමාට ලැබුණේ නැද්ද?"

"ලියුම ලැබුණා. ඔබ සඳුදා මෙහේ එන බවයි ඒකෙ තිබුණේ. තානාපතිතුමා හිතුවේ ඔබ ලබන සඳුදා ඒවි කියලයි. මේ සඳුදා ඔබ ඒවි කියා හිතුවේ නැහැ"

"ඒක තේන්නං. දැන් ඉතින් මං මොනවද කරන්නේ?" මං ඔවුන්ගෙන් ඇහුවා.

"ඔබට කැමති නම් ඒ තෑග්ග අපට භාර දී යන්න. තානාපතිතුමා ආව වහාම අපි ඒක ඔහුට භාරදෙනවා" ඔවුන් කිව්වා.

"මට ඒක කරන්න හැටියක් නෑ" මං කිව්වා. "ඒ මොකද මේ තෑග්ග තානාපතිතුමාගේ අතටම භාරදීලා, එය භාරගත් බවට ඔහුගෙන් කුවිතාන්සියක් රැගෙන එන්නයි මට උපදෙස් ලැබුණේ."

"එහෙනම් මොනවා කරන්නද? එතුමා හමුවෙන්න ඔබට සිදුවෙනවා නීස් නගරයට යන්න. එතුමා එහි ලැගුම් ගෙන ඉන්නේ ඩූලොං-පැලස් හෝටලයේ."

"මොනවා කරන්නද? එහෙනම් හෙට උදැසන දුම්රියෙන් මං නීස් බලා පිටත් වෙනවා" මං තානාපති කාර්යාලයේ නිලධරයාට කිව්වා. එහෙම කියලා එදා රෑ මේ හෝටලයේ ලැගුම් ගත්තා.

මේක මා සන්තකයේ තබා ගැනීමත් එය දුම්රියෙන් යද්දී රැගෙන යාමත් මට විශාල බරක් වුණු බව ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැ. ඒකට හේතුව මා වැනි රාජ්‍ය නිලධරයන් ගැන ජාත්‍යන්තර ඔත්තුකාරයන් සහ හොරුන් හොඳට දන්නවා. අප ගෙනියන්නේ දියමන්ති හෝ මැණික්, හෝ රත්තරන් වැනි





වටිනාකමින් වැඩි දෙයක් වෙන්නත් පුළුවනි. රාජ්‍ය අතර හුවමාරු කෙරෙන වැදගත් ලියවිල්ලක් වෙන්නත් පුළුවනි. දෙරටක් අතර යුද්ධ ප්‍රකාශ කෙරෙන, නැත්නම් යුද්ධයක් නවත්වන ගිවිසුමක් වෙන්නත් පුළුවනි. මෙවර මට ගෙනියන්න භාරවුණු දියමන්ති මාලය ප්‍රමාණයෙන් කුඩා එකක්. ඒ නිසා ඒ සඳහා මං යොදාගත් ක්‍රමය මං ඔබට පැහැදිලි කරන්නම්.

මං කාලයක් තිස්සේ සුරුට්ටු අසුරාගෙන යාමට යොදාගත් පරණ සුරුට්ටු පසුම්බියක් මා ළඟ තියෙනවා. ඒක දෙපැත්තම ගෙවී ගිය දුර්වර්ණ වූ, නමුත් ගාංචුව තවමත් හොඳින් වැඩ කරන එකක්. ඒ වර්ගයේම අලුත්ම අලුත් සුරුට්ටු පසුම්බියක් මා ළඟදී මිලදී ගත්තා. ඒක ඉතාම අලංකාර එකක්. ඒකෙ පිටපැත්තේ මගේ නමේ මුල'කුරු 'M.M.' යනුවෙන් "එම්බොස්" ක්‍රමයට මුද්‍රණය කරවා ගැනීමටත් මට හැකිවුණා. එතකොට ඒ දෙකම එකම සාක්කුවක තිබුණත්, නැත්නම් අන්ධකාරයේදී වුණත්, මගේ ඇඟිලි තුඩු වලින් ඒවා හඳුනාගැනීමට මට හැකියාව තිබෙනවා."

"ඔබ වටිනා දේවල් මේ ආකාරයට සඟවා ගෙන යන හැටි ගැන, කවදා හරි කාටවත් කියා තිබෙනවාද?" මං විමසුවා.

"මං ඒ ගැන කලකට පෙර මගේ හිතවත්ම මිත්‍රයෙකුට කිව්වා." මෝටිමර් මේබර්ලි පිළිතුරු දුන්නා. "ඔහුත් මා වගේම රාජකීය පණිවුඩකරුවෙක්. මං එදා "පෙරදිග ශීඝ්‍රගාමී" දුම්රියෙන් ගමන් කරමින් සිටියේ කොන්ස්තන්තිනෝපල් බලා. එදා සාන්ත ජෝජ් කුරුසිය හා සාන්ත මයිකල් කුරුසිය මං අපේ තානාපතිවරයා වෙත ගෙන යමින් හිටියේ. මං කියූ මිත්‍රයා ගියේ වියනා නුවරට. අපි දෙන්නා දුම්රියට නැගුණේ පැරිස් නුවරින්. මාස අටකට පසු අප දෙදෙනා යළිත් වරක් පැරිසියේදීම හමුවුණා. වයින් වීදුරුවක් තොලගාමින් සිටිද්දී ඔහු මෙහෙම කිව්වා.

"මේබර්ලි. ඔබ වටිනා බඩු හංගාගෙන යන රහසිගත ක්‍රමය මං මගේ මිතුරු මිතුරියන් කීප දෙනෙකුට කිව්වා. ඒව අහලා ඔවුන් හරිම විස්මයකට පත්වුණා."

"ඔබ හරි මිනිහෙක් නේ. මං ඒක ඔබට කිව්වේ රහසක් හැටියට තියාගන්න කියලයි. ඒක ලෝකෙ පුරා ප්‍රචාරය කළේ ඇයි?"

"සිත් ඇදගන්නා කෙනෙක් හමුවුණාම, වයින් වීදුරුවක් දෙකක් පානය කළාම, අපි මොනවා කියනවා ද කියල අපිම දන්නෙ නැහැනේ" මගේ මිත්‍රයා කිව්වා.

"ඔබ හරි කෙනෙක්. පිරිමින්ට කිව්වා මදිවට ගැහැනුන්ටත් කියලා" මං ඔහුට දොස් කිව්වා. "රහස් කියන ඒවා ගැහැනුන්ට කියන මිනිහා මොන තරම් මෝඩයෙක්ද? ඔබ ගැහැනු කී දෙනෙකුට මේක කිව්වාද? ඒ කවුද?"

"එකම එක ගැහැනියකටයි මං කිව්වේ"

"කවුද ඒ?"

"ඔබ අහල තියෙනවද වෙරී මේරියන් කුමරිය ගැන?"

"ඔය කියන්නේ අර, කළුපාට කොණ්ඩයක් තිබෙන, සිහින් උස ඉතාම ලක්ෂණ රුසියානු කුමරිය ගැන නේද?"

"අන්න හරි. ඔබට ඇය හමුවී තිබෙනවාද?"

"නැහැ. නමුත් මං ඇය ගැන දන්නවා. ඇය හැමෝටම පෙන්වන්නේ රාජ කුමාරියක් හැටියට. නමුත් ඇත්තටම ඇය ඔත්තුකාරියක්. මුලින් ඇය රුසියානු ආණ්ඩුව වෙනුවෙන් රහස් ඔත්තු සේවයේ යෙදුණා. ඒ සඳහා ඇය ලන්ඩන්, මැඩ්‍රිඩ්, පැරිස් හා රෝම නගරවල සංචාරය කරමින් ඔත්තු බැලුවා. ඇය ඔවුනට කළ වංචාවක් හෙළිදරව් වී රුසියාවෙන් ඇයව පන්නා දැමුණා. වෙරීට දැන් ස්ථිර ආදායම් මාර්ගයක් නැහැලු. ඒ නිසා මුදල් වෙනුවෙන් මිනියක් වුණත් මරාවිලු"

"අප දෙදෙනා අතර එදා ඇතිවුණේ ඔය වගේ සංවාදයක් ෂර්ලොක් හෝම්ස් මහත්මයා." මේබර්ලි කිව්වා. "මං අවුරුදු පහළොවකට වැඩි කාලයක් බ්‍රිතාන්‍ය රජය වෙනුවෙන් සේවය කරල තියෙනවා. ගෙන ගොස් දීමට මට භාරවූ වටිනා භාණ්ඩ, ලියවිලි අප්‍රමාණයි. ඒත් කිසි දවසක කිසිම දෙයක් මගේ අතෙන් නැතිවුණේ නෑ. නමුත් අවාසනාවක මහත! මෙවර නම් ඒ වටිනා භාණ්ඩය මා අතින් නැතිවෙලා. දෙවියනේ! මං මොන තරම් අවාසනාවන්තයෙක්ද? ඔවුන් හිතාවි මං මේක වංචා කර විකුණා ගත්තා කියලා....... මට ජීවිතාන්තය දක්වා හිරේ යන්නයි සිදුවෙන්නේ. ඒකට කමක් නෑ. නමුත් මගේ අසරණ බිරිඳට හා දරුවාට ඇතිවෙන ලැජ්ජාව.......... මේබර්ලි කියන නමට ඇතිවෙන අපකීර්තිය........"

"ඉතින් වොට්සන්, මේබර්ලි ඔය විදියට දොඩවන්න ගත්තේ පිස්සෙක් වගේ. ඒ තත්ත්වයට පත්වුණාම ඕනම කෙනෙකුගේ මොළය අවුල් වෙන්න පුළුවනි. නමුත් ගැටලුව විසඳන්න නම් කාරණා හැම එකක්ම අපි හරිහැටි අසා දැනගත යුතුයි. ඉතින්





අපේ කතාබහ මං පැයකින් කල් දැමුවා. මං ගියා එළියේ ඇවිදින්න. මිනිත්තු හතළිස් පහක් එළියේ ඇවිදලා තේ කෝප්පයක් පානය කරලා මං යළිත් වරක් මෝටිමර් මේබර්ලිගේ කාමරයට ගියා.

"එන්න හෝම්ස් මහත්මයා. අපි කතාකරමු" ඔහු කිව්වා. "මට තේරෙනවා. මං පිස්සෙක් වගේ දොඩවලා හරියන්නෙ නෑ. මගේ කරදරය ගැන හැමදෙයක්ම ඔබට කිවයුතුයි නේ. මං හැමදෙයක්ම අඩු නැතුව කියන්නම්.

මා ළඟම තිබූ දියමන්ති මාලය හොරකම් කරගත්තේ ඇය - වෙරී මේරියන් කුමරිය තමා. මං ලන්ඩනයෙන් පිටත්වුණු මොහොතේ ඉඳලම ඇය මා පසුපස ඇවිත් තියෙනවා. දියමන්ති මාලය හංගලා තියෙන්නේ මගේ සුරුට්ටු පසුම්බියේ බව ඇය දැනගෙන ඉඳල තියෙනවා.

නිස් නගරය බලා යෑමට මං පැරිස් දුම්රිය පොළෙන් දුම්රියට නැඟුණා. ඒක පිටත්වුණේ උදේ දහයට. දුම්රියේ ආරක්ෂක නිලධරයෙක් ඉන්නවා නේ. රාත්‍රී දුම්රියක මං ගමන් කරනවා නම් මං හැමවිටම ඒ නිලධරයාට කියනවා, මං රැජිනගේ පණිවුඩකරුවකු බව. එතකොට ඔහු ඒ මැදිරිය මටම වෙන්වෙන විදියට පියවර ගන්නවා. නමුත් දවල් වෙලාවට මං ඒ ගැන එච්චර උනන්දු වෙන්නෙ නෑ. එන හැටියකට භාර ගන්නවා. එදා මං නැග්ගේ හිස්ව තිබුණු මැදිරියකට. දුම්රියට නගින්න කලින් දුම්රිය නියාමකයාටත් මං පොඩි "ටිප්" එකක් දුන්නා. ඒ මං ගිය මැදිරිය හිස්ව තබන මෙන් ඉල්ලමින්. මං එහෙම ඉල්ලීමක් කළේ මා ළඟ තිබුණු දියමන්ති මාලය කවුරු හරි පැහැර ගනීවි කියල හිතේ ඇතිවුණු භයකට නෙමෙයි; මැදිරියේ තනියම ගමන් කළාම මට අවශ්‍ය වෙලාවට දුම්පානයේ යෙදෙන්න පුළුවන් කම තියෙනවා. කවුරුවත් ඒකට ආවොත් දුම්පානය කිරීමේ නිදහස මට නැතිවෙනවානෙ. නියාමකවරයා මං ගිය මැදිරියේ දොර පිටතින් යතුරු දැම්මා. දුම්රිය පිටත් වීම සඳහා අන්තිම සීනුවත් නාදවුණා. මගේ හිතට ඇතිවුණේ ලොකු සතුටක් සහ සැනසීමක්. මගේ බඩු බාහිරාදිය පිළිවෙළකට හරි ගස්සගන්න ඕන කියල මං කල්පනා කළා.

සුරුට්ටු පසුම්බිය තුළට දැමූ මාලය තිබුණේ මගේ ඇතුළු කබායේ ඇතුළු පැත්තේ සාක්කුවේ. ඒක තරමක් ඇඩි මඳක් පිම්බුණු එකක්

නිසා මගේ පපුවට ඒක තරමක් හිරිහැරයක් වෙමිනුයි තිබුණෙ. ඒ හින්ද මාලය මගේ අත් බෑගයේ දමා ගැනීමේ අරමුණෙන් මං ඒක සාක්කුවෙන් එළියට අරගන්නට කල්පනා කළා.

මා හිඳගෙන සිටි අසුන උඩින් මගේ අත් බෑගය තැබුවා. මගේ අත් බෑගය කුඩා එකක්......... අර තියෙන්නෙ. ඔය පණිවුඩකාරයො, කාර්යාලයට යන තරුණ ළමයි ගෙනියන ආකාරයේ කුඩා මල්ලක්. ඒකෙ පටිය කොයි වෙලෙත් මගේ උරහිස උඩින් දමාගෙන ඉන්නෙ. ඒ නිසා කිසිම මොහොතක ඒක මගෙන් ඈතට යන්නෙ නෑ මං වාඩිවෙලා හිටියත්, ඇවිද්දත්, නින්දට ගියත්, අත් බෑගය මගේ කරෙන් ඉවත් කරන්නෙ නෑ. දැන් මං මගේ ඇතුළු කබා සාක්කුවේ තිබුණු මාලය සහිත සුරුට්ටු පසුම්බිය එළියට ගත්තා. ඒක තැබුවා මා සිටි අසුන මතින්. මගේ අත් බෑගය ඇතුළෙ තිබුණු අලුත් සුරුට්ටු පසුම්බියත් එළියට ගත්තා. ඒකත් තැබුවා පරණ එක ළඟින්ම. ඒ ගමන සුරුට්ටුවක් දල්වා ගැනීම සඳහා මං සෙව්වේ ගිනිපෙට්ටියක්. ඒ මගේ කුඩා බෑගය ඇතුළත.

ඔන්න ඒ මොහොතෙම දුම්රිය පිටත් වෙන්න සූදානමෙන් නළාව නාද කළා. දුම්රිය මැදිරි එකිනෙක ගැටී ගැස්සුණේ සාමාන්‍යයෙන් ඒ වෙලාවට සිදුවෙන විදියට.

එක් ක්ෂණයකින් මොකද වුණේ! කවුද කලබලයකින් උස්හඬින් කතාකරන ශබ්දයක් ඇහුණා. දුම්රිය සේවකයන් කිහිප දෙනෙක් මා සිටි තැනම දොර විවෘත කරලා ගෑනු කෙනෙකුව ඒ දොරටුවෙන් ඇතුළට තල්ලු කළා. ඇය විතරක්ද. ඇගේ ගමන්මලු පාර්සල් සහ කුඩ ආදියත් ඇතුළට දැම්මා.

මා විසින් කළ යුතු දේ කරන්න, මං එක් මොහොතක් වත් පමාවුණේ නෑ. දියමන්ති මාලය සහිත පසුම්බිය මං වහාම දැම්මා මගේ බෑගය ඇතුළට. ඊලා බෑගය වහලා දැම්මේ ස්වයංක්‍රීයව වැහෙන අගුළ වැටෙන විදියට. ඊළඟට සුරුට්ටු ටික දමාගත්තා මගේ ඇතුළු කබා සාක්කුවට. එහෙම කළත් මං කල්පනා කළේ දැන් මේ ගැනියෙකුත් මේ මැදිරියට වැටුණු එකෙන් මට නිදහසේ දුම් බොන්නවත් නැතිවුණා නේද කියලයි.

ඇගේ ගමන් බඩුවලින් එකක් තිබුණේ මගේ දෙපා ළඟ. මේ කාන්තාව මා සිටි මැදිරියට පැමිණීමෙන් මට වුණේ මහ හිරිහැරයක්. නමුත් ඒ බව මුලදීම ඇයට පෙන්වා, මගේ තරහ පෙන්නුවොත්? ඒක මට අවාසියක් වීමට ඉඩ ඇතියි කියල මට





හිතුණා. ඉතින් බිම මගේ දෙපා ළඟ තිබුණු අත්බෑගය අහුලාගෙන මං ඒක තැබිය යුත්තේ කොහෙන්ද කියල ඇගෙන් විමසුවා. එහෙම කරන ගමන් මං බැලුවේ ඇගේ මුහුණ දෙස. එතකොටයි මං දුටුවේ ඇය අතිශයින්ම රූමත් තරුණ කාන්තාවක බව.

මගේ ප්‍රශ්නයට ඇය පිළිතුරු දුන්නේ සිනාමුසු මුහුණෙන්. ඒ ගැන මට කරදර නොවෙන මෙන් ඉල්ලූ ඇය තම ගමන් මල්ලෙන් රත්තරන් වලින් තැනූ සිගරට් අසුරණයක් එළියට ගත්තා.

"මං දුම්පානය කිරීම ගැන ඔබේ විරුද්ධත්වයක් තියෙනවද?" ඇය විමසුවා.

"ඒක හරි පුදුම දෙයක්" මං කිව්වේ සිනාවෙමින්. "ඔබත් මේ දුම්රිය මැදිරියට ආවම මං බයවුණා. ඔබ මට දුම්බීමට ඉඩදෙන එකක් නැහැ කියලයි මට හිතුණේ."

"ඇත්තට? ඔබත් දුම්බොන කෙනෙක් නම් මගේ සිගරැට් එකක් දල්වා ගෙන බලන්න" ඇය කිව්වා.

ඇයගේ දුම්වැටි ඉතාම හොඳ වර්ගයේ ඒවා බව මට පෙනී ගියා. ඉතින් මගේ සුරුට්ටුවලට වඩා මගේ හිත ඇදී ගියේ ඇගේ සිගරට් වලට. ඇය ඉහළ පැළැන්තියේ ප්‍රභූ කාන්තාවක් බවට කිසිම සැකයක් නෑ. එහෙම නොවෙන්න නාඳුනන පිරිමියෙකු ඉදිරියේ මේ විදියට නිර්භයව දුම්පානය කරන්න, ගැහැනියක ඉදිරිපත් වේවි කියා හිතන්න අමාරුයි.

මීළඟට ඇය තමන් ගෙනැවිත් තිබුණු නවකතා පොතක් කියවන්න ගත්තා. වරින් වර ඒ කටයුත්ත නවත්වමින් අපට දකින්න ලැබුණු දර්ශන ගැනත් ඇයගේ අදහස් පළකළා. ඊළඟට අපේ කතාබහ ටිකෙන් ටික යොමුවුණේ, යුරෝපයේ ජාත්‍යන්තර දේශපාලනයට. යුරෝපයේ ප්‍රධාන නගර හැම එකක් ගැනත් ඒවායේ දේශපාලනයේ වැදගත් අය ගැනත් ඇය දැන හිටියා. මේ විදියට දේශපාලන වැදගතුන් දැන හඳුනාගෙන සිටියා කියන්නේ ඇයත් ප්‍රභුවරියක් විය යුතුයි කියලයි මට හිතුණේ. නමුත් තමා කවුද කියන එක ගැන, ඇය ඉඟියක් වත් කළේ නෑ. නමුත් ඇයගේ කටින් දෙවරක් මේ වගේ දේවල් අහම්බෙන් වගේ කියැවුණා. "....... මගේ ස්වාමිපුරුෂයා වියනාවල සිටි කාලෙ........" "මගේ සැමියාට උසස්වීමක් ලැබිලා රෝමෙට ගිය වෙලාවෙ........" ඇගේ ස්වාමිපුරුෂයා මහ ලොක්කෙකු වෙන්න ඇති කියලා එවේලෙයි මට හිතුණේ.

"මොන්ටෙ කාලෝ වලදි ඔබගේ මුහුණ දැකල පුරුදුයි වගේ" ඇය කිව්වේ මගේ මුහුණ දිහා ඇඩි උනන්දුවකින් බලමින්. "අර පරෙවියන්ට වෙඩිතැබීමේ ශූරතාව දිනාගත්තෙ ඔබ නේද?"

මං එවැනි දේකට කවදාවත් සහභාගි නොවූ බව මං ඇයට කියා සිටියා.

"අනේ! ඒක මට වුණු වැරදීමක් වෙන්න ඇති. මට සමාවෙන්න. මට වුණු වැරදීමක් තමයි. මං හිතුවේ ඔබ නයිජල් රොබින්සන් කියලා"

ඇගේ එක්තරා හැසිරීමකින් මට තිබුණා, ඇය ගැන සැකයක් ඇතිකර ගන්න. සෑම දුම්රියපොළකදීම, ඇය එක් මොහොතකට දුම්රියෙන් ´බැස්සා. ඊට නිදහසට කරුණකුත් ඇය ළඟ තිබුණා. තමන්ගේ සේවිකාවත් මේ දුම්රියේ දෙවැනි පංතියේ මැදිරියක ගමන් කරන බව ඇය කිව්වා. තමන්ගේ සේවිකාව තමාව සොයාගෙන ආවෙ නැත්තෙ ඇයි කියල, තමාට හිතාගන්න අමාරු බව ඇය මා සමඟ කිව්වා. තමන්ට මොනවා හරි මිලට ගන්න උවමනා වුණොත්, මට ගිහින් ඒක අරගෙන එන්න පුළුවන් වේවි නේද කියලත් විමසුවා.

මං මගේ ඇඳුම් පෙට්ටිය දුම්රිය රාක්කයෙන් පහළට ගත්තා. අරගෙන ඒක විවෘත කළේ නවකතා පොතක් එළියට ගන්න. ඒක මං දුම්රියේ අසුනක් උඩ තියලා විවෘත කළා විතරයි; ඇය ඇහුවා ඇයට චොක්ලට් බීම එකක් අරගෙන එන්න පුළුවන්ද කියලා. මං ගිහින් ඇය කියූ දේ අරගෙන ආපහු එද්දී ඇය මගේ ඇඳුම් පෙට්ටිය මත අත්දෙක තියාගෙන.

"හරි වැඩේ නේ වුණේ. ඔබේ බෑගය දුම්රිය ගැස්සෙද්දී අහකට වැටුණානේ. ඒකෙ ඇතුළෙ තිබුණු බෝතල් මොනවා හරි බිඳිලද දන්නෙත් නෑ. ඉක්මනට බලන්න. බෝතල් බිඳිලා තිබුණොත් ඒවා ඉක්මනටම බෑගයෙන් ඉවත් කරන එක ඔබට වාසියි."

හෝම්ස් මහත්මයා. ඔබට කියන්න ඕන. මං ඒ වෙලාවෙ කටයුතු කළේ බූරුවෙක් වගේ. ඇගේ කෛරාටික කතාවට මං රැවටුණා. අනේ ඒක මතක් වෙනකොට, මගේ මෝඩකම ගැන මගේ ඇඟම වෙව්ළනවා. ඇයට පෙනෙන විදියට මං මගේ ඇඳුම් පෙට්ටිය විවෘත කළා. මොනවා හරි බිඳිලද කියල ඒක පරීක්ෂා කරල බැලුවා. නමුත් ඒකෙන් ඇයට වාසියක් කරගන්න බැරිවුණා.





ඒ මොකද මාලය තිබුණෙ මගේ කරේ දමාගෙන මං හැමතැනම අරගෙන ගිය කුඩා බෑගයේ නේ.

ඇඳුම් පෙට්ටියේ එම සිද්ධියෙන් පස්සේ ඇගේ ස්වභාවය වෙනස් වෙන්න පටන් ගත්තා. එක්කෝ මං නොහිටි අතරෙ, ඇය මගේ ඇඳුම් පෙට්ටිය හොඳට සෝදිසි කර බලන්න ඇති. එහෙමත් නැත්නම් මං එය විවෘත කර බෝතල් බිඳිලද කියා බලද්දී ඇයට ඇති තරම් බලා ගත්තා.

දියමන්ති මාලය ඇත්තේ මගේ සුරුට්ටු පසුම්බියේ කියල, ඒ වෙලාවේ ඉඳන් ඇයට තහවුරු වෙන්න ඇති. ඒක තියෙන්නෙ මං කොයි වෙලාවක වත් කරෙන් ගැලෙව්වෙ නැති කුඩා බෑගයේ විය යුතුයි කියල, ඇය නිශ්චිතව හිතාගන්න ඇති. මාව රවට්ටල ඒක ගන්නෙ කොහොමද කියන එක වෙන්න ඇති, ඇය හිතෙන් සැලසුම් කරන්න ඇත්තෙ.

ඇගේ ස්වභාවය වෙනස් වුණා කියල මං කිව්වෙ ඇයි දන්නවද? මෙච්චර වෙලා තොර තෝංචියක් නැතිව ඇය කළ දෙඩවිල්ල හොඳටම අඩුවුණා. මං මොනවා හරි ප්‍රශ්නයක් ඇහුවාමත්, ඇය උවමනාවෙන් උත්තර දුන්නේ නෑ. සැකයක් නෑ. ඇගේ මොළය ක්‍රියා කරන්න ඇත්තෙ මොනවා හරි ගැටයක් ගහන්න. අපේ ගමනාන්තයත් ඉක්මනින් ළඟාවෙමින් තිබුණෙ. ඇයට ක්‍රියාත්මක වෙන්න තිබුණු කාලයත් ඉතා වේගයෙන් අඩුවුණා. මේ ශීඝ්‍රගාමී දුම්රිය ගමන් කළ වේගයෙන් එම කාලය අඩුවුණා කිව්වොත් නිවැරදියි. මට වෙලාවකට හිතුණෙ ඇයට මොකක් හරි අසනීපයක් හැදීගෙන එනවදෝ කියලත්.

ඇයට උවමනා වෙලා තිබුණු අවස්ථාව බූරුවෙක් වගේ මං ලබාදුන්නු හැටි! හැබැයි එහෙම නොවෙන්න ඇය මට පිහිපාරක් ඇනලා මාව දුම්රියෙන් බිමට තල්ලුකරල දාන්නත් ඉඩ තිබුණා. ඒ කොහොම වුණත් මගේ හිතේ ඇය ගැන කනගාටුවක් ඇතිවුණා. මේ දීර්ඝ ගමන නිසා ඇයට මහන්සි ඇති. ඒ බව ඇයට කියලා මං ඇහුවා, මා ළඟ තිබුණු බ්‍රැන්ඩි බෝතලයෙන් ඇයට බොන්නට බ්‍රැන්ඩි ස්වල්පයක් දෙන්නද කියලා.

මුලින් ඇය මට ස්තුති කරල එපා කිව්වා. ඊළඟ මොහොතේ ඇගේ දෙනෙත් දීප්තියෙන් බැබළුණා. ඇය මෙහෙම කිව්වා.

"ඔබ හිතුවා හරි. ගමන් මහන්සිය නිසා වෙන්න ඇති. මට ක්ලාන්තය හැදීගෙන එනවා වගෙයි. ඔබ මොන තරම්

කරුණාවන්තද? ඔබට කරදරයක් නැත්නම් කරුණාකරල මට බ්‍රැන්ඩි ස්වල්පයක් දෙන්න"

මගේ කුඩා බ්‍රැන්ඩි බෝතලය තිබුණේ කර වටා පටියක් දමා මං ආරක්ෂා කළ කුඩා අත් බෑගයේ. ඒක යතුරකින් වහන්න පුළුවන් කම තිබුණා. නමුත් ඒක නිතරම තිබුණෙ මගේ කරේ, මගේ ඇඟට ස්පර්ශ වෙමින් නෙ. ඒ නිසා, ඒ අත් බෑගයේ තිබෙන බඩු හොඳටම පරෙස්සම් කියන හැඟීමයි මගේ හිතේ තදින්ම තිබුණෙ. ඒක යතුරකින් අගුළු දමන්න මට නොහිතුණේ ඒ නිසයි. ඇඟිලි දෙකෙන් දෙපැත්තෙන් තද කළ ගමන් ඒක ක්ෂණයකින් විවෘත වෙනවා. මගේ දුම්රිය ටිකට්, ගමන් මාර්ග සිතියම හා අමතර මුදල් ආදිය මං තබාගත්තෙත් මේ කුඩා බෑගය ඇතුළෙ. යතුරකුත් නොමැතිව ක්ෂණිකව මේ බෑගය මං අරින හැටි, මේ ගෑනි හොඳට බලාගෙන හිටියා. ඒක එළියට නොපෙන්නුවට ඇයගෙ හිතේ මොන තරම් සතුටක් ඇතිවෙන්න ඇත්ද? දැන් තමයි ඒක මට මතක් වෙන්නෙ.

දුම්රිය පැරිසියේ ඉඳන් එද්දි අපට කඳුකර ප්‍රදේශයක් පහුකර එන්න තිබෙනවානෙ. ඒ හරියෙදි මට සෑහෙන සීතලක් දැනුණා. ඒ වෙලාවෙ මං රැගෙන ආ ලෝම කබායක් මං ඇඳගත්තා. නමුත් එම ප්‍රදේශ පහු කරල ඇවිත් දුම්රිය මැදිරිය තුළ පහන් දැල්වූවාටත් පස්සෙ තත්ත්වය වෙනස් වුණා. දුම්රිය මැදිරිය ඇතුළෙ තද උණුසුම් ගතියක් හා ඒ නිසාම ඇඟට අපහසු ගතියක් මට දැනුණා. මං තීරණය කළා ලෝම කබාය වහාම ඉවත් කරන්න. ඒක ඔළුවෙන් ගලවන්න බෑ, කර වටා පටියක් තිබුණු බෑගය ඉවත් නොකර. ඒක ඉවත් කළත් මං ඒ අත් බෑගය තියන්නෙ මගේ අතේ දුරින්. ඒ නිසා මට බය වෙන්න හේතුවක් තිබුණෙ නෑ.

ඉතින් මං බෑගය කරෙන් ගලවලා අසුන උඩ මා ළඟම තබාගෙන, මගේ ලෝම කබාය ගැලෙව්වා. ඒ මොහොතෙම දුම්රිය නැවැත්තුවේ මං කිසිසේත් නොහිතූ විදියට. ඒ ආල්ස් දුම්රියපොළේ. තරමක වේගයෙන් වේදිකාව ළඟින් ගමන් කළ දුම්රිය, නැවැත්තුවේ දුම්රියපොළේ තරමක් ඈතින්. සෙනග දුම්රියෙන් බැහැලා වේගයෙන් අනෙක් පැත්තට ඇවිද යන්න පටන් ගත්තා. ඒ වෙන කොට මං අර ලෝම කබාය ඉවත් කරලා, ඒක උඩ රාක්කයට විසි කරන්න ඕන කියලා හිතුවා විතරයි. තවත් එක් නිමේෂයකින් මගේ බෑගයේ පටිය මං මගේ කරට දමාගන්නවා.





නමුත් ඒ මොහොතේ අර ගෑනි කළේ මොකක්ද? දුම්රිය මැදිරියේ දොර ඇරලා, වේදිකාවේ ඇවිද යන මඟීන් දිහාට කෑගැහුවා.

"නැටලී නැටලී!" ඇය කෑගැහුවා. "නැටලී! මං මෙහේ! නැටලී!" ඊළඟට ඇය මං දිහා බැලුවේ හරිම කැලඹීකට පත් මුහුණෙන්.

"අනේ වෙච්ච දේ බලන්න!" ඇයට උස් හඬින් කියවුණා. "මගේ සේවිකාව නැටලී මෙතැන පහුකරගෙන අර පැත්තට ගියා. මේ ජනේලයෙන් මාව දැක්කෙ නැතුව අරහෙට ගියා. දැන් මාව හොයනවා ඇති. අනේ ගිහිල්ලා කොහොම හරි ඇයව එක්ක එන්න මහත්මයා. තව ටිකකින් දුම්රිය පිටත් වේවි. ඊට කලින්! අනේ කරුණාකර මේ උදව්ව කරන්න" ඇය කිව්වේ මගේ එක් අතකින් අල්ලා අදිමින්, අනෙක් අතින් වේගයෙන් ඇවිද ගිය සෙනග පෙන්වමින්.

ඇය එය කියූ ශබ්දෙට, ආයාචනය කළ ආකාරයට මට හැම දෙයක්ම අමතක වුණා. ඒක නිකං ආඥාවක් වගෙයි. එක් මොහොතකට මගේ සිහිය විපරීත වුණා. මං වහාම දුම්රියෙන් එළියට බැහැලා ඒ පැත්තට දුවන්න පටන් ගත්තා. ඊළඟට මිනිත්තුවක් යන්න කලින් ආපහු ආවා. ඒ ඇගේ නැටලීගේ පෙනුම මොන වගේද කියා අහගන්න.

"ඇය ඇඳගෙන ඉන්නේ කළුපාට ඇඳුමක්" අර ගෑනිය කීවේ මට දුම්රියට නගින්න බැරි විදියට දොරටුව අවහිර කරගෙන. "සම්පූර්ණ ඇඳුමම කළුපාටයි. ඉක්මන් කරන්න!"

දුම්රිය ආල්ස් දුම්රියපොළේ මිනිත්තු තුනක් නවත්වා තිබුණා. ඒ කාලය ඇතුළත මං හිතන්නේ කළු ඇඳපු තරුණියන් විසිදෙනෙකුගෙන් මං අහන්න ඇති "ඔයා නැටලිද?" කියලා. කාගෙන් හරි කුඩයකින් පහර කෑමට ලක්වුණේ නැති එක, මාව පොලිස් භටයෙකුට අල්ලා නුදුන්නු එක පුදුමයි. බොහොම වෙලාවට ඔවුන් හිතන්න ඇති මං පිස්සෙක් කියලා. දුම්රිය යළිත් පිටත් වෙන්න සූදානම් වෙද්දී, මං යන්තම් මගේ දුම්රිය මැදිරිය සොයාගෙන දොරටුවේ එල්ලුණා. අර ගෑනි නෑද. තමන්ගෙ අසුනට වෙලා ඇස් දෙකත් පියාගෙන වගේ හිටියෙ අප්‍රමාණ සන්තෝෂයකින්. ඇය මගේ අතින් ඇල්លුවේ ලොකු සෙනෙහසකින් වගේ.

"ඔයා හරිම කරුණාවන්ත කෙනෙක්" ඇය කිව්වා. "ඔයාට කරදර කරන්න වුණු එක ගැන මට හරි කණගාටුයි"

"නැටලිව කොහේ හොයන්නද? වේදිකාවේ ඇවිද ගිය ඔක්කොම ගෑනු ඇඳල හිටියේ කළුපාට නේ"

"ඒක නේන්නං. මට ඒ ගැන හරි කණගාටුයි" ඇය කිව්වේ නොනවත්වාම සිනාවෙමින්. ඇය බොහොම වේගයෙන් හුස්ම ඉහළ පහළ ගන්න පටන් ගත්තා. ඇය කොයි මොහොතෙ හරි ක්ලාන්ත වේවිද දන්නෙ නැහැ කියලයි මට හිතුණෙ.

ඇගේ ගමනේ අන්තිම පැය භාගය ගතකිරීම ඇයට බොහොම අපහසු වෙන්න ඇති. මං දැනගෙන හිටියෙ නැති වුණත්, මගේ සුරුට්ටු පසුම්බිය දැන් ඇය ළඟ. මං අන්තිම මොහොතෙ හරි මගේ බෑගය ඇරල බැලුවොත්, දියමන්ති මාලය සහිත පසුම්බිය එහි තිබුණෙ නැත්නම්, ඒක ගත්තෙ ඇය බවට මට ස්ථිරයි. ඒ මොකද ඇය දුම්රියට නගින කොටම තමයි මං ඒ මාලය මගේ බෑගය තුළ දමා ගත්තෙ. ඊට පස්සෙ කිසි කෙනෙක් දුම්රිය මැදිරියට ඇතුළුවුණෙත් නෑ. හොරකම අහුවුණොත් ඊළඟට එන මාසෙ දුම්රියපොළෙන් බහිද්දී ඇයට යන්න වෙන්නෙ හිරගෙදරට. අහුනොවුණොත් ඇය දුම්රිය පොළෙන් පිටවෙලා යන්නෙ පවුම් විසිදහසකින් ධනවත් වෙලා.

ඊළඟට ඇය මං කිසිසේත් නොහිතූ විදියකට හැසිරෙන්න පටන්ගත්තා. මහ හඬින් සිනාසෙමින් නොයෙක් දේ දොඩවන්න පටන් ගත්තා. විටෙක මට නොනවත්වාම ප්‍රශ්න ඉදිරිපත් කළේ මැෂින් තුවක්කුවකින් වෙඩි තියනවා වගේ. මං ඇයට බොන්න දුන්නු බ්‍රැන්ඩි ඇයට සැර වැඩි වෙලාවත්ද කියලා මං කල්පනා කළා. මගේ බෑගය තවමත් කර වටේ තිබූ පටිය සමඟ, මා ළඟම තිබුණා. ඒ නිසා ඒක විවෘත කර බලන්න මං උනන්දු වුණේ නෑ. කොහොම හරි අපේ දුම්රිය මාසේ දුම්රියපොළට ළඟා වෙන කොටත් මං ජීවතුන් අතර. මගෙන් සමුගැනීමට ඇය අතට අත දුන්නා. ඇගේ මුහුණට සිනාවක් නැඟුණා. එතකොට ඇගේ මූණේ තිබුණේ හොරා කාලා පැන යන හොර පූසියකගේ බැල්මක්. තම සේවිකාව වන නැටලී සොයාගත යුතු බව කියමින් ඇය පිටවී ගියා.

මේ දුම්රියපොළෙන් මං තවත් දුම්රියකට නැගිය යුතුව තිබුණා. ඒ නිස් බලා යන දුම්රියට. ඒකට තව පැය පහක් පමණ තිබුණු නිසා, මට නගරය වටේ රවුමක් ගිහින් එන්න හිතුණා. ආයෙත්





මට හිතුණා හෝටලයකට ගිහින් එහි කාමරයක් අරගෙන, එහි ආරක්ෂක සේප්පුවේ දියමන්ති මාලය තැන්පත් කරන්න.

මං හෝටලයකට ගිහින් එහි මට ලැබුණු කාමරයට වෙලා දොර වහගත්තා. අත්බෑගය මේසය උඩ තියලා විවෘත කළා. එහි මතුපිට තිබුණු දේවල් අතගාල බැලුවා. ඒත් මගේ සුරුට්ටු පසුම්බිය නම් මට අහුවුණේ නෑ. මගේ කොඳු නාරටිය සීතල වේගන ගියා. ඊළඟට මං හැමදෙයක්ම එළියට ඇද දමමින් පිස්සුවෙන් වගේ සුරුට්ටු පසුම්බිය හෙව්වා. මට එය දකින්න ලැබුණේ නෑ. මගේ ඇඟ ගිනියම් වුණා. මුළු ශරීරයෙන්ම ඩහදිය ගලන්න වුණා. මේක ඉවසීමෙන් පරීක්ෂා කළයුතු බව මටම කියාගෙන මං යළිත් බැලුවා. නමුත් දියමන්ති මාලය සහිත පසුම්බිය අතුරුදන්වෙලා!

මගේ අත් බෑගයේ තිබූ දේවල් පිරික්සමින්, මං කීප සැරයක්ම සොයා බැලුවා. නමුත් වැඩක් වුණේ නෑ. මං ඒක මගේ ඇඳුම් පෙට්ටියේ නොදැම්ම බව මට සහතිකයි. නමුත් මං ඒකත් ඇරල බැලුවා. ඒකෙ තිබුණෙත් නෑ. මං ඒක දමාගත්තේ මගේ අත් බෑගයට බව මට සහතිකයි. එහෙනම් ඒකට මොකද වුණේ? එතකොටයි මට මතක් වුණේ. ලෝම කබාය ගැලවීමට, අත්බෑගය මගේ කරෙන් එක් මොහොතකට ඉවත් කළ වෙලාවෙ, මට දුම්රියෙන් එළියට බහින්න සිදුවුණා නේ. ඇගේ සේවිකාව "නැටලී" සොයන්න කියලා ඇය මාව පිටත් කර හැරියේ මේකට තමයි. අනේ මං වගේ මෝඩයෙක්! මට පිස්සු හැදුණෙ නැතුව විතරයි.

මං වහාම පහළට දුවගෙන ගිහිං කුලීරියක් කැඳවා ගත්තා. මං ගියේ ප්‍රංශයේ සුරෙටි පොලීසියේ කාර්යාලයට. එතැන හිටි සුළු මුලාදෑනියෙක් මාව ගණනකටවත් ගත්තෙ නෑ. ඔහු කළේ පොතක් අරගෙන මගේ පැමිණිල්ල ලියා ගැනීම. මට සිදුවුණා ඔහුට ටිකක් සැරෙන් කථා කරන්න. මං ඔහුට කිව්වා මං බ්‍රිතාන්‍ය මහ රැජිනගේ පණිවුඩකරුවෙකු බව. ඊට පස්සේ තමයි ඔහු මං කියන දේට කන් දුන්නේ. නමුත් දියමන්ති මාලය සොයා ගැනීමට ඔවුන් කිසිම පියවරක් අරගන්න පාටක් නෑ. බැරිම තැන තමයි මම මයික්‍රොෆ්ට් හෝම්ස් මහත්මයාට දන්වලා ඇරියෙ. මෙතැනින් එහාට කරන්න ඕන මොකක්ද කියන එක මට තේරෙන්නෙ නෑ" මෝටිමර් මේබර්ලි මහතා කතාව අවසන් කළා.

වොට්සන්. මේ කතාව ඇහුවම ඔබට පෙනෙනවා ඇති; මට තවත් කරන්න දෙයක් ඉතිරිවෙලා තිබුණෙ නෑ. ඔහු කියන ගැති

නොම්මර එකේ හෙරක් බව පැහැදිලියි. ඉතාම සූක්ෂම විදියට දියමන්ති මාලය ඔහුගෙන් පැහැර ගන්න ඇය සැලසුම් කරලා. ඒක ඇහුවාම මටත් පුදුමයි. ඒක ලබාගත් වහාම ඇය ප්‍රංශයෙන් පිටවී යන්න ඇති. ඇයට රැකවරණය සැලසෙන රටකට ගිහිං හැංගිලා ඇති. මේ ගැන තවත් කාලය නාස්ති කිරීමෙන් වැඩක් නොවෙන බවයි මට සිතුණේ. නමුත් ලන්ඩනයේ ඉඳලා විශේෂයෙන්ම ගමනක් පැරිසියට ආව එකේ, ඔහුගෙන් ප්‍රශ්න කිහිපයක් ඇසීමට මට හිතුණා.

"මේබර්ලි මහත්මයා. ඔබ හැම තැනක්ම සෝදිසි කළා නේ. මාලය මෙතැන නැතිබව ඔබට හොඳටම විශ්වාසයිද?"

"ඔව් මහත්මයා. හොඳටම විශ්වාසයි."

"එහෙනම් ඔබේ ඇඳුම් මලු ආදී සියලුම භාණ්ඩ මමත් පරීක්ෂා කර බැලුවට කමක් නැද්ද?"

"එක සැරයක් නෙමෙයි හෝම්ස් මහත්මයා. කීප සැරයක් පරීක්ෂා කර බලන්න. නමුත් අර කට්ට කෙරාටික ගැහැනිය පැනල ගියේ හිස් අතින් කියල මං හිතන්නෙ නෑ"

"මේබර්ලි මහත්මයා" මං කිව්වා. "ඔබ කියූ විස්තරයේ හැටියට සියයට අනූනවයක්ම ඉඩ තිබෙන්නෙ මාලය ඇයගේ ග්‍රහණයේ වීමටයි. එය ඔබ ළඟ තවමත් තිබෙන්න සියයට එකක ඉඩක්වත් නෑ. ඒ වුණත් මං පරීක්ෂණ සිදුකරන ක්‍රම තිබෙනවා. එම පරීක්ෂණවල එකම අවස්ථාවක්වත් මගහැර යාමට මං කැමති නෑ. ඒ නිසා තවදුරටත් පරීක්ෂා කර බලන්නම්. ඔබට කැමති නම් එය බලාගෙන නිශ්ශබ්දව ඉන්න"

මං සෝදිසිය පටන්ගත්තේ ඔහුගේ ඇඳුම් පෙට්ටියෙන්. එහි තිබී කිසිවක් හමුවුණේ නෑ. මීළඟට මං ඔහු කරේ දමාගෙන යනවා කියූ අත් බෑගය පරීක්ෂා කළා. එහි තිබූ බඩු සියල්ල මේසය මතට හළා එකින් එක බැලුවත් මාලයක් තබා එවැන්නක කැබැල්ලක් වත් මට හමුවුණේ නෑ.

බලාපොරොත්තු කඩවුණු හැඟීම, මගේ මුහුණෙත් පැවසෙන්න ඇති. මෝටිමර් මේබර්ලිගේ මුහුණ සුදුමැලි වුණේ මා බලා ඉඳිද්දිමයි. තව මොහොතකින් ඔහු ක්ලාන්ත වී බිම ඇද වැටෙනවා නිසැකයි කියා මට හිතුණා. ඔහුට බ්‍රැන්ඩි වීදුරුවක් දෙන්න මට උවමනා වුණා. නමුත් එවැනි කිසිවක් කාමරයේ තිබුණේ නැහැ.





ඔහු ගැන අමතක කර මගේ සෙවීම අවසන් කරන්න මං තීරණය කළා.

මේබර්ලි මහත්මයා ගමනේදී ඇඳගෙන ආ කලිසම, කබාය, ඇතුළු කබාය හා කමීසය, කාමරයේ කෙළවරක වූ හාන්සි පුටුවක් මත දමා තිබුණා. ඊට අමතරව ඔහු සඳහන් කළ ලෝම කබායත් ඇඳ සහ බිත්තිය අතර බිම වැටී තිබුණා. ඔහුගේ කලිසම් හා කබා සාක්කුවල වැදගත් යමක් තිබුණේ නැහැ. ඇතුළු කබායේ සාක්කුවල කුඩා යතුරු කිහිපයක්, මුදල් නෝට්ටු සහිත කුඩා මුදල් පසුම්බියක් මෙන්ම මාරුකාසි කිහිපයක් තිබුණා. තවත් කොහේ හොයන්නද?

මා විසින් මීළඟට කළ යුතුව තිබුණේ සීනුව නාද කර හෝටලයේ සේවකයෙකු කැඳවීමටයි. එවිට ඔහු ලවා බ්‍රැන්ඩි ස්වල්පයක් ගෙන්වා ගෙන මේබර්ලිට පෙවිය හැකි බව මට කල්පනා වුණා.

හෝටල් සේවකයා ගෙන්වා ගැනීමට සීනුව නාද කිරීමට ගිය මට බාධකයක් වුණේ, බිම වැටී තිබූ මේබර්ලිගේ ලෝම කබාය. මං ඒක අතට ගත්තේ ඉවතට දැමීමේ අදහසින්. එම කබායේ ඇතුළු පැත්තේ සාක්කුවක් ඇති බව මට දකින්න ලැබුණා. මං එය ඔබා බැලුවේ විශේෂ හේතුවක් ඇතුව නොවෙයි. නමුත් එය එබීමට නොහැකි අයුරින් යම් දෙයකින් පිරී ඇති බව මං තේරුම් ගත්තා. සාක්කුව වැසීමට තිබූ බොත්තම් දෙක ඇර, මම ඒ තුළට ඇඟිලි දෙකක් දැම්මා. මට අහුවුණේ මොකක්ද? දෙපැත්තම ගෙවී ගිය අබලන් වූ සුරුට්ටු පසුම්බියක්. මං වහාම එය විවෘත කර බැලුවා. මට දකින්න ලැබුණේ මා මීට පෙර කවදාවත් දැක නොතිබුණු ආකාරයේ අලංකාර මාලයක්. අපේ මහ රැජින සාර් රැජිනිය වෙත යැවූ තෑග්ග මෙය බව තේරුම් ගැනීම මට අමාරු වුණේ නැහැ.

සිහි විසඥ වෙලා හිටි මේබර්ලිගේ මුහුණට මං ඒ මාලය ළං කළා. ඔහු දෙනෙත් ඇර ඒ දිහා බැලුවේ මවිතයෙන්. ඊළඟට ඔහු එක්වරම සිටි තැනින් උඩ පැන්නා. ඒ මහ හඬින් යමක් කියා කෑ ගසමින්. සතුට දරාගන්න බැරුව කෑගැසූ ඔහු, ඊළඟ මොහොතේ සිහි විසඥ වුණා. හෝටලයේ කළමනාකරු දැනුම්වත් කරලා මේබර්ලිට වෛද්‍ය ප්‍රතිකාර ලබාදෙන්න මං කටයුතු කළා.

වෙරී මේරියන් කුමරිය නම් රුසියානු ඔත්තුකාරිය සොරා ගත්තේ යයි සැක කළ දියමන්ති මාලය මට හමුවුණේ ඒ විදියටයි.

මේක කොහොමද ඔහුගේ ලෝම කබායේ ඇතුළු සාක්කුවට ගියේ? ඒකට පිළිතුරක් මේබර්ලි දැන හිටියේ නැහැ. මාලය ආරක්ෂා කර ගැනීම තමන්ගේ එකම වගකීම බව, ඔහුට මතක තිබුණා නේ. ඉතින් අඩ සිහියෙන් වගේ ඔහු මාලය සහිත පසුම්බිය, ලෝම කබායේ සාක්කුවට ඔබා තිබෙනවා. නමුත් ඒ බව ඔහුගේ මතකයේ කොහොමටවත් සටහන් වෙලා නෑ.

මේබර්ලිගේ සුරුට්ටු සහිත අලුත් පසුම්බිය මංකොල්ල කාගෙන ගිය චෙරි මේරියන් කුමරියට සිදුවුණේ මොකද්ද කියා මට සොයාගන්න බැරිවුණා. ඇයට පොළොව පලාගෙන යන්න හිතෙන්න ඇති. බ්‍රිතාන්‍ය මහ රැජින වෙනුවෙන් මා කළ සේවයට මට ත්‍යාග මුදලක් ලැබුණා. ඒකට මැදිහත් වුණේ මයික්‍රොෆ්ට් බව රහසක් නෙමෙයි.

මේ පරීක්ෂණය ගැන ඒ කාලයේ මං ඔබට නොකීවේ හේතු කිහිපයක් නිසා. එයින් එකක් තමයි මේ කතන්දරය ප්‍රසිද්ධ වුණොත් එයින් මේබර්ලිගේ කීර්ති නාමයට සිදුවිය හැකි හානිය. අතික නැති වූ මාලය සොයා ගැනීම මගේ දක්ෂකමින් කළ දෙයක් නෙමෙයි. ඒක හමුවුණේ අහම්බෙන්. මගේ නිරීක්ෂණ, නිගමන, තර්කානුකූල උපකල්පන ආදී කිසිවක් උවමනා වුණේ නැහැ. ඔබේ පාඨකයන් ගේ විනෝදය සඳහා මිසක්, රහස් පරීක්ෂණ විධි ඉගෙන ගන්නා කෙනෙකුට මේකෙන් ප්‍රයෝජනයක් නැහැ. අතික ඔබේ පාඨකයන් කියාවි, දොස්තර වොට්සන් මේ කථා ඉදිරිපත් කරලා ඔහුගේ පාඨකන් නොමග යවනවා කියල. කොහොම වුණත් මේ කතන්දරය ලියලා ඊටපසු ඒක ඔබේ ට්‍රන්ක පෙට්ටියේ තැන්පත් කරන්න"



## අද්භූත ආගන්තුකයා

"වොට්සන්. අද දීප්තිමත්ව හිරු පායන දවසක්. ඔබ කැමති නැද්ද දවල් කෑමෙන් පස්සෙ රීජන්ට් උද්‍යානය පැත්තෙ ඇවිදල එන්න?" මගේ මිත්‍රයා විමසුවේය. ඔහු එවැන්නක් කීවේ උදේ වරුවම පුවත්පත් කියවමින් කාලය ගතකිරීම නිසා, අප දෙදෙනාටම කම්මැලි ගතියක් ඇති තිබුණු නිසා විය යුතුය.

"හවස තේ පානයෙන් පස්සෙ යමු." මම කීවෙමි. "එතකොට ටිකක් හැන්දෑවෙන තුරු ඇවිදලා එන්න පුළුවනි."

හැන්දෑකාලය ඒ අයුරින් ගත කිරීමට සැලසුම් කර ගත්තද එය වෙනස් කිරීමට සිදුවූයේ අනපේක්ෂිත අයුරෙනි. හෝම්ස් හමුවීමට අමුත්තෙකු පැමිණ සිටිතැයි හඩ්සන් මහත්මිය දැනුම් දුන්නාය.

"ඔහුව උඩුමහලට එවන්න හඩ්සන් මහත්මිය" එම වචන හෝම්ස්ගේ මුවෙන් පිටවී ගතවන්නට ඇත්තේ මිනිත්තුවකට අඩු කාලයකි. කිසිවෙකු වේගයෙන් පියගැට පෙළ නැග උඩුමහලට එන ශබ්දය අපට අසන්නට ලැබිණි. හති දමමින් ආ මේ ආගන්තුකයා තරුණයෙකු බැව් අපි දුටුවෙමු. නගරයේ කාර්යාලයක සේවය කරන වැදගතෙකුගේ සම්පූර්ණ ඇඳුමෙන් ඔහු සැරසී සිටියේය. එහෙත් ඔහුගේ අතේ තිබූ හිස්වැස්ම තැළී පොඩිවී තිබිණි. මඳ වේලාවකට පෙර අනතුරකට මුහුණ දුන් අයෙකුගේ ලක්ෂණ ද ඔහු වෙතින් දිස්විය. එක් ඇසකට යටින් මුහුණට එල්ල වූ පහරක් නිසා එතැන කළු වී තිබූ අතර, මුහුණේ එක් තැනක ලේ තැවරී තිබිණි.

"මේ විදියට කඩා වැදීම ගැන මට සමාවෙන්න මහත්වරුනි" ඔහු කීය. "මං ඉන්නේ ලොකු හදිසි තත්ත්වයකට මුහුණ දීලා. ඒක මොන තරම් බරපතළ එකක්ද කියන එක ඔබට හිතාගන්නවත් බෑ."

"මහත්මයා" හෝම්ස් කීය. "ඔබ යම්කිසි අවාසනාවන්ත සිදුවීමකට මුහුණ දී ඇති බව අපට හිතාගන්න පුළුවනි. කරුණාකර මේ අසුනේ හිඳගන්න. ඊට පස්සේ ඔබේ ප්‍රශ්නය මොකක්ද

කියන්න. ඔබට උදව් කිරීමට මට හැකිවෙන්නේ මොන ආකාරයටද කියා අපි බලමු"

"මහත්වරුනි. මගේ නම මයිකල් ටේලර්. මං පදිංචිව ඉන්නේ උතුරු ක්ලැප්හැම් ප්‍රදේශයේ සමසෙට් උද්‍යානයේ. පසුගිය සති හයක කාලය අපි බොහොම සන්තෝෂයෙන් මේ ප්‍රදේශයේ ජීවත්වුණා. අද උදේ සුපුරුදු ලෙස මං මගේ රැකියාවට ගියා. ඒ අතරෙ හොරු බොහොම ක්‍රියාශීලී වෙලා. මං හවස ආපහු එනකොට, හොරු මගේ ගෙදර සම්පූර්ණයෙන්ම හොරකම් කරගෙන ගිහින්!"

"මොකක්?" මට මෙන්ම හෝම්ස්ටද එක්වරම කෑගැසිණ.

"ඒක තමයි" අමුත්තා කීය. "ඔබටත් පෙනෙනවා නේද? මෙහෙම දෙයක් ඇති මිනිසෙකුව පිස්සු වට්ටනන"

"මේක ඔබට වුණු වැරැදීමක් වෙන්න ඇති" මම කීවෙමි. "ලන්ඩනයේ හරස් පාරවල් හුඟක් ඒවා බොහොම දුරට එක වගෙයි. ඒ පාරවල් දෙපැත්තේ තිබෙන ගෙවලුත් එහෙමයි. ඔබ වැරැදීමකින් වෙනත් වීදියකට ගියා වෙන්න බැරිද?"

"කොහොමටවත් නෑ!" ටේලර් කීය. "මං මෙහේ පදිංචිව හිටියේ සති හයක කාලයක් බව ඇත්තයි. නමුත් ඒ පැත්ත මට හොඳට පුරුදුයි. සමසෙට් උද්‍යානය අඳුනාගන්න බැරිකමක් මට කොහොමටවත් නෑ. ඒ නැතත් විවෘතව තිබුණු ජනේලයෙන් මං දුටුවා, මගේ ලී බඩු තවමත් ඒ ගෙදර තිබෙන බව"

"ඒ කියන්නෙ මුළු නිවස පිටින්ම අතුරුදන් වෙලා නැහැ?" හෝම්ස් ඇසීය. "නමුත් දැන් ඒකෙ ඉන්නෙ වෙනත් පදිංචිකාරයන්?"

"අන්න හරියට හරි"

"එහෙම නම් මෙහෙම දෙයක් වෙන්න බැරිද?" හෝම්ස් ඇසීය. "ඔබ නිවස කුලියට ගෙන තිබෙන කාලය ගැන යම් වැරැදි වැටහීමක් ඇතිවෙලා; නිවස අයිතිකරුවන් එහි යතුරු අලුත් පිරිසකට භාරදීලා? ටේලර් මහත්මයා. මං ඔබට කියන්නේ මේ ගැන නිවස අයිතිකාරයා හමු වී කතාබහ කර බලන්න කියලයි"

"නෑ! නෑ! නෑ!" අසුනෙන් නැගී සිටි ටේලර් දැත් ඔසවා කෑගැසීය.

"මහත්මයා. මං කියන දේ ඔබට තේරෙන්නෙ නෑ. නාඳුනන මනුස්සයින් පිරිසක් තමයි දැන් ඒ ගෙදර ඉන්නෙ. ඒ අද උදේ එහි





පදිංචියට ආව පිරිසක් වගේ නෙමෙයි. එයාල ඉන්නෙ ඒ ගෙදර අවුරුදු විස්සක තිහක ඉඳන් පදිංචිවෙලා හිටි එහි අයිතිකාරයින් වගෙයි. ඒක අමතක කරමු. අද උදේ වෙන තුරු මේ ගෙදර ජීවත් වුණු මගේ බිරිඳටයි සේවිකාවන්ටයි මොකද වුණේ? ඔවුන් කොහේටද වාෂ්ප වුණේ?"

"ඔබේ ගෙදර බලෙන් පදිංචියට ඇවිත් ඉන්නේ මොන වගේ පිරිසක්ද?" හෝම්ස් විමසුවේය. "මංකොල්ලකාරයින් හෝ වණ්ඩින් වගේ අයද? නැත්නම් යාචකයන් වගේ පිරිසක්ද?"

"ඔය දෙවර්ගයම නෙමෙයි මහත්මයා" ටේලර් කීවේ යළිත් අසුනේ හිඳගනිමිනි. "මට පෙනුණේ ඔවුන් ඉතාම වැදගතුන් වගෙයි. ඒකනේ පුදුමය! මගේ ළඟ තිබුණු යතුරෙන් මට බැරිවුණා දොර ඇරගන්න. එතකොට මං මගේ ගෙදර දොරට තට්ටු කෑවා. එතකොට ආවා තරුණ වැඩකාර කෙල්ලක්. මේ මගේ ගෙදර බවට ඒ කෙල්ල එක්ක මං තර්ක විතර්ක සණ්ඩු සරුවල් වුණා. එතකොට ආව නේද ගෙදර නෝනා. මේ ගෙදර මගේ ගේ බවට මං ඇයට තදින්ම කිව්වා. ඇයත් මා එක්ක හරි-හරියට උත්තර දුන්නා. ඒ වුණත් කොයි වෙලාවක වත් ඇගේ වැදගත් ආචාරශීලී බවේ වෙනසක් වුණේ නැහැ"

"මේ ගැන පොලිස් භටයෙකු කැඳවා ඔහුට දැනුම් දෙන්න ඔබ හිතුවේ නැද්ද?"

"ඒ වැඩේ මට කරන්න උවමනා වුණේ නැහැ හෝම්ස් මහත්මයා. ඒ මොකද මගේ ගෙදර හිටී අර වැදගත් නෝනා, පාරේ හිටි පොලිස් භටයෙකු කැඳෙව්වා. මොකක්ද දන්නවද ඔහු කිව්වේ? මං වහාම එතැනින් පිටවී නොගියොත්, මාව අත් අඩංගුවට ගෙන පොලිස් හිර කූඩුවට ගෙනිහින් දමන බවට මට තර්ජනය කළා!"

"එතකොට ඔබේ අසල්වැසියන්? ඔබ ගැන සහතික වෙන්න ඔවුනට වත් බැරිවුණාද?"

"අපි සමසෙට් උද්‍යානයේ පදිංචියට ආවා තමයි. නමුත් මගේ අසල්වැසියන් හමුවෙන්න යන්න මට වෙලාවක් තිබුණෙ නෑ. ඒ මොකද කාර්යාලයේ වැඩ කටයුතු අධික වීම නිසා, මං ගෙදර එනකොට හුඟක් රෑ වෙනවා. මගේ බිරිඳට නම් දෙතුන් දෙනෙකු හමු වී තිබුණා. ඇය කිව්වේ ඔවුන් ඉතාම යහපත් අය බවයි....... ඒ වුණත්......... ඒ වුණත් දැන් ඉතින් ඒකෙන් ඇති වැඩේ මොකක්ද? දෙවියනේ! මගේ ජෙනීට මොකද වුණේ?"

අපේ අමුත්තා - මයිකල් ටේලර් මහතා ඉකිගසමින් හඬා වැලපෙන්නට පටන් ගත්තේය.

අමුත්තාට බීමට යමක් දී, අපේ කතාබහ අලුතෙන් පටන්ගත යුතු බවට හෝම්ස් මට සංඥා කළේය. ඒ අනුව මම පහළ තට්ටුව වෙත ගොස් කෝපි පෝච්චියක් අප වෙත එවන මෙන් හඩ්සන් මහත්මියට ඇනුම් දුන්නෙමි. මඳ වේලාවක් ගතවෙද්දී ඇය ඒ ඉල්ලීම ඉටුකළාය.

උණුසුම් කෝපි පානය කළ පසු, අපේ අමුත්තා තරමක් සන්සුන් තත්ත්වයකට පත්වුණු බැව් අපි දුටුවෙමු. හෝම්ස් අමුත්තා ඇමතුවේ එවිටය.

"ටේලර් මහත්මයා. ඔබට අපේ උදව් උවමනා බවට සැකයක් නෑ. නමුත් මේ ප්‍රශ්නය මුල ඉඳලම තේරුම් නොගෙන, ඒකට මැදිහත්වීම අපට අපහසුයි. ඒ නිසා කරුණාකරල හැමදෙයක්ම මුල ඉඳලම කියන්න"

"ඇත්තෙන්ම ඔව්. මං හැමදෙයක්ම කියන්නම්." ටේලර් කිය. "මාත් මගේ බිරිඳත් මේ ලන්ඩනයේ අය නොවෙයි. අපි නෝත්හැම්ටන්ෂයරයේ අය. අවුරුදු පහකට කලින් මට රක්ෂාවක් ලැබුණා, පෲඩෙන්ෂල් ඇෂුවරන්ස් රක්ෂණ සමාගමේ. ඒ ගිනි හා හදිසි අනතුරු අංශයේ. මට රැකියාව ලැබුණේ මේ සමාගමේ නෝත්හැම්ටන් ශාඛාවේ.

තුන්මාසයකට කලින් මට රැකියාවේ උසස්වීමක් ලැබුණා. මගේ යහපත් සේවය ගැන සලකලා, ඔවුන් මට උසස්වීමක් දුන්නා. නමුත් ඒ තනතුර බාරගැනීමට පෲඩෙන්ෂල් සමාගමේ ලන්ඩනයේ පිහිටි ප්‍රධාන කාර්යාලයට එන්න සිදුවුණා. මුලින් මං විතරක් ඇවිත් හෝටලයක නැවතුණා. ඊළඟට මගේ බිරිඳත් ආවා. ඊට පස්සේ අපි දෙන්නා කුලියට ගැනීමට සුදුසු නිවසක්, ලන්ඩන් නගරය පුරාම හෙව්වා. ගෙවල් කීපයක්ම පරීක්ෂා කරල බැලුවත්, ඒ එකක් වත් අපේ හිත්වලට හරිගියේ නෑ. අන්තිමට තමයි මේ කියන සමසෙට් උද්‍යානයේ අංක 14 නිවස අපට හමුවුණේ. ඒකෙ කුලියත් සාධාරණයි. තිබෙන තැනත් පහසුයි. ඒ නිසා මීට මාස එකහමාරකට කලින් අපි ඒ ගෙදර පදිංචියට ආවා.

මෙතැන මට ලොකු පහසුවක් වුණේ මෙකයි. ක්ලැප්හැම් මංසන්ධිය දුම්රියපොළට මේ ගෙදර සිට පයින් යන දුර. එතැනින් ලන්ඩන්බ්‍රිජ් වෙත යන එන දුම්රිය උදේ හවස අල්ලාගන්න මට





පහසුවෙන් හැකිවුණා. කාර්යාලයේ අලුත් තනතුරකට ආව නිසා, මා ඉගෙන ගතයුතු වැඩ රාශියක් තිබුණා. ඉතින් මා ගෙදර ආවේ හුඟක් රෑ වෙලා. ඒ නිසයි මගේ අසල්වැසියන් හඳුනාගන්නවත් මට වෙලාවක් නොලැබුණේ.

ගිය සඳුදා අපේ කාර්යාලයේ මගේ සමීපතම ප්‍රධානියා-හේඩ්න් මහතා, එක් වැදගත් කාරණාවක් මට ඇනුම් දුන්නා. ඒ තමයි අපේ තරඟකරුවන් අභිභවා රක්ෂණ ක්ෂේත්‍රයේ ඉදිරියට යාමට, සමාගම ගෙන ඇති අලුත් තීරණයන් ගැන. උතුරේ තිබෙන අපේ ප්‍රධාන කාර්යාලය තිබෙන්නේ මැංචෙස්ටර් නගරයේ. අපේ අලුත් තීරණ හා ප්‍රතිපත්ති ගැන ඔවුනට පැහැදිලි කර දීමට මැංචෙස්ටර් වෙත යැවීමට, ඔවුන් තෝරගෙන තිබුණේ මාව. සති අන්තයේ එහි යාමට කැමතිද කියලා හේඩ්න් මහතා මගෙන් ඇහුවා. එවැනි කටයුත්තකට මා තෝරා ගැනීම මට ලොකු ගෞරවයක්. ඉතින් මං ඊට එකඟවුණේ ලොකු සතුටකින්.

ඉතින් මා එහි යා යුතු පිළිවෙළ හේඩ්න් මහතා මට කිව්වා. දිවා ආහාරයෙන් පසු මං කාර්යාලයෙන් පිටවී යායුතු බවටත්, අපර භාගයේ දුම්රියෙන් යූස්ටන් සිට මැංචෙස්ටර් බලා පිටත්වී යායුතු බවත් ඔහු කිව්වා. මැංචෙස්ටර් කාර්යාලයේ ප්‍රධානියා වන වික්ර්ස් මහතා මා පිළිගැනීමට එම දුම්රිය ස්ථානයට එන බවත් ඔහු කිව්වා. දින දෙකක් මැංචෙස්ටර්හි නැවතී සිට එන මට, ඊළඟ දිනයේ පඩි සහිත නිවාඩුවකුත් අනුමත වී තිබුණා. ඉතින් මේ දිනය එනතුරු සතිය පුරාම මං බලාගෙන හිටියේ නොඉවසිල්ලෙන්.

මැංචෙස්ටර් බලා යෑම සඳහා කාර්යාලයෙන් මා පිටවන්න පැය භාගයකට කලින්, විදුලි පුවතක් අපට ලැබුණා. ඒකෙ සඳහන් වුණේ වික්ර්ස් මහතා සහ කාර්යාලයේ කිහිප දෙනෙකුම පැපොල රෝගයට ගොදුරු වී ඇති නිසා, පැවැත්වීමට බලාපොරොත්තු වුණු වැඩ සටහන අවලංගු කිරීමට සිදුවන බවයි. ඉතින් මගේ සිතේ ඇතිවුණු බලාපොරොත්තු කඩවීම ඔබට තේරුම් ගන්න පුළුවන්ද? ඒ අනුව සාමාන්‍යයෙන් වෙනදා ගෙදර යන වෙලාවට කාර්යාලයෙන් පිටවෙලා, සාමාන්‍යයෙන් ගෙදර යන දුම්රියෙන් ගෙදර යෑම හැර මට වෙනත් විකල්පයක් තිබුණේ නෑ"

"ඔබ ඒ බව ඔබේ බිරිඳට විදුලි පුවතකින් දැන්නුවද?" හෝම්ස් ඇසුවේ කථාවට බාධා කරමිනි. "මැංචෙස්ටර් ගමන අවලංගු වුණු

බවත් ඔබ සාමාන්‍යයෙන් වෙනදා එන වෙලාවට ගෙදර එන බවත් ඔබ දැනුම් දුන්නද?"

"එහෙම කිරීමේ අවශ්‍යතාවයක් තිබුණෙ නෑ මහත්මයා" වේලර් කීය. "හවසට ගෙදර නොඑන බව කියා ගිය මා දුටුවාම, මගේ බිරිඳ පුදුමයට පත්වෙන බව ඇත්තයි. නමුත් ඒකෙන් ඇය සතුටට පත්වෙන බවත් මට විශ්වාසයි. ඊළඟට මා එක්තරා අසාමාන්‍ය සිදුවීමකටත් මුහුණ දුන් බව ඔබට කිවයුතුයි.

ක්ලැප්හැම් සිට ලන්ඩන්බ්‍රිජ් දක්වා මා යන එන දුම්රියේ ගමන් කරන ඩොනාකි නම් පුද්ගලයකු, සති දෙක තුනකට පෙර මට අඳුනාගන්න ලැබුණා. ඔහු කුමන ආයතනයක කුමන රැකියාවක යෙදෙන්නෙකුද කියා මං දන්නෙ නෑ. නමුත් එකම දුම්රියක උදේ හවස යන එන නිසාත්, පාපන්දු රසිකයන් නිසාත්, අප දෙදෙනා අතර කුළුපගභාවයක් ඇතිවුණා. ආපසු ගෙදර යන අතරේ ඔහු සමග බීර වීදුරුවක් පානය කරමින්, පැය භාගයක් ගත කරන්න එන මෙන් අද ඔහු මට ඇරයුම් කළා. මේක සාමාන්‍යයෙන් කෙරෙන දෙයක් නෙමෙයි. මැංචෙස්ටර් ගමනත් අවලංගු වුණු නිසා මං හිටියේ ටිකක් කලකිරීමෙන්. ඉතින් ඔහුගේ ආරාධනයට මං එක්වරම එකඟවුණා.

මගේ මිත්‍රයා මාව කැඳවාගෙන ගියේ ක්ලැප්හැම් මංසන්ධිය ළඟම තිබෙන අවන්හලකට. අපි දෙන්නා බීර වීදුරු දෙකක් පුරවාගෙන මේසයක් වෙත යන්න හැදුවා පමණයි. එක්වරම උස මහත මිනිහෙක් වලිප්පුව හැදිලා වගේ වෙව්ලා ගිහින්, මා සිටි පැත්තට ඇද වැටුණා. ඔහුගේ එක අතක් මගේ බීර වීදුරුවේ වැදිලා බීර ටික ඔක්කෝම මගේ කබායේ හා කලිසමේ වැටුණා. අනෙක ඔහුගේ වැළමිට වැදුණෙ මගේ මුහුණේ ඇසට යටින්. ඒ පාරට මට දැනුණේ, මගේ ඇස ඇස් කුහරයෙන් එළියට පැන්නා වගෙයි. ඔහුට උදව් කරන්න මාත් මගේ මිත්‍රයාත් උත්සාහ කළා. ඔහුගේ නියපොත්තක් මගේ මුහුණේ වැදී ලේ ගලන්න පටන්ගත්තා. ඒ මදිවට මගේ බිම වැටුණු තොප්පිය මං හරිහැටි නොදැක, මගේ පයටම පෑගුණා. මං සණ්ඩුවකට සම්බන්ධ නොවී, මෙහෙම දෙයක් සිදුවුණා කිව්වාම කෙනෙකු විශ්වාස කරන එකකුත් නෑ. තවදුරටත් බීර බොමින් එතැන කාලය ගත කරන්න මගේ කැමැත්තක් තිබුණේ නෑ. දැන් මගේ බාහිර පෙනුම ඉතා අලංකාර





එකක් නොවෙන බව මං දැන හිටියා. ඉතින් මට උවමනා වුණේ අසල්වාසීන්ට නොපෙනෙන විදියට ඉක්මනට ගෙදර එන්න.

වාසනාවකට වගේ එතරම් පිරිසක් සමසෙට් උද්‍යානයේ අපේ ගේ ඉදිරිපිට හිටියේ නෑ. ඉස්සරහ දොරේ යතුර මගදීම මං සූදානම් කරගෙනයි ආවේ. ඒ ඉක්මනට දොර ඇරගන්න.

නමුත් දොරේ අගුළ තුළට නිවැරදිව යතුර දමා කරකැව්වත් මගේ ගෙදර ඉදිරි දොර විවෘත වුණේ නෑ. මං පත්වුණේ අතිශය පුදුමයකට. යතුර එළියට අරගෙන මේ නිවැරදි යතුරද කියලා යළිත් වරක් මං පරීක්ෂා කර බැලුවා. මට වැරදීමක් වෙලා නෑ. යතුර හරි. මං ආයෙම සැරයක් යතුර දාලා කරකැව්වා. ඒත් අගුළ ඇරුණෙ නෑ. මං කිහිපවාරයක්ම නොනවත්වා දොරට ගැහුවා. මට එක්වරම හිතුණේ මේ අපේ සේවිකාවකගේ නොසැලකිලිමත් කමින් සිදුවූ දෙයක් කියලයි. ගේ ඉදිරිපිට පාරේ සිටි අයත් බලාගෙන හිටියා. ඉතින් මම යළිත් වරක් දොරට තඩිබෑවේ කේන්තියෙන්.

අන්තිමේදී දොර විවෘත වුණා. ඒ මිනිත්තු හත අටකට පස්සේ විය යුතුයි. මට නම් දැනුණේ පැයක් විතර ගතවුණා කියලයි. දොර විවෘත කළේ කවුද? මං ජීවිතේටම දැකල නැති තරුණ ගැහැනු ළමයකු විසින්. ඇය ගෘහ සේවිකාවකගේ නිල ඇඳුමකින් සැරසී සිටියා. ඇය දොර සම්පූර්ණයෙන්ම විවෘත කළේ නෑ. දොර ඇතුළෙන් තිබූ ආරක්ෂක දම්වැල දමාගෙන, ඇය දොර විවෘත කළේ අඟල් කිහිපයක් පමණයි. ඇයගේ මුහුණෙන් දිස්වුණේ කෝපාවිෂ්ඨ බැල්මක්.

"මොනවා?" මට කෑගැසුණා. "ඔහේ කවුද?"

"මගෙන් එහෙම අහන්න ඔහේ කවුද?" ඇය ඇසුවේ කිසිම ආචාරශීලී බවක් නැතුව.

"මොකක්ද ඒ කතාවෙ තේරුම? මොකද මේ මහ දවාලෙ දොරේ දම්වැල දමලා?"

"ඔහේල වගේ කරදර කාරයින්ගෙන් බේරිල ඉන්න" ඇය කිව්වා.

"ඒක යක්ෂ කතාවක් නේ!" මට කෑගැසුණා. "මේ මගේ ගෙදර!"

"මේක ඔහේගෙ ගෙදර? පිස්සුද?" ඇය ඇහුවේ උපහාසයෙන් හිනාවෙමින්. "ඊළඟට කියාවි ඔහේ ජපන් රටේ රජ්ජුරුවෝ කියලා.

වැදගත් මිනිසුන්ට පාඩුවේ ඉන්න දීලා යනව යන්න මෙතැනින්!" ඇය කඩා පැන්නා.

සම්පූර්ණයෙන්ම නාඳුනන අය මගේ ගෙදර අයිති කරගෙන, මේ විදියට කථාකළ එකෙන්, මාව තරමෙහත් වෙව්ළන්න ගත්තා. මීළඟට කළ යුත්තේ කුමක්ද කියා මට හිතාගන්න බැරිවුණා. ඊළඟට ගේ ඇතුළෙන් වැඩිහිටි ගැහැනු කෙනෙකු කථා කරන ශබ්දය ඇහුණා.

"මොනවද ඔය පැත්තෙන් ඇහෙන කෑගැහිල්ල? මොනවද ඔහේ සිද්ධ වෙන්නෙ?"

"නෝනා, මහා රස්තියාදුකාර තක්කඩි පෙනුමක් තියෙන මිනිහෙක් මේ දොර ළඟට ඇවිත්. එයා උත්සාහ කරන්නේ දොර කඩාගෙන ගෙට ඇතුළු වෙන්න" සේවිකාව කිව්වා.

එතකොටම ගෙදර නෝනා කියූ තැනැත්තිය එතැනට ආවා. සේවිකාවගේ මුහුණට ඉහළින්, නෝනාගේ මුහුණ මට දකින්න ලැබුණා. ඇය අවුරුදු තිස් පහක හෝ ඊට මඳක් වැඩි වයසේ කෙනෙක්. මං මීට කලින් කවදාවත් ඇයව දැක නැති බව විශ්වාසයි. ඒ වුණත්........ ඒ වුණත්........ ඇගේ මුහුණේ යම් දැක පුරුදු කෙනෙකුගේ ලක්ෂණ තිබුණා කියලයි මට හිතෙන්නේ. නමුත් ඒ කවුද, දැක තිබෙන්නේ කොහේදිද කියල මට හිතාගන්නත් බෑ.

"හොඳයි, මොනවද දැන් ඔහේට උවමනා වෙලා තියෙන්නේ?" ඇය ඇසුවා.

"උවමනා වෙලා තියෙන්නෙද?" මං ඇහුවා. "මේක මගේ ගෙදර. මට උවමනා මගේ ගේ ඇතුළට එන්න. මං කැමතියි දැනගන්න මං නැති වෙලාවෙ ගේ ඇතුළට වැදිල, ඔහේල මොනව කරනවද කියන කාරණය"

"මේ! පිස්සු කතා නොකියා යනව යන්න!" ඇය කිව්වේ තර්ජනාත්මක හඬකින්. "මේ වගේ බහුබූත කතාවක් මං මගේ ජීවිතේටම අහල නෑ. මේ මොහොතෙම ඔහේ නොගියොත් මං පොලීසිය කැඳවනවා"

එහෙම කියූ ඇය දොර ඇරගෙන එළියට ඇවිත් මාව පහුකරගෙන පාර පැත්තට ගියා. ගිහින් පාර අයිනේ සිටි හැඩි දැඩි පොලිස් භටයාව කැඳෙව්වා.

"ඔව් නෝනා. මොකක්ද දැන් ප්‍රශ්නේ?" ඔහු විමසුවා.





"මේ මිනිහා අපි නාඳුනන කෙනෙක්. ඔහු මගේ සේවිකාවත් භය කරලා. දැන් ඔහු උත්සාහ කරන්නේ දොර කඩාගෙන මගේ ගෙට ඇතුළුවෙන්න. අපට පාඩුවේ ඉන්න දීල යන්න කියල මං ඔහුට කිව්වා. නමුත් ඔහු ඒක කනකට ගන්නෙ නෑ"

"ඒයි හොර තක්කඩියා!" පොලිස් භටයා කිව්වෙ මා අමතමින්. "තමුසෙ ලැස්ති වෙන්නෙ මොකකටද?"

මං ඒකට පිළිතුරු දෙන්නත් කලින් අර කාන්තාව කථා කළා.

"ඔහු කවුරු වුණත් අද දවසම මත්පැන් බොමින් තමයි ගත කරල තියෙන්නේ. ඔබටත් එනව නේද ඔහු බිව් මත්පැන්වල දුගඳ. ඒ මදිවට කවුරු හරි එක්ක සණ්ඩු සරුවල් කරගෙන. ඒ හරිය බැලූ බැල්මට පෙනෙනවා"

අර ඩොනාකි නම් මිත්‍රයාගේ ඇරයුමෙන් තැබෑරුමට යාමේ විපාකය, මට පලදුන්නේ ඒ වෙලාවෙයි.

"මට පෙනෙනවා නෝනා" පොලිස් භටයා කිව්වා. "ඔහුගේ හැටි මං තුදුටුවා නොවෙයි." මීළඟට ඔහු මා දෙසට හැරුණා.

"ඔහේ ඇඳගෙන ඉන්නෙ නම් වැදගත් මහත්මයෙක් වගේ. ඒ වුණාට ඔහේ ගිල දැමූ මත්පැන්වල දුගඳ හැමතැනම. ඊට අමතරව සණ්ඩු සරුවල් කරලා ලේ පෙරාගෙන. මහත්මයා මං ඔබට හොඳ අවවාදයක් දෙන්නම්. ඔබේ අසරණ බිරිඳ ඔබ එනතුරු මඟ බලාගෙන ඇති. වහාම ගෙදර යන්න"

"මාත් මේ උත්සාහ කරන්නේ මගේ ගෙදරට යා ගන්න තමයි" මං කිව්වා. "මෙන්න මේක තමයි මගේ ගේ"

"මොන පිස්සු කතාවක්ද ඒ?" ගැහැනිය කිව්වා. "මෙහෙම මිනිහෙක් මං මගේ ජීවිතේට දැකල නෑ"

"ඔහේ දැකල තියෙනවද මේ නෝනව?"

"මං කවදාවත් දැකල නෑ"

"හරි මට තේරෙනවා කාරණය" පොලිස් භටයා කිව්වා. "මං තමුසෙට දෙන්නම් තත්පර දහයක්. ඒ කාලය ඇතුළත මෙතැනින් පිටවෙලා යනවා. නැත්නම් තමුසෙ නවතින්නෙ බ්‍රික්ස්ටන් පොලීසියේ, අපරාධකාරයින් දමන හිරකුඩුවේ. තේරුණාද?"

"ඔහු ඒක අදහස් කළේ අවංකවම බව මට හිතාගන්න පුළුවන් වුණා. ඒ නිසා එතැනින් පිටවීම ඇර මට වෙනත් විකල්පයක් තිබුණේ නෑ. මා හඳුනන කිසිවෙක් නොමැතිව පිහිටක් ලබා ගත්තේ කාගෙන්ද කියලයි මං කල්පනා කළේ.

මේ වගේ ප්‍රශ්නවලදී අසරණයින්ට පිහිට වෙන ෂර්ලොක් හෝම්ස් කියල මහත්මයෙකු ගැන, මං පුවත්පත් සගරාවල කියවල තිබුණා. නමුත් ලන්ඩනයේ ඔබ ඉන්නේ කොහේද කියල මං දැන හිටියෙ නෑ. ඔබ ඉන්නේ බේකර් වීදියේ බව මං අන්තිමට දැනගත්තේ කුලීරථ රියැදුරන් කිහිපදෙනෙකු විමසීමෙන්."

"ඔබේ අබිරහස විසඳා ගැනීමට ඔබ මා තෝරාගැනීම ගැන, මට හුඟක් සතුටුයි වේලර් මහත්මයා" හෝම්ස් කීය. "ඔබ කියන මේ අද්භූත සිදුවීම මගේ සිත තදින්ම ඇදගත්තා"

"ඒ කියන්නේ මං මේ කියන්නේ ඇත්තක් කියල, ඔබ විශ්වාස කරනවා එහෙනම්?"

"ඒ ගැන මට කිසිම අවිශ්වාසයක් නෑ"

"ඒ ගැන දෙවියන්ට ස්තුතිවේවා!" වේලර් කීය. "මට මුහුණ පාන්නට වුණු මේ අද්භූත සිදුවීම, මේ ලෝකෙ කිසි කෙනෙකුට කවදාවත් සිදුවෙලා නැතුව ඇති?"

"එතැනදි නම් ඔබට වැරදුණා" හෝම්ස් කීය. "මේ වගේම සිදුවීමක් ඉතාලියේ නේපල්ස් නගරයෙන් වාර්තා වුණා 1882 දී. ඊළඟට 1889 දී අයර්ලන්තයේ ඩබ්ලින් නගරයෙනුත් බොහොම දුරට මීට සමාන සිදුවීමක් වාර්තා වුණා."

"හොඳයි. මොනවද හෝම්ස් මහත්මයා ඔබ මේ ගැන කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"මෙවැනි ප්‍රශ්නයකදී අපි පොලීසියේ උදව් ලබා ගැනීම අත්‍යවශ්‍යයි. අපට කරන්නට බැරි සමහර දේ කළ හැක්කේ ඔවුන්ට පමණයි"

"පොලීසිය? නමුත් ඔවුන්ගෙන් මට කිසිම සහයෝගයක් ලැබුණෙ නෑ?"

"ඒකට හේතු කීපයක්ම තිබෙනවා" හෝම්ස් කීවේ අතේ ඇඟිලි එකින් එක නමා පෙන්වමිනි. "එයින් පළමුවැනි එක තමා ඔබ කියන අර කාන්තාව හිටියේ ගේ ඇතුළෙ. ඔබ හිටියෙ පාරෙ. දෙවැන්න; ඇය වැදගත් විදියට ඇඳුම් පැළඳුම් වලින් සැරසිලා; නමුත් ඔබේ ඇඳුම් පැළඳුම් පොඩිවෙලා, මත්පැන් වලින් තෙත්වෙලා; ඔබේ මුහුණෙන් ලේ ගලනවා. තැල්මක ලකුණුත් මුහුණෙන් පෙනුණා. තුන්වැනි කරුණ තමයි ඔබ මුහුණ දුන්නු අද්භූත අත්දැකීමෙන් ඔබ මවිතයට පත් වෙලයි හිටියේ. මේ ප්‍රදේශයට අලුත් කෙනෙකු





වීමත්, සිතේ තිබූ කැලඹීමත්, ඔබෙ අවාසියට හිටියා. මේ නිසා ඔබ කියන්නේ ඇත්තක් බව පොලිසියට ඒත්තු ගන්වන්න ඔබට හැකිවුණේ නෑ.

හොඳයි වේලර් මහත්මයා. අපි තවත් ප්‍රමාද නොවී වහාම සමසෙට් උද්‍යානයේ ඔබේ නිවස වෙත යා යුතුයි. ඊට කලින් අපි යමු බ්‍රික්ස්ටන් පොලිස් ස්ථානයට. එතැනින් නිලධරයන් කිහිප දෙනෙකු කැඳවාගෙන ගිහින්, අප ඇතුළුවෙන්න ඕන ඔබේ නිවසට"

"හෝම්ස් මහත්මයා. ඔබ මගේ සිතේ ඇති කරන සහනය මට වචන වලින් විස්තර කරන්න බෑ....... මේ අවුල සම්පූර්ණයෙන්ම විසඳිය හැකි බවට ඔබට හොඳටම විශ්වාසද?"

"අපි පුළුවන් තරම් උත්සාහ කරල බලමු" හෝම්ස් කීය. "ඊට කලින් ඔබේ පෙනුම යථා තත්ත්වයට පත්කර ගත යුතුයි. ඊට යායුතු තැන දොස්තර වොට්සන් පෙන්නාවි."

වේලර් මහතාට නාන කාමරය පෙන්වා දී මම ආපසු විසිත්ත කාමරයට ආවෙමි. හෝම්ස් තවමත් සිටියේ ගිනි උදුන සමීපයේ ඔහුගේ හාන්සි පුටුවේ ම ය. ඔහු ගැඹුරු කල්පනාවකට වැටී සිටියේ නළල රැළිකරගෙනයි.

"ඇයි මොකක්ද හෝම්ස් ප්‍රශ්නෙ?"

"ප්‍රශ්නය වේලර්ගෙ බිරිඳ ගැන"

"ඔබ හිතන්නේ ඇය අනතුරකට මුහුණපාල කියලද?"

"ඒක බොහොම දුරට සිදුවෙලා වෙන්නත් පුළුවනි. මේ සිද්ධිය ඇතිවෙලා තිබෙන්නේ කෙසේද, එය ගමන් කරන්නේ මොන පැත්තකටද කියලා අපට තවමත් හිතාගන්න බෑ. ඒකට ප්‍රමාණවත් තරම් සාක්ෂි නෑ."

"හෝම්ස් ඔබ කිව්වානේ නේපල්ස්වල හා ඩබ්ලින්වල මෙවැනිම සිදුවීම් දෙකක් වුණා කියල. ඒ වලදීත් ගෙහිමියාගෙ බිරිඳ ඊට පටලැවුණද?"

"නේපල්ස්හි සිදුවීමෙ හැමදෙයක්ම සැලසුම් කරලා, එය රඟ දක්වලා තිබුණෙ ගෙහිමියාගෙ බිරිඳ. නමුත් ඩබ්ලින්හි සිදුවීමෙදි ගෙහිමියාගෙ බිරිඳ කිසිම දෙයක් දැනගෙන හිටියෙ නෑ. කොහොම වුණත් ඒක අවසන් වුණේ ඉතාම අවාසනාවන්ත ආකාරයට"

"ඒ කියන්නේ?"

"ඒ තරුණ කාන්තාව මරාදමා තිබුණා"

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!"

"මේ සිද්ධින් ගැන ටේලර්ට කිසිවක් කියන්න මං අකමැති වුණේ ඇයි කියල, දැන් ඔබට තේරෙනව ඇති."

"ජීවිත කාලයක්ම ඈත පළාතක පදිංචි වෙලා හිටිය ගැහැනියක්, මෙහෙම දෙයක් කළේ කොහොමද? ඒක අපට හිතන්න අමාරුයි නේද හෝම්ස්?"

"අන්න ඒක තමයි බොහොම පැටළිලි සහිත කාරණය. සති හයක්ම මේ ගෙදර පදිංචි වෙලා හිටී ටේලර්, ගෙදර නොහිටියෙ අද විතරයි. තවත් විස්තර කරලා තියනවා නම්, මහත්මයා පැය හතළිස් අටක පමණ කාලයකට ගෙදර නොඑන බව බිරිඳ උදේ ඉඳලම දන්නවා. හරියටම එදාම, සම්පූර්ණයෙන්ම නාඳුනන පිරිසක්, ගෙදර ආක්‍රමණය කරලා බලය අල්ල ගත්තෙ කොහොමද? මේක මුළුමනින්ම අහඹු සිදුවීමක් කියලා හිතන්න අමාරුයි නේද?"

"ටේලර්ට පිස්සු නොහැදුණු එකයි පුදුමෙ." මම කීවෙමි. "ඔය ගේ ආක්‍රමණය කළ පිරිස එහෙම දෙයක් කළේ මොන අරමුණකින්ද හෝම්ස්?"

"මේ වෙලාවෙ ඒ ගැන උපකල්පන කරන්න හැකියාවකුත් නෑ. එයින් ප්‍රයෝජනයකුත් නෑ. ටිකක් හැන්දෑවෙද්දී අපට හැකිවේවි මේ ප්‍රශ්නය ගැන ඉදිරියට යන්න. ටේලර් මහත්මයා ආව නේද? හරි අපි වහාම පිටත් වෙමු. ප්‍රමාද වෙන්න බෑ"

මිනිත්තු දෙකක් ගතවෙද්දී අපි සමසෙට් උද්‍යානය දෙසට කුලීරියකින් ගමන් කරමින් සිටියෙමු. තවමත් හිරු බැස නොගිය නිසා, සැඳෑ හිරු එළිය මංමාවත් ආලෝකමත් කළේය. අපේ අනුග්‍රාහකයා සමග වැඩිපුර කතාබහ නොකරුණේ අශ්වකරත්තයෙන් ගමන් කරන අතරය.

"ටේලර් මහත්මයා. කරුණාකරල මට ඔබ සහ ඔබේ බිරිඳ ගැන සම්පූර්ණ තොරතුරු කියන්න" හෝම්ස් කීය. "ඔබේ පවුලේ අය තවමත් නොදැම්ටන්වල පදිංචිව ඉන්නවද?"

"ඔව්. මගේ මවත් පියාත් තවමත් ජීවතුන් අතර ඉන්නවා. මං කුඩා කාලයේ හැදුණු වැඩුණු අපේ ගෙදර තමා ඔවුන් පදිංචි. මට ඉන්නේ එක් සහෝදරයෙකු පමණයි. ඔහු පාවහන් අලෙවි කරන සමාගමක වෙළඳ ප්‍රවර්ධකයකු ලෙස සේවය කරනවා"





"ඔබ විවාහ වෙලා කොපමණ කල්ද?"

"අවුරුදු දෙකක් පමණ වෙනවා"

"ඔබේ බිරිඳත් නොදැම්ටන්ෂයරයේ කෙනෙකු බව ඔබ කිව්වා?"

"ඔව්. අප විවාහවුණෙත් එහිදී"

"ඔබ ඇය ගැන දන්නෙ, විවාහ වෙන්න අවුරුදු කීයකට පෙර සිටද?"

"අවුරුදු ගණනාවක් තිස්සේ මං ඇයව හඳුනනවා........ අවුරුදු පහක් හයක්........"

"එහෙනම් ඇගේ පවුලේ සාමාජිකයන් ගැනත් ඔබ හොඳින් දන්නවා ඇති?"

"ඇත්තෙන්ම ඔව්. ජෙනීගේ පවුල ගැනත් මං හොඳින් දන්නවා. ඇගේ පියා පොලීසියේ සේවය කොට විශ්‍රාම ලැබූ කෙනෙක්. ජෙනී තමයි පවුලේ වැඩිමලා. ඇගේ බාල සහෝදරයා චාල්ස්. චාලි ඉගෙනීමට දක්ෂකම් දැක්වූයේ නැහැ. ඔහු රැකියාවක් සොයාගෙන ඇමරිකාවට යන්න තීරණය කළා. ඔහු ගිහින් අවුරුදු දෙකකට කිට්ටුයි. නමුත් ඔහුට සතුටුදායක රැකියාවක් ලැබිල තිබුණේ නැහැ. මුලින් දිගටම වගේ ඔහුගෙන් ලියුම් ලැබුණා. පසුව ලියුම් ඒමත් අඩුවුණා. ඔහුගේ ඇමරිකා ගමනට ගෙදර කවුරුත් විරුද්ධ වුණා. දැන් පවුලේ කවුරුත් චාලි ගැන කම්පාවෙමිනුයි ඉන්නේ. ඔහුට මොකක් හරි කරදරයක් වෙලාද කියල සැකයකුත් අපේ හිත්වල තිබුණා. මෑතකදී ඔහුගෙන් ලියුමක් ලැබුණා. දැන් ඔහු නිතිය ඉගෙන ගන්නවාලු නිව්යෝර්ක්වල"

"ඔබගේ පවුල්වල සමීප නෑදැයින් ගැන පැහැදිලි විස්තරයක් කළා" හෝම්ස් කීය. "දැන් මං කැමතියි සමසෙට් උද්‍යානයේ ඔබේ නිවසේ ඔබගේ සේවක මණ්ඩලය ගැන දැනගන්න"

"අපේ ගෙදර ඉන්නේ සේවිකාවන් දෙදෙනෙකු පමණයි. ඉවුම් පිහුම් කරන මුළුතැන් ගෙයි සේවිකාව මරීටා ක්වින්. ඇය ඒ වැඩවලට ඉතාම දක්ෂයි. ගෘහ සේවිකාව හැටියට කටයුතු කරන්නෙත් මරීටා. ඊට අමතරව ගෙදර නොයෙක් වැඩ කටයුතු වලදී මගේ බිරිඳට උදව් වෙන්නෙත් මරීටා. අනික් සේවිකාව අවුරුදු දහසයක පමණ ගැහැනු ළමයෙක්. ඇගේ නම නෝරා හිල්. ඇය ඒ පැත්තෙම කෙල්ලක්. ඇගේ දෙමව්පියන් පදිංචි බැටර්සීවල. මේ

ඇයගේ පළමුවැනි රැකියාව. ඒ නිසා කිසිම වැඩක් ගැන ඇයට තේරුමක් නෑ. නමුත් ගෙදර වැඩ කටයුතු ඉගෙන ගන්න, ඇයට උවමනාව තිබෙනවා. කාලයක් යද්දි හරියාවි."

කතාබහ කරන අතරේ අප ගමන්ගත් කුලීරිය වෙස්ට්මින්ස්ටර් පාලමෙන් තේම්ස් ගඟ හරහා එගොඩට ගමන් කළේය. ඉන්පසු කෙනිංටන් පාරේ බ්‍රික්ස්ටන් දෙසට ගමන් කළෙමු. යහපත් කාලගුණයක් තිබූ බැවින්, මහජනයා එළියට බැස පාරවල් පුරා සැරිසැරූ බැව් අපි දුටුවෙමු.

අපි ඉක්මනින් බ්‍රික්ස්ටන් පොලිස් ස්ථානය වෙත ළඟාවූයෙමු. ටේලර් සහ මා රිය තුළ සිටියදී, හෝම්ස් එයින් බැස පොලිසිය වෙත ගියේය. මඳ වේලාවක් ගත වෙද්දී ඔහු ආපසු පැමිණියේ නිල ඇඳුමින් සැරසී සිටි හැඩිදැඩි පොලිස් නිලධරයකු සමගය.

"ටේලර් මහත්මයා. මේ තමයි පොලිස් පරීක්ෂක විට්නි" හෝම්ස් කීය. "ඔබ මුහුණ දීල තියෙන ප්‍රශ්නය ගැන, මං ඔහුට කෙටියෙන් කිව්වා. ඔහු කැමතියි අපට උදව් කරන්න. විට්නි මහත්මයා තවත් පොලිස් භටයන් දෙදෙනෙකු සමග ඔවුන්ගේම රථයකින් අප සමග ඒවි"

ඒ සමගම පොලීසියේ රථගාල දෙසින් ලොකු අශ්ව කරත්තයක් එළියට පැමිණියේය.

"හෝම්ස් මහත්මයා" විට්නි කීය. "ඔබ යන්න ඉස්සරහින්. අපි ඒ පිටුපසින් එන්නම්"

සමසෙට් උද්‍යානය එතරම් පුළුල් නොවූ මාවතක් විය. පාර අයිනේ තැන් තැන්වල තිබූ ඕක් හා බීච් ගස්වලින් මාර්ගය සෙවණ විය. පාර දෙපස තිබුණේ එකම ආකාරයේ නිවාස පේළි දෙකකි. පාර අයිනේ එතරම් සෙනගක් දක්නට නො ලැබිණි.

පොලිස් රථයක් පැමිණෙන බව දුටු විට, ඔවුන්ගේ අවධානය අප වෙත යොමු විය.

සමසෙට් උද්‍යානයේ අඩක් පමණ ඉදිරියට ගිය පසු, රිය නැවැත්වීමට උපදෙස් ලැබිණි. ටේලර්ගේ අංක 14 නිවසට යාම සඳහා පාරේ සිට තරප්පු කිහිපයක් ඉහළට නැගීමට සිදුවිය. අනෙක් සියලුදෙනා පැමිණෙන තුරු බලාසිටි ටේලර්, ඉන්පසු තරප්පු පෙළ නැග ඉදිරි දොර අසලට පිවිසියේය. එහෙත් මීළඟට කළ යුත්තේ කුමක්දැයි සිතාගැනීමට අපහසු අයුරෙන්, ඔහු බලා සිටියේ මගේ මිත්‍රයා දෙසයි.





"ඔබේ යතුර අගුළට ආලා, දොර අරින්න පුළුවන්ද බලන්න" හෝම්ස් කීය.

"ගිය වතාවෙ නම් එහෙම කළාට වැඩක් වුණේ නෑ" කී ටේලර් යතුර සාක්කුවෙන් ගෙන, එය යතුරු කටට දමා කරකැවීය. දොර කිසිදු අපහසුතාවයකින් තොරව විවෘත විණි. ටේලර් පුදුමයට පත්වූ බැව් අපි දුටුවෙමු. මීළඟට ඔහු නිවස තුළට ගමන් කළේය.

"හැම දෙයක්ම නියම පිළිවෙළට තිබෙනවා. මොකුත් අවුලක් නෑ වගෙයි" අප සමග කී ඔහු මඳක් උස් හඬෙන් "හලෝ! ගෙදර කවුද?" යයි කීවේය. එහෙත් නිවස තුළ තිබුණේ ඇඩි නිහඬතාවයකි.

"මං හුඟක් වැඩ රාජකාරි තියෙන කෙනෙක්" පොලිස් පරීක්ෂක විට්නි කීය. "නාස්ති කරන්න කාලයක් මට නෑ. ඒ බව ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැනෙ හෝම්ස් මහත්මයා. මේක ඔබේ අනුග්‍රාහකයාට එක් මොහොතකට ඇතිවූ මනෝ විකාරයක් වෙන්න ඇති"

"මොහොතක් ඉන්න විට්නි" හෝම්ස් කීය. "නිගමනවලට එන්න කලින් අපි ඉක්මනට ගේ ඇතුළෙ ටිකක් බලල ඉඳිමු."

මගේ දෙනෙත් යොමුවූයේ ඔවුන්ගේ කුඩා විසිත්ත කාමරය වෙතයි. සුව පහසු අසුන් හා සෝපා සහිත ගෘහභාණ්ඩ වලින් එය පිරී තිබිණි. ජනේලයට විරුද්ධ පැත්තේ බිත්තිය අසල පියානෝවක් විය.

පියානෝව මත රිදී රාමුවක ඇමූ ඡායාරූපය, කුඩා දැරියකගේ එකක් බැව් මම දුටුවෙමි. විසිත්ත කාමරයේ එක් පැත්තකින් වූ කුඩා මේසය මත බන්දේසියක් හා තේ පානය සඳහා සූදානම් කළ පීරිසි කෝප්ප දෙකක් විය. මේ දෙකේම තේ පානය අරඹා අතරමගදී නැවැත්වූ බවට සලකුණු විය. තේ බන්දේසිය අසලම මේසය මත රෝස පැහැති මල් ඇමූ වීදුරු මල්වාස් එකක් තිබිණි. ගිනි උදුනට වම්පසින් කුඩා ලාච්චු අල්මාරියක් විය. ඒ මත පිත්තල රාමුවක් සහිත අලංකාර කුඩා ඔරලෝසුවක් තබා තිබිණි. එමෙන්ම ගිනිඋදුන් පඩිය මත, ද ප්‍රමාණයෙන් විශාල ඔරලෝසුවක් විය. ඒ අසලම බිත්තියේ එල්ලා තිබුණේ දෙව්මැදුරක චිත්‍රයකි. තරමක පැරණි පෙනුමක් තිබූ එය රාමුකර තිබිණි. විසිත්ත කාමරයේ පෙනුම ගැන මා යොමු කළ අවධානය බිඳී ගියේ එක්වරම මා අසලින් ඇසුණු කෑගැසීමකිනි.

"මොකක්ද අර පින්තූරෙ?" ටේලර් කෑගැසුවේ දෙව්මැදුරේ චිත්‍රයට ඇඟිල්ල දිගු කරමිනි.

"ඇයි ඒක සාමාන්‍යයෙන් එතැන තිබෙන එකක් නෙමෙයිද?" මගේ මිත්‍රයා විමසුවේ විසිත්ත කාමරයේ පොළොවට ඔහු යොදමින් සිටි අවධානය නවතමිනි.

"සාමාන්‍යයෙන් නෙමෙයි" ටේලර් කීය. "ඒක කොහොමටවත් මේ ගෙදර තියෙන එකක් නෙමෙයි. ඔහොම එකක් මං ජීවිතේට දැකල නෑ!"

සිටි තැනින් නැගී සිටි හෝම්ස් එම පින්තූරය ගලවා අතට ගත්තේය. අනතුරුව ඔහු එය සියුම් ලෙස පරීක්ෂා කිරීම ඇරඹීය.

"සාන්ත පෝල් දෙව්මැඳුර" යනුවෙන් මුද්‍රිත කුඩා ලේබලයක් පින්තූරය පිටුපස අලවා තිබිණි.

"මේක අපි දැකල තියෙන සාන්ත පෝල් දෙව්මැඳුර වගේ නම් නෙමෙයි" පොලිස් පරීක්ෂක විට්නි පැවසුවේ ඒ දෙසට බැල්මක් හෙළීමෙන් අනතුරුවය.

"සමහරවිට මේක සම්පූර්ණයෙන්ම වෙනස් සාන්ත පෝල් දෙව්මැඳුරක් වෙන්න ඇති" හෝම්ස් කීය. "ටේලර් මහත්මයා. ඔබට පුළුවන්ද මේ දෙව්මැඳුර හඳුනාගන්න?"

"නෑ. මං මෙහෙම තැනක් කවදාවත් දැකල නෑ" කී ටේලර් මීළඟට පියානෝව මත තිබූ රාමු කළ ඡායාරූපය අතට ගත්තේය.

"මෙන්න මෙයා කවුද කියලත් මං අඳුනන්නෙ නෑ"

"මේ ඔබ දන්න කෙනෙක් නෙමෙයි?"

"කොහොමටවත් නෑ"

"මේ ඔබේ බිරිඳගේ කුඩා කාලයේ ඡායාරූපයක් නෙමෙයිද?"

"මගේ බිරිඳගේ කුඩා කාලයේ ඡායාරූප මං දැකල තියෙනවා. නමුත් ඒ කාලයේ ඇයගේ පෙනුම මීට සම්පූර්ණයෙන්ම වෙනස්."

එය ස්ටුඩියෝවක් තුළ ගත් ඡායාරූපයක් බැව් පහසුවෙන්ම තේරුම් ගැනීමට හැකිවිය. අවුරුදු හයක් හෝ හතක් වයසැති දැරිය බෝනික්කෙකු ද වඩාගෙන සිටගෙන සිටියාය. පසුබිමේ තිබුණේ ගස් කිහිපයක චිත්‍රයකි. ඡායාරූපයේ පහළින් "වික්ටෝරියා ඔ වික්ටෝරියා" යනුවෙන් ලියා තිබිණි.

"මේකත් හරි අපූරු දෙයක්" හෝම්ස් කියද්දී ටේලර් ඊට බාධා වන ලෙස කෑගැසීය.





"මං ගෙනාපු මල්!" ඔහු කීවේ මේසය උඩ තිබූ මල් බඳුන අතට ගනිමිනි. "කවුරුහරි මං ගෙනැත් තිබුණු රෝසමල් ටික ඉවත් කරගෙන"

"ඒ මල් ටික පරවෙලා නිසා කවුරු හරි ඒවා අහකට දමන්න ඇති" විට්නි කීය.

"නෑ නෑ" ටේලර් කීවේ එයට එකඟ නොවෙමිනි. "මං ඊයෙ හවස වැඩ ඇරිල ගෙදර එද්දි, ලන්ඩන්බ්‍රිජ් දුම්රියපොළ ළඟ මල් සාප්පුවකින් තමයි ඒවා මිලට ගත්තේ. අලුත්ම මල්. ඊයෙ හැන්දෑවෙත් ඒවා ඉතා අලංකාරව තිබුණා. මොන උවමනාවකට ඒව මෙතැනින් ඉවත් කළාද? ඒක මට හිතාගන්නවත් බෑ"

"මල් පොකුරක් අර ගැනීමෙන් කාටවත් ඇති ප්‍රයෝජනේ මොකක්ද?" පොලිස් නිලධරයා විමසීය.

"ඔය වගේ දේ ගැන පිළිතුරු හිතන්න කලින්, අපි මේ ගෙදර අනික් කාමරත් පරීක්ෂා කරල බලමු" හෝම්ස් කීය.

"ටේලර් මහත්මයා. මේ වහල තියෙන දොර විවෘත වෙන්නෙ කොහේටද?"

"මේකෙන් යන්නෙ කෑම කන කාමරයට" ටේලර් කීවේ එහි දොර විවෘත කරමිනි. එහි ඇතුළුවීමට සූදානම් වූ ඔහුගේ මුවෙන් නිකුත් වන්නට ගියේ විලාපයකි. එහෙත් ඔහු ඉක්මනින් තම මුව වසා ගත්තේය. හෝම්ස් එහි ඇතුළු වූයේ තරුණයා පසෙකට තල්ලු කරමිනි.

"පොලිස් පරීක්ෂක මහත්මයා" හෝම්ස් කීවේ විට්නි කැඳවමිනි. "මෙන්න මෙතැන තියෙනවා ඔබ භාරගත යුතු වැඩක්."

කළු පැහැති ඇඳුම් කට්ටලයකින් සැරසුණු තරබාරු පුද්ගලයෙක් කාමරයේ මැද බිම වැතිර සිටියේය. ඔහු සිටියේ උඩුබැලි අතටය. ඒ එම පුද්ගලයාගේ මළසිරුර බව එක් ක්ෂණයකින් මට වැටහිණ. අවමංගල්‍ය සේවා ආයතනයකින් සිදුකරන අන්දමට, ඔහුගේ දෑත් පපුව හරහා එක්කොට තිබූ අතර, ඒ ඇඟිලිවලට මැදිවී රෝස මල් පොකුරක් විය.

"කවුරුත් අයින් වෙන්න" පොලිස් නිලධරයා කීය. "මෙතැන මොකක් හරි අපරාධයක් වෙලා තිබෙන පාටයි."

"මං වෛද්‍යවරයෙක්" මම කීවෙමි. "මං මොහුව පරීක්ෂා කරල බලන්නද?"

"ආ ඒක බොහොම හොඳයි" විට්නි කීය.

මම බිම තිබූ සිරුර පරීක්ෂා කර බැලීමි.

"මොහු මිය යන්න ඇත්තේ පැය දෙකකට තුනකට කලින් විය හැකියි.

"ඔහුගේ මරණයට හේතුවක් මොකක් හරි, බැලූ බැල්මට ඔබට පෙනෙනවාද වොට්සන්?"

"පැහැදිලිවම පෙනෙන එහෙම ලකුණු නම් නෑ. ආයුධයකින් තුවාල සිදුකිරීමක් නොවෙන බව නම් ස්ථිරයි"

"වස ශරීර ගත කිරීමක්?" විට්නි විමසීය.

"ඒ ගැනත් මට විශ්වාසෙට කියන්න අමාරුයි" මම කීවෙමි. "ඒකට මළසිරුර තියුණු පරීක්ෂණයකට භාජනය කරන්න වෙනවා. මට නිකමට හිතෙනවා මේක හෘදයාබාධයකින් සිදු වූ මරණයක් විය හැකියි කියල. නමුත් ඒක අනුමාන කිරීමක් පමණයි"

"මේවාද ඔබ නැතිවුණා කියූ රෝසමල්?" හෝම්ස් ඇසුවේ ටේලර්ගෙනි. "ඔබ අඳුනනවාද මේ අවාසනාවන්ත පුද්ගලයාව?"

"මෙහෙම කෙනෙක් මං ජීවිතේට දැකල නෑ" ටේලර් කීය.

"මට පෙනෙනවා ඔහුගේ සාක්කු ඔරලෝසුවේ පියන ඇරිලා, එහි වීදුරුව බිඳිලා බව. කොහොමද එහෙම දෙයක් වුණේ?" හෝම්ස් කීවේ කල්පනා කරමිනි. "ඔහු බිම ඇද වැටිලා........ ඒ වෙලාවෙ තමයි ඔරලෝසුව බිම වදින්න ඇත්තෙ. මරණයට හේතුව හෘදයාබාධයක් විය හැකියි කියා වොට්සන් කියූ කරුණත් ඒකෙන් තහවුරු වෙනවා. ඔහුගේ ඇතුළු කබා සාක්කුවේ වීදුරු කැබලි නම් නෑ. ඒ කියන්නේ ඔහු ඇද වැටෙද්දී ඔරලෝසුව තිබිලා තියෙන්නේ එළියේ. ඒක අතෙන් ලිස්සා වැටිල නෑ. ඔහු ඒකෙ වෙලාව පරීක්ෂා කරමින් ඉඳල තියෙන්නේ"

"ඒ කාරණයේ තිබෙන වැදගත්කම මොකක්ද?" පොලිස් නිලධරයා විමසුවේය.

තම ප්‍රබල කාචයෙන් ඔරලෝසුව පරීක්ෂණයට ලක් කරමින් සිටි හෝම්ස්ට, එම ප්‍රශ්නය ඇසුණු බවක් වත් නොපෙනිණ.

"ගෙදර ඇත්තටම සිදුවුණේ මොකක්ද කියන කාරණය අපි දන්නෙ නෑ. නමුත් ඊට සමීප සිදුවීම ගැන පැහැදිලි චිත්‍රයක් මවාගන්න, ඔරලෝසුව සම්බන්ධ කාරණය වැදගත්."

"මෙන්න මෙහෙම දෙයක් තමා මං හොයමින් හිටියේ" පොලිස් නිලධරයා කීවේ මියගිය තැනැත්තාගේ සාක්කුවකින් සටහන්





පොතක් එළියට ගනිමිනි. "මේ අවාසනාවන්ත පුද්ගලයා ගැන යම් තොරතුරක් දැනගන්න, මේක අපට ප්‍රයෝජනවත් වේවි."

ඔහු පිටු පෙරළා බැලුවත් වැදගත් යමක් එම පොතෙන් දැනගන්නට ලැබුණු බවක් නොපෙනිණ.

"ඔහුගේ නමක් ගමක් කිසිම තැනක නෑ" විට්නි කීය.

"ඔහුගේ නමේ මුලකුරු නම් H.J." හෝම්ස් කීය. "කමීස අත් පියවන කෆ්ලිංක්ස් වල ඒ අකුරු තිබුණා"

මෙම අද්භූත ආගන්තුකයා නාඳුනන අයෙකුගේ නිවසට, කුමන කාරණයක් සඳහා පැමිණෙන්ට ඇතිදැයි මම කල්පනා කළෙමි. මගේ ඒ දැහැන බිඳුණේ කිසිවෙකු කළ කෑගැසීමකිනි. යළිත් වරක් එසේ කෑගසා තිබුණේ ටේලර් මහතාය.

"අන්න තවත් මිනිහෙක් වැටිල ඉන්නවා" ටේලර් කීය. "ගේ පිටුපස මල් උයනේ"

මම වහා එතැනට ගියෙමි. තණකොළ වවා තිබූ බිම්කඩ මත දුඹුරු පැහැති ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි අයෙකු උඩුබැලි අතට වැතිර ඉන්නා අන්දම අපි දුටුවෙමු.

"දෙවියනේ!" පොලිස් පරීක්ෂක විට්නිට කෑගැසිණි. "මේක ආදි කාලෙ සොහොන් පිට්ටනියක් වගෙයි නේ. බැලූ බැල්මට පෙනුණාට වඩා වැඩ කටයුතු හුගක්, මෙතැන සිද්ධ වුණු පාටයි. ඔහේගෙ නම ටේලර් කියල නේද කිව්වෙ? මේව ඔහේගේ අනු දැනුමෙන් සිදුවුණු දේවල් නොවෙයි කියලා ඔහේට හොඳටම විශ්වාසද?"

"මේ ගැන කිසිම දෙයක් මං දන්නෙ නෑ"

තණබිම මත වැටී සිටි පුද්ගලයා ජීවතුන් අතර බැව්, මට ඉවෙන් මෙන් වැටහිණ. උඩුබැලි අතට වැටී සිටි ඔහු හුස්ම ඉහළ පහළ හෙළූ බව එතැනට ළංවෙද්දී පෙනිණ.

"ක්ලාන්තවීමක් වගෙයි. ඒත් ඒ මොන හේතුවක් නිසාද කියන්න බෑ" කී හෝම්ස් අසල වූ දිය බඳුනක දිය දෝතක් ගෙන වැතිර සිටි පුද්ගලයාගේ මුහුණට ඉස්සේය. තම දෙනෙත් විවෘත කර බැලූ ඔහු සිරුර කෙළින් කරගෙන එතැනම බිම හිඳගත්තේ, අප ඉමහත් පුදුමයකට පත් කරමිනි. හයෙන් නැති ගත් ටේලර්ට කෑගැසිණ. පොලිස් නිලධරයාගේ මුවෙන් පිටවූයේ දිවුරුමකි. මෙතැන වැතිර සිටි පුද්ගලයා මීළඟට දෙනෙත් පිස දමමින් නැගිට්ටේය. අනතුරුව තම ඇඳුම් කට්ටලය ඉක්මනින් පිස දැමුවේ, එහි ඇලී තිබූ තණකොළ කැබලි හා වැලි ඉවත්වන අයුරෙනි.

"මිත්‍රවරුනි" ඔහු කීවේ අප සිටි තැනට පැමිණෙමිනි. "මං මේ ඉන්නෙ කොහේද? මං මෙහේ මොනවද කරන්නෙ?"

"අන්න ඒක තමා අපටත් ඔහේගෙන් දැනගන්න උවමනා" විට්නි කීවේ තම සටහන් පොත හා පැන්සල සාක්කුවෙන් එළියට ගනිමිනි. "ඔක්කොටම ඉස්සර වෙලා කියනවා ඔහේගේ නම. ඊළඟට රක්ෂාව. මෙහේට වෙලා මොනවද කළේ?"

"මමද?" අමුත්තා විමසුවේ යළිත් වරක් දෙනෙත් පිස දමමිනි. "මට තදින්ම නින්ද ගිහිල්ලයි තිබුණෙ. සාමාන්‍යයෙන් මේ වෙලාවට මං නිදාගන්නෙ නෑ. මං කවුද කියල තේද ඇහුවෙ. මං පුවත්පත් වාර්තාකාරයෙක්. මෙන්න මගේ හැඳින්වීමේ පත්‍රය" ඔහු සාක්කුවෙන් ගත් කුඩා කාඩ්පතක් අප වෙත දිගු කළේය.

නිල් ජැක්සන්

නිව්ස් ඔෆ් ද වර්ල්ඩ්

පුවත්පත් වාර්තාකරු

යනුවෙන් කාඩ්පතේ සඳහන් වී තිබිණි.

"නිල් ජැක්සන්!" පොලිස් නිලධරයා කීවේ එය කියවා බලමිනි. "මෙහේට වෙලා ඔහේ මොනවා වාර්තා කරාද කියල දැනගන්න අපි කැමතියි"

"ඇත්තම කියන්නම් මහත්වරුනි" ජැක්සන් කීය. "මං මෙහේ මොනවා කළා ද කියල මම දන්නෙත් නෑ. නමුත් මට පුළුවනි ඔබට කියන්න, මීට කලින් මං කළේ මොනවද කියන එක"

"හරි අපි අහගෙනයි ඉන්නෙ"

"අද උදේ පාන්දරින්ම මං සේවය කරන පුවත්පත් කාර්යාලයට මගේ නමට ලියුමක් ලැබුණා. ඒක එව්වෙ කවුද කියල සඳහන්ව තිබුණා. එහි සඳහන් වෙලා තිබුණෙ මෙහෙමයි.

"මහජනයාට විශාල බලපෑමක් ඇතිවිය හැකි සිදුවීමක් වාර්තා කිරීමට. ඔබ කැමතිද? එසේ නම් උතුරු ක්ලැප්හැම්හි සමසෙට් උද්‍යානයේ අංක 14 දරණ නිවසට පැමිණෙන්න. ඔබ එහි පැමිණිය යුත්තේ සවස පහටයි.

-ඩොල්බි මහත්මිය"

"ඇගේ නම ඩොල්බි මහත්මිය කියා සඳහන්ව තිබුණත්, මේ ඇගේ සත්‍ය නම නොවෙන බව ඇය පිළිගත්තා."

"ඒ ලියුම දැන් ඔබ ළඟ තියෙනවද?" හෝම්ස් විමසුවේය.





"ඒක තිබිය යුතුයි" කී පුවත්පත් වාර්තාකරු තම සාක්කු සියල්ල සෝදිසි කළේය. බලාපොරොත්තු කඩවූ ලකුණු ඔහුගේ මුහුණෙන් පෙනිණ.

"ලියුම කවුරු හරි හොරකම් කරගෙන" ඔහු අන්තිමේදී කීවේ පරාජිත හඬෙනි.

"කමක් නෑ. ඔබේ කථාව දිගටම කියන්න"

"මං මේ ලිපිනයට ආවා. නමුත් ඒ හරියටම පහට නෙමෙයි. මං මිනිත්තු දහයක් විතර ප්‍රමාද වෙන්න ඇති. දොර ඇරලා මාව ඇතුළට ගත්තේ ගෑනු ළමයෙක් - මං හිතන්නේ සේවිකාවක්.

ගෙදර නෝනා විසිත්ත කාමරයට ආවේ මිනිත්තු කිහිපයක් ගතවුණාට පස්සේ. ඇය වැදගත් පෙනුමක් තිබූ උසෙන් වැඩි ගැහැනියක්. වේගයෙන් හුස්ම ගනිමින් ඇය සිටියේ සිතේ අපමණ කැලඹීමකින් බව මම දුටුවා.

මා වෙත ලිපිය එවූ ඩොල්බි මහත්මිය තමන් බව ඇය කිව්වා. තමන් තවත් අමුත්තෙකු බලාපොරොත්තුවෙන් සිටින බවත් ඇය කිව්වා. ඔහු තවත් මිනිත්තු දහයක් පමණ ගතවෙද්දී මෙහි එන බවත් කීවා. ඔහු මෙහි එනතුරු අදාළ කාරණය ගැන කතාබහක් ඇරඹීමට තමන් කැමති නැති බවත් ඇය සඳහන් කළා. සමහර අවස්ථාවලදී මොළයේ විකල්වීම් ඇතිවූ අයගෙනුත් මෙහෙම කැඳවීම් ලැබෙනවා. නමුත් මේ ඩොල්බි මහත්මියගේ කතාබහෙන් නම් එවැනි ස්වභාවයක් මට පෙනුණේ නෑ.

මීළඟට නිවස තුළට ගිය ඇය ආපසු ආවේ සේවිකාව සමඟ. ඇයගේ අතේ තේ කෝප්පයක් සහිත බන්දේසියක් තිබුණා. ඇය මට තේ කෝප්පය පිළිගැන්නුවා. ඊළඟට මා සමග කතාබහ කළා. මම "නිව්ස් ඔෆ් ද වර්ල්ඩ්" පුවත්පතේ පාර්ලිමේන්තු වාර්තාකරුවා බව ඔබට කිව යුතුයි. ඇය මගෙන් විමසුවේත් පාර්ලිමේන්තු වාර්තාකරණය ගැනයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතින් ඉටුවිය යුතු මහජන සේවයට, ඔවුන්ගේ පෞද්ගලික ජීවිතයෙන් බලපෑම් ඇතිවීම ගැන මං දන්නේ මොනවද කියා ඇය විමසුවා.

මීළඟට මට තද නිදිමතක් දැනුණා කියලයි මට හිතෙන්නේ. ඇය මගේ අතෙන් පීරිසි කෝප්පය ගත්තා. මං ඇයට මොනවා කිව්වාදැයි දැන් මට මතක නෑ. ඇය නොනවත්වාම යමක් දෙඩවූ බව මට ඇහුණා. නමුත් ඒ මොනවා ගැනද කියා මං දන්නෙ

නෑ. ඊළඟට මං දන්නේ ඔබ පැමිණ මා නින්දෙන් අවදි කළ බව විතරයි."

"මොහොතක් ඉන්න" හෝම්ස් කීය. "ඇය ඔබට පිළිගැන්වූ තේ කෝප්පයේ තේවල රසයේ යම්කිසි වෙනසක් තිබුණාද?.......... තිත්ත රසක් හෙම?"

"හැබෑ තේන්නම්" වාර්තාකරු කීය. "ඔබ කෙළින්ම ඒක ඇසූ නිසා මගේ මතකයට එනවා. තරමක තද තිත්ත රසක් තිබුණු නිසා මං එය බිව්වේ අපහසුවෙන්. ඒ බව ඇය දකින්න ඇති. සේවිකාව තේ පිළියෙල කිරීමේදී කහට වැඩිවෙලා. ඒ වැඩිවීම නිසා තිත්ත රසක් තිබෙනවාද කියා ඇසුවා. මං ඒ බව කිව්වාම, අමතර සීනි ටිකක් දැම්මාම රසේ වෙනස හරියාවි කියා ඇය කිව්වා.

ඒක නෙමෙයි මහත්වරුනි. ඔබ කවුද, මෙහේ මොනවද කරන්නෙ කියා මට තවමත් කිව්වේ නෑ. මේ මහත්මයා නම් පොලිස් පරීක්ෂකවරයෙකු බව මට පෙනෙනවා. කවුද මේ අනිත් මහත්වරු?"

"ඔහුගේ තේ කෝප්පයට එකතු කරලා තියෙන්නේ ක්ලෝරල් නිද්‍රාකාරකයේ බින්දු කිහිපයක් විය යුතුයි. එහෙම නේද වොට්සන්?"

"ඒ ගැන කිසි සැකයක් නෑ" මම කීවෙමි. "තේ කෝප්පයේ ඉතිරි වී තිබෙන කොටස රසායනික විශ්ලේෂණයකට භාජනය කළා නම් ඒක ස්ථිර කරගන්න තිබුණා"

"ඔබ ඇහුව තේ මේ කොහේද කියල" හෝම්ස් කීය. "මේ ඔබ පැමිණි සමසෙට් උද්‍යානයේ අංක 14 ම තමයි. මේ ඉන්නා මයිකල් ටේලර් මහත්මයා තමයි මේ ගෙදර අයිතිකාරයා. ඔහු තමන්ගේ කාර්යාලයේ රාජකාරි අවසන් කර හවස ගෙදර ආවා. එතකොටයි ඔහුට දකින්න ලැබුණේ, තමන්ගේ බිරිඳ හා සේවිකාවත් ඉතා පුදුමාකාර ලෙස ගෙදරින් අතුරුදන් වී ඇති බව. ඊට අමතරව නාඳුනන පිරිසක් නිවස ආක්‍රමණය කර, එහි පාලනය ඔවුන් අතට අරගෙන තිබුණා. ඔබ කියූ ඩොල්බි මහත්මියත් ඒ කණ්ඩායමේ කෙනෙකු වෙන්න ඇති. අපි මේ ගෙදරට ඇවිත් එච්චර වෙලාවක් ගතවුණේ නෑ. කොහොම වුණත් මේ ගෙදර කෑමකන කාමරයේ තිබී අපට මළසිරුරකුත් හමුවුණා"

"දෙයි හාමුදුරුවනේ!" ජැක්සන්ට කෑගැසිණි.





"ඔබට සිදුවෙනවා ඒ ගැන කට උත්තරයක් දෙන්න" පොලිස් නිලධරයා කීය.

"මං ඔබට දිවුරා කියන්නම් මහත්මයා" ජැක්සන් කීවේ පොලිස් නිලධරයාටයි. "මිනීමැරුමක් ගැන මං කිසි දෙයක් දන්නෙ නෑ. මේ ගෙදර මං ගතකළේ කෙටි වෙලාවක් පමණයි. ඒ කාලය තුළ මං මේ ගෙදර පිරිමියෙකු ඇහැට දුටුවේ නැහැ. මං දුටුවේ අර කාන්තාව සහ ඇගේ සේවිකාව පමණයි"

"එන්න ඇවිත් බලන්න" හෝම්ස් පුවත්පත් වාර්තාකරුවාට කීය. "බලන්න ඔහු ඔබ හඳුනන කෙනෙකු ද කියා"

"එහෙම වීමේ ඉඩකඩ අඩුයි. ඒ වුණත් මං බලන්නම්"

තම නිවසේ අනික් ස්ථාන පරීක්ෂා කර බැලීම සඳහා ටේලර් ගියේය. ඒ අතර අපි කෑම කන කාමරය වෙත ගියෙමු. ඒ අසල දණගසාගත් වාර්තාකරුවා මළ සිරුරේ මුහුණ දෙසට තම දෙනෙත් යොමු කළේය. මිනිත්තුවක් පමණ ඒ දෙස බලාසිටි වාර්තාකරුගේ මුහුණ ක්‍රමයෙන් වෙනස් විය. ඒ සමගම ඔහුගේ කට ඇරුණේ ඔහු මවිතයට පත්බව පෙන්වමිනි.

"ඔබ අඳුනන කෙනෙක්ද?"

"මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමෙක්." ජැක්සන් කීය. "මේ නැගෙනහිර මිඩ්ලන්ඩ් ප්‍රදේශයේ ඩොන්කැස්ටර් ඡන්ද කොට්ඨාසයේ මන්ත්‍රී හෙන්රි ජෙන්කින්ස් මහත්මයා විය යුතුයි"

"මං හිතන්නේ ඔබ හරි" හෝම්ස් කීය. "ඔහුගේ කෆ්ලිංක්වල තිබුණා H.J. යනුවෙන් ඔහුගේ නමේ මුල'කුරු"

"දෙවියනේ!" මට කියැවිණි. "ඒ තරම් ඈත පළාතක මන්ත්‍රීවරයෙක් මේ ගෙදර මොනවා කරනවද?"

"ඔබ මොනවද ඔහු ගැන දන්නෙ?" පොලිස් පරීක්ෂක විට්නි විමසුවේ වාර්තාකරුවා ගෙනි.

"අපේ පුවත්පතේ පාර්ලිමේන්තු වාර්තාකරුවා හැටියට, මට ඔහු නොයෙක් වර දකින්න ලැබී තිබෙනවා. ඔහු පැවැත්වූ ප්‍රවෘත්ති සාකච්ඡාවලටත් මං සහභාගී වී තියෙනවා.

ඔහු හැමවිටම කිව්වේ, පතල් කම්කරුවන්, කර්මාන්ත ශාලා සේවකයන් හා ගොවීන් වෙනුවෙන් පෙනී ඉන්නවා; ඔවුන්ගේ යහපත වෙනුවෙන් හඬක් නගනවා කියලයි. නමුත් විපක්ෂයේ අය නම් කියන්නේ ජෙන්කින්ස් ගේ කට විතරයි වැඩ නෑ; ඔහු මන්ත්‍රී

පඩිය හා දීමනා අරගෙන සුඛෝපභෝගී ජීවිතයක් ගත කරන නොම්මර එකේ බොරුකාරයෙක් කියලයි."

උඩුමහල පරීක්ෂා කළ ටේලර් මේ අතර පහළට බැස්සේය.

"උඩ තට්ටුවේ නම් කිසිම අවුලක් නෑ. නමුත් මගේ බිරිඳ සහ සේවිකාවන්ගේ ලකුණක්වත් නෑ"

"මේ අහන්න ටේලර් මහත්මයා" හෝම්ස් කීය. "ගෙදරට ඇතුළුවීමට ඉඩ නොදුන් කාන්තාව හා සේවිකාව ඔබ හා කථා කරද්දී, ඔවුන්ගේ ඉංග්‍රීසි උච්චාරණයේ වෙනසක් ඔබට වැටහුණාද?"

"ඔව් මහත්මයා. ඔබ දැන් කියන කොට තමයි ඒක මට මතක් වෙන්නේ. ඒ උච්චාරණයේ වෙනසක් තිබුණ නේන්නම්"

"ඒක මිඩ්ලන්ඩ් ප්‍රදේශයේ උච්චාරණය වගේද?"

"නැහැ නැහැ. එංගලන්තයේ නොයෙක් ප්‍රදේශ වල සංචාරය කර තිබෙන නිසා, ඔවුන්ගේ උච්චාරණයේ වෙනස්කම් මට හොඳට හුරුයි. මේක නම් මං කවදාවත් අහලා නැති ආකාරයේ, හුඟක්ම වෙනස් උච්චාරණයක් කියන්න පුළුවනි."

"මහත්මයා. මටත් ඒකට එකඟවෙන්න පුළුවනි. මා සමග කථාකළ කාන්තාව එම තැනැත්තියම නම් ඇයටත් තිබුණේ වෙනස් උච්චාරණයක්........" පුවත්පත් වාර්තාකරු ජැක්සන් කීය.

"........ මේ ඉංග්‍රීසි උච්චාරණය ගැන සාකච්ඡා කිරීම පිස්සු වැඩක් නේ" පොලිස් නිලධරයා කථාවට බාධා කළේය. "මේකට සම්බන්ධ ඔක්කොම එංගලන්තයේ ඉංග්‍රීසිකාරයො. ඉන්දියානුවොත් නෑ. ඇමරිකන්කාරයොත් නෑ. අප්‍රිකානු ජාතිකයනුත් නෑ. මට දැන් උවමනා කරන්නේ මළසිරුර මෙතැනින් ඉවත් කොට මෘත ශරීරාගාරයට ගෙන යෑමටයි. ඊළඟට ඔබ මා සමඟ පොලිස් ස්ථානයට ආ යුතුයි ජැක්සන් මහත්මයා. මට තියෙනවා ඔබගෙන් වැඩිදුර ප්‍රශ්න කරන්න"

"මට කියන්න තිබෙන හැම දෙයක්ම මං කිව්වා........ වෙන මොනවා කියන්නද?"

"පොලිස් ස්ථානයට එන්න ඔබ කැමති නැත්නම්, මට සිදුවෙනවා ඔබ අත් අඩංගුවට ගන්න"

"ඒ මොන වරදක් කළාටද?"

"යම්කිසි ස්ථානයක සැක සහිත ආකාරයට මරණයක් සිදුවී තිබෙනවා. මියගොස් තිබෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු





වීම වඩාත් ආන්දෝලනාත්මකයි. ඒ ගෙදර සිට අපට හමුවුණු ඔබ, පොලීසියේ රාජකාරි වලට බාධා කරන බවයි මට කියන්න තියෙන්නේ"

මේ අවස්ථාවේ පොලිස් පරීක්ෂකවරයා සහ පුවත්පත් වාර්තාකරුවා අතර ඇතිවූ වචන හුවමාරුව වඩාත් උණුසුම් ස්වභාවයක් ගත්තේය. මොහොතක් එතැන බලා සිටි මගේ මිත්‍රයා, වහාම එතැනින් පිටවී විසිත්ත කාමරය දෙසට ගියේය. මඳ වේලාවකින් ඔහු සොයා යාමට මම තීරණය කළෙමි. එවිටම වාගේ හෝම්ස් අප සිටි තැනට ආපසු පැමිණියේය. ඔහුගේ දෙනෙත්වල යම්කිසි දීප්තියක් මම දුටුවෙමි.

"යම්කිසි කාරණයක් ගැන ඔබ සතුටට පත්වෙලා වගෙයි හෝම්ස්?" මම ඇසීමි.

"මෙතැන තිබෙන ගැටලුව පැහැදිලි වෙන හෝඩුවාවක් මට හමුවුණා"

"ඒ මොකක්ද?"

"මේ කෑම කන කාමරයේ එකම ඔරලෝසුවක් වත් නැහැ. නමුත් විසිත්ත කාමරයේ නිවැරදි වේලාව දක්වන ඔරලෝසු දෙකක් අපට දකින්න ලැබුණා."

"ඉතින් ඒකෙ තිබෙන වැදගත්කම මොකක්ද?" විමසුවේ පොලිස් නිලධරයාය.

"වැදගත්කමද? අර තේ කෝප්ප තිබුණු මේසය අසලම බිම බුමුතුරුණ මත තිබී, සාක්කු ඔරලෝසුවේ වීදුරුවෙන් බිඳී ගිය කැබලි මට හමුවුණා" හෝම්ස් කීය. "ඒකෙන් මට ගත හැකි නිගමනය මෙයයි........"

ඔහුගේ කථාවට බාධාවූයේ කිසිවෙකු ඉදිරිපස දොරට කළ තට්ටු කිරීමකිනි. විවෘත කරන ලද දොරෙන් ඇතුළට ආවේ එළියේ මුරට සිටි පොලිස් භටයෙකි. ඔහු තම ප්‍රධානියා ඇමතුවේය.

"මහත්මයා. කාන්තාවන් දෙදෙනෙක් ඇවිත් ගෙට ඇතුළුවෙන්න උත්සාහ කළා. ඔවුන් කියනවා ඔවුන් මේ ගෙදර පදිංචිකාරයන්ලු. ඔවුනට........!"

පොලිස් පරීක්ෂකයා මෙයට පිළිතුරු දීමටත් පෙර, ඉදිරි දොරෙන් කාන්තාවක් නිවසට ඇතුළුවූවාය. නිල් පැහැති ඇඳුමකින් සැරසී සිටි ඇය වෙතින් දිස්වූයේ විඩාපත් පෙනුමකි.

"මයිකල්!" ඇය කෑ ගැසුවේ විසිත්ත කාමරය හරහා ගමන් කරමිනි. "මොනවද මෙතන මේ සිද්ධවෙන්නෙ?"

"ජෙනී!" ටේලර්ට කෑගැසිණි. ඉදිරියට දිව ගිය ඔහු දැතින්ම ඇය බදාගත්තේය.

"ඔයා මොන ලෝකෙකද ගිහින් හිටියෙ? ඔයා ගැන හිතාගන්න බැරුව මම මොන තරම් දුකෙන්ද කාලය ගත කළේ?"

"අද දවසේ මං වෙච්ච මහන්සියක්" කී ඇය ආපසු හැරී දොර අසල සිටි අනෙක් කාන්තාවට කෑගැසුවාය. "මරීටා එන්න! එන්න!"

ටේලර් අමුත්තන් අපට හඳුන්වා දුන්නේය. "මේ මගේ බිරිඳ" ඔහු කීවේ ප්‍රමාණයෙන් කුඩා ලාබාල කාන්තාව පෙන්වමිනි.

අප සැම දෙනෙකු වෙතම නෙත් යොමු කළ ටේලර් මහත්මිය අප ගැන සිය සැමියාගෙන් විමසුවාය.

"මේ කාණ්ඩෙ කවුද මයිකල්? මොන උවමනාවකටද එයාල මෙහේ ඇවිත් ඉන්නෙ? පොලීසියෙ අයත් ඇවිත්. ඇයි ඔයා අද මැංචෙස්ටර් ගියේ නැද්ද?"

සැමියාගෙන් පිළිතුරක් ලැබෙන තුරු නොසිටි ටේලර් මහත්මිය කෑමකන කාමරයේ දොර තල්ලු කරගෙන එහි ඇතුළු වූවාය. ඇයගේ ගමන අවහිර කිරීමට ඇගේ සැමියා උත්සාහ කළත්, ඔහු පමාවූවා වැඩිය. කාමරය මැදට ඇවිද ගිය ඇය ඊළඟ මොහොතේ, කන් බිහිරි කරවන හඬින් විලාප නගනු අපට අසන්නට ලැබිණි. ඊළඟ මොහොතේ අපට ඇසුණේ ඇය ක්ලාන්ත වී බිම ඇද වැටුණු ශබ්දයයි.

"නෝනා! මොකද වුණේ!" කියා කෑගසමින් මරීටා නම් වූ සේවිකාව එහි දිව ගියාය. එක් ක්ෂණයකින් ඇයගේ කෑගැසීම ද අපට ඇසිණි. "දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! මෙකෙ බිම ඉන්නවා නාඳුනන මිනිහෙක්. ඒක දැකලා නෝනා ක්ලාන්ත වුණා"

ඒ කාමරය තුළට මම වහා දිව ගියෙමි. ක්ලාන්තව බිම ඇද වැටී සිටි ටේලර් මහත්මිය දෙසට, ඇගේ සේවිකාව පහත් වී සිටියාය.

"ඔබේ නිවසේ සැල්වොලටයිල් ඖෂධය තියෙනවද? ඊට අමතරව බ්‍රැන්ඩි බෝතලයත් මා අතට දෙන්න" මම කීවෙමි.

මීළඟ පැය කාල තුළ සිදුවීම් ගණනාවක්ම විය. ක්ලාන්ත බවින් සුවය ලැබූ ටේලර් මහත්මිය, යථා තත්ත්වයට පත්වූවාය. පොලිස්





පරීක්ෂක විට්නි විසින් මළසිරුර පොලිස් රියකින්, මෘත ශරීරාගාරය වෙත යවන ලදී.

පැය භාගයක් ගතවෙද්දී විසිත්ත කාමරයට පැමිණෙන මෙන්, හෝම්ස් කාන්තාවන් දෙදෙනාගෙන් ඉල්ලා සිටියේය. ඔවුන් එතැනට පැමිණෙන විටත් එහි රැස්ව සිටියේ, පුවත්පත් වාර්තාකාර නීල් ජැක්සන්, පොලිස් පරීක්ෂක විට්නි, ටේලර් මහතා, හෝම්ස් සහ මා ය.

"අද සිදුවුණු පැටලිලි සහගත දේ පහදා ගැනීමයි අපට කරන්න තියෙන දේ" මගේ මිත්‍රයා කතාව ඇරඹීය. "අපි එක එක්කෙනා සතු තොරතුරු අපි බෙදා හදා ගමු. මුලින්ම මම ටේලර් මහත්මයා මුහුණ දුන් අත්දැකීම කියල පටන් ගන්නම්"

එසේ කී හෝම්ස්, ටේලර්ගේ මැංචෙස්ටර් ගමන අවලංගු වී ඔහු ගෙදර බලා පැමිණි අයුරු කීය. ඉන්පසු ටේලර් මුහුණ දුන් සිදුවීම් එකින් එක විස්තර කළේය. ඉන්පසු ඔහු පැවසුවේ වාර්තාකාර නීල් ජැක්සන් මේ නිවසට පැමිණ ඔහුට විඳින්නට සිදුවුණු අත්දැකීමය. අනතුරුව අප මේ නිවසට පැමිණි පසු මළසිරුරක් හමුවූ සැටිත් එය පාර්ලිමේන්තු මන්ත්‍රී හෙන්රි ජෙන්කින්ස්ගේ බැව් හඳුනාගත් ආකාරයත් විස්තර කළේය.

"ඉතින් ටේලර් මහත්මිය. ඔබ අද දවස ගතකළේ කොහොමද කියන කාරණය අපට පවසන මෙන් මං ඉල්ලා සිටිනවා"

"බොහොම හොඳයි" ටේලර් මහත්මිය කීවාය. "අද උදේ දහයට පමණ මගේ නමට විදුලි පුවතක් ආවා. ඒක එවල තිබුණේ මගේ සහෝදරයා චාලි, පෝට්ස්මත් නගරයෙන්"

"ඒක වෙන්න බැහැනේ." ටේලර් මහතා කතාවට බාධා කළේය. "චාලි ඉන්නේ නිව්යෝක් නගරයේ නේද? එයා දැන් එහේ නීති ශිෂ්‍යයෙක් කියල අපට දන්වා එව්ව නේ"

"ඒක ඔයා වගේම මමත් දන්නවා." ඇය පිළිතුරු දුන්නාය. "නමුත් ඒ වෙලාවෙ මට හිතුණේ මෙහෙම දෙයක්. මොනවා හරි අවාසනාවන්ත සිදුවීමක් හෝ කරදරයක් වෙලා, චාලිට ආපහු එංගලන්තයට ඒමට සිදුවුණා වත්ද? විදුලි පුවතේ සඳහන් වුණේ මං වහාම පෝට්ස්මත් නගරයට පැමිණිය යුතු බවයි. තමන් එහි දුම්රියපොළේ මා එනතුරු රැඳී සිටින බවත්, මා හමුවූ වහාම සියලුම දේ මට කියන බවත් විදුලි පුවතේ සඳහන් කර තිබුණා.

මගේ හිතට දැනුණේ ලොකු දුකක්. ඒ වගේම භයක්. ඔහු මුහුණ දීල ඉන්නේ මොන වගේ කරදර වලටද? ඒක හිතාගන්නවත් මට හැකියාවක් තිබුණෙ නෑ. මිනිත්තු දහයෙන් මං ගෙදරින් පිටත් වුණා.

දවල් එක වෙන්න කලින් මං පෝට්ස්මත් දුම්රියපොළට ළඟාවුණා. නමුත් එහිදී මගේ සොහොයුරා හමුවුණේ නෑ. ඔහුගේ පැමිණීමේ ප්‍රමාදයක් වෙන්න ඇති කියලයි මට හිතුණේ. ඉතින් දුම්රියපොළේ බංකුවක වාඩිවෙලා, මං පැයක් විතර බලාගෙන හිටියේ නො ඉවසිල්ලෙන්. අන්තිමේදී දුම්රිය පොළේ කාර්යාලයෙන් මං චාලි ගැන විමසුවා. එදා උදේ කිසිවෙකු දී තිබූ ලියුම් කැබැල්ලක් ඔවුන් ළඟ තිබුණා.

"දුම්රිය මගී ටේලර් මහත්මිය. දුම්රිය ස්ථානාධිපති භාරයේ" එහි පිටත ලියා තිබුණා. ඒකෙදි චාලි මෙහෙම සඳහන් කර තිබුණා. නොවැළැක්විය හැකි කරුණක් නිසා, ඔහුට වහාම සවුතැම්ටන් දුම්රියපොළට යෑමට සිදුවුණු බව. තමන් හමුවීමට එතැනට එන ලෙස ඔහු කියා තිබුණා. මං එවේලේම පිටත්වුණා. මං සවුත්හැම්ටන් වලට යද්දී සවස තුනහමාර වෙන්නැති. එහි පැයකට කිට්ටු කාලයක් බලාගෙන හිටියත් චාලිගේ ලකුණක් වත් දකින්න ලැබුණේ නෑ. ඔහු මා වෙත පණිවුඩයක් තබා තිබුණෙත් නෑ. අන්තිමේදී මං ආපහු ගෙදර එන්න තීරණය කළා. ඉතින් ලන්ඩනය බලා එන දුම්රියකට නැගුණා. වෝටලූ දුම්රියපොළේදී මට මරීටා හමුවුණා. ඊට පස්සෙ තමයි අපි දෙන්නා එකට ආපහු ගෙදර ආවේ."

"ඔබේ සොහොයුරා පෝට්ස්මත් සිට ඔබ වෙත එවූ විදුලි පුවත ඔබ ළඟ තියෙනවද?" හෝම්ස් විමසුවේය.

"නැහැ මහත්මයා" ඇය කීවාය. "ඒක ඒ වෙලාවෙ මගේ අතේමයි තිබුණේ. පස්සෙ බලන කොට තිබුණෙ නැහැ. මං හිතන්නේ එය එතැනදී මා අතින් වැටිලා"

"චාලි ඔබ වෙනුවෙන් ලියා, පෝට්ස්මත් දුම්රියපොළට දී තිබූ ලියුම් කැබැල්ල ඔබ ළඟ තිබෙනවද?"

"ඔව් මහත්මයා. මේ තියෙන්නෙ" කී ඇය තම අත් බෑගයෙන් ගත් නමා තිබූ කඩදාසියක් හෝම්ස් අත තැබුවාය. මගේ මිත්‍රයා එය පරීක්ෂා කර බැලුවේ මිනිත්තුවක පමණ කාලයකි. අනතුරුව ඔහු





අප සැමට එය කියවීමට හැකිවන පරිදි ඉහළට ඔසවා අල්ලාගෙන සිටියේය. එහි තිබුණේ ඇය කලින් සඳහන් කළ පණිවුඩයයි.

"මේ ඔබේ මල්ලීගේ අත් අකුරු කියා ඔබට හොඳටම විශ්වාසද?" හෝම්ස් ඇසීය.

"මට හිතෙන්නේ එහෙමයි" ටේලර් මහත්මිය කීවාය. "ඇයි ඔබට හිතෙන්නේ මේක වංචනික ලෙස සකස් කළ එකක් කියාද?"

"පැහැදිලිවම ඔව්. ඔබ වෙත එවුණු විදුලි පුවතෙන් හා මේ ලියුම් කැබැල්ලෙන් ඔවුන් අපේක්ෂා කර තිබුණේ එකම දෙයයි. ඒ තමයි හැකි තරම් කාලයකට ඔබ නිවසෙන් පිටත් කර, ලන්ඩන් නගරයෙන් ඈතට යවා තැබීම. ඔහු ඇමරිකාවේ සිට මෑතක ඔබට එවූ ලියුමක් ඔබ ළඟ තියෙනවාද? මං කැමතියි ඒ ලියුමේ අත් අකුරු සමග මේක සංසන්දනය කර බලන්න"

තම සොහොයුරා මෑතකදී එවූ ලිපියක් ඇය හෝම්ස් අතට දුන්නාය.

"ඔහුගේ අත් අකුරු වලට මෙහි අකුරුවල යම් සමාන කමක් තිබෙන බව ඇත්තයි" හෝම්ස් කීවේ ලියවිලි දෙක එක ළඟින් තබා පරීක්ෂා කළ පසුය. "නමුත් මේ ලියුම් කැබැල්ල වංචනික ලෙස සකස් කළ එකක්. ඒ ගැන මට කිසිම සැකයක් නෑ. හොඳයි අපි මීළඟට සවන් දෙමු අපේ අවසන් සාක්ෂිකාරිය මරීටා ක්වින් මෙනෙවියට"

"මට කියන්න තියෙන්නේ ඒ තරම් දිග කතන්දරයක් නෙමෙයි මහත්මයා" මරීටා කථාව ඇරඹුවාය. "ටේලර් මහත්මිය ගෙදරින් පිටවෙලා ගිහින් පැය තුනක් ගතවෙන්න ඇති. මා නමට විදුලි පුවතක් ලැබුණා. පෝට්ස්මත් දුම්රිය පොළෙන් ඒක එවා තිබුණේ ටේලර් මහත්මිය ම යි. ඒකෙ කියල තිබුණේ ගිනිඋදුන් පඩිය මත තබා තිබෙන පරණ ජෑම් බෝතලයෙන් පවුම් පහකුත් අරගෙන, මට වහාම පෝට්ස්මත් වෙත එන්න කියලා. අර පුංචි කෙල්ල නෝරාව තනියෙන් ගෙදර දාලා යන්න බැහැනේ. මං ඇයව ඇරලුවා බැටර්සීහි ඇගේ දෙමව්පියන් ගේ ගෙදරට. ඊළඟට අල්ලාගන්න පුළුවන් වුණු පළමුවැනි දුම්රියෙන්ම පෝට්ස්මත් බලා ගියා.

නමුත් එතැනදී මට ටේලර් මහත්මිය දකින්න ලැබුණේ නෑ. දුම්රියපොළ ඇතුළෙ මං පැයක් විතර බලාගෙන හිටියා. ඇය නොහිටි නිසා, මං ටිකට් නිකුත් කරන කාර්යාලයෙන් විමසා බැලුවා.

ඔවුන් ඇය ගැන දැනගෙන හිටියෙ නෑ. පස්සෙ කොහොම හරි එතැන ලිපිකරුවෙකුට මතක් වුණා; ඒ ටේලර් නමින් මහත්මියක් සෑහෙන වෙලාවක් පෝට්ස්මත් දුම්රියපොළේ බලාගෙන ඉඳලා සවුතැම්ටන් වෙත යන්න පිටත්වුණු බව. මං ඇහුවා ඇය මා නමට මොකක් හරි පණිවුඩයක් තබා ගියාද කියල. නමුත් එහෙම පණිවුඩයක් තිබුණෙ නෑ. ටේලර් මහත්මිය සොයාගෙන සවුතැම්ටන් වෙත යෑමෙන් වැඩක් වෙන එකක් නැහැ කියලයි මට හිතුණේ. ඉතින් මං ආපහු ආවා. වෝටලූ දුම්රියපොළේදී බැස්සාම මට ඇහුණා, ශබ්ද විකාශන යන්ත්‍රයෙන් කළ ප්‍රකාශයක්. සවුතැම්ටන් සිට එන දුම්රියක් තවත් මිනිත්තු දෙකකින් පළමුවැනි වේදිකාවට ළඟාවෙන බව. ඉතින් මං වේදිකාවට වෙලා බලාගෙන හිටියා. ඇය ඒ දුම්රියේ ආපසු පැමිණි බව දුටුවාම මගේ හිතට ඇතිවුණේ ලොකු සැනසීමක්"

"ටේලර් මහත්මිය. ඔබ මරීටාට පෝට්ස්මත් ඉඳල විදුලි පුවතක් එවන්න නැතුව ඇති?"

"කොහොමටවත් නෑ මහත්මයා"

"මරීටා ඔබ ළඟ තියෙනවද ටේලර් මහත්මිය ඔබ නමට එවූ විදුලි පුවත?"

සේවිකාව හිස සෙලවූයේ තමා ඒ ගැන කනගාටුවන ආකාරය පෙන්වමිනි. "පෝට්ස්මත් යද්දී මං ඒක අරගෙන ගියා. දුම්රියේදී තමයි ඒක මා අතින් නැතිවෙන්න ඇත්තෙ. දැන් නම් ඒක කොහේද කියල හොයාගන්න බෑ."

"ඒකට කමක් නෑ. ඒක එච්චර වැදගත් නෑ" හෝම්ස් කීය. "කාටවත් තියෙනවද ප්‍රකාශ කරන්න යමක්?"

සේවිකාව තේ පිළියෙල කිරීම සඳහා මුළුතැන් ගෙය දෙසට ගියාය. දිනයේ වූ සිදුවීම් ගැන කතාබහ ඇරඹුණේ ඒ අතරයි.

"මහ පුදුමාකාර පිස්සු වැඩක් තේ අද සිද්ධ වුණේ" ටේලර් මහතා කීය. "කොහොමටවත් නාඳුනන මනුස්සයො වගයක් මගේ ගෙට බලහත්කාරයෙන් කඩා වැදුණා. ඊට පස්සේ තේරුම් ගන්න අමාරු මොකක් හරි වැඩක යෙදුණා. ඊළඟට අර මිනිස්සු පිටවෙලා ගිහින්. මොන පිස්සු වැඩක්ද මේ සිදුවුණේ?"

"ආපු මිනිස්සු ඔක්කොම පිටවෙලා ගියේ නෑ" පොලිස් නිලධරයා කීය. "ඔබට මතක නේද අපි මෙහේට එනකොට එක්කෙනෙක් හිටියේ කෑම කන කාමරයේ බිම?"





"ඔහුට අනතුරක් කළ බවට සලකුණු නම් තිබුණෙ නෑ නේද?" ටේලර් ඇසීය.

"කවුද දන්නෙ? බාග වෙලාවට ඔහුට වස දුන්නා වෙන්නත් පුළුවන්" පොලිස් නිලධරයා පිළිතුරු දුන්නේය. "විෂ යෙදූ කෑමබීම දෙන එක ඔවුන්ට හොඳට හුරුපුරුදු පාටයි. ජැක්සන්ගේ කතාව ඇත්තක් නම්, ඔවුන් එයාටත් මොනව හරි වසක් තේ දීල තියෙන්නේ"

"මටත් තේරුම් ගන්න බැරි කාරණාව අන්න ඒක" පුවත්පත් වාර්තාකරු පැවසීය.

"මාව මෙහේට කැඳෙව්වා. ආව ඉක්මනින්ම වගේ නිදි බෙහෙත් දැමූ තේ බොන්න දුන්නා. ඊළඟට මාව ගේ පිටිපස්සෙ මිදුලට ඇලා ඔවුන් යන්න ගියා"

"තේරුම් ගන්න බැරි පුදුමාකාර පිස්සු වැඩක් කියල මං කිව්වෙ අන්න ඒකටයි" ටේලර් කීය.

"කොහොම වුණත් මට යන්න වෙලාව හරි" පුවත්පත් වාර්තාකරු කීය. "හෙන්රි ජෙන්කින්ස් මන්ත්‍රීතුමාගේ අබිරහස් මරණය ගැන, මං වහාම අපේ පුවත්පතට වාර්තාවක් ලිවිය යුතුයි. නැත්නං මේක හෙට උදේ පත්තරේට දාගන්න බැරිවෙනවා. ඇයි හෝම්ස් මහත්මයා ඔබ අත ඉස්සුවෙ? මං මෙතනින් යාම ගැන ඇයි ඔබ විරුද්ධ?"

ලොකු බන්දේසියක කෝප්ප හා පීරිසි රැසක්ද, ලොකු තේ පෝච්චියක්ද ගෙන, ගෘහ සේවිකාව මරීටා එතැනට පැමිණියේ ඒ මොහොතේ දී ය.

"මොහොතක් ඉන්න" හෝම්ස් කීවේ වාර්තාකරුට ය. "තේ කෝප්පයක් බීලම යන්න."

"අනේ මං දන්නෙ නෑ. ගිය සැරේ මේ ගෙදරදි තේ කෝප්පයක් බීලා මං එලොව ගිහින් මෙලොව ආවා"

"බයවෙන්න එපා" හෝම්ස් කීවේ සිනා වෙමිනි. "මේ ගමන තේ වලින් ඔබට හොඳ උත්තේජනයක් ලැබේවි"

බන්දේසියේ තිබූ තේ කෝප්ප හා පීරිසි මේසය උඩින් තැබූ මරීටා, ඒවාට පෝච්චියෙන් තේ වත් කළාය. අනතුරුව පිරිසට තේ කෝප්ප පිළිගැන්වූවාය. ඉක්මනින් මුළුතැන් ගෙය වෙත දිව ගිය මරීටා ඉක්මනින් ආපසු ආවාය. ඇය ගෙන ආවේ කේක් කැබලි පිරවූ පිඟානකි.

"ඔබට වුණේ ලොකු වැරදීමක් නේද?" හෝම්ස් විමසුවේ එතැනින් පිටවී යාමට සූදානම් වූ මරීටාගෙනි.

ඒ වනවිට හෝම්ස්ගේ අතේද කේක් කැබැල්ලක් තිබිණි. ඔහු කළ ප්‍රකාශයට සේවිකාව ඔහු දෙස බලා සිටියේ අතිශය පුදුමයෙනි.

"ඒ මොකක්ද මහත්මයා?" ඇය ඇසුවාය.

"නෑ නෑ. කේක් හැදීම ගැන නෙමෙයි. ඒ කටයුත්තට ඔබ අතිදක්ෂ තැනැත්තියක බව මට දැනගන්න ලැබුණා."

"ස්තුතියි මහත්මයා"

"ඔබට වැරදුණා කියල මං කිව්වේ, අර විද්‍යුලිපුවත ගැන කතන්දරය......."

"ඒ මොකක්ද මහත්මයා?"

"ඔබට ලැබුණු විදුලිපුවතේ අඩංගුවුණු කරුණු ඔබ අපට කිව්ව නේ?"

"ඔව් මහත්මයා"

"ගිනිඋදුන් පඩිය මත ඇති පරණ ජෑම් බෝතලයෙන්, පවුම් පහේ කාසියක් අරගෙන පෝට්ස්මත් බලා එන්න කියලයි, ඔබ නමට ලැබුණු විදුලි පුවතෙ සඳහන් වුණේ. එහෙම නේද?"

"ඔව් මහත්මයා"

"ඒ බෝතලයේ මුලින් තිබුණෙ මොන වර්ගයේ ජෑම්ද?"

"ස්ට්‍රෝබෙරි ජෑම්" ටේලර් මහත්මිය කීවාය.

"ඒක හිස්වෙලා හුඟක් කල්ද?"

"ඔව් මාසයකට වැඩියි"

"ඊට පස්සෙ ඔබ ඒක මුදල් දැමීමට පාවිච්චි කළා?"

"ඔව්"

"හොඳයි. මං කියන මේ කාරණය කවුරුත් හිතට ගන්න. පවුම් පහක් ජෑම් බෝතලයෙන් අරගෙන පෝට්ස්මත් වෙත එන්න කියා, විදුලිපුවත එව්වේ ටේලර් මහත්මිය නම් කිසිම ප්‍රශ්නයක් නෑ. නමුත් දැන් අපි දන්නවා, ඇය එහෙම විදුලි පුවතක් කොහොමටවත් නො එවූ බව. එහෙම නම් ඒක එවල තියෙන්නේ අපි නොදන්නා පිටස්තරයෙක්. ඒ මොකටද? මේ ගෙදර පදිංචිකරුවන් ප්‍රයෝගයෙන් මේ ගෙදරින් ඉවත් කර තබන්න.

මෙතැන තියෙන ලොකුම පුදුමය මේකයි. මේ විදුලිපුවත එවූ පිටස්තර පුද්ගලයා කොහොමද දන්නේ, පහසුවෙන් ගැනීමට පුළුවන් විදියට, අමතර මුදලක් ගිනි උදුන් පඩිය මත තිබෙන බව? අනික මේ මුදල් දමා තිබෙන්නේ පරණ ජෑම් බෝතලයක බව? බොහොමයක් ගෙවල්වල හදිසියට ගැනීමට සුළු මුදලක්, ගිනිඋදුන් පඩිය මත තබන බඳුනක දමා ඇති බව ඇත්තයි. නමුත් ඒ පවුම් ගණනින් නෙමෙයි. පැන්ස ගණන්වල කුඩා කාසි. කලාතුරකින් සිලිං කාසි. ඒත් උපරිම මුදල සිලිං දහයක් කියලයි මං විශ්වාස කරන්නේ.

නමුත් මෙතැන තිබෙන ප්‍රධානම ගැටලුව, මුදල් දමා තිබෙන්නේ ජෑම් බෝතලයක බව අර පිටස්තරයා දැනගෙන හිටියේ කොහොමද කියන එකයි. මේ ගෙදර එවැනි මුදලක් දමා තිබෙන්නේ ජෑම් බෝතලයක බව, ඔහු කොහොමද දැනගත්තේ? ගෙවල් විශාල ප්‍රමාණයක මෙවැනි කටයුතු සඳහා පාවිච්චි කරන්නේ, පයිප්ප දුම්කොළ හෝ සිගරට් අසුරා එවන භාජන. එයිනුත් වඩාම ජනප්‍රිය ඇල්ෆ්‍රඩ් ඩන්හිල් සහ පීටර් ස්ටුවසෙන්ට් වර්ගවල දුම්කොළ අසුරන ටින්. මේ ගෙදර ප්‍රධානියා - ටේලර් මහත්මයා මොනම ආකාරයකින් වත් දුම් පානය නොකිරීම නිසා ගැටලුව ලිහිල් වෙනවා. දුම්කොළ අසුරන ටින් නොතිබීම නිසා සමහර ගෙවල්වල මේ කටයුත්තට භාවිත කරන්නේ ටොෆී ටින්, සහ කෝපි ටින්. එම කටයුත්තට ජෑම් බෝතලයක් යොදවන්නේ ඉතාමත් කලාතුරකින්. ඉතින් මේ ගෙදර ඒ කටයුත්තට ජෑම් බෝතලයක් තිබෙන බව ඔහු දැන සිටීම පුදුමයි නේද?"

"මං දන්නෙ නෑ මහත්මයා" මරීටා කීවේ තම ස්වාමිදූව දෙස බලමිනි.

"මං දිහා බලන එකෙන් වැඩක් නෑ මරීටා. විදුලිපුවත එව්වෙ මම නෙමෙයිනේ. ඉතින් ඕක පැහැදිලි කරන්න මට පුළුවන් කමක් නෑ"

"ජෑම් බෝතලයේ මුදල් තබන බව ඔබ කාට හරි කිව්වද?" හෝම්ස් විමසුවේ ටේලර් මහත්මියගෙනි.

"කවදාවත් කිසි කෙනෙකුට කියල නෑ" ඇය කීවාය.

"එහෙම නම් පිට කෙනෙකු කොහොමද ඒ කාරණාව දැනගත්තෙ?" හෝම්ස් ඇසීය.

"මම දන්නෙ නෑ මහත්මයා" සේවිකාව පිළිතුරු දුන්නාය.

"මට හිතෙනවා ඒක සිද්ධවෙන්න ඇත්තෙ මෙහෙමයි." හෝම්ස් කීවේ මරීටා අමතමිනි. "මේක ඔබට වුණු පටළැවිල්ලක් විය

යුතු යි. විදුලිපුවතෙ සඳහන් වෙන්න ඇත්තෙ පවුම් පහක මුදලක් අරගෙන එන්න කියලා වෙන්න ඇති. නමුත් හදිසියට එහෙම මුදලක් හොයාගන්නෙ කොහෙන්ද? එවැනි මුදලක් ගිනිළඳුන් පඩිය මත තබන ජෑම් බෝතලයේ තිබෙන බව ඔබට මතක් වුණා. ඔබ අපට කිව්වේ ඔබේ මොළේට ආව ඒ කාරණාවයි; නැතුව හරියටම විදුලි පුවතේ තිබුණු දේ නොවෙයි. එහෙම නේද මරීටා?"

සේවිකාව තළල රැළි කරගෙන කල්පනා කළාය.

"බාගවෙලාවට එහෙම වෙන්න ඇති මහත්මයා" ඇය අන්තිමේදී කිවාය.

"ඒ කාරණය ඔබට හරියටම මතක නැද්ද?"

"දැන් මට මතක්වෙනවා මහත්මයා. ජෑම් බෝතලයේ කියා ඒකෙ තිබුණෙ නැහැ නේන්නං. ටේලර් මහත්මිය මුදල් තබන්නෙ ඒකෙ කියා මං දැනගෙන හිටියා"

"විදුලි පුවතෙ කියල තිබුණෙ ඔබට පවුම් පහක් අරගෙන එන්න කියලා. ඒක හරිද?"

"ඔව් මහත්මයා"

"ජෑම් බෝතලයේ එපමණ මුදලක් තිබුණද?"

"ඔව් මහත්මයා"

"රත්තරන් පවුම් වලින්?"

"ඔව් මහත්මයා"

"මෙන්න තවත් අද්භූත කාරණයක්" හෝම්ස් කීය. "මට ඒක තේරුම් ගන්නත් අමාරුයි. මේ ගෙදර අය නොහඳුනන සම්පූර්ණ පිටස්තරයෙක් කොහොමද, එපමණ ලොකු මුදලක් පහසුවෙන් ගන්න පුළුවන් තැනක තියෙනවා කියල දන්නෙ?"

"නෑ මහත්මයා. මං ඒ මුදල පරෙස්සම් කරගත්තා. වෝටලූ දුම්රියපොළේදී ටේලර් මහත්මිය හමුවුණු ගමන්ම මං ඒ මුදල ඇයට භාර දුන්නා"

"ඒ ගැන මට අවිශ්වාසයක් නෑ මරීටා" හෝම්ස් කීය. "මේ විදුලිපුවත එව්වේ ටේලර් මහත්මිය නම්, ඒ ගැන කිසිම ප්‍රශ්නයක් පැන නගින්නේ නෑ. තමන්ගේ ගෙදර මෙතරම් මුදලක් ගිනිළඳුනේ පඩිය මත තිබෙන බව ඇය හොඳින් දන්නා නිසා. නමුත් එහෙම විදුලි පුවතක් තමන් නොඑවූ බව ටේලර් මහත්මිය කියනවා නේ. අපි තවමත් නොහඳුන පිටස්තර කෙනෙක් කොහොමද, ඔබේ





නෝනයි මහත්මයයි ඔබයි පමණක් දන්නා මේ කාරණය දැනගෙන හිටියෙ?"

"අනේ මං දන්නෙ නෑ මහත්මයා. මට කිසි දෙයක් හිතාගන්න බෑ. මගේ ඔළුව ඔක්කොම අවුල් වෙලා"

"එහෙම අවුල් කරගන්න එපා. ඔක සිදුවුණේ කොහොමද කියන එක ගැන, මට තියෙනවා විසඳීමක්"

"ඒ මොකක්ද මහත්මයා?"

"මේ ඔක්කොම ඔබ හිතේ මවාගත් දේවල්. ඔබ කියන විදියේ විදුලිපුවතක් පෝට්ස්මත් වලින් මේ ගෙදරට ලැබුණෙත් නෑ. ඒ ඔක්කොම අපර භාගයේ මේ ගෙදරින් පිටවී ඉන්න ඔබ යොදාගත් උපක්‍රම!"

"නෑ මහත්මයා!" මරීටා නම් සේවිකාවට කෑගැසිණි. ඇය අඩියක් පිටුපසට තැබුවේ භීතියට පත් ආකාරයෙනි.

"සිද්ධවුණු දේ මං කියන්නම්" හෝම්ස් කීය. "මට වැරදෙන තැන් තියෙනවා නම් ඔබට පුළුවනි නිවැරදි කරන්න.

"තෝරා කියන ගෑනු ළමයා ගේ ඇතුළෙ වැඩක යෙදී ඉන්න වෙලාවෙ ඔබ මොකද කළේ? ඔබ ගිහින් ඉස්සරහ දොර ඇරලා, ඔබම උස් හඬින් දොරට තට්ටු කළා. ඊළඟට ඔබ ඇවිත් තෝරාට කිව්වා, ඔබේ නමට ටේලර් නෝනාගෙන් විදුලි පුවතක් ඇවිත්; ඔබට වහාම පෝට්ස්මත් බලා යන්න සිදුවෙන බව. ඒ නිසා ඇයට තමන්ගේ දෙමව්පියන්ගේ ගෙදරට යන්න සිදුවෙන බව. ඇය ළාබාල දැරියක බව මට අහන්න ලැබුණා. ඒ නිසා ප්‍රශ්න නොඅසාම ඔබ කියූ දෙය ඇය පිළිගත්තා. ඇය මේ ගෙදරින් ඉවත් කළාට පස්සේ ඔබේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ඔබට හැකිවුණා"

"නෑ නෑ! එහෙම දෙයක් වුණේ නෑ!"

"මරීටා. ඔබ කොහොමටවත් පෝට්ස්මත් වෙත ගියේ නෑ. ඔබ හිටියේ ලන්ඩනයේ. නමුත් ඔබ ටේලර් මහත්මිය මුණගැහෙන්න වෝටර්ලූ දුම්රිය පොළට නම් ගියා. එතකොට ඔබ ගෙතූ ප්‍රබන්ධ කතාව ඇත්තක් ලෙස ඇයට ඒත්තු ගන්වන්න පුළුවන් නිසා"

"නෝනා!" කෝපයට පත් සේවිකාව කීවේ තම ස්වාමිදුව දෙසට හැරෙමිනි. "බලන්න මේ මහත්මයා කියන කතාව. මේක හරිම අසාධාරණයි. ඇයි ඔහු නිස්කාරණේ මට මේ විදියට දොස් පවරන්නේ?"

"ඔබට ඉන්නවා නේද සොහොයුරියක්?" හෝම්ස් විමසුවේ සේවිකාවගේ දෝෂාරෝපණය නොසලකමිනි.

මේ ප්‍රශ්නයෙන් තිගැස්සුණු ඇය තුෂ්නිම්භූත වූවාය. කිසිවක් නොකී ඇගේ මුව සෙමෙන් ඇරිණි.

"කෝ කෝ? මට මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න" හෝම්ස් කිවේ වඩාත් මිත්‍රශීලී ආකාරයෙනි. "කෙනෙකුට සොහොයුරියක් ඉන්න එකේ කිසිම වැරැද්දක් නෑ. ඒක අපරාධයක් නෙමෙයි. එහෙම ඉන්නවා කියල කවුරුවත් ඔබව අත් අඩංගුවට ගන්නෙ නෑ. මට කියන්න. ඔබට ඉන්නවා නේද සොහොයුරියක්?"

"ඔව් මහත්මයා"

"මං හිතන්නේ ඇගේ නම ලොරේටා. හරිද?"

සේවිකාවගේ දෙනෙත් විශාල විය. ඇගේ දැත් දෙකම්මුල් වෙත ගියේ ඇගේ මවිතය පෙන්වමිනි. ඇගේ මුහුණ ක්‍රම ක්‍රමයෙන් සුදුමැලි වූ අයුරු මම දුටුවෙමි.

"දෙවියනේ! ඔබ කොහොමද මේව දන්නෙ?"

"ඒවා දැනගැනීම මගේ වෘත්තියේ එක් අංශයක්." හෝම්ස් කීය. "මරීටා සහ ලොරේටා කියන නම් ඉතාලි සම්භවයක් ඇති නාම. 1870 දී හෙන්රි ජෙන්කින්ස් ඔබේ සොයුරිය ලොරේටා ක්වින් විවාහ කරගත්තා. ඒ කියන්නෙ මීට අවුරුදු දහහතකට කලින්. නමුත් පසුව ඔහු ඇයව අත්හැර දැම්මා. ඔහු ඇයට සැලකුවේ ඉතාම නින්දිත විදියට........"

මෙතෙක් වේලා නැගිට මේ කථාවට සවන්දීගෙන සිටි මරීටා ක්වින් නම් සේවිකාව, දෙපා අප්‍රාණික වූ කලක මෙන් බිම ඇද වැටුණාය. දෑතින්ම මුහුණ වසාගත් ඇය ඉකිගසමින් නොනවත්වාම හඬා වැලපුණාය.

"මේ කතන්දරේ ඇත්තක්ද මරීටා?" මයිකල් ටේලර් මහතා විමසුවේය.

ඉකිගසා හඬමින් සිටි ඇයට, ප්‍රශ්නවලට පිළිතුරු දීමට හැකියාවක් නොවීය. හඬමින් ම යමක් කීමට ඇය උත්සාහ කළාය. එහෙත් මුවෙන් පිටවූ වචන තේරුම් ගැනීමට අපහසු විය. ඇය ගැන අනුකම්පා කොට කවුරුත් නිහඬ වූ පසු හැඬීම නැවතිණ. මගේ මිත්‍රයා ඇයගෙන් ඉල්ලීමක් කළේ එයින් පසුවය.

"අද මේ ගෙදර හරියටම සිද්දවුණේ මොකක්ද කියලා අපට පැහැදිලි කරන්න මරීටා" හෝම්ස් කීවේ කාරුණික හඬෙනි. "එතකොට මේ ගැන කාටත් තේරුම් ගන්න පුළුවන් වෙනවා"





මිළඟට ඇය සඳහා ගෙන එන ලද පුටුවේ හිඳගත් මරීටා ක්වින් පහත සඳහන් ප්‍රකාශය කළාය.

"මගේ අක්කා ලොරේටා මට වඩා අවුරුදු දෙකක් වයසින් වැඩියි. අපි දෙන්නා ඉපදිලා හැදුණෙ වැඩුණෙ මේ ලන්ඩනයේ. අපේ පියා ජුලියස් ක්වින්, මව ජෙසිකා ක්වින්. ඔවුනට හිටි ළමයි මා සහ අක්කා පමණයි. මගේ වයස අවුරුදු දොළහ කාලෙ අපේ පවුලම ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වුණා. අපි ගියේ මෙල්බර්න් පළාතට. එහි බැලරට් ප්‍රදේශයේ රත්රන් ආකරවල හොඳ රැකියාවක් ගැනීමට හැකිවේවි කියල මගේ පියා විශ්වාස කළා.

ඒ කාලයේ මෙල්බර්න් ප්‍රදේශයේ සිටි කර්නල් හේවඩ් ගේ නිවසේ මට රැකියාවක් ලැබුණා. මුළුතැන්ගෙයි සේවිකාවක ලෙස මුලින් කටයුතු කළ මට, පසුව කෝකි තනතුර ලැබුණා. එහි සේවා කාලය අවසන් කළාම කර්නල් හේවඩ්ට ආපසු එංගලන්තයට ඒමට සිදුවුණා. ඔවුන් සමග එංගලන්තයට එන මෙන් ඔවුන් මගෙන් ඉල්ලා හිටියා. මං ඒකට එකඟ වුණා.

මේ අතරේ මගේ අක්කා මෙල්බර්න්හි සාන්ත පෝල් දෙව්මැඳුරේදී විවාහ වුණා. ඇය විවාහ වුණේ කඩවසම් තරුණයෙකු වුණු හෙන්රි ජෙන්කින්ස් සමගයි. එතකොට ඇගේ වයස අවුරුදු 21 යි. ඇගේ එම තීරණය ගැන මට දොසක් කියන්න බැහැ.

හෙන්රි ජෙන්කින්ස්ට කඩවසම් පෙනුමක් තිබුණා. ඔහු කරන්න බලාපොරොත්තු වෙන ලොකු ලොකු දේවල් ගැන ඔහු කථා කළේ බොහොම ආඩම්බරයෙන්. හෙන්රි ජෙන්කින්ස් කියන්නේ කතාව මිස වැඩක් කරගන්න බැරි කෙනෙකු බව අපට පෙනුණේ ටික කලක් ගතවෙද්දි. ලොකු ලොකු සැලසුම් තිබුණත් ඔහුට හරි රක්ෂාවක් තිබුණෙ නෑ. ඔවුන් විවාහ වෙලා අවුරුදු දෙකක් ගතවෙන කොටත් තත්ත්වය ඒ වගේමයි.

මෙල්බර්න් සිට සැතපුම් සිය ගණනක් රට ඇතුළේ අලුත් රත්රන් ඉල්ලම් වගයක් හමුවුණේ ඔය කාලෙදි. තමන් විශාල ධනවතෙකු වෙලා තමයි ආයෙ ගෙදර එන්නේ කියූ ජෙන්කින්ස් එම රත්රන් ඉල්ලම් ගොඩ ඇමූ ප්‍රදේශය බලා පිටත් වී ගියා. නමුත් ඔහු කවදාවත් ආපහු ආවෙ නෑ. ඔහු ගිහින් අවුරුද්දකට පමණ පසු ගෙදරට ආරංචියක් ආවා. ඒ රත්රන් ඉල්ලම් හෑරූ පතලක් තුළ සිදු වූ පස් කඩාවැටීමක් නිසා, එයට යටවූ හෙන්රි

ජෙන්කින්ස් මියගොස් ඇතිබව. ඔහු පිටත්ව යන කොටත් මගේ අක්කා සිටියේ දරු ප්‍රසූතියට ළංවෙලා. ඔහු ගිහින් ටික දවසකින් ඇයට කුඩා දියණියක් ලැබුණා. ඇයට ජීවිතයට තනියම මුහුණ දෙන්න සිදුවුණා. කුඩා දරුවෙකුත් හදාගන්නා ගමන් රැකියාවක් කිරීම අපහසු කටයුත්තක් බව අපට දැනගන්න ලැබුණා. රෝගීනට හෙදකම් කරන සාත්තු සේවිකාවක ලෙසයි ඇයට රැකියාවක් ලැබුණේ. තමන් ඉතා දුෂ්කර ජීවිතයක් ගතකරන බව ඇය තමන්ගේ ලියුම්වල මට දන්වා තිබුණා.

අවුරුදු ගණනාවක් ගතවුණා. මා රැකියාව කළ තැන කර්නල් හේවඩ් මියගියා. මේ වෙනකොට මගේ වෘත්තියේ මා හොඳ පළපුරුද්දක් ලබා තිබුණු නිසා, මට රැකියාවක් හොයා ගැනීම අමාරු වුණේ නෑ. මුලින් ඉප්ස්විච්වල එඩිංටන් සාමිවරයාගේ නිවසේ රැකියාව කළා. ඊටපසු නෝටන් සාමිවරයාගේ නිවසේ රැකියාවක් ලැබුණා. ඔහු දේශපාලන ක්ෂේත්‍රයේ හුගක් සම්බන්ධකම් තිබෙන කෙනෙකු බව ඔබ දන්නවා. ඔහු තම නිවසේ අමුත්තන් වෙනුවෙන් නිතර භෝජන සංග්‍රහ පැවැත්වූ කෙනෙක්. ඒ පැමිණෙන අමුත්තන් කළ කතාබහ නොයෙක් වර මගේ කනට වැටුණා. නමුත් ඒවා මට වැදගත් වුණේ නැහැ. ඒ නිසා මං ඒවාට කන්දුන්නේ නෑ. නමුත් අමුත්තන් ගෙන් කෙනෙක් එක දවසක් හෙන්රි ජෙන්කින්ස් කියන නම සඳහන් කළා. එය නම් මගේ කනට තදින් වැදුණා. ඒත් මේ අවුරුදු ගණනාවකට කලින් මා ඕස්ට්‍රේලියාවෙදි දැන හිටි හෙන්රි ජෙන්කින්ස් කියා මං හිතුවේ නෑ.

කොහොම වුණත් දින කීපයකින් නෝටන් සාමි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් වෙනුවෙන් භෝජන සංග්‍රහයක් පැවැත්තුවා. හෙන්රි ජෙන්කින්ස් කියන නම ඒ අමුත්තන්ගේ ලේඛනයේ තිබුණා. ඔහුට නොපෙනෙන ආකාරයට, නමුත් සමීපව ඉඳගෙන ඔහුව දැකගන්නට මට අවස්ථාවක් ලැබුණා. ඒ දර්ශනයෙන් මට ඇතිවුණේ කම්පනයක්. තව ටිකෙන් මා ක්ලාන්ත වී ඇද වැටෙනවා.

මා ඔහු දැක තිබුනේ කෙසඟ තරුණයෙකු හැටියට. නමුත් අවුරුදු ගණනාවකට පසු වුණත් ඔහු අඳුනාගැනීම මට අපහසුවුණේ නැහැ. ඒ මගේ අක්කාගේ ස්වාමිපුරුෂයාම තමයි. මන්ත්‍රී වරයෙකු ලෙස පත්වී ඔහු ගෙවන සුඛෝපභෝගී ජීවිතය නිසා වෙන්න ඇති ඔහු අධික ලෙස තරබාරු වී තිබුණා. අශ්ව කරත්ත වලම ගමන්





කොට, ව්‍යායාම නොමැතිවීම නිසාම වෙන්න ඇති, ඔහුට තිබුණේ රෝගී පෙනුමක්.

ඕස්ට්‍රේලියාව අත්හැර දමා ඔහු එංගලන්තයට ආවේ ඇයි කියන කරුණ මට තේරුම් ගැනීමට හැකි වුණා. විශාල ධනවතෙකු වී ආපසු එන බව කියමින් රත්රන් ඉල්ලම් සොයා ගිය ඔහුගේ වැඩ කටයුතු අසාර්ථක වෙන්න ඇති. යළිත් වරක් දුප්පතෙකු ලෙස ගෙදර ඒමට ඔහුට ලැජ්ජා හිතෙන්න ඇති. ඉතින් බිරිඳ හා දරුවා අත්හැර දමා හොරෙන්ම එංගලන්තයට එන්න ඔහු තීරණය කරන්න ඇති.

මේ පුද්ගලයා ගැන ඕස්ට්‍රේලියාවේ ජීවත්වෙන අක්කාට කියම්දෝ නොකියම්දෝ සිතමින්, මං ගතකළේ අසහනකාරී ජීවිතයක්. ඔහු නිසා ලැබුණු දියණිය ද සමග ජීවත්වීම සඳහා අක්කා සටනක යෙදෙද්දී, ඇගේ ස්වාමි පුරුෂයා මන්ත්‍රීවරයෙකු ලෙස මෙහේ සුවපහසු ජීවිතයක් ගත කරනවා. කොහොම වුණත් අන්තිමේදී ඇයට සත්‍යය හෙළි කරන්න මං තීරණය කළා. එය දැනගත්තාම ඇගේ හිතේ ඇතිවුණේ බරපතළ කම්පාවක්. ඒ ගැන දිගින් දිගටම විස්තර මං ඔබට කියන්න යන්නේ නෑ. නමුත් ඒ දූෂ්‍ය සැමියා දැකීමට තමන් කවදාහරි දවසක එංගලන්තයට එන්න ඇය තීරණය කර තිබුණා.

ඇයට සහ ඇගේ දුව වික්ටෝරියාට එංගලන්තය බලා එන්න නැව් ගාස්තු ලෙස, විශාල මුදලක් අවශ්‍ය වුණා. මාස ගණනක් මහන්සි වී ඒ මුදල ඉතිරි කරගන්න ඇයට හැකිවි තිබුණා. දුව වික්ටෝරියා සමග මගේ අක්කා එංගලන්තයට ආවා.

හෙදියක ලෙස ඕස්ට්‍රේලියාවේ සේවය කොට ඇය ලබා තිබූ පළපුරුද්ද ඇයට ප්‍රයෝජනවත් වුණා. එයින් ඇයට හැකිවුණා පෝට්ස්මත් නගරයේ වෛද්‍ය ආයතනක රැකියාවක් ලබාගන්න. ඒ අතරම ඇයගේ දියණියට පුහුණුවන ගෘහසේවිකා තනතුරකුත් සොයාගත්තා.

එයින් පස්සේ අපි කිහිප වාරයක් හමුවී කතාබස් කළා. හැම වාරයකම ප්‍රධාන මාතෘකාව වුණේ ඔහු. ජෙන්කින්ස් හමුවීමට අවස්ථාවක් ලබා ගැනීම තමා ලොකුම ප්‍රශ්නය වුණේ. ඒ මොකද දුප්පතුන් මගහැරී ඔහු, හැමවිටම ආශ්‍රය කළේ ඉහළ තනතුරු තිබූ ප්‍රභුවරුන්. ධනවත් ප්‍රභුවරියක ලෙස පෙන්වීමට ලොරේටා, ට

හැකිනම් ඇගේ සැමියා කොටුකර ගැනීමට හැකිබව අප තේරුම් ගත්තා.

මේ අතරේ නෝටන් සාමිවරයාට එංගලන්තයෙන් යන්න සිදුවුණා. ඒ ඉන්දියාවේ ප්‍රාන්තයක ආණ්ඩුකාර ධූරයක් ලැබීම නිසා. ඔවුන් සමග මට ඉන්දියාවට යන්න තිබුණා. නමුත් එංගලන්තය හැරදමා යන්න මං කැමති වුණේ නැහැ. ඒකෙන් නෝටන් සාමි ළඟ මට තිබුණු රැකියාව අහිමි වුණා. ටේලර් මහතා සහ මහත්මිය ඔවුන් ළඟ රැකියාවක් මට ලබා දෙන්න තරම් කාරුණික වුණා.

මීළඟට එක දවසක් අක්කා සහ මම හමුවුණු වෙලාවෙ අපි කතාකළේ මෙහෙම දෙයක්. ටේලර් මහත්මයයි නෝනයි මේ ගෙදරින් පිටවෙලාම ඉන්න දවසක් තිබුණොත් අපට හෙන්රිව මෙහේ ගෙන්වා ගන්න පුළුවන් නේද කියලයි. ඒ අතරෙදි තමයි මේ අවස්ථාව උදාවුණේ. ටේලර් මහත්මයාට මැංචෙස්ටර් යාමට සිදුවෙලා එක දවසකට ගෙදර නො එන බව කලින් කිව්වා. හොඳින් සැලසුම් කර ගත්තොත් ලොරේටාට ඇගේ සැමියා හමුවෙන්න මේ දවස යොදා ගත හැකි බව මට කල්පනා වුණා.

ටේලර් මහත්මියගේ සොහොයුරා චාල්ස් ඇමරිකාවේ ඉන්නා බව මං දැන හිටියා. ඔහුට එහේ ස්ථිර රැකියාවක් නොලැබීම ගැන ඇය හැමවිටමත් කථා කළේ සිත් වේදනාවෙන්. ඔහුගේ නමින් විදුලි පුවතක් ලැබුණොත්, ඇය වහා ක්‍රියාත්මක වන බව මට විශ්වාසයි. ඒ නිසා චාල්ස් මහත්මයා එවන විදියට විදුලි පුවතක් පෝට්ස්මත් සිට එව්වේ ලොරේටා. ලන්ඩන් බලා එන දුම්රියේ නගින්න කලින්, ඇය චාල්ස් මහත්මයා ලියන විදියට ලියූ ලියුම් කැබැල්ලකුත් පෝට්ස්මත්හි දුම්රිය කාර්යාලයට භාරදී තිබුණා. ඒක ලියුවේ මම. ඔහු මේ ගෙදරට එවා, ලාච්චුවක තිබුණු ලියුමක අත් අකුරු බලාගෙනයි මං ඒක ලිව්වේ. මේ අතරේ ඇය තම ස්වාමිපුරුෂයා වෙත යැවීමට ලියුමක් සකසා එය මා වෙත එව්වා. ඒ මෙහෙන් තැපැල් කරන්න.

තමන් හා දරුවා අත්හැර දමා හෙන්රි ඔස්ට්‍රේලියාවෙන් එංගලන්තයට හොරෙන් පැන ඒම ගැන, ලොරේටා හරි සිත් වේදනාවෙන් හිටියේ. ඔහු මෙහේට වෙලා සුඛෝපභෝගී ජීවිතයක් ගතකළා විතරක් නෙමෙයි; සමාජයේ ඉහළ තනතුරකටත් ඇවිත්. මේ ගැන ඔහුට චෝදනා කොට, මාස්පතා ඔහුගෙන් දීමනාවක්





ලබා ගන්නයි ඇයට උවමනා වුණේ. නමුත් ඔහු මෙය කෙළින්ම ප්‍රතික්ෂේප කර දමන්න ඉඩ ඇති බවත් අපට අමතක වුණේ නැහැ. නමුත් එය රටේ මහජනයාට දැනගන්න ලැබෙන ලෙස ප්‍රසිද්ධ වුණොත්, ඔහුට ඒ ආකාරයෙන් මගහරින්න නොලැබෙන බව ස්ථිරයි. ඒ නිසයි මේ ගැන සාක්ෂිකරුවෙකු වීමට පුවත්පත් වාර්තාකාරයෙකු ගෙන්වා ගන්න මං හිතුවේ.

ටේලර් මහත්මයා කියවන්නේ නිව්ස් ඔෆ් ද වර්ල්ඩ් පුවත්පත, ඒකෙ පාර්ලිමේන්තු වාර්තාකරු නීල් ජැක්සන් කියන නම, අපේ මහත්මයා නිතර සඳහන් කරන නමක්. හෙන්රි පාර්ලිමේන්තුවේ කළ කථා මේ වාර්තාකාර මහත්මයා පුවත්පතට ලියා තිබුණා. ඒ නිසා ඔහු ඉදිරිපිට හෙන්රි මෙල්ල කර ගැනීම හුඟක් පහසු වේවි කියලයි අපි අනුමාන කළේ."

මේ අවස්ථාවේ කතාව අත්හිට වූ මරීටා යළිත් වරක් ඉකිගසමින් හඬන්නට පටන් ගත්තාය. ඒ අතරම අප ඇමතුවාය. "මට සමාවෙන්න! කවුරුත් මට සමාවෙන්න. ඔබ හැමදෙනාම කරදරයටත් කැලඹීමටත් පත් කිරීම ගැන වැරැද්ද මං භාරගන්නවා. හෙන්රි ජෙන්කින්ස් කියන නම මට ජීවිතේටම අහන්න නොලැබුණා නම් කොයිතරම් හොඳද. මගේ අක්කාට එහෙම කෙනෙක් කවදාවත් හමු නොවුණා නම් මෙහෙම ප්‍රශ්නයක් කවදාවත් ඇති නොවෙන්න ඉඩ තිබුණා"

"ඔබ දෙදෙනා සැලසුම් කළ විදියට හැම දෙයක්ම සිදුවුණේ නෑ. එහෙම නේද?" හෝම්ස් විමසීය.

"ඔව් මහත්මයා" මරීටා කීවේ කඳුළු පිසදාගෙන කථාව යළි අරඹමිනි. "හෙන්රි ජෙන්කින්ස් නියමකර ගත් වෙලාවට ආවා. මං ගේ පිටුපසට වෙලා හිටියා. ලොරේටා ඔහුව පිළිගත්තා. ඒ මේ විසිත්ත කාමරයෙදි. ඔවුන් දෙදෙනා විවාහ වුණු මෙල්බර්න්හි සාන්ත පෝල් දෙව් මැඳුරේ සිතුවමකුත් ඇය අරගෙන ආවා. එවැනි දේ පෙන්වීමෙන් ඔහුගේ සිත සසල කොට, ඔහුගෙන් යම් අනුකම්පාවක් ලබා ගැනීමට හැකිවේවි කියා ඇය විශ්වාස කළා. නමුත් කාරණා ඒ පරිදි සිදුවුණේ නැහැ කියලයි මට හිතෙන්නේ.

මීළඟට ඇය ඔහුට පෙන්නුවා ඔවුන් විවාහ ගිවිසගත් අවස්ථාවේ හුවමාරු කරගත් තෑගි. ඔහු ඇයට තෑගි දී තිබූ මැණික් ඇල්లූ හාරිච්චිය ඇය පෙන්නුවා. ඊළඟට තමන් ඔහුට තෑගි දුන්

ඔරලෝසුව තවමත් ඔහු ළඟ තිබෙනවාද කියා ඇය විමසුවා. එතකොට තමන්ගේ ඇතුළු කබා සාක්කුවේ තිබූ ඔරලෝසුව ඔහු එළියට ගත්තා. ඒ බොහොම අකමැත්තෙන්. ඔවුන් දෙදෙනාගේ නම් කොටා තිබූ එය, අවුරුදු ගණනකට කලින් ඇය තෑගි දුන් ඔරලෝසුවමයි. මරීටාගේ දියණිය මේ වෙලාවේ විසිත්ත කාමරය තුළට ආවා. ඒ බන්දේසියක තබාගත් තේ පැන් සමග.

"ඔබ තවමත් නොදන්නා තවත් කාරණයක් තියෙනවා" ලොරේටා ඇගේ සැමියාට කිව්වා.

"හැබැට? ඒ මොකක්ද?" ඔහු විමසුවේ කිසිම ගණනකට නැතිව.

"ඔබගේ ලෙයින් ඉපදුණු දියණියක් ඉන්නවා" ඇය කිව්වා.

ඇය කියූ දෙය ඔහු මුලදී ප්‍රතික්ෂේප කළා. නමුත් ඇය තොරතුරු ඉදිරිපත් කරද්දී කල්පනාකාරී වුණු ඔහු නිශ්ශබ්ද වුණා. ඇය කියූ දේවල් සත්‍ය බව ඔහු පිළිගන්නා බවක් තමයි පෙනුණේ.

"කෝ මගේ දියණිය දැන්?" ඔහු ඇසුවා.

"දැන් ඔබට තේ අරගෙන ආවේ ඇය තමා"

"මොන බොරුද? ඒ ඔබේ සේවිකාව"

"නැහැ. ඒ අප දෙදෙනාගේ දියණිය"

මෙහෙම කියූ අක්කා, දියණිය කුඩා කාලයේ ඕස්ට්‍රේලියාවේ දී ගත් ඡායාරූපයක් ඔහු අතට දුන්නා. ඔහු එය අතට ගෙන බලද්දී ඔහුගේ දෑත් වෙව්ළු හැටි මා දුටුවා. මට හිතෙන්නේ ඔහුගේ මුහුණ සුදුමැලි වී ඩහදිය දැම්මා කියලයි.

"වික්ටෝරියා! මෙහේ එන්න" ඇය තම දියණිය කැඳෙව්වා.

"වික්ටෝරියා මේ තමයි ඔබේ පියා, හෙන්රි. මේ ඔබේ දුව!"

ඔහු සිටි තැනින් නැගිට්ටේ තම දියණිය ආදරයෙන් වැළඳගන්නටයි. ඔහු ඇය බදාගෙන හඬා වැලපුණු අයුරු දුටු අපටත් හැඬුණා. මීළඟට එක්වරම තම දකුණු අත පපුවට තද කරගත් ඔහු වේදනාවෙන් වගේ කෑගැහුවා. ඊළඟ මොහොතේ ඔහු බිම ඇදගෙන වැටුණේ කපා හෙළූ ගසක් වගේ.

මං වහාම එතැනට දිව ආවා. ලොරේටාට කෑගැසුණා. ඔහු උඩුබැලි අතට බිම ඇද වැටී සිටියේ ඇස් දෙක ඇරගෙන. ඔහු හුස්ම ඉහළ පහළ හෙළූ බවක් මට පෙනුණේ නෑ. ඔහු මියගියාවත්ද කියලා මට නිකමට සිතුණා. නමුත් සාත්තු සේවිකාවක වූ ලොරේටා ට සියල්ල ඉක්මනින් වැටහුණා.





මේ සිදුවීම වෙලා මිනිත්තුවක් ගියේ නෑ. කවුදෝ ඉස්සරහ දොරට තට්ටු කරන ශබ්දය ඇහුණා.

"ඒ අර පුවත්පත් වාර්තාකාරයා වෙන්න ඇති" ලොරේටා කිව්වේ තැතිගත් හඬෙන්. "ඉක්මන් කරන්න! මට උදව් කරන්න! හෙන්රිව කෑම කන කාමරයට වත් ඇදගෙන ගිහින් දාමු"

අපට හැකි ඉක්මනින් ඔහුව එම කාමරයට ඇදගෙන ගියා. මේ අතරේ වික්ටෝරියා දුව ඉස්සරහ දොර විවෘත කර අමුත්තා පිළිගත්තා. හදිසියකදී උවමනා වුණොත් පාවිච්චි කරන්න කියලා ලොරේටා බෙහෙත් වර්ග කිපයක් ගෙනැවිත් තිබුණා. මේ වෙලාවේ ප්‍රයෝජනවත් වුණේ කුඩා බෝතලයක ගෙන ආ ක්ලෝරල් නම් නිදි බෙහෙත.

"මෙකෙන් බින්දු දෙකක් අපි ජැක්සන්ගේ තේ කෝප්පයට දාමු." ලොරේටා කිව්වා. "ඒකෙන් එයාට හිරිහැරයක් වෙන්නෙ නෑ. පැයක් විතර නින්ද යාවි"

තේ කෝප්පය බීලා ඉක්මනින්ම වාර්තාකාර ජැක්සන් මහත්මයාට නින්ද ගියා. අපි දෙන්නා ඔහුව ඔසවාගෙන ගේ පිටුපස මිදුලට අරගෙන ගියා. ආයෙමත් සැරයක් දොරට ගහන ශබ්දය ඇසුණේ ඒ අතරේ.

ඒ ඇවිත් තිබුණේ ගෙදර නියම අයිතිකරු ටේලර් මහත්මයා. මොකක්ද අප දැන් කළ යුත්තේ යන්න මට හිතාගන්නවත් බැරිවුණා. කළ හැකි දෙයක් කරන්නම් කියා ලොරේටා ඉදිරි දොර වෙත ගියා. එතැන හිටි පොලිස් භටයාගේ උදව්වෙන් ටේලර් මහතා යවන්න ඇය සමත් වී තිබුණා.

දැන් අපට උවමනා වුණේ, හැකි ඉක්මනින් මෙතැනින් පිටවී යාමටයි. අපි ගේ පිටුපස මල් උයන කෙළවර තාප්පයෙන් එහා පැත්තට පැන්නා. එතැන තිබෙන්නේ පාරක්. ගෙදරින් අප පිටවී ගියේ ලොකු හදිසියකින්. වික්ටෝරියාගේ කුඩා කාලයේ ඡායාරූපය පවා අරගන්න අපට අමතක වුණේ ඒ නිසයි. අපි තුන්දෙනා ඉක්මනින් වෝටලූ දුම්රියපොළ වෙත ගියා. ඔවුන් දෙදෙනා පෝට්ස්මත් බලා යන දුම්රියකට නැගුණා. සවුතැම්ටන් සිට දුම්රියක් ඉක්මනින්ම එන බව මට අහන්න ලැබුණා. ඒ නිසා ටේලර් මහත්මිය එනතුරු මං දුම්රියපොළේ බලාහිටියා"

"හෙන්රි ජෙන්කින්ස් ගේ මළ සිරුරට මොකක් කරන්නද ඔබ බලාපොරොත්තු වුණේ?"

"ටේලර් මහත්මිය සමග ගෙදර ආවම අපට එය දකින්න ලැබෙන බව මං දැන හිටියා. එවිට පොලීසියට දනුම් දීමටයි මං බලාපොරොත්තු වුණේ"

"මෙතැන ඉතාම බරපතළ විධියට නීතිය කඩවෙලා තියෙනවා" පොලිස් පරීක්ෂකයා කීවේ සිටි තැනින් නැගිටිමිනි. "මරණයක් සිදු වුණාම ඒ ගැන දැනුම් නොදී නොසලකා සිටීම විශාල වැරැද්දක්" ඔහු කීවේ මරීටා ක්වින් සේවිකාව අමතමිනි. "මා සමග පොලිස් ස්ථානයට පැමිණ ඔබ කට උත්තරයක් දිය යුතුයි."

"මං හිතාගෙන හිටියේ පොලීසියට දැනුම් දෙන්න තමයි" ඇය කීවාය.

"ඔය වැරැද්දට පොලිස් අත් අඩංගුවට ගන්නා හැමෝම කියන්නෙ ඔහොම තමයි. ඒක විතරක් නෙමෙයි. ජැක්සන් මහතාගේ තේ කෝප්පයට මත්ද්‍රව්‍ය දැමීම, මිනීමැරීමට තැත් කිරීමක් ලෙස සැලකිය හැකි වරදක්. හෙන්රි ජෙන්කින්ස් මහතාට තර්ජනය කර කප්පම් මුදල් ඉල්ලීම, ඔහු ප්‍රාණ ඇපකරුවකු කිරීමට උත්සාහ දැරීමත් සුළුකොට තැකිය හැකි වැරැදි නෙමෙයි."

තමා මෙහි අභිරහස හෙළිකර දූන් පසු ඊට අදාළ ගැටලු විසඳා ගැනීම, අදාළ පාර්ශ්වයන් හා පොලීසිය සතු කටයුත්තක් බැව් හෝම්ස් කීය. එබැවින් ඉක්මනින් එතැනින් පිටවී ඒමට ඔහු තීරණය කළේය.

"මේ අද්භූත සිදුවීම සැලසුම කොට ක්‍රියාත්මක කළේ ක්වින් සොහොයුරියන් දෙන්නා. මේකෙ ප්‍රධාන මෙහෙයුම්කරු මරීටා ක්වින් බවත් ඇයට ලොරේටා නමින් සොයුරියක සිටිනා බවත් ඔබ දැනගත්තෙ කොහොමද හෝම්ස්?"

මා මගේ මිත්‍රයාගෙන් විමසුවේ අප ආපසු නිවස බලා එන අතරේය.

"වොට්සන්. මං විසඳූ අභිරහස් පරීක්ෂණ ගැන වාර්තා ලියද්දී මේ පරීක්ෂණයත් පාඨකයන් වෙත ඉදිරිපත් කරන්න ඔබ කැමති ඇති. එවිට මෙන්න මේ කාරණා කිහිපය අවධාරණය කරන්න අමතක කරන්න එපා. ඒ තමයි විසිත්ත කාමරයේ බුමුතුරුණ මත තිබී හමුවූ සිහින් වීදුරු කැබලි වල වැදගත් කම; ඊළඟට විසිත්ත කාමරයේම වේලාව නිවැරදි ලෙස දැක්වූ ඔරලෝසු දෙකක් තිබුණු බව.





ඔබට මතකද වොට්සන්; මුලින්ම අපි මේ නිවසට ඇතුළු වෙලා මුල්වරට විසිත්ත කාමරයට පැමිණි වෙලාව? මගේ දෙනෙත් වලට මුලින්ම දකින්න ලැබුණු දේ කුමක්ද? ඒ තමයි බිම තිබුණු සිහින් වීදුරු කැබලි කිහිපයකින් පරාවර්තනය වුණු ආලෝක කිරණ. මේවා පරීක්ෂා කිරීමේදී මට පෙනී ගිය දෙයක් තමයි, මේ ඉතාම තුනී නමුත් ශක්තිමත් වීදුරුවක කැබලි බව. අනෙක එය වක්‍ර වී තිබූ ආකාරයෙන් පැහැදිලිව පෙනුණේ, මේක වීදුරු තහඩුවකින් බිඳුණු කැබලි නොවෙන බව. සාමාන්‍යයෙන් එවැනි වීදුරු කැබලි ඇතිවෙන්න පුළුවන් බිඳුණු වයින් වීදුරුවකින්. කොහොම වුණත් නිගමනයකට එන්නෙ නැතිව, මං මගේ මනස විවෘතව තබාගත්තා.

අපට ජෙන්කින්ස්ගේ මළසිරුර හමුවුණා නේ. එය පරීක්ෂා කිරීමේදී මට පෙනුණා, ඔහුගේ ඔරලෝසුවේ වීදුරුව බිඳී ඇති බව. එහෙම නම් මෙය සිදුවී තිබෙන්නෙ විසිත්ත කාමරයේදි විය යුතුමයි. ඔරලෝසුවේ ආවරණය ඒ වෙලාවෙත් විවෘතවයි තිබුණේ. මං උත්සාහ කළා එය වහන්න. නමුත් ඒක කරන්න හැකිවුණේ නෑ. ඒකට හේතුව ලෝහ ආවරණය යන්තමින් ඇඹරී ගොසින් තිබූ නිසා. කොහොමද මෙහෙම දෙයක් වුණේ? ඒ මොකද එවැන්නක් වීමට ආවරණය මතට සෑහෙන බලයක් යෙදිය යුතුයි. එහෙම දෙයක් වුණේ, ඔරලෝසුවේ අයිතිකරු සිහි විසඥව බිම ඇද වැටෙද්දී බව එයින් පැහැදිලි වුණා. ඔරලෝසුව ඔහුගේ ඇතුළු කබායේ සාක්කුවට දමන්න මං උත්සාහ කළා. ඒක කළ හැකිවුණේ ඉතාම අපහසුවෙන්. ඒකට හේතුව ඒ සාක්කුව මහලා තියෙන්නේ ඔරලෝසුව පහසුවෙන් ඉවතට නො එන පරිදි. එයින් මා කළ නිගමනය මොකක්ද? ඔරලෝසුව මේ ආකාරයෙන් බිම වැදෙද්දී එය තිබී ඇත්තේ එය අයිතිකරුගේ අතේ. එහි ආවරණය පළුදු වීමට හේතුවත් එයින් තහවුරු වෙනවා.

ජෙන්කින්ස් වැටිල තියෙන්නේ විසිත්ත කාමරයේ බව මං ඔබට කිව්වා. නමුත් එහි නිවැරදි වෙලාව පෙන්වන ඔරලෝසු එකක් නෙමෙයි, දෙකක්ම තිබුණා. ඉතින් මොන හේතුවක් නිසාද ඔහු තමන්ගෙ සාක්කු ඔරලෝසුව අතට ගත්තේ?

තමන්ගේ පුරුද්දට ආදී වශයෙන් මේකට හේතු හත අටක්ම දිය හැකියි. නමුත් ඊට කලින් මං ඔහුගේ ඔරලෝසුව පරීක්ෂාවට ලක් කළා. මගේ ප්‍රබල කාචයෙන් මට දැකිය හැකිවුණා, සාමාන්‍ය

ඇසට දැකිය නොහැකි විශේෂ සලකුණු කිහිපයක්. එයින් පළමුවැනි එක තමා, ඔහු මකා දැමීමට උත්සාහ කළ සලකුණු. ඒවා තිබුණේ ඔරලෝසුවේ ඇඳවුණු ලෝහ ආවරණයේ ඇතුළු පැත්තේ. උඩින්ම මඳක් ලොකු එකට බැඳුණු H.J. යන අකුරු තිබුණා. ඊටත් පහළින් මා දුටුවා 1870 කොටා තිබූ අයුරු. ඊට පහළින් කැටයම් කර තිබුණේ මෙහෙම දෙයක්.

From
Ever Loving
Loretta Q.
සදා ආදර
ලොරෙටා Q
ගෙන්

මේ පේළි තුන මං දැකගත්තේ ඉතාම අපහසුවෙන්. ඊට හේතුව එය සූරා දැමීමට කර තිබූ උත්සාහය නිසා. ලොරේටා කිව් අමතක කර දමන්න හෙන්රි ජෙන්කින්ස් උත්සාහ දරා ඇති බව ඒකෙන්ම පැහැදිලි වෙනවා නේද වොට්සන්. කවුද මේ ලොරේටා කිව්?

ලොරේටා කියන නම මේරි, ජේන්, ඇලිස් මාග්‍රට් ආකාරයේ එංගලන්තයේ සුලභව අසන්නට ලැබෙන නමක් නෙමෙයි. ඒ වගේමයි Q අකුරේ පටන් ගන්නා වාසගම්. ඒවාත් ඉතා දුර්ලභයි. මොන තරම් දුර්ලභ වුණත් මේ සිදුවීමට අදාළ ගෙදර ඉන්නවා Q අකුරෙන් නම තිබෙන Quinn කෙනෙක්. ඒ මරීටා ක්වින් නම් සේවිකාව. එතකොට ලොරේටා ක්වින් කියන්නේ මරීටා ක්වින්ගේ කවුරු හරිද? මේක මගේ සිතට නැඟුණේ එක් ක්ෂණයකින්. ලොරේටා හා මරීටා කියන නම් දෙකම එංගලන්තයේ දුර්ලභ නමුත්, ඉතාලි සම්භවයක් ඇති නම් බව මම කලින් කිව්වා. එහෙම නම් මේ එක කුස උපන් අක්කලා නංගිලා දෙන්නෙක්ද? එහෙමත් නැත්නම් මේ එකම තැනැත්තියක්ද? එතකොට මට මතක් වුණා ටේලර් මහත්මයා අපට කියූ එක් කරුණක්. ඒ, තමන්ට ගෙට ඇතුළුවීමට ඉඩ නොදුන් ගැහැනියගේ මුහුණේ පෙනුමේ, තමන්ට හුරුපුරුදු, තමන් මීට කලින් දැක ඇති ලක්ෂණ තිබුණා දෝ කියා.





මේ ගැන මං මීට පෙරත් ඔබට කියා ඇති වොට්සන්. එකම පවුලක එකම දෙමව්පියන්ගේ දරුවන්ගේ මුහුණේ, සමාන ලක්ෂණ තිබීම, අලුත් සොයා ගැනීමක් හෝ අමුතු දෙයක් නෙමෙයි. සරසවියේ මගේ ආචාර්යවරයෙකු වූ මහාචාර්ය විලියම් ක්‍රැන්වෙල් කළ අධ්‍යයනක් ගැන ඔබට නොකිව්වොත් මේ කතාව අසම්පූර්ණයි. එකම පවුලේ සොයුරියන් හය දෙනෙකු ගැන ඔහු අධ්‍යයනයක් කර තිබුණා. ඔවුන් හය දෙනාටම තිබුණේ ඔවුන්ගේ පියාට තිබුණු පිටතට දිග හැරුණු "ගොටු" කන් පෙති. ඒවා ප්‍රමාණයෙන් හා හැඩයෙන් එක සමාන වුණා. ඔවුන්ගෙන් තිදෙනෙකුට තිබුණේ පියාගේ නාසයට සමාන උසින් වැඩි සෘජු, මඳක් ඉදිරියට දික්වූ නාස. අනෙක් තුන්දෙනාගේ නාස ඔවුන්ගේ මවගේ නාසයට හැම අතින්ම සමාන වුණා. ඒ කියන්නේ ඒවා දිගින් අඩු, පැතලි, අප බිඳුණු නාස යයි හඳුන්වන කෙටි නාස, මේ ආකාරයට ඔහු කාරණා රැසක් කිව්වා. නමුත් මේ වෙලාවේ මං ඒවා ඔබට කියන්න යන්නේ නෑ.

එතකොට අපර භාගයේ මේ ගෙදර පාලනය භාරගත් ගැහැනියගේ ඉංග්‍රීසි උච්චාරණයේ, යම් වෙනසක් ටේලර්ට දැනී තිබුණා. එංගලන්තයේ ලන්ඩනයට ඈත ප්‍රාන්තවල උච්චාරණ කිහිපයක්ම ටේලර් දැන සිටියා. නමුත් මේ කාන්තාවගේ ඉංග්‍රීසි උච්චාරණය වෙනස්ම එකක්.

අනික් අතට හෙන්රි ජෙන්කින්ස් ඕස්ට්‍රේලියාවේ උපත ලබා, එහි හැදී වැඩී, පසු කලක එංගලන්තයට සංක්‍රමණය වුණු කෙනෙකු බව, පුවත්පත් වාර්තාකාර ජැක්සන් අපට කිව්වා. අර ගැහැනියටත් තිබුණේ ඕස්ට්‍රේලියානු උච්චාරණයක්ද? දෙදෙනා අවුරුදු දහ හතකට කලින් ඕස්ට්‍රේලියාවේ ජීවත් වූ අයද?

මීළඟට අර කුඩා දරුවාගේ ඡායාරූපයෙන් අප තවත් ඉදිරියට යනවා. එහි යටින් ලියා තිබුණේ Victoria O' Victoria කියලයි. මේක Victoria of Victoria වෙන්න පුළුවනි. එය ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ උපත ලැබූ හෝ ජීවත් වූ, වික්ටෝරියා යයි නම ලැබූ දැරියකගේ යයි සිතිය හැකියි. සාක්ෂි තිබුණේ ඒ පැත්තටයි.

ටේලර් මහතා මේ ගෙදර දැක නොතිබූ, සාන්ත පෝල් දෙව් මැඳුරක අලංකාර සිතුවමක්, මේ ගෙදරට ආවේ ඇයි? ඒ කොහොමද? නිසැකවම එය ගෙන එන්න ඇත්තේ ලොරේටා

ක්වින්. කුමක් සඳහාද? ඔවුන් විවාහ වූ තැන, තමන් අත්හැර දමා ආ සැමියාට සිහිගන්වන්න ලොරේටා ට සිතෙන්න ඇති.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් උපන් ගම් රටවල් ගැන පමණක් නොවෙයි; ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ගැනත් හොඳ දැනුමක් වාර්තාකාර නීල් ජැක්සන්ට තිබෙනවා. හෙන්රි ජෙන්කින්ස් මන්ත්‍රීතුමා මීට අවුරුදු දෙකකට පෙර වතාවකුත්, මීට මාස හයකට පෙර වතාවකුත්, හෘදයාබාධවලට ගොදුරු වෙලා, රෝහල් ගතවී ප්‍රතිකාර ලබල තියෙනවා. හෘදයාබාධ වලට ලක්වුණු අයට වෛද්‍යවරුන් දෙන අවවාද ඔබට හොඳට හුරුපුරුදු ඒවා නේ වොට්සන්. ඒ තමයි දුම්පානය සම්පූර්ණයෙන්ම නවත්වන්න; ශරීරයේ බර අඩුකරගෙන, ආහාර ගැනීම තදින්ම පාලනය කරන්න; දිනපතාම ව්‍යායාම කරන්න. වෛද්‍යවරුන් ඔය කියන දේවල් අපට වත් කරන්න බැරි කොට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කොහොම කරන්නද?"

"ඒ නිසා තමයි හෘදයාබාධයෙන් ඔහු ක්ෂණිකව මිය ගියේ" මම කීවෙමි.

"හරි හරි! වෛද්‍ය අවවාද නොසලකා හැරීම එකක්. ඒ විතරක් නෙමෙයි. තමන් විසින් නොසලකා හරින ලද බිරිඳ හා දියණිය හමුවුණාම, තමා අතින් වුණු වැරැද්ද තේරුම් ගියාම, ඔහුට ඇතිවුණේ දරාගන්න බැරි දුකක්. හෘදයාබාධය ඇතිවෙන්න ආසන්නම හේතුව ඒක නේද?"

"ඔව්. ඔබ නිවැරදියි"

"ඒක නෙමෙයි වොට්සන්. ඔබ කැමති නැද්ද අද රෑ කෑමට ස්ට්‍රෑන්ඩ්හි සිම්සන්ගේ අවන්හලට යන්න?"

"අකමැත්තක් නෑ. නමුත් පහුගිය ටිකේම අපි කෑවෙ ඔවුන්ගේ කුකුළු මස් ඇමූ ලසඤ්ඤා. මං කැමතියි අද වෙනත් මොනවා හරි කාල බලන්න"

"ඉතාම අනර්ඝ අදහසක් මගේ හිතවත් වොට්සන්. මමත් ඔබට කරන්න හිටියේ ඒ යෝජනාවමයි. ඉතාලි අවන්හලක් නිසා ඔවුන් ළඟ පීට්සා නපොලිතානා ඇති. නැතිනම් අපේ මිත්‍රයා ගිලිමෝගේ ෆ්‍රීකසේ දි පූලේ භෝජනය රස විඳින්න ප්‍රංශ අවන්හලකට යමු"



## විෂ්ණුගේ අක්ෂිය

1895 වසරේදී රෙමිංටන් දියමන්තිය අතුරුදන්වීමෙන් ඇතිවූ කලබැගෑනිය මගේ පාඨකයන්ට මතක ඇතැයි සිතමි. මෙම මාණික්‍යයේ ඉතිහාසය පිළිබඳ තොරතුරු රැසක් එවක පුවත්පත්වල පිටු ගණන් පළ විය. කෙසේ වෙතත් එම තොරතුරු කියවීමට නොලැබුණු බොහෝ දෙනෙකු ද ඇතුවාට සැක නැත. ඔවුන්ගේ යහපත තකා එම තොරතුරු කථාව මුලදීම කෙටියෙන් සඳහන් කිරීම සුදුසු වේ යයි සිතමි.

ප්‍රමාණයෙන් කැරට් 105.6 ක් වූ මෙම දියමන්තිය ගැන මුලින්ම අසන්නට ලැබෙන්නේ, ඉන්දියාවේ ශ්‍රී නගර් හි කෝවිලකිනි. එහි විෂ්ණු දෙවියන්ගේ ප්‍රතිමාවක ඇස්දෙක ලෙස යොදා තිබුණේ වර්ණයෙන් එක සමාන, ප්‍රමාණයෙන් විශාල දියමන්ති දෙකකි. ඉන්දියාවේ කොටසක් ආක්‍රමණය කළ ප්‍රංශ හමුදාවේ භටයෙක් මෙම විෂ්ණු පිළිමයෙන් එක් ඇසක් ගලවා ගත්තේය. ඔහු අනෙක් ඇස ගැලවීමට උත්සාහ කරද්දී රතින් තනා තිබූ එම පිළිමයේ මුහුණ, බිහිසුණු ආකාරයෙන් වෙනස් වූ බව පැවසේ. තමාට ක්ෂණික මරණයක් අත්වේ යයි බියපත් වූ යුද භටයා ගලවා ගත් මැණික ද රැගෙන එතැනින් පැන දිව්වේය.

දින කිහිපයකට පසු ඔහු එම මැණික රුසියානු ජාතික ධන කුවේරයකුට පෙන්වා, එයට පවුම් අනූදහසක මුදලක් ඉල්ලා සිටියේය. නමුත් රුසියානුවා එතරම් මුදලක් ගෙවීම ප්‍රතික්ෂේප කොට, දියමන්තිය ඊට අඩු මුදලකට ගැනීමට උත්සාහ කර ඇත. මේ අතර එය ඉන්දියාවේම රඳවා ගැනීමේ අරමුණෙන් මයිසූරයේ මහාරාජා සහ බුන්දල් කුන්ද්හි මහාරාජා ද එය මිලට ගැනීමට උත්සාහ දරන බවට ආරංචියක් පැතිර ගියේය.

අන්තිමේදී ප්‍රංශ යුද භටයාගෙන් එය පවුම් අනූදහසක මුදලකට මිලට ගෙන ඇත්තේ, ඉංග්‍රීසි ජාතික නෞකා කපිතාන්වරයෙකි. 1783 දී මෙම දියමන්තිය කපිතාන්වරයාගෙන් ඔස්කා මොන්ට්ගොමරි නම් ඉංග්‍රීසි ජාතිකයා විසින් මිලට ගන්නා ලදී. ඔහු එකල පෙරදිග රටවල සංචාරයක යෙදී සිටියේ ය. ඒ තම බාප්පා වූ සුප්‍රකට

තානාපති නිලධරයකු වූ සර් ජෝන් මොන්ට්ගොමරි සමඟ ය. රෙමිංටන් ප්‍රභූ පරපුරේ ආදිපාදවරයකු වූ ඔස්කා මොන්ට්ගොමරි මෙම දියමන්තිය එංගලන්තයට රැගෙන ආ විට කවුරුත් විස්මයට පත්වූහ. මඳ කොළ පැහැයක් සමඟ ලා නිල් පාටින් බැබළුණු මෙතරම් විශාල දියමන්තියක් කිසිවෙකු කවදාවත් දැක නොතිබිණි.

දියමන්තිය එංගලන්තයට ළඟාවීමටත් පෙර, එය හා බැඳුණු අභාග්‍ය සම්පන්න සිදුවීම් ඇරඹී තිබිණි. විෂ්ණු දේව පිළිමයෙන් දියමන්තිය ගලවා විකුණා සති දෙකක් ගතවීමටත් පෙර, නාගයකු විසින් දෂ්ඨ කිරීමෙන් ප්‍රංශ යුද භටයා ඉන්දියාවේ දී ම මිය ගියේය. ඉන්දියාවේ සිට එංගලන්තයට යාත්‍රා කළ සර් ජෝන් මොන්ට් ගොමරි රැගත් නැව, ඉන්දියන් සාගරයේ දී ම දරුණු කුණාටුවකට හසුවිය. එහිදී සර් ජෝන් හා ඔහුගේ පෞද්ගලික සේවකයා මුහුදට වැටී ජීවිතක්ෂයට පත්වූහ.

පසුව මෙම මාණික්‍යය හඳුන්වන ලද්දේ රෙමිංටන් දියමන්තිය යන නමෙනි. එයට හිමිකම් කියූ රෙමිංටන් පරපුරේ ආදිපාදවරු දෙදෙනෙක්ම, තරුණ වයසේදීම අනපේක්ෂිත ලෙස, හදිසි අනතුරු වලින් ජීවිතක්ෂයට පත්වූහ. එක් අයෙක් පෝලෝ ක්‍රීඩාවේ යෙදී සිටියදී අසු පිටින් වැටී බරපතළ තුවාල ලබා මිය ගියේය. අනෙකා සතුන් දඩයමේ ගොස් සිටියදී වැරැදීමකින් එල්ල වූ වෙඩි පහරකින් ජීවිතක්ෂයට පත්විය.

දියමන්තිය හා බැඳුණු මෙම අභාග්‍ය සම්පන්න සිදුවීම් අවසන් කිරීමට උත්සාහයක් දැරුවේ රෙමිංටන් පරපුරේ පස්වැනි ආදිපාදවරයාය. ඔහු මෙම දියමන්තිය ඇම්ස්ටඩෑම් වෙත යවා එහි හැඩය වෙනස් වන සේ කපා, ඔපදමා, රත්රන් මාලයකට සවිකරන පෙන්ඩනයක් බවට පත් කළේය. පහතට වැටෙන දිය බිඳුවක හැඩය එයට අලුතෙන් ලැබිණි. එමෙන්ම එය වඩාත් ශෝභමාන විණි. ඒ අනුව රෙමිංටන් පවුලේ ආදිපාදවරයකු විවාහ වන මංගලෝත්සවයේදී, මෙම දියමන්තිය මනාලියගේ කරේ පැළඳවීම සම්ප්‍රදායක් බවට පත්විය.

1895 ඔක්තෝබර් මාසයේ එක් වැසිබර උදෑසනක අපි උදේ තේ පානය අවසන් කොට පුවත්පත් කියවමින් සිටියෙමු. "මෝනිං ක්‍රොනිකල්" පුවත්පතේ උප සිරස්තලයක් වෙත හදිසියේම මගේ අවධානය යොමුවිය.





"මේ පත්තරේ තියෙනවා" මම කීවෙමි. "රෙමිංටන් දියමන්තිය අතුරුදන් වෙලාලු. ඒක හොරු අරගෙන කියලයි සැක කරන්නේ"

"මොනවා? තවත් සැරයක් ඒක හොරු අරගෙනද? කාටවත් තුවාලද?" හෝම්ස් මගෙන් විමසුවේ ඔහු කියවමින් සිටි පුවත්පත පහත් කරමිනි.

"ඒ බවක් නම් පත්තරේ සඳහන් වෙලා නෑ. මේකෙ තියෙන්නේ දියමන්තිය ගිය සෙනසුරාදා රෑ අතුරුදන්වෙලා තියෙන්නේ රෙමිංටන් ආදිපාදවරියගේ කාමරයෙන්ලු."

"එක අතකින් ඒක සැනසීමට කරුණක්" හෝම්ස් කීය. "ඕක හොරකම් කරන්න උත්සාහ කරල, කී දෙනෙකුට නම් ජීවිත අහිමිවෙලා තියෙනවද? කී දෙනෙකුට බරපතළ තුවාල සිදුවුණාද? අවාසනාව උරුම කරගත් මේ අඟුරු කැල්ල සවි කරන්න යොදලා තියෙන්නේ රත්තරන් නෙමෙයි; මනුස්ස ලේ කියන එකයි වඩාත් නිවැරදි. හොරකම ගැන වැඩිදුර විස්තර ඔය පත්තරේ තියෙනවද වොට්සන්?"

"ඒ තරම් වැදගත් තොරතුරක් නෑ. හර්ට්ෆඩ්ෂයරයේ තියෙන එයාලගෙ රෙමිංටන් මන්දිරයේ, සති අන්ත සාදයක් පැවැත්වුණාලු. ඒකට ඇවිත් උන්නු අමුත්තන්ගෙ නම් සඳහන් වෙනවා; බාන්පූරයේ මහාරාජා, ගරු හැරියට් ඩේවිස් මෙනෙවිය, මෙල්වින් ස්කාබ්‍රෝ මහතා, එලිනර් රොබට්ස් මෙනෙවිය. මෙයාලා කවුද කියල නම් සඳහන් වෙන්නෙ නෑ........"

මගේ කථාවට බාධා වූයේ අප නිවසේ ඉදිරි දොරේ සීනුව නාද වීමෙනි. විදුලි පුවතක් රැගත් සේවිකාව මොහොතකින් අපේ උඩුමහලට පැමිණියාය. වහා එය අතට ගෙන විවෘත කළ හෝම්ස් ඊට පිළිතුරක් ලියා සේවිකාව අතට දුන්නේය. අනතුරුව විදුලි පුවත මා දෙසට විසිකළේ සිනාවක් ද සමඟය.

"දියමන්තිය අතුරුදන් වී ඇත.
වහාම එන්න.
රෙමිංටන්."

"ඔබ යනවද?" මම ඇසීමි.

"ඔව්." ඔහු කීවේ බිත්ති ඔරලෝසුව දෙස බැල්මක් හෙළමිනි. "කිංස්ක්‍රොස් දුම්රිය පොළෙන් ශීඝ්‍රගාමී දුම්රියක් අල්ල ගන්න මට හැකිවුණොත්, ඉක්මනට ගිහිං ඉක්මනට ආපහු එන්නත් මට පුළුවනි."

උදේ වරුව ගතකිරීම සෑහෙන තරම් අපහසුවන බැව් මම තේරුම් ගතිමි. පුවත්පත් සියල්ල ඉවතට දමා, විලියම් ක්ලාක් රසල්ගේ "සමුදුරු අන්දර" පොතක් අතට ගත්තෙමි. වෙනදාට මෙම කතන්දර වලින් මට සතුටක් ලැබිණි. එහෙත් එදා නම් මගේ සිත් ඇද ගැනීමට මෙම කථා සමත් නොවීය. මගේ මිත්‍රයා ආපසු පැමිණෙන හඬ අපේක්ෂාවෙන් මම නොඉවසිල්ලෙන් බලා සිටියෙමි. අන්තිමේදී ඔහුගේ පාවහන් හඬ පියගැට පෙළ දෙසින් ඇසෙද්දී, අපර භාගයද අවසන් වෙමින් තිබිණ.

"කොහොමද හෝම්ස් ඔබේ ගමන සාර්ථකද?"

"ඔව්. තරමක් දුරට" කී ඔහු සයිඩ්බෝඩය මත වූ වීස් බෝලයෙන් පෙත්තක් කපාගෙන, පාන් කැබැල්ලක් සමඟ කෑම ඇරඹීය.

"රෙමිංටන් දියමන්තිය ඇත්තටම හොරකම් කරලද?"

"ඒ වගේ තමයි පෙනෙන්නෙ"

"හෝඩුවාවන් මොනවා හරි අනාවරණය කරගන්න ඔබට හැකිවුණාද?"

"හෝඩුවාවන් කිහිපයක් නම් හමුවුණා" හෝම්ස් කීය. "නමුත් ඒවා යොමුවෙලා තියෙන්නේ වෙනස් වෙනස් පුද්ගලයන් දිහාවට. ප්‍රශ්නය තියෙන්නේ එතැනයි"

"ඔබ ඔය කියන්නේ මොකක්ද කියලා මට තේරුම් ගන්න අමාරුයි හෝම්ස්"

"තේ කෝප්පයක් හෙම බීලා මං ඔබට ඒක පැහැදිලි කරන්නම්"

මෙසේ කී හෝම්ස් මිනිත්තු කිහිපයක්ම කළේ, එඩෑම් චීස් කැබලි සමඟ පාන් පෙති කිහිපයක් අනුභව කිරීමය. අනතුරුව සේවිකාව ගෙන ආ තේ පෝච්චියෙන්, තේ කෝප්ප දෙකක්ම පානය කළේය.

"මගේ කෑමබීම අවසන්වන තුරු ඔබ රස්තියාදු කිරීම ගැන මට සමාවෙන්න වොට්සන්. රෙමිංටන් මන්දිරයේ සිතුවම ඔබ සමහරවිට දැකලත් ඇති. එය පිහිටා තිබෙන්නේ හැට්ෆීල්ඩ් වලට හැතැක්ම පහක් පමණ උතුරෙන්. ඒක ඉතාම අලංකාර ස්ථානයක්. ඒ වගේම පැරණියි. රෙමිංටන් පවුල මේක අත්පත් කරගෙන තියෙන්නේ මීට අවුරුදු 150 කට පමණ කලින්. මන්දිරයට ගිය මාව පිළිගත්තෙ එහි ප්‍රධාන ගෘහ සේවකයා තොම්සන්. ඔහු මාව





ගෘහ මූලිකයා ළඟට කැඳවාගෙන ගියා. රෙමිංටන් ආදිපාදවරයා ඒ වෙලාවෙ හිටියෙ ඔහුගේ කාර්යාල කාමරයේ.

"හෝම්ස් මහත්මයා. මට අහන්න ලැබුණා සුළු අපරාධ විසඳීමට ඔබ ලන්ඩනයේ දක්ෂතා දක්වලා තියෙනවා කියල. පොලීසිය නම් හිතන්නේ මේක මගරිජ් හොර කල්ලියේ වැඩක් කියලයි. තවත් පොලිස් නිලධරයෙක් කිව්වා මේක ෆ්‍රෙඩ්රික් ක්ලයින් නම් හොර තක්කඩියාගේ වැඩක් වෙන්නත් පුළුවන් කියලා. මේ අහන්න. ඔහේ මේකට යොදාගන්න ක්‍රමය මොකක්ද කියන එකේ මට ප්‍රශ්නයක් නෑ. නමුත් ඔබ කොහොම හරි මට රෙමිංටන් දියමන්තිය සොයා දිය යුතුයි. ඔහේට තේරුණාද? මේක සොයා දෙන කෙනෙකුට පවුම් දෙදහසක තෑග්ගක් ලබාදෙන බවට මං ප්‍රසිද්ධ කළා. නැතිවුණු දේ හොයා දුන්නොත් ඒ තෑග්ග ලැබෙන්නෙ ඔබට"

"ආදිපාදතුමනි. මුලින්ම මං කැමතියි අපරාධය සිදුවුණු තැන පරීක්ෂා කර බලන්න. ඊළඟට සෙනසුරාදා රාත්‍රියේ මීට අදාළව යමක් දකින්න ලැබුණු සහ, අහන්න ලැබුණු අය සමඟ සාකච්ඡා කරල බලන්න."

"පොලීසිය ඒ හැම දෙයක්ම දැනටමත් කරලයි තියෙන්නෙ" ඔහු හිස සොලවමින් කිව්වේ තමන් එයට එකඟ නොවන බව අඟවමින්. "යළිත් වරක් එම දේවල්ම කිරීමෙන් මොකක්ද ඇති ප්‍රයෝජනේ?"

"ආදිපාදතුමනි. මං කියන දේත් අහන්න" මං කිව්වා. "නැතිවුණු දියමන්තිය සෙවීම ඔබ මට භාර කරනවා නම්, මං ඒක කරන්නේ මම කැමති පිළිවෙළට. මං ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය සමඟ සම්පව කටයුතු කර තිබෙන කෙනෙක්. වැදගත් නිරීක්ෂණ, විශ්ලේෂණ, උපකල්පන, පොලීසියට බොහොම විට මඟ හැරී තිබෙන බව මං හොඳින් දන්නවා. ඒ නිසා පරීක්ෂණය මට කැමති පිළිවෙළට කරන්න ඔබ එකඟ නම් පමණක්........."

අපේ කතාවට බාධා කරමින් කාමරයේ දොර එක්වරම විවෘත වුණා. ඒ සමඟම කාමරය ඇතුළතට ආවේ ඉතාම සුන්දර තරුණියක්. අවුරුදු විසි දෙකක් පමණ වූ ළාබාල වයසේ සිටි ඇය, සිහින් උස සිරුරක් සහ රන්වන් පැහැති අලංකාර කේශ කලාපයක් තිබුණු තැනැත්තියක්. මේ රෙමිංටන් ආදිපාදවරයා ගේ බිරිඳ වියයුතු බව මම එක්වරම තේරුම් ගත්තා. ඇය කෙළින්ම

ඔහුට යමක් කියන්නට පටන්ගත්තා. නමුත් මා දුටු වහාම ඇය ඒ කථාව අත් හිටෙව්වා.

"මැරිලින්. මොකක්ද ඒ පාර ඇතිවෙලා තිබෙන ප්‍රශ්නේ?" ආදිපාදවරයා ඇසුවා.

"මේ මහත්මයා කවුද?"

"මේ ලන්ඩනයේ රහස් පරීක්ෂකයෙක්. නැතිවුණු දියමන්තිය ගැන සෙවීම මං ඔහුට භාරදුන්නා. ඔයා දැන් මෙතැනට ඇවිත් ඉන්න නිසා, ඔයාට කියන්න තිබෙන දේවල් මෙයාට කියන්න. ඊයෙ අර පොලිස් පරීක්ෂකවරයාට කිව්වා වගේ, හැම දෙයක්ම එක සැරේටම කිව්වොත් පහසුයි. එතකොට ඔහුට පුළුවනි තමන්ගේ රාජකාරි වහාම පටන්ගන්න"

මා දෙසට හැරුණු ඇය මඳ වේලාවක් නිශ්ශබ්දව මා දිහා බලා හිටියා. ඒ මා කුමන ආකාරයක කෙනෙකුද කියා නිශ්චය කරන්න වගේ.

"මට කියන්න තියෙන්නේ කාරණා බොහොම ස්වල්පයයි" ඇය අන්තිමේදී කිව්වා. "සෙනසුරාදා රෑ මං මගේ කාමරයට ගියේ, රෑ දහයමාර පහුවෙලා මිනිත්තු කිහිපයකින්. මගේ සේවිකාව මට ඇඳුම් මාරු කරන්න උදව් වුණා. ඒකට වැඩි වේලාවක් ගතවුණේ නෑ. ඊළඟට ඇය කාමරයෙන් පිටවෙලා ගියා. එතකොට වෙලාව රෑ එකොළහට විතර ඇති. ඊළඟට මං ඇඳට ගියා"

"එතකොට දියමන්ති පෙන්ඩනය?"

"ඒක මං දැම්මේ මගේ ආභරණ පෙට්ටියට. ඒක තැබුවේ මං ඇඳුම් අඳින කාමරයේ. ඒ කාමරය තියෙන්නේ මගේ නිදන කාමරයට යාබදව."

"ඔබේ ආභරණ පෙට්ටිය යතුරකින් වහලද තිබුණේ?"

"ඔව්"

"නමුත් යතුර තිබුණේ පෙට්ටියේ යතුරු කටේ" ආදිපාදතුමා කිව්වේ නියම තත්ත්වය පහදමින්. "ඔය යතුර ආරක්ෂා සහිත තැනක හංගල තියන්න කියලා, මං කොයිතරම් වාර ගණනක් කියල තියෙනවද?"

"සාමාන්‍යයෙන් මං යතුර පරෙස්සම් සහිත තැනක තියනවා" ආදිපාදවරිය කිව්වා. "නමුත් සෙනසුරාදා රෑ ඒක මට අමතක වුණා. මට නින්ද ගිය වෙලාවෙ කවුරු හරි ඒ කාමරේට රිංගාවි කියල මට හිතුණෙම නෑ"





"ඔබේ නිදන කාමරයේ දොර යතුරු දමලද තිබුණෙ?" මං ඇහුවා.

"ඔව්. මං හැමවිටම මගේ නිදන කාමරයේ දොර ඇතුළෙන් යතුරු දමනවා. ඇඳුම් මාරු කරන කාමරයට යන්න පුළුවන්, මගේ නිදන කාමරය හරහා පමණයි. හැබැයි ඉතින් ඒකෙ ජනේලයක් නම් තියෙනවා"

"ජනේලය විවෘතව ද තිබුණෙ?"

"මගේ නිදන කාමරයේ ජනේලය නම් වහලයි තිබුණේ. නමුත් ඇඳුම් මාරු කරන කාමරයේ ජනේලය වහල තිබුණේ බාගෙට. ජනෙල් පියන අඩවල් කර තිබුණේ"

"ඔබ රාත්‍රියේ නින්දට යද්දී, පෙන්ඩනය ආභරණ පෙට්ටිය තුළ තැබූ බවට ඔබට හොඳටම විශ්වාසද?"

"ඇත්තෙන්ම ඔව්. ඒක කරෙන් ගළවලා ආභරණ පෙට්ටිය ඇතුළෙන් තැබුවෙ මම ම යි. සේවිකාව නොවෙයි"

"එය නැතිවී ඇති බව තේරුම් ගත්තෙ, කවදා කොයි වෙලාවෙද?"

"ඉරිදා - ඒ කියන්නෙ ඊයෙ උදේ. කනට දාන්න වෙනත් කරාබු කුට්ටමක් ගන්න අදහසින් මං ආභරණ පෙට්ටිය ඇරියා. පෙන්ඩනය එහි නොමැති බව මං දුටුවෙ එතකොටයි."

"මං මේ ප්‍රශ්නය අහනවට මට සමාවෙන්න ආදිපාදතුමියෙනි. ඔබේ පෞද්ගලික සේවිකාව ඔබට හොඳටම විශ්වාසද?"

"සහතිකෙන්ම ඔව්" ආදිපාදවරිය කිව්වා. "ඇය මගේ පෞද්ගලික සේවිකාව වෙලා දැන් අවුරුදු ගණනාවක්. මගේ වටිනා ආභරණ ගැන පමණක් නෙමෙයි; මගේ ජීවිතය සම්බන්ධව දෙයක් වුණත් මට පුළුවනි බය නැතුව ඇයට භාර දෙන්න. ඒ තරම් විශ්වාසයි. ඇය කොයිවගේ කෙනෙක්ද කියා ඔබ හඳුනාගෙන තිබුණා නම්, ඔහොම ප්‍රශ්නයක් අහන එකක්වත් නෑ!"

"ඔබට ස්තූතියි ආදිපාදතුමියනි" මං කිව්වේ හිස නමා ඇයට ආචාර කරමින්. ඇය සිටියේ හිතේ චකිතයෙන්, බොහොම වේගයෙන් හුස්ම ඉහළ පහළ ගනිමින්. ඇගේ සැමියා ඉදිරියේදී මං තව මොන මොන ප්‍රශ්න අහවිද කියලා, ඇය කැලඹීමට පත්වෙලා හිටියා කියලයි මට හිතුණේ. මේකට හේතු වෙන්න ඇත්තේ ඇගේ ළාබාල වයස වෙන්න ඇති. ඇය ආදිපාදවරයාට වඩා අඩුම වශයෙන් අවුරුදු දහයකින් වත් ළාබාල ඇති."

"තව මොනවද ඔබට දැනගන්න උවමනා?" ඇය අන්තිමේදී ඇහුවෙ මං නිශ්ශබ්දව සිටි ආකාරය දැකලා.

නමුත් මං ප්‍රශ්නයක් අහන්න කලින් කථා කළේ ඇගේ සැමියා.

"මුද්ද!" ඔහු කිව්වා. "නැතිවුණු මුද්ද ගැන ඔබ කිසිවක් කිව්වෙ නැහැනේ. මගේ මවට අයත්ව තිබූ, කහපාට පුෂ්පරාගයක් සවිකළ මුද්ද මං ඇයට තෑගි කර තිබුණා. ඒකත් හොරු අරගෙන ගිහිං"

"ඒ ගැන මං ඔයාට කිව්ව නේ ඩග්ලස්" ආදිපාදවරිය කිව්වා. "පහුගිය සතියේ තිබුණු කලබල අස්සේ මං ඒක කොහේ හරි දාලා. ඒක හම්බවෙයි. මං ඒක අරං තිව්වේ කොතැනද කියලා දැන් මට අමතකයි. ඒ ගැන නම් ඔයාගෙ හිත කරදර කරගන්න එපා ඩග්ලස්. ඒක හම්බවෙන බව මට හොඳටම විශ්වාසයි"

"මොන පිස්සු කතාවක්ද ඒ?" ඇගේ සැමියා කිව්වෙ තරහෙන්. "සිකුරාදා හැන්දෑවෙ ඒ මුද්ද ඔයාගෙ ආභරණ පෙට්ටියේ උඩින්ම තිබුණා. අපි ඔයාගෙ කාමරේ කතා කරමින් ඉද්දදී, මං ඒක මගේ ඇස් දෙකටම දැක්ක දේ නේ."

ආදිපාදතුමියගේ දෙකම්මුල් රතුවුණා.

"ඔහ්!" ඇයට කියැවුණේ නිතැතින්. "එහෙම නම් මුද්ද පෙට්ටියේ නොතිබුණු බව මං දකින්න ඇත්තෙ සෙනසුරාදා රෑ. ඒක තිබෙන්නෙ ඕන තැන නොතිබුණු බව, මං කොයි වෙලාවක හරි දුටුවා. ඒ කාරණය මට හොඳට මතකයි."

ඇගේ මේ කියමනෙන් ආදිපාදවරයා කොහොමටවත් සෑහීමට පත්වුණේ නෑ. ඒ බව මං පැහැදිලිවම දුටුවා. ඔහු ඒ ගැන මොනවා හරි කියන්නයි සූදානම් වුණේ. එතකොටම දොර විවෘත වුණා. ඇතුළට ආවෙ සේවකයා - තොම්සන්. ඔහු ආවේ හර්ට්ෆඩ්ෂයර් පොලිසියේ පරීක්ෂක මැලෝනි ඇවිත් ඉන්න බව දැනුම් දෙන්න.

"මේ වෙලාවෙ මං වැදගත් වැඩක යෙදිලා ඉන්න බව පොලිස්කාරයට කියන්න" ආදිපාදවරයා කිව්වේ සේවකයාට. "තමුසෙට පුළුවන් මේ රහස් පරීක්ෂකයාවත් එළියට එක්ක යන්න. දැන් උවමනා කාරණා හැම දෙයක්ම අපි කිව්වනේ. එයාට පුළුවන් තමන්ගේ වැඩ කටයුතු පටන් ගන්න. එයාට බලන්න උවමනා කරන තැන් තියෙනවා නම් ඒවත් පෙන්වනවා"

වොට්සන්. මං ඔබට වචනයෙන් වචනයට කිව්වෙ ආදිපාදතුමා කථා කළ ආකාරයයි. ඔහු හරි උද්ධච්ඡ කෙනෙක්. ඔය සමහර





මිනිසුන්ගේ බැංකු ගිණුම් රන් පවුම් වලින් පිරෙන්න පිරෙන්න, යම් යම් දේවල් ඔවුනට නැතිවී යනවා. ඒ තමයි ඔවුන්ගේ සිත්වල රැඳී තිබිය යුතු බුද්ධිය, ආචාරශීලී භාවය සහ නිහතමානි නිරහංකාර බව."

"ඔහු උඩඟු බවින් හිස උදුම්මාගත් අවිනීත චණ්ඩියෙක් කියලයි මට හිතෙන්නෙ" මම කීවෙමි. "ගෑනිගෙයි මිනිහගෙයි සණ්ඩු සරුවල් වලට මැදිවෙන්න සිදුවුණාම, ඔබට ලැජ්ජා හිතෙන්න ඇති?"

"ඔහු කථාකළ තාලෙට වෙන කෙනෙකු නම් දමල ගහල එතැනින් පිටවෙලා එනවා; තමුසෙලගෙ නැතිවෙච්ච මැණික තමුසෙලාම හොයා ගන්නවා කියල. මටත් එහෙම නොහිතුණා නෙමෙයි වොට්සන්.

නමුත් මේ වටිනා දියමන්තියට අත්වුණු ඉරණම මොකක්ද? අන්න ඒ අභිරහසට මගේ හිත ඇදිල ගියා. මේක එයාල කියන විදියේ බොහොම සරල ගැටලුවක් නෙමෙයි කියල, මට ඒ මොහොතෙම වැටහුණා. එයාලගෙ ආඩම්බර බල බල හරි මේ ගැටලුව විසඳුවොත්, ඒකෙන් මගේ හිතට ලොකු සතුටක් තෘප්තියක් ලැබෙනවා. ඒ නිසයි මේක භාරගන්න මං තීරණය කළේ.

තමන්ගේ ඇඳුම් මාරුකරන කාමරයේ ජනේලය රාත්‍රිය පුරා අඩවන්ව තිබුණු බව රෙමිංටන් ආදිපාදවරිය කිව්වා. ඒ බව ඔබට මතක ඇති. ඒ ජනේලය කෙළින්ම පහළ උද්‍යානයේ තණබිම් කඩට මා එක්ක යන්න කියලා මං සේවකයාට කිව්වා.

මේක අවුරුදු දෙසීයකට වඩා පරණ මන්දිරයක්. මේකෙ බිත්ති පුරාම බිම සිට ඉහළට ඇදී තිබුණෙ අයිවි මල් වැල්. පොලිස් නිලධරයාට උදව් කරන්න සේවකයා ගියා. මං ඒ අතරේ තණබිමේ හෝඩුවාවන් වෙත මගේ අවධානය යොමු කළා. මෘදු පස් මත වැදුණු අඩි සටහන් ගැන මං දැඩි අවධානයක් යොමු කරන බව ඔබ දන්නවා. ඒ නිසා මම බිම වැතිරී මගේ දෙනෙත් පොළොවට යොමු කළා. විශ්වාස කරන්න වොට්සන්. කිසිම ආකාරයක අඩි සටහනක් පොළොවේ තිබුණෙ නැහැ. ඒ වගේමයි. අයිවි වැල් අල්ලාගෙන කවුරු හරි බිත්තිය දිගේ ඉහළට නැගලද කියලත් සෝදිසි කළා. යන්තමින් අල්ලා අද්දදී අයිවි ඉති කොළ සමග කැඩී ආවා. බිත්තිය දිගේ කිසිවෙකු ඉහළ නැග්ග බවට, මොනම ආකරයක වත් සලකුණක් තිබුණේ නැහැ. ඒ නිසා සෙනසුරාදා රෑ ආව හොරා, ගෙට ඇවිත් තියෙන්නේ ඒ පාරෙන් නම් නෙමෙයි.

මිනිත්තු දහයක් විතර ගතවෙද්දී තොම්සන් නම් සේවකයා මා සිටි තැනට ආවා. රෙමිංටන් ආදිපාදවරියගේ නිදන කාමරය මට පෙන්වන මෙන් මං ඔහුගෙන් ඉල්ලා සිටියා. එය තිබුණේ සිරිත් පරිදි උඩු මහලේ - පළවෙනි තට්ටුවේ. එහි කාමර පිහිටා තිබෙන ආකාරය මං ඔබට පැහැදිලි කරන්නම් වොට්සන්. මේ ගැටලුව තේරුම් ගැනීම එහෙම නැතිව අමාරුයි.

විසිත්ත කාමරයේ එක් කෙළවරක සිටයි, උඩුමහලට යන ප්‍රධාන තරප්පු පෙළ පිහිටා තියෙන්නේ. ඒක අඩි අටක් දහයක් පමණ පුළුල් එකක්. ඒක මුදුනේදී වම් පැත්තට සහ දකුණු පැත්තට කොරිඩෝර දෙකකට බෙදී යනවා, වම් පැත්තට තියන කොරිඩෝව වැටෙන්නේ රෙමිංටන් ආදිපාදවරයාගේ නිදන කාමරයට සහ තවත් කාමර කිහිපයකට. මේ අනික් කාමර දැනට ප්‍රයෝජනයට නොගන්නා, වසා දමා තිබෙන ඒවා.

ඊළඟට අපි හැරෙමු දකුණු පැත්තේ කොරිඩෝවට. රෙමිංටන් ආදිපාදවරියගේ නිදන කාමරය තියෙන්නේ එහි වම් පසින්. ඒක තමයි මුලින්ම හමුවෙන කාමරය. එයට යාබදව ඇති කුඩා කාමරය තමා ආදිපාදවරිය ඇඳුම් අඳින කාමරය. ඊට පසු තිබෙන කාමරය පාවිච්චියට නොගෙන වසා දමා ඇති කාමරයක්. ඊටත් පසුව තමයි ගෙදරට පැමිණෙන අමුත්තන් සඳහා වෙන්කළ නිදන කාමර හමුවෙන්නේ.

ඒ පැත්තේ එනම් දකුණු කොරිඩෝවේ වම් පැත්තේ තුන්වැනි කාමරය තමයි ආදිපාදවරියගේ ඥාති සොහොයුරිය වන එලිනර් රොබට්ස් මෙනෙවියගේ නිදන කාමරය. දකුණු කොරිඩෝවේ දකුණු අත පැත්තේ පළමුවැනි කාමරය දීල තියෙන්නේ හැරියට් ඩේවිස් මෙනෙවියට. දෙවැනි කාමරය බාන්පූරයේ මහරාජාට, තුන්වැනි එක මෙල්වින් ස්කාබ්‍රෝ මහත්මයාට. මේ කාමර පහු කරගෙන මේ කොරිඩෝවේ තවත් ටිකක් ඉදිරියට ගියාම තවත් පියගැට පෙළක් හමුවෙනවා. ඒකෙන් උවමනා නම් ඉහළ තට්ටුවට නගින්නත් පුළුවනි. නැත්නම් පහළ බිම් තට්ටුව වෙත බහින්නත් පුළුවනි.

රෙමිංටන් ආදිපාදවරියගේ නිදන කාමරය සෑහෙන තරම් ලොකු එකක්. එයට ඇතුළුවුණාම දකුණු පැත්තේ තිබෙන්නේ ඇගේ ඇඳ සහ අනෙකුත් ගෘහ භාණ්ඩ. කාමරයේ වම් පැත්තට තිබෙනවා කුඩා දොරක්. ඒකෙන් ඇතුළුවෙන්න පුළුවනි, ඇය





ඇඳුම් අඳින කාමරයට. ඒක ඉතා කුඩා එකක්. ඒකෙ තිබුණේ කණ්ණාඩි මේසයක්, ලාච්චු කැබිනෙට්ටුවක් සහ කුඩා මේසයක් පමණයි. මෙම මේසය උඩ තමා ඇගේ ආභරණ පෙට්ටිය තබා තිබුණේ. එය යතුරෙන් වහලා තිබුණත් යතුර පෙනෙන තෙක් මානයක තිබුණේ නැහැ.

ආභරණ පෙට්ටිය තරමක් ලොකුයි කියන්න පුළුවනි. හරි හතරැස් එකක් වුණු එහි ආරක්ෂාවට, කහපාට සම්වලින් සකස් කළ කවරයක් යොදා තිබුණා. ඒ ළඟම මේසය මත තිබෙනු මං දුටුවේ කාන්තාවන්ගේ අත්මේස් ජෝඩුවක්. අළු පැහැති රෙදි වර්ගයකින් මසා තිබූ එහි පිට පැත්තේ, වර්ණවත් නූලෙන් එම්බ්‍රොයිඩර් මෝස්තරයක් මසා තිබුණා. මේ අත්මේස් ගැන මං ඔබට කියන්නෙ ඇයි? මගේ පරීක්ෂාව සිදු කළ වෙලාවෙ නම්, මට ඒ අත්මේස් වල වැදගත් කමක් පෙනුණෙ නෑ. නමුත් පසුව මං දුටු කරුණු වලින් ඒ අත්මේස් වල යම් වැදගත් කමක් මං දුටුවා.

ඇඳුම් මාරු කරන කාමරය පරීක්ෂාවෙන්, මට කිසිම අලුත් දෙයක් හොයාගන්න හැකිවුණේ නෑ. පොලීසිය යමක් සොයාගත්තා ද කියා මං සේවකයාගෙන් විමසුවා. ඔහු කිව්වේ තමන්ගේ මතකයේ හැටියට එහෙම යමක් සොයා නොගත් බවයි. ඊළඟට මං විමසා බැලුවේ ගෙදර ඉන්න සේවකයන් ගැන.

ඔවුන් ගැන දීර්ඝ විස්තර තිබුණත් මං ඒවා කෙටියෙන් කියන්නම්. ඒ ඔවුන් මේ සොරකමට අදාළ යයි සිතාගන්න බැරි නිසා. මේ ගෙදරට සම්බන්ධ සේවකයන් දහහත් දෙනෙකු ඉන්නවා. උද්‍යාන සේවකයන්, අශ්වයන් බලාගන්නා අය ආදී අය පදිංචි වී ඉන්නේ ගෙදරින් පිටත, වත්තේ කෙළවර ඇති නිවසක. මැඳුර තුළ පදිංචි අය ගැන හිතමු. මෑතකදී බඳවාගත් තරුණ සේවිකාවන් දෙදෙනෙකු හැරුණාම, අනික් ඔක්කොම අවුරුදු ගණනක් තිස්සේ මේ නිවසට සේවය කරන වයස්ගත අය. ඔවුන් හැම දෙනෙකුගේම පවුල්වල තොරතුරු ආදිය මං තොම්සන්ගෙන් විමසුවා. ඔවුන්ගේ නිදන කාමර තිබෙන තැන් ගැනත් මං ඔහුගෙන් අසා දැනගත්තා.

ඊළඟට මං විමසුවේ මෙම තට්ටුවේ බිමට යෙදූ ලෑලි ගැන. ඒවා මත අඩිය තබා ඇවිදිද්දී ලෑලිවලින් "කිරි කිරි" හඬක් නිකුත් වෙනවාද කියන කරුණ, මං සේවක තොම්සන්ගෙන් විමසුවා. රෙමිංටන් ආර්යාවගේ නිදන කාමරය තිබෙන කොරිඩෝවේ

ඇවිදින කොට, සමහර තැන්වල ලෑලිවලින්, "කිරි කිරි" ශබ්දය නිකුත් වෙන බව මං නිරීක්ෂණය කළා. මිනිත්තු කිහිපයක්ම ඒ මත එහා මෙහා ඇවිදීමෙන්, මං එක්තරා දෙයක් තේරුම් ගත්තා. ඒ තමයි මොනම ශබ්දයක්වත් නොනැගෙන විදියට ඇවිදිය හැකි තැනක් මේ කොරිඩෝවේ නොමැති බව.

මීළඟට මං තීරණය කළා පහළ - බිම් තට්ටුවට යන්න. ඒ රෙමිංටන් ආදිපාදවරයාගේ අමුත්තන් හමුවෙන්න. මේ සති අන්තයේ රෙමිංටන් මන්දිරයේ සිටි අමුත්තන් හැම කෙනෙකුම දවල් කෑම ගැනීමට සූදානම් වෙමින් හිටියේ. ඔවුන් බලාපොරොත්තු වුණේ දවල් කෑම අවසන් කළ වහාම පිටත් වෙන්න. ඒ දුම්රියෙන් ලන්ඩනය බලා එන්නට.

"මේ අය හැරෙන්නට හොඳටම මෑතකදී මේ ගෙදරට ආව අමුත්තන් කවුද?" මං තොම්සන්ගෙන් විමසුවේ පහළ තට්ටුවට එන අතරේ.

"කොන්රඩ් තෝප් කියල මේ කිට්ටුව පදිංචි මහත්මයෙක් ඉන්නවා. ඔහු ආවා"

"ඒ මොකටද? කවදද? කොයි වෙලාවෙද?"

"තෝප් මහත්තයා ආවෙ දවල් දෙකට තුනට විතර. ආදිපාදතුමාගෙ වතුයායෙ ඈත කෙළවරට යාබදව, තෝප් මහත්තයට අයිති ගොවිපොළක් තියෙනවා. ඔහු ආවේ ආදිපාදතුමා සමග ව්‍යාපාරික යමක් කතා කරන්න"

"ඒක අවසන් කළ වහාම ඔහු පිටවෙලා ගියාද?"

"නැහැ. පවුලේ අය සහ අමුත්තන් සමඟ හවස තේ බොන්න ඔහු රැඳී සිටියා."

"තේ පානය සිද්දවුණේ කොහේද?"

"එදා වැස්සක් නොතිබුණු දීප්තිමත් දවසක්. ඉතින් තේ පානය සූදානම් කළේ නිවසට පිටත, පැත්තෙන් තිබෙන කුඩා මිදුලේ"

"තෝප් මහත්තයා නිතර නිතර මෙහේ ඇවිත් යන කෙනෙක්ද?"

"ඇත්තෙන්ම ඔව් මහත්මයා" සේවකයා කිව්වා. "ඔහු හරි විහිළුකාරයා. ඔහු මේ ගෙදර ඉන්න වෙලාවට අමුත්තන් කවුරුත් හරියට විනෝද වෙනවා. ඔහු කියන කතාවලට විශේෂයෙන්ම නෝනලාට හරියට හිනා"





රෙමිංටන් ආදිපාදතුමාගෙ අමුත්තන් කවුරුත් හිටියේ බොහොම නිශ්ශබ්දව, බුම්මාගත් මුහුණු වලින්. ඒකට හේතුව ඔවුන් මෙහේ සිටියදී සිද්දවුණු හොරකම වෙන්න ඇති. එලිනර් රොබට්ස් මෙනෙවිය සහ හැරියට් ඩේවිස් මෙනෙවිය ඉඳගෙන හිටියේ මිදුලේ බංකු මත. තමන්ගේම කල්පනාවන්ට වැටිලා, ඔවුන් බලාගත් අතේ බලාගෙන වගේ හිටියා. බාන්පූර් මහරාජා සහ ස්කාබ්‍රෝ මහත්මයා සිටියේ උදෑසන කාමරයේ. ඔවුන් එහි පොත් කියවමින් සිටියා.

බාන්පූරයේ මහරාජා සිත් ඇදගන්නා චරිතයක් වෝට්සන්. ඔහු දුටුව ගමන් ඔබට නම් හිතෙන එකක් නැහැ, මේ ඉන්දියානු ප්‍රභුවරයෙක් කියල. ඔහු හැඳ පැළඳගෙන සිටියේ ඉන්දියානු ක්‍රමයට නෙමෙයි. ඔහු ෆ්ලැනල් රෙදිවලින් මැසූ කෝට් කලිසම් ඇඳලා ටයි එකක් දමලා හිටියේ, එංගලන්තයේ ගම්බද ඉඩම් හිමි මහත්මයෙක් වගේ. අප ඔහුට ඇමතීමේදී 'මහරාජා' හෝ 'රාජා' කියා යොදනවාට ඔහු කැමති නෑ. තමන්ට 'රාම්' කියා අමතන මෙන් ඔහු ඉල්ලා හිටියා. ඉතින් මං 'රාම්' කියා ඔහුව හඳුන්වන්නම්. ඔහු මුලින් ම එංගලන්තයට ඇවිත් තියෙන්නේ ළාබාල ළමයෙකු හැටියට. ඒ ඊටන් විද්‍යාලයේ අධ්‍යාපනය ලබන්න. මීට අවුරුදු විස්සකට පමණ කලින් ඔහුට රෙමිංටන් ආදිපාදවරයා හඳුනාගන්න ලැබිලා තියෙන්නෙ ඒ පාසලේදී. ඒ අධ්‍යාපනය නිසාම ඔහු ඉංග්‍රීසි කථා කරන්නේ නියම ඉංග්‍රීසි ජාතිකයෙකු වගේ. ඔහුට උවමනා වෙලා තියෙනවා ඊටන් විද්‍යාලයේ මොඩලයට පාඨශාලාවක්, ඉන්දියාවේ බාන්පූරයේ අරඹන්න. ඔහු මෙවර එංගලන්තයට ඇවිත් තියෙන්නේ ඒ කටයුත්තට.

සෙනසුරාදා රාත්‍රියේ මේ ගෙදර සිද්දවුණු දේවල් ගැන නම් ප්‍රයෝජනවත් යමක් කියන්න ඔහුට හැකිවුණේ නෑ. ඔහු ඊ එකොළහටත් කලින් වගේ ඇඳට ගියාලු. ඒ ඉක්මනින්ම ඔහුට නින්ද ගිහින් තියෙනවා. හොඳින් නින්ද ගිය නිසා ඔහුට කිසිම ශබ්දයක් අහන්න ලැබිල නෑ. ඔහුට උදේ ඇහැරුණේ ගෙදර සේවිකාව කාමරයට තේ අරගෙන ආව වෙලාවෙලු. ඔහු කථා කළේ බොහොම ප්‍රසන්න ආකාරයෙන්. ඒ වගේම විවෘතව. ඒ වුණත් ඔහුගේ සිතුවිලි හෝ ඇතසිටි යමක්, තමන්ගෙ වචන වලින් පිට නොකරන්න, ඔහු උත්සාහයක් දැරුවා කියලයි මට හිතෙන්නෙ. ඒ

මොකද මා සමඟ කතාබහට ඔහු වචන තෝරාගත්තෙ බොහොම පරෙස්සමෙන්.

මෙල්වින් ස්කාබ්‍රෝ කියන්නේ රෙමිංටන් ආදිපාදවරයාගේ දුරස්ථ ඥාති සොහොයුරෙක්. ඔහු ඔක්ස්ෆඩ් සරසවියෙන් පිටවෙලා තියෙන්නෙ ගිය අවුරුද්දෙ. සුදුසු රැකියාවක් සොයමින් කාලය ගත කළත් තවමත් එවැන්නක් ලැබිල නෑ. සෙනසුරාදා රෑ දහය පහුවුණු ඉක්මනින්ම වගේ තමන් ඇඳට ගිය බව ඔහු මා සමඟ කිව්වා. එදා හැන්දෑවෙ තමන් හුඟක් මත්පැන් පානය කළ බවත්, ඒ නිසාම තද නින්දකට වැටුණු බවත් ඔහු කිව්වා. පහුවදා උදේ අවදිවන තුරු ඔහු කිසිම දෙයක් දැනගෙන ඉඳල නෑ. දියමන්තිය සහිත පෙන්ඩනය අතුරුදන්වීමෙන් ඇතිවුණු කලබැගෑනිය, ඔහු දැන ගත්තේ පහුවදා උදේලු. අපි මේ ගැන කතා බහ කරද්දී ඔහු වෙනත් දෙයක් ගැන කල්පනා කරමින් හිටියාදෝ කියල මට හිතුණා. ඒ මොකක් ගැනද කියල මට තවමත් හරියටම කියන්න පුළුවන් කමක් නෑ වොට්සන්. ප්‍රංශ මාදිලියේ ජනේල හරහා ඔහු කිහිපවිටක්ම බැලුවා. ඒ නිවසේ පැත්තකින් තිබුණු මිදුල දිහා. ඒ නිසා මට හිතෙනවා ඔහුගේ බැල්මට අදාළ වුණේ එලීනර් රොබට්ස් මෙනෙවිය ද කියලා.

ඇය වයස අවුරුදු දහනවයක විස්සක ඉතාම සුන්දර තරුණියක්. ඇය ආදිපාදවරියගේ සමීප ඥාති සොහොයුරියක්. ඔවුන් දෙදෙනා කුඩා අවදියේ පටන්ම මිතුරියන් බවයි මට අහන්න ලැබුණේ. ඒ නිසාම එලීනර් නිතර නිතර රෙමිංටන් මන්දිරයට ආ ගිය කෙනෙක්ලු. ඇගේ පියා ලන්ඩනයේ ශ්‍රේෂ් ඉන්හි අධිනීතිඥවරයෙක්.

ඇය සමඟ කළ කතාබහෙන් මට තේරුණේ රොබට්ස් මෙනෙවිය ඉතාම බුද්ධිමත් තැනැත්තියක බවයි. ඇය කියනවා සෙනසුරාදා හවස ඒ ගෙදර තිබුණු කතාබහෙන්, ඇය හරි විඩාවකට පත් වී සිටියලු. රෙමිංටන් ආදිපාදවරයා සහ ඛාන්පූර් මහරාජා දිගින් දිගටම, පාසල් පිහිටුවීම සහ අධ්‍යාපන ක්‍රම ගැන සාකච්ඡා කරමින් ඉඳල තියෙනවා.

ඇයට තරමක හිස කැක්කුමකුත් තිබුණලු. ඉතින් වැඩිය රෑ වෙන්න කලින් ඇය උඩුමහලට නැගුණේ ආදිපාදවරියත් සමගලු. වහාම තමන්ගේ කාමරයට ගිය රොබට්ස් මෙනෙවිය මිනිත්තු පහක් යන්න කලින් ඇඳට වැටුණාලු. ඒ හොඳ නින්දක් ලබා





ගැනීමේ අරමුණෙන්. තමන්ට ඉක්මනින් නින්ද නොගියෙ හිස කැක්කුම නිසා වෙන්න ඇති කියල ඇය කියනවා. අනිත් අය උඩුමහලට ඇවිත් නිදන කාමරවලට ගිය ශබ්දය ඇයට ඇහුණලු. තවමත් නින්ද නොගිය ඇයට, මඳ වේලාවකින් මහරාජා උස් හඬින් ගොරවන ශබ්දය ඇහුණලු. රොබට්ස් මෙනෙවියට නින්ද ගිහින් තියෙන්නේ ඊටත් පස්සේ.

මීළඟට මං කථා කළේ ගරු හැරියට් ඩේවිස් මෙනෙවිය සමඟ. ඇය ප්‍රභූ පවුලකට අයිති නිසා තමයි “ගරු” කියන වචනය ඇගේ නම ඉදිරියෙන් සඳහන් වෙන්නේ. වයසින් අවුරුදු 65 ක් පමණ වන ඇය, රෙමිංටන් ආදිපාදවරයාගේ ඥාතියෙක්. මහරාජා උස් හඬින් කළ ගෙරවීම නිසා, හැරියට් ඩේවිස් මෙනෙවියටත් හොඳට නින්ද ගිහින් නෑ. ඇයට නිදාගන්න ලැබිල තියෙන්නේ මහරාජාගේ නිදන කාමරයට යාබද කාමරය. මේ හේතුව නිසා තමන්ට පැය ගණනක් හරි හැටි නින්ද ගියේ නෑ කියල ඇය කියනවා. ඒක නම් අතිශයෝක්තියක් කියලයි මට හිතෙන්නේ. තමන් වයසට යද්දී ගැඹුරු නින්දකට වැටීම අමාරු වෙමින් ඇති බව ඇය පිළිගන්නවා. තමන්ගේ ගෙදර තමන්ගේ ඇඳේ මිස, වෙනත් තැනක හොඳට නින්දකට වැටීම අපහසු බවත් ඇය කියනවා. මේ හේතුව නිසාම ඥාතීන් හා හිතවතුන්ගේ ගෙවල්වල, දින කිහිපයක් ගත කිරීමට ලැබෙන ආරාධනා, දැන් ඇය එතරම් පිළිනොගන්නා බව ඩේවිස් මෙනෙවිය මා සමඟ කිව්වා.

හැරියට් ඩේවිස් සමඟ කතා බහෙන් මගේ බලාපොරොත්තු කඩවුණා කිව්වොත් නිවැරැදියි වොට්සන්. ඒ මොකද තමා අවට අයගේ කතාබහට හොඳින් ඇහුන්කන් දෙමින් ඒවා ඉතා හොඳින් නිරීක්ෂණය කරන්නේ වයස්ගත කාන්තාවන්. ඇය මොකක් හරි දෙයක් දන්නවා වෙන්නත් පුළුවනි. නමුත් ඇය ඒක අපට හංගනවා. මහරාජාගේ ගෙරවිල්ල ඇරෙන්න වෙනත් කිසිවක් තමන්ට නොඇසුණු බවට, ගරු හැරියට් ඩේවිස් මෙනෙවිය සහතික වෙනවා.

ඩේවිස් මෙනෙවිය සමඟ මිදුලේ කතා කරමින් ඉන්න අතරේ මං දුටුවා වැඩක යෙදී සිටි තවත් කෙනෙක්. ඔහු ආදිපාදවරියගේ ජනේලය කෙළින්ම පහළ උද්‍යානයේ පොළොව පරීක්ෂා කරමින් සිටියා. පොලිස් පරීක්ෂකවරයා ඔහු විය යුතු බවටයි මං නිගමනය

කළේ. මං කවුද කියන එක සුහදව ඔහුට හඳුන්වාදීලයි, මං පොලිස් පරීක්ෂක මැලෝනි සමඟ කථා කළේ. මේ වෙනකොට ඔහු සොයාගත් හෝඩුවාවන් මොනවද කියලත් මං විමසුවා. ඒ වුණත් මං මේ පරීක්ෂණය සඳහා යාම ගැන ඔහුගේ හිතේ තිබුණෙ තරහක්.

"දැන් ඉතින් ආදිපාදතුමා ලොකු තෑග්ගක් දෙනව කියල තියෙනවා නේ" මැලෝනි කිව්වා. "ඔහේ වගේ කෙනෙක් කොයි වෙලාවෙ හරි මෙහේට කඩා වැටේවි කියල මං හිතුවා"

"මෙහේට ඇවිත් මේ ගැටලුව විසඳලා දෙන්න කියලා මගෙන් ඉල්ලා හිටියේ ආදිපාදවරයා" මං කිව්වා. "නැතිවුණු දියමන්තිය හොයා දෙන කෙනෙකුට තෑග්ගක් දෙන බව, මං දැනගත්තෙත් මීට පැයකට විතර කලින්"

පසුව ඔහු මා සමඟ හිතවත් වුණා. තමන් කළ නිරීක්ෂණ හා උපකල්පන ගැන ඔහු කිව්වෙ බොහොම සතුටෙන්.

"දියමන්තිය ගැනීමට හොරා ඒ කාමරයට ඇතුළුවෙන්න ඇත්තෙ ඇරල තිබුණු ජනේලයෙන්." ඔහු කිව්වා. "ආදිපාදවරියගේ කාමරයේ දොරයි ජනේලයයි දෙකම අගුළු දාලයි තිබුණෙ. පිටතට විවෘතව තිබුණු එකම කවුළුව, ඇගේ ඇඳුම් අඳින කාමරයේ ජනේලය. අයිවි වැල් සහ උස ගස් කොයි තරමක් මේ බිත්තිය අයිනෙ තියෙනවද? වැල්වල එල්ලී යන දක්ෂයෙකුට මේක අමාරු කටයුත්තක් නෙමෙයි"

"ඒ විදියට ඇතුළුවුණු කෙනෙකු ඉතිරි කර ගිය සලකුණු මොනවා හරි ඔබට දකින්න ලැබුණද?" මං ඇසුවා.

"එහෙම මොකුත් නම් දකින්න ලැබුණෙ නෑ. මේ අපරාධකාරයො හොඳට පළපුරුදු තක්කඩි. සලකුණක් ලේසියට ඉතිරි කරල යන අය නෙමෙයි. අනික මේ පඳුරුවල සලකුණක් ඉතිරි වෙන්නෙත් නෑ"

"පා සටහන් මොනවා හරි දකින්න ලැබුණෙ නැද්ද?" මං ඇහුවා.

"හුග දවසකින් වැස්සක් වැහැලා නෑ. පොළොව හොඳටම වේළිලා. පා සටහනක් වදින්නෙම නෑ. මං හොඳට සෝදිසි කළා. අත්මේස් එක ඇරෙන්න වෙනත් කිසිම දෙයක් හමුවුණේ නෑ"

"මොකක්ද අත්මේස් එකක් ගැන කිව්වෙ?" මං ඇහුවෙ පුදුමයෙන්.





"ඇයි ඔවුන් ඔබට කිව්වෙ නැද්ද? ඒකෙ ඇති වැදගත්කමක් නෑ හෝම්ස් මහත්මයා. ඒක රෙමිංටන් ආදිපාදවරියගේම අත්මේස් එකක්. මෙතන බිම තිබිලා මට ඒක හමුවුණා. අපරාධකාරයා ජනේලයෙන් පිටවෙලා එද්දි, ඔහුගේ ඇඳුම්වල පැටලිලා අත්මේස් එකත් එන්න ඇති."

"ඔව් වෙන්න ඇති"

"තවත් වෙන්න පුළුවන් එක දෙයයි" පොලිස් පරීක්ෂක මැලෝනි කිව්වා. "තමන්ගෙ මිත්‍රයෙකුට සංඥාවක් හැටියට අපරාධකාරයා අත්මේස් එක, ජනේලයෙන් එළියට විසි කළා වෙන්නත් පුළුවනි"

"ඒත් ඒ වෙලාවෙ තිබුණු ඝන අන්ධකාරයේ හැටියට එහෙම දෙයක් හිතන්නත් අමාරුයි නේද?" මං ඇහුවා.

"ඔව් ඒකත් හරි. ඒ අත්මේස් එක ඔවුන් විසිත්ත කාමරයට ඇතුළුවන තැන පෙට්ටියක් උඩ තියල තියෙනවා. ඔවුන් එහෙම තැබුවෙ මට ආයෙ බලන්න උවමනා වුණොත් බැලීමට පහසුවෙන්නයි. ඒක ආයෙ බලන්න මට නම් අවශ්‍යතාවයක් නෑ"

පොලිස් පරීක්ෂකවරයා මීළඟට ගේ ඇතුළට ගියේ ආදිපාදවරයා හමුවෙන්න. මං එළියට වෙලා කල්පනා කරමින් හිටියා. මට මොනවා හරි අමතක වුණාද? මට නොපෙනී මඟ හැරුණද?"

බිත්තිය දිගේ උඩට වැවී තිබෙන අයිවි මල්වැල් හා පඳුරුවල එල්ලී කවුරු හරි උඩට නැඟුණා ද කියල මං තව දුරටත් කල්පනා කළා. රෙමිංටන් ආදිපාදවරිය සඳහන් කරන, ඇඳුම් මාරු කරන කාමරයේ ජනේලය කෙළින් පහළ, වැල්වල මං එල්ලී බැලුවා. මං හුගක් බර කෙනෙක් නෙමෙයි. ඒ වුණත් කොළ අතු පහසුවෙන් කැඩී ගියා. සෙනසුරාදා රෑ කාගෙ හරි අතින් එහෙම අතු කැඩීගිය සලකුණු තිබුණෙත් නෑ.

ඊට පස්සෙ මං ගියා රෙමිංටන් මන්දිරය ඇතුළට. මැලෝනි සඳහන් කළ අත්මේස් එක මං පරීක්ෂා කරල බැලුවා. අළුපාට මෘදු රෙද්දකින් මසා තිබූ එය, කාන්තාවකගේ දකුණු අතේ මේස් එකක්. එහි පිටපැත්තේ එම්බ්‍රොයිඩර් කළ ගෙත්තමක් තිබුණා. උඩුමහලේ ආදිපාදවරියගේ කාමරයේ මට දකින්න ලැබුණු අත්මේස් ජෝඩුවට මේක බොහොම සමානයි. වෙනසක් වුණේ, ඒ අත්මේස්වල මල් මෝස්තරය ගෙත්තම් කර තිබුණේ රෝස පාටෙන්. මේකෙ එය තිබුණේ නිල්පාටෙන්. මැලෝනි කිව්වේ ඒ අත්මේස් එක සොරාගේ කබා අතේ අහම්බෙන් පැටලී එළියට ආ එකක් විය යුතුයි කියලයි.

නමුත් මම ඒ මතයට එකඟ නෑ. මම හිතන්නේ ඒක හිතාමතාම ජනේලයෙන් එළියට දැමූ එකක් කියලයි. නමුත් ඒ කවුරු විසින්ද කුමක් නිසාද කියල තේරුම් කරන්න මට තවමත් හැකියාවක් නෑ.

මම දැන් ඔබට කිව්වෙ මට දකින්න ලැබුණු තුන්වැනි අත්මේස් එකක් ගැන. එතකොට කෝ මේකෙ හතරවැනි එක? ඒ කියන්නේ එළියේ තිබී හමුවුණු එකේ වම් පැත්තේ අත්මේස් එක. එය තවමත් මට දකින්න ලැබුණෙ නැති බව මට සිහිවුණා. මීළඟට කළ සොයා බැලීමේදී ඒක මට හමුවුණා. ඒ ආදිපාදවරියගෙ ඇඳුම් මාරු කරන කාමරයේ තිබිලා. එහි පුටුවක් මත තිබුණා පුළුල් වාටිය සහිත පත් තොප්පියක්. අත්මේස් එක තිබුණේ ඒකට යටවෙලා. අපරාධය සිදුවුණාට පස්සෙ කාමරයෙ බඩු එහා මෙහා කළාද, අස්පස් කරාද කියලා මම සේවකයාගෙන් විමසුවා. පොලීසිය ඇවිත් පරීක්ෂා කරන තුරු කිසිවක් එහා මෙහා නොකරන මෙන්, ආදිපාදතුමා උපදෙස් දුන් බව සේවකයා කිව්වා. ඒ කියන්නේ ඒ කාමරයේ තිබී මට හමුවුණු අත්මේස් එක එතැන තිබෙන්නේ, අපරාධය සිදුවුණු සෙනසුරාදා රාත්‍රියේ සිට විය යුතුයි.

එතකොට වොට්සන් අද උදේ වරුවේ මා කළ නිරීක්ෂණ හා විමසීම් ගැන තමයි මං ඔබට කිව්වේ."

"ඔබට ලැබිලා තියෙන දත්ත හා නිරීක්ෂණ වලින් යම් නිගමනයකට ඒමට ඔබට හැකිවුණාද හෝම්ස්?"

"සොරකම කළේ කවුද කියන එක නිශ්චය කරන්න තරම් මේ දත්ත ප්‍රමාණවත් මදි" හෝම්ස් කීවේ ඔහුගේ පයිප්පයේ කෝවට දුම්කොළ පුරවමිනි. "නමුත් මූලික නිගමන කිහිපයකට එන්න මට පුළුවනි"

"ඒ මොනවද?"

"එයින් පළමුවැනි එක: රෙමිංටන් මන්දිරයට සෙනසුරාදා රෑ පිටතින් හොරෙක් ආවෙ නෑ. හොරකම කළේ ගෙදර සිටි කෙනෙක්. අත්මේස් එක උවමනාවෙන්ම එළියට විසි කළේ අපව නොමඟ යැවීමට"

"මොනවා? එතකොට ඔබ කියන්නේ සති අන්තයේ ගෙදර නැවතුණු අමුත්තන්ගෙන් කවුරු හරි මේ සොරකම කළා කියලද? ඔවුන් හැම දෙනෙකුම, වැදගත් ධනවත් අය නේ"





"ඔවුන් වැදගතුන් වෙන්න පුළුවන් වොට්සන්. නමුත් දියමන්තිය ගත්තේ එයින් කෙනෙකු බව මට විශ්වාසයි. මේ අය හැම දෙනෙකුම අද දවසේ පදිංචි ලන්ඩනයේ. මෙන්න මා ළඟ තියෙනවා ඔවුන්ගේ ලිපින" කී හෝම්ස් කුඩා සටහන් පොතක් අතට ගත්තේය.

"ඛාන්පූරයේ මහරාජා හෙවත් රාම් මේ දිනවල නවාතැන් ගෙන ඉන්නේ ග්‍රොව්නර් හෝටලයේ. හැරියට් ඩේවිස් මෙනෙවිය පදිංචි චෙරි ට්‍රී උද්‍යානයේ ඇගේම නිවසේ. ස්කාබ්‍රෝ මහත්මයාගේ ලිපිනය වොක්ස්හෝල් වීදියේ. රොබට්ස් මෙනෙවිය ඉන්නේ ඩෝසෙට් උද්‍යානයේ ඇගේ දෙමව්පියන්ගේ නිවසේ. රෙමිංටන් ආදිපාදවරියත් දින කිහිපයකට ලන්ඩන් නුවරට ඇවිත්. ඇය ඉන්නේ සාන්ත ජේම්ස් චතුරශ්‍රයේ ඔවුන්ගේ නිවසේ. ඒ නිසා මේ පරීක්ෂණය පිළිබඳව වැඩිදුර විමසීමකට ඕනෑම මොහොතක මට පුළුවනි ගිහිං ඔවුන් හමුවෙන්න.

රෙමිංටන් මන්දිරයේදී ඔවුනට නිදහසේ කථා කරන්න අවස්ථාවක් තිබුණෙ නෑ. ඒක නම් පැහැදිලියි. තමන්ට කීමට තිබෙන දේවල් පෞද්ගලිකව, රහසිගතව මා එක්ක කියන්න තිබෙනවා නම්, වැඩිමනත් යමක් කියන්න ඔවුන් සූදානම් ඇති. මගේ ආගන්තුක පත්‍රය ඔවුන් හැමදෙනෙකුටම දුන්නා. ඔවුන්ගෙන් කෙනෙකු නැත්නම් දෙදෙනෙකු, ඉක්මනින්ම මා හමුවෙන්න ඒවි කියල මට විශ්වාසයි වොට්සන්"

කතාව අවසන් කළ ඔහු දෙනෙත් අඩවන් කරගෙන පයිප්පයෙන් දුම් පිටකළ අයුරු මම බලා සිටියෙමි. මගේ සිතට නැඟුණු ප්‍රශ්නය මා ඔහු වෙත ඉදිරිපත් කළේ එවිටයි.

"රෙමිංටන් ආර්යාවගේ නිදන කාමරයේ දොර, සෙනසුරාදා රාත්‍රියේ අගුළු දමා තිබුණු බව අපට අහන්න ලැබුණා" මම කීවෙමි. "ඇගේ නිදන කාමරය හරහා මිසක් අර ඇඳුම් මාරු කරන කාමරයට යන්න වෙනත් කිසිම ක්‍රමයක් නෑ. එහෙම නම් ගේ ඇතුළ හිටි කෙනෙක් කොහොමද දියමන්ති පෙන්ඩනය අරගෙන හංගාගත්තේ?"

"ඔබ කියන දේ නිවැරදියි වොට්සන්" මගේ මිත්‍රයා කීවේ මිනිත්තු කිහිපයක නිහඬතාවයකට පසුවය. "ඒක ගන්න ක්‍රමයකුත් නෑ: නමුත් අරගෙන. කොහොමද ඒක කළේ? මං ඔබට නිශ්චිතව

කියන්නම්. මං කලින් නම් සඳහන් කළ අයගෙන් දෙදෙනෙක්; නැත්නම් ඊට වැඩි ගණනක් කළ ප්‍රකාශ, සියයට සීයක් ඇත්ත නෙමෙයි. ඒවාට බොරුත් අන්තර්ගතයි......."

මේ මොහොතේ ඔහුගේ කථාවට බාධා කරමින් අප නිවසේ සීනුව නාද වනු අසන්නට ලැබිණ. ෂර්ලොක් හෝම්ස් මහතා හමුවීමට අමුත්තෙකු පැමිණ ඇති බැව් පැවසූ සේවිකාව, ඔහු විසිත්ත කාමරය තුළට කැඳවාගෙන ආවාය. ඒ කළු පැහැති කෙටි කොණ්ඩයක් හා උස් සිරුරක් තිබූ කඩවසම් තරුණයෙකි.

"ආයුබෝවන් මෙල්වින් ස්කාබ්‍රෝ මහත්මයා" හෝම්ස් අමුත්තා පිළිගනිමින් කීවේ ඔහුට පුටුවක හිඳ ගැනීමට සංඥා කරමිනි.

"හෝම්ස් මහත්මයා. ඔබ දැනගත යුතු කාරණා කිහිපයක් ඔබට දැනුම් දෙන්න මං කැමතියි" කී අමුත්තා මා දෙස බැල්මක් හෙළුවේය. "ඔබේ මිත්‍රයා සමඟ මගේ අහිතක් නෑ. නමුත් මේ කාරණා හෝම්ස් මහත්මයාට පෞද්ගලිකව පැවසීම සුදුසුයි කියලයි මං හිතන්නේ"

"මේ ජෝන් වොට්සන් දොස්තර මහත්මයා, මගේ හිතවත් මිත්‍රයා. අභිරහස් පරීක්ෂණ විසඳීමට මට උදව් වෙන්නේ මේ මහත්මයා. මා සමඟ කියන ඕනෑම දෙයක් ඔහු ඉදිරියේ කියන්න පුළුවනි."

"ඒ ගැන මට අවිශ්වාසයක් නෑ මහත්මයා" අමුත්තා කීය. "මට ඔබ සමඟ කියන්න සිදුවෙලා තිබෙන්නේ අතිශයින්ම පෞද්ගලික ඒ වගේම රහස්‍ය කාරණා..........."

"දොස්තර වොට්සන් ඒවා කාටවත් හෙළි නොකරන බවට මං සහතික වෙන්නම්" හෝම්ස් කීවේ තම දකුණු අත ඔසවා අත්ල පෙන්වා විශ්වාසය තහවුරු කරමිනි.

"බොහොම හොඳයි" තරුණයා කීය. "ඔබේ ඒ වචනය මට ප්‍රමාණවත්. සෙනසුරාදා රාත්‍රියේ රෙමිංටන් මන්දිරයේ සිදුවුණු හොරකම ගැන ඔබ සොයනවා නෙ. ඒ නිසා මෙම කාරණය ඔබට වැදගත් වේවි කියල මං හිතනවා. ඒ හින්දා මං කෙළින්ම කාරණයට බහින්නම්.

රෙමිංටන් මැදුරෙ එදා - සෙනසුරාදා, රාත්‍රී භෝජන සංග්‍රහයෙන් මං පටන්ගන්නම්. ඒක මං ආශාවෙන් භුක්ති වින්දේ නැති බව මුලින්ම කිව යුතුයි. ඒකට ප්‍රධාන හේතුව වුණේ, අමුත්තන් අතර





ප්‍රසන්න, විනෝදමත් සංවාදයක් නොතිබීම. ආදිපාදවරයා රාම් සමඟ අධ්‍යාපන ක්‍රම ගැන කථා කළා. ඔවුන්ගේ අනික් මාතෘකාව වුණේ රෙමිංටන් පවුලට අයිති ඉඩකඩම්, මන්දිර සහ අනිකුත් දේපළ. මේ කතන්දර අහගෙන ඉන්න බැරි තරමට තිත්ත වෙලයි මං හිටියේ. එලිනර් හිටියේ මා ළඟම අසුනක. ඇය සමඟ අප දෙදෙනාගේ කතාබහක් අරඹන්න මං උත්සාහ කළා. නමුත් ඒක හරි ගියෙත් නෑ.

ඒකෙ ප්‍රතිඵලය වුණේ මොකක්ද. මං දිගින් දිගටම වයින් පානය කළා. වයින් වලින් මත්වෙද්දී, මගේ කටිනුත් මෝඩ විදියට නොයෙක් දේ කියවෙන්න ඇති. ඒ නිසා වෙන්න ඇති වෙනදාට මා එක්ක සුහදව කතා කරන එලිනර්, පසුව වඩාත් නිශ්ශබ්ද වුණේ.

අපි රෑ කෑම අවසන් කළා. එතකොට වෙලාව රෑ දහයමාර හා 10.45 අතරේ විය යුතුයි. මුලින්ම කාන්තාවන් තුන් දෙනා - එලිනර්, ඩේවිස් මෙනෙවිය සහ ආදිපාදවරිය නිදාගන්න යන බව අපට කිව්වා. තවත් පැය කාලකට විතර පස්සේ ආදිපාදවරයා සහ රාම් දෙන්නාත් නිදාගන්න යන බව කිව්වා. එතකොට රෑ එකොළහ පහුවුණා විතරයි. මේ වෙලාවෙ ඇඳට ගියාට මට නින්ද යන්නෙ නැති බව මං දැන හිටියා. මට හිතුණා ගෙදර පුස්තකාලයට ගිහිං කියවන්න පොතක් හොයාගන්න.

පුස්තකාලයට ගියාම ඒක තිබුණේ කළුවරේ. පුංචි එළියක් විහිදුණේ ගිනි උදුනෙන් පමණයි. ඒකෙ තිබුණා හොඳ උණුසුම් බවක්. ගිනි උදුන කිට්ටුවම තිබුණු හාන්සි පුටුවක මං වැතිරුණා. ඒ වෙරිමත අඩු වුණාම, මගේ කාමරයට යා යුතුයි කියන කල්පනාවෙන්. මට එතන ඉක්මනින්ම නින්ද යන්න ඇති.

මීළඟට ශබ්දයක් ඇසී මට ඇහැරුණා. ඒ දොරක් විවෘත කළ සහ පරෙස්සමෙන් දොර වහපු ශබ්දය. ඒ ඉක්මනින්ම මට අහන්න ලැබුණෙ කාන්තාවකගෙ දිග සායක රැළි, එකිනෙක ගැටීමෙන් ඇති වූ ශබ්දය සහ, ඇය සෙමෙන් පියවර තැබූ හඬ. ඇය ගමන් කළේ මං වැතිරී සිටි පුටුවට පිටුපසින් පුස්තකාල කාමරය හරහා.

මේ වෙලාවේ මං හිටියේ අඩ නින්දේ විය යුතුයි. නමුත් සැහැල්ලු ගමනින් ඇවිද ගිය මේ තැනැත්තිය එක්කෝ මැරිලින් - එහෙම් ආදිපාදවරිය. නැත්නම් එලිනර් විය යුතුයි. මා විසින් කළ

යුතුව තිබුණේ එතැනින් නැගිට, මා එතන සිටින බව වහාම දැනුම් දීමයි. මං එහෙම කළොත් මෙය දකින කවුරු හරි, ඒ ගැන වැරදි වැටහීමක් ඇති කරගන්න පුළුවන් බවත් මට වැටහුණා. මොකක්ද මං කළ යුත්තේ කියල හිත හිතා ඉන්න කොට, මට තවත් ශබ්දයක් ඇහුණා. ඒ උස ජනේලයක තිරයක් ඉවතට අදින හඬ සහ, ජනේල පියනක් විවෘත වුණු හඬ. ඊළඟට අහන්න ලැබුණේ ගැහැනියක සහ පිරිමියෙකු රහස් කියන ආකාරයට අඩු ශබ්දයෙන් කථා කළ හඬ. නමුත් ඒ කතාබහ මොකක්ද කියන එක නම් මට යන්තමින් වත් ඇහුණෙ නැහැ.

ඔවුන් කී දේවල් මට තේරුම් ගන්න බැරිවුණු බව ඇත්තයි. නමුත් මේක බොහොම රහසිගත සාකච්ඡාවක් බව මම තේරුම් ගත්තා. මේකට සම්බන්ධ නොවී මං වහාම මෙතැනින් පිටවී යායුතු බව මට වැටහුණා. නමුත් අන්ධකාර නුපුරුදු තැනක එහෙම කරන්න යන එකත් අවදානම්. ඔවුන් කොයිතරම් වෙලාවක් කතාබහ කළාද කියල මං දන්නෙ නෑ. සමහරවිට මිනිත්තු දහයක්........? කොහොම වුණත් මට නම් ඒක දැනුණේ පැය භාගයක් වගේ. අන්තිමේදී ජනේලය වහන හඬත් ජනෙල් රෙද්ද ආපසු ඇද්ද ශබ්දයත් මට ඇහුණා. මීළඟට ඇය ඉක්මනින් පුස්තකාලය හරහා ඇවිද ගිහින්, එහි දොර විවෘත කරගෙන පිටවී, යළිත් ශබ්ද නොනගා දොර වසා යන්න ගියා.

පුස්තකාලය යළිත් වරක් නිශ්ශබ්ද වුණා. ඒ මොහොතේ මගේ හිතේ ඇතිවුණේ ඉමහත් සැනසීමක්. මං මිනිත්තු පහක් එතැනම හිටියේ මං ආපසු මගේ කාමරයට යා යුතු ආකාරය මතක් කරමින්. බිම ලෑලි වලින් පුළුවන් තරම් "කිරි කිරි" ශබ්දය මඟ හරිමින් මං ආපසු කාමරයට ගියා. එතකොටයි මං වෙලාව පරීක්ෂා කළේ. එතකොට රෑ එකට පහයි"

"කාගෙ හරි නිදන කාමරයක පහනක් තවමත් දැල්වෙන ආකාරයක් ඔබට දකින්න ලැබුණාද?" හෝම්ස් විමසීය.

"නැහැ. හැම කාමරයක්ම තිබුණේ අඳුරේ. ඇඳට වැටුණු මට ඉක්මනින් නින්ද ගියා. රාජාගේ ගොරවන සද්දය ඇහුණත් ඒක මට ප්‍රශ්නයක් වුණේ නෑ"

"මේ තොරතුරු මට ලබාදීම ගැන මං ඔබට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා" හෝම්ස් කීය. "පුස්තකාලය ඇතුළෙ ඔබ





ඉන්න ඇත්තෙ, මොන තරම් අමාරු තත්ත්වයක ද කියල මට තේරුම් ගන්න පුළුවනි. ඒ වගේමයි මේ කාරණා මට කියන්නත්, ඔබ හිත හදාගන්න ඇත්තෙ අපහසුවෙන්. ඔබ කියූ කාරණා මගේ පරීක්ෂණයට මොන තරම් ප්‍රයෝජනයක් වේවිද කියල මට කියන්න අමාරුයි. කොහොම වුණත් මේ තොරතුරු කාටවත් හෙළි නොකරන බවට අපි දෙන්නා පොරොන්දු වෙනවා"

ස්කාබ්‍රෝ තරුණයා අපේ කාමරය තුළ රැඳී සිටියදී මගේ මිත්‍රයාගේ තිබුණේ ආචාරශීලී සන්සුන් ලීලාවකි. එහෙත් තරුණයා අපට අතට අත දී පිටවී ගිය පසු හෝම්ස්ගේ ස්වභාවය වෙනස් විය. දූත්තක් සේ එක්වරම කෙළින් වූ ඔහු මිනිත්තු කිහිපයක්ම කාමරයේ ඉහළ පහළ සක්මන් කළේය. ඒ සම්පූර්ණයෙන්ම නිහඬවය. අන්තිමේදී මම ඔහු ඇමතුවෙමි.

"හෝම්ස්. ඔබ හිතන්නෙ ඒ කාන්තාව එලිනර් රොබට්ස් මෙනෙවියද, ආදිපාදවරියද?"

"නිසැකවම රෙමිංටන් ආදිපාදවරිය"

"මේ තොරතුරු ලැබීම නිසා අභිරහස ගැන ඔබේ තිබුණු දැකීම වෙනස් වෙනවද?"

"කොහොමටවත් නෑ" හෝම්ස් කීය. යම්තාක් දුරට මං ගොඩනංවා තිබූ උපකල්පනය, මේකෙන් තවදුරටත් ස්ථිර වෙනවා. ඔහු ස්ව කැමැත්තෙන් එළිකළ කාරණාව මට මොන තරම් ප්‍රයෝජනවත්ද කියල, ස්කාබ්‍රෝ මහත්මයාවත් හිතන එකක් නෑ"

මීළඟට මා සමඟ වචනයක් හෝ කථා නොකොට කල්පනා කළ ඔහු කඩදාසියක් හා පෑන අතට ගත්තේය. මීළඟට ඔහු එහි යමක් ලිවීය.

"ඔබ එන විට රෙමිංටන් දියමන්තිය ගෙන එන්න. එසේ කළහොත් විශාල අප කීර්තියකින් ඔබ ගලවා ගැනීමට මට හැකිවේවි. ඔබ එය ගෙන ආවේ නැතහොත් සත්‍යය හෙළි කිරීමට මට සිදුවේවි. එයින් ඔබ විනාශයට පත්වීම වැළැක්විය නොහැක."

මී ළඟට එය කවරයක් තුළට දමා පිටතින් ඇලවූ හෝම්ස් සීනුව නාද කර සේවිකාව කැඳෙව්වේය. ලිපිය ලැබිය යුත්තා හට

අතින්ම ගෙනගොස් දීම සඳහා, හෝම්ස්ට පණිවුඩකරුවකු අවශ්‍ය විය. හෝම්ස් සේවිකාවට දැනුම් දුන්නේ එවැනි පණිවුඩකරුවෙකු කැඳවන ලෙසයි. පණිවුඩකරු අතේ ලිපිය යැවූ හෝම්ස් හාන්සි පුටුවේ වැතිරී දෙනෙත් පියා ගත්තේය.

පැය එක හමාරක් පමණ ගතවිය. සේවිකාව හෝම්ස් නමට එවා තිබූ ලිපියක් රැගෙන ආවාය. කවරය විවෘත කොට අන්තර්ගතය කියැවූ හෝම්ස් ලිපිය මා වෙතට විසි කළේය. එය කෙටි ලිපියකි.

"හිතවත් හෝම්ස් මහතාණනි,

අද රාත්‍රී නවයට ඔබේ නිවසට පැමිණ ඔබ හමුවීමට බලාපොරොත්තු වෙමි.

බාන්පූර්හි රාජා

අටයි කාල පමණ වෙද්දී අපේ ඉදිරි දොරේ සීනුව නාදවෙන ශබ්දය ඇසිණි. මිනිත්තු කිහිපයකට පසු නිවසේ සේවිකාව අමුත්තෙකු උඩු මහලට කැඳවාගෙන ආවාය. අමුත්තා හඳුන්වා දෙනු ලැබුවේ ගරු හැරියට් ඩේවිස් මෙනෙවිය ලෙසයි. වයස්ගත කාන්තාවක වූ ඇයට තිබුණේ කුඩා සිරුරකි. ඇගේ කෙස්වැටිය බාගෙට පැසී අළු පැහැයට හැරී තිබූ අතර සිරුර මඳක් කුදු වී තිබූ බැව් අපි දුටුවෙමු. ගිනිඋදුන අසලම පුටුවේ හිඳගන්නා මෙන් හෝම්ස් ඇයට සංඥා කළේය. මීළඟට ඔහු තමා සඳහා පුටුවක් ඒ අසලට ගෙන ගියේය. ඇය තම දෑත් ගිනි උදුනට ළං කරමින් උණුසුම් කළාය. එමෙන්ම ඇගේ තිබුණේ නිහඬ බවකි. අන්තිමේදී හෝම්ස් කතාව ඇරඹුවේය.

"සෙනසුරාදා රෑ රෙමිංටන් මන්දිරයේ යම් යම් දේ සිදුවුණා" හෝම්ස් කීය. "ඒ ගැන මට කිවයුතු යමක් ඔබේ හිතේ තියෙනවා"

ඇය මගේ මිත්‍රයා දෙසට හැරුණත් වචනයක් හෝ නොකීවාය. ඒ වෙනුවට එම කථාව හෝම්ස්ට කීමට සිදුවන බැව් පෙනිණ.

"සෙනසුරාදා රෑ ඔබට නින්ද ගියේ නෑ. ඔබේ කාමරයේ ඇඳට වෙලා, නමුත් ඇහැරිලා ඔබ නිහඬව සිටියා. මැදියම් රැයත් පහුවෙලා රෙමිංටන් ආදිපාදවරියගේ කාමරයේ දොර ඇරෙන ශබ්දය ඔබට ඇසුණා. ඊළඟට ඇය තරප්පු දෙසට ඉතා පරෙස්සමෙන් ඇවිද ගිය ශබ්දය ඔබට ඇසුණා. ඔබ ඔබේ කාමරයේ දොර යන්තමින්





ඇරලා බැලුවා. මොකක්ද ඔබ දුටුවේ? ඇගේ රාත්‍රී ගවොමට පිටතින් ඩ්‍රෙසිං ගවොමක් හැඳගෙන, ආදිපාදවරිය පහළ තට්ටුවට බැසයන හැටි ඔබට දකින්න ලැබුණා.

ඔබේ හිතට යම් සිතිවිල්ලක් ආවේ ක්ෂණිකව. ඔබ ක්‍රියාත්මක වුණේ වැඩිදුර කල්පනා නොකර. ඔබ බරාඳය හරහා ගිහින් ඇගේ නිදන කාමරයට ඇතුළු වුණා. එතැනින් ඇගේ ඇඳුම් මාරු කරන කාමරයට ගිය ඔබ දුටුවා එහි තිබූ ඇගේ ආභරණ පෙට්ටිය. යතුර එහි යතුරු කටේ තිබුණා. වහාම ආභරණ පෙට්ටිය විවෘත කළ ඔබ රෙමිංටන් දියමන්තිය අතට ගෙන පෙට්ටිය වැහුවා. මේක පිටතින් ආ කෙනෙකුගේ වැඩක් බව පෙන්වීමට ඔබට සිතිවිල්ලක් ආවා. පුටුවක් මත තොප්පියකට යටවෙලා තිබූ අත්මේස් කුට්ටමකින් එකක් අරගෙන ඔබ එය ජනේලයෙන් එළියට විසිකළා. ඒක පහුවදා උදේට හමුවෙන බව ඔබ දැන හිටියා. ඊළඟට ඔබ ඉක්මනින්ම ඔබේ කාමරයට ගිහින් දොර වසාගෙන, දියමන්තිය ඔබේ ගමන් මල්ල තුළ සැඟෙව්වා."

ඩේවිස් මෙනෙවියගෙන් කිසිදු පිළිතුරක් නොලැබිණි. ඇය දිගටම හෝම්ස් දෙසම බලා සිටියාය. ඔහු තම කථාව යළි ඇරඹුවේය.

"ඔබ සොරකම් කරගත් දේ සමඟ ආපසු ගෙදර ආවමයි, ඔබ පත්වුණු තත්ත්වයේ නියම ස්වභාවය ඔබට වැටහුණේ. එක් මොහොතක ගත් හදිසි තීරණයක් නිසා, ඔබ වැටුණේ හරි කරදරයක. භයානක විනාශකාරී තත්ත්වයක කියල කියන්නත් පුළුවනි. ඔබට ඇත්තෙන්ම ඔය දියමන්ති පෙන්ඩනය උවමනා නැහැ. ඔබට ඒක පළඳින්නත් බැහැ. ඒක ඉතාම සුප්‍රසිද්ධ මැණිකක් නිසා ඒක විකුණන්නත් බැහැ. මොනව කරනවාද කියල ඔබ කල්පනා කළා. මේ අතරෙදි තමයි මගේ ලියුම ඔබට ලැබුණේ. මේ ප්‍රශ්නයෙන් ගොඩ ආ හැකි ක්‍රමයක් ඒකෙ සඳහන් වුණා. මං කියූ දේවල් හරි නේද?"

"ඔබ කියන දේ නිවැරැදි යි" ඩේවිස් මෙනෙවිය කීවාය. "මගේ නම මොනම අයුරකින් වත් සඳහන් නොකර, ඔබට පුළුවන්ද දියමන්තිය ආදිපාදවරියට භාරදෙන්න?"

"ඒක තමයි මගේ අරමුණ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඔබේ නමේ මඩ තැවරෙන විදිහට එය ඇඟා ගැනීමෙන් කිසිම ප්‍රයෝජනයක් අත්වෙන්නෙ නෑ, විනාශයක් මිසක්"

"බොහොම හොඳයි" ඩේවිස් මෙනෙවිය කීවේ පරාජිත හඬකිනි. මීළඟට තම උකුළ උඩ තිබූ අත් බෑගය විවෘත කළ ඇය ලේන්සුවක ඔතා තිබූ කුඩා පොදියක් අතට ගත්තාය. අනතුරුව ඒ තුළ තිබූ දෙය දකුණු අත්ලට ගෙන, ඇය තම අත්ල මත තබා එය අපට ප්‍රදර්ශනය කළාය. දුටු දෙයින් මම විස්මයට පත් වූයෙමි. මගේ ජීවිතයේ මා දැක තිබූ විශාලම දියමන්තිය එයයි. එහි පෘෂ්ඨ ගණනාවක් විය. අපේ ගිනි උදුනේ ආලෝකය ඒ මතට වැටී අලංකාර ආලෝක ධාරා දසත විහිදුණේය.

"මෙන්න තියනවා ඔබ කියූ විදියට මා අමාරුවට පත් කළ දෙය" ඇය කීවාය. "මං ගත්තේ මේක විතරයි. නැතිවුණු මුද්දට මොකක් වුණාද කියල මම දන්නේ නෑ"

හෝම්ස් එය ඇගේ අතෙන් ගත්තේ දියමන්ති පෙන්ඩනය එල්ලා තිබූ මාලයත් සමගය. මීළඟට ඔහු එය මඳක් කරකැවෙන සේ රන්මාලය ඒ මේ අතට හැරෙව්වේය. එසේ කළ ඔහු එය මගේ අතට දුන්නේ එය සමීපව නැරඹීමට මට අවස්ථාවක් ලබා දෙමිනි.

"බලන්න වොට්සන් ඒකෙ ලස්සන. විද්‍යාඥයින් නම් කියන්නේ මේක පීඩනයට ලක්වුණු අඟුරු කුට්ටියක් පමණයි කියල. වොට්සන් මගේ මිත්‍රයා. මේ මොහොතේ ඔබ හොර බඩු ජාවාරම් කාරයෙක් කියන්න පුළුවනි" කී හෝම්ස් දඟකාර අයුරින් සිනාසුණේය.

මීළඟට ඔහු ඩේවිස් මෙනෙවිය ඇමතුවේය.

"ඔබ බුද්ධිමත් කාන්තාවක්. මෙහෙම අපරාධයක් ඔබ අතින් සිදුවුණේ ඇයි?"

"හෝම්ස් මහත්මයා. ඒ හැම දෙයක්ම මං ඔබට කියන්නම්. මෙතැන ඔබ දන්නෙ නැති කාරණා හුගක් තියෙනවා. නමුත් මැණික ගත්තෙ මම බව ඔබ දැනගත්තෙ කොහොමද? ඔබ නම් පොලිස් පරීක්ෂක මැලෝනිට වඩා අති දක්ෂ රහස් පරීක්ෂකයෙක්. ඔහු කළේ ඒ පැත්තෙ ගැවසෙන බිහිසුණු මංකොල්ල කල්ලි ගැන ලැයිස්තුවක් දුන්නු එක විතරයි. මහ රාත්‍රියේ ජනෙල් වලින් ගෙවල්වලට ඇතුළුවෙන මගරිජ් කල්ලිය, ජෝන් ක්ලේ කල්ලිය ගැන තොරතුරු ඔහු කියද්දී මගේ ඇඟ සීතල වුණා. ඔබ කොහොමද මේ කාරණාව දැන ගත්තේ? ඔබ අනුමාන කළාද?"

"අනුමාන කිරීම මං කොහොමටවත් නොකරන දෙයක්" හෝම්ස් කීය. "තර්කානුකූලව යම්කිසි උපකල්පනයකට ඇවිත්,





ඒකෙන් ඉදිරියට යා හැකි මාර්ග සොයා බලනවා මිසක්, අනුමාන කිරීම මං කරන්නේ නෑ.

මෙතැනට පිටතින් හොරෙකු නොආ බව, මගේ නිරීක්ෂණ මගින් මං මුලදීම තේරුම් ගත්තා. ඊළඟට එළියේ තිබී හමු වූ අත්මේස් එක. එය එළියට විසිකළ තැනැත්තා එය සිතාමතාම අප නොමග යැවීමට කළ දෙයක් බව මට පෙනුණා. එතකොට කවුරු වෙතද අපේ සැකය යොමුවෙන්නේ? නිවසේ සේවක මණ්ඩලය ගැන සැකයක් ඇතිවෙන්නේ නෑ. ඒ මොකද රාත්‍රියට මේ අංගනයට, සේවක සේවිකාවන් කිසිවෙකුට පැමිණීමට අවසර නැතිවීම නිසා. එතකොට අපගේ සැකය යොමුවෙන්නේ එදා රෑ නිවසට ඇවිත් සිටි අමුත්තන් හතරදෙනා සහ ආදිපාදවරිය වෙත. ඇයි ආදිපාදවරිය? මෙතැනදී ඇගේ හැසිරීම හරිම අමුතු බව මට පෙනී ගියා. ඇයගේ සිතේ යම් රහසක් තිබෙන බවත් මට හැඟුණා. ඉතින් තමන්ගේම දියමන්ති පෙන්ඩනය හොරු ගැනීම ගැන ඇයගේත් යම් දායකත්වයක් තිබෙනවාද කියන සැකය මෙතැනදී බැහැර කරන්න බෑ. 1870 දී ඔස්ට්‍රියානු ප්‍රභූ පවුලකත් එවැනි දෙයක් සිදුවුණා.

හතරවැනි අත්මේස් එක තොප්පියකට යටවී පුටුවක් උඩ තිබී හමුවුණාම, මා නිශ්චිත දිශාවකට යොමුවුණා. ඒ මොකද තුන්වැනි අත්මේස් එක කවුරු හරි එළියට විසිකළේ, යම් බලාපොරොත්තුවක් ඇතිව. ඒ තමයි හොරකම ගැන හොයන අයට ඒක පසුවදා උදේ හමුවීම. ආදිපාදවරිය කිව්වා සේවිකාව ගියාට පස්සේ, තමන් දොර යතුරු දමා වසාගත් බව. ඒක සියයට සීයක් ඇත්ත වෙන්න බැරි බව මට පෙනී ගියා. ඇය මිනිත්තු කිහිපයකට හරි කාමරයෙන් එළියට යන්න ඇති. එහෙම නම් දියමන්තිය ගන්න ඇත්තේ මේ ළඟම කාමරයක සිටි අමුත්තෙකු විසින් විය යුතුයි.

පළමුවෙන්ම සැකය එල්ල වෙන්නේ මහරාජාට කියල කවුරු හරි කියන්න පුළුවනි. ඔව්. විෂ්ණු දේව පිළිමයේ ඇස යළිත් යථා තත්ත්වයට පමුණුවන්න ඔහු එසේ කළාද? ඔවුන් දැඩි හින්දු භක්තිකයන්. ආගමේ නාමයෙන් ජීවිතය විනාශ කර ගන්න, වුණත් ඔවුන් දෙපාරක් කල්පනා කරන්නෙ නෑ. විෂ්ණු පිළිමයට අයත් මැණික ඒ කාලයේම මිලට ගන්න, මහාරාජාවරු දෙදෙනෙකු උත්සාහ කර තිබූ බවත් අපට අහන්න ලැබුණා. කොහොම වුණත්

මෙ මහරාජා ගැන ඒ සැකය ඇතිවෙන්නේ නෑ. ඔහු උගත් කමින් පිරිපුන් බුද්ධිමත් කෙනෙක්. අනික ඔහු දිගින් දිගටම නින්දෙන් ගෙරවූ ශබ්දය කාටත් අහන්න ලැබී තිබුණා. බොරුවට ගෙරවීමක් ඕනම කෙනෙකුට පහසුවෙන් කරන්න පුළුවනි. නමුත් ඒ ඉතාම කෙටි කාලයකට පමණයි. ඒ නිසා අපට පුළුවනි ඔහුව බැහැර කරන්න.

එතකොට ඉතිරි වෙන තිදෙනාගෙන් රොබට්ස් මෙනෙවිය සහ ස්කාබ්‍රෝ මහත්මයා යන දෙදෙනාට, ආදිපාදවරියගේ කාමරයට එන්න සෑහෙන දුරක් ගමන් කළ යුතුයි. එහෙම එද්දී නිසැකවම බිම ලැලිවල "කිරි කිරි" ශබ්දය අනික් අයට අහන්න ලැබෙනවා. නමුත් ඔබ කිව්වා ඔබට ගෙදරින් පිට ගියාම නිදාගන්න හුඟක් අමාරුයි; එදා සෙනසුරාදා රෑත් ඔබ සෑහෙන වෙලාවක් නිදි නැතුව හිටියා කියල. එතකොට ලැලිවලින් නැඟුණු ශබ්දයක් ඔබට ඇහිල තිබුණෙත් නෑ. ඉතින් මට කණගාටුයි කියන්න. ඉතිරි වෙන්නෙ ඔබ පමණයි ඩේවිස් මෙනෙවිය. මට ඔබෙන් අහන්න තිබෙන ප්‍රශ්නය මේකයි. ඇයි ඔබ මෙවැනි දෙයක් කළේ?"

"ඉතාම හොඳ ප්‍රශ්නයක් හෝම්ස් මහත්මයා. සමහරවිට ඔබ ඒක මගෙන් නොඇසුවත්, කාරණා සියල්ල මං ඔබට කියන්න ඉඩ තිබුණා. ඒව හෙළිකරලා මට පුළුවනි මගේ හිත සැහැල්ලු කරගන්න.

මමත් රෙමිංටන් ආදිපාදවරයාගේ ඥාතියෙකු බව ඔබ දන්නවා. ඔහු පැවත එන්නේ මේ දියමන්තිය එංගලන්තය වෙත ගෙන ආ ඔස්කා මොන්ට්ගොමරි ගෙන්. මා පැවත එන්නේ ඒ කාලයේ අකාලයේ මියගිය සර් ජෝන් මොන්ට්ගොමරි ගෙන්.

පහුගිය අවුරුදු හතළිහක පමණ කාලයක් තිස්සේ මමත් රෙමිංටන් මන්දිරයට වරින්වර ඇවිත් ගියා. ඥාතිවරිය අවිවාහක කෙනෙකු වීම නිසා ඔවුනටත් මාව කරදරයක් වෙන්න ඇති. නමුත් සමහර වෙලාවට මා සිටීම ඔවුනට ප්‍රයෝජනවත් වුණා. ඒ කෑම මේසයට හිඳගන්නා අමුත්තන් ගණන සම්පූර්ණ කරන්න උවමනා වුණාම. මේ ආදිපාදවරයාගේ පියාගේ අදහසක් තිබුණා, ඔහුගේ අවිවාහක අමුත්තෙකුට මාව විවාහ කර දෙන්න. නමුත් ඒක ඉටුවුණෙත් නෑ. සැෆ්රොන් හිල් කිට්ටුව තට්ටු නිවාසයකට වෙලා මං දුකසේ ජීවත්වුණා. කලින් සිටි ආදිපාදවරයා මගේ දූමරිය





ගාස්තුව මා වෙත එව්වා. විවාහ විය හැකි තරුණ වයසේ සිටි මම ක්‍රමක්‍රමයෙන් වයසට ගිහින් විවාහ නොවෙන මහලු ගැහැනියක බවට පත්වුණා."

"ඔබේ පවුල ආදිපාදවරයාට ඥාති වෙන්නෙ කොහොමද?"

"මගේ මුත්තාත් ඔහුගේ මී මුත්තාත් ඥාති සොහොයුරන්. මගේ පියාට විල්ස්ඩන් හි අර්ල්වරයා ලෙස ප්‍රභූ තානාන්තරයක් තිබුණා. නමුත් ඒකෙන් ඔහුට මූල්‍යමය වාසි සැලසුණේ නෑ. මගේ පියා කළේ ඔහුට අයත් වතුපිටිවල ගොවිපොළවල් පවත්වාගෙන යාම. නමුත් ඔබ දන්නවා; ඕලන්දයේ හා ඩෙන්මාර්කයේ ගොවිපොළවල් සමඟ අපට තරඟ කරන්න බැරිවුණු වග. ඔවුන් කිරි නිෂ්පාදන හා මස් අඩු මිලට පිටරටවලට යැව්වා. අපේ ගවයන් මියගොස් ගොවිපොළවල් වසා දැමුණා.

මට හිටියේ එකම සොහොයුරෙක් පමණයි. ඔහු තරුණ කාලයේම යුද්ධ හමුදාවට බැඳුණා. ඉන්දියාවට යැවුණු ඔහු ඉන්දියානු කැරැල්ලේදී මියගියා. මගේ මව මිය ගියේ හුඟක් කලින්. අඟහිඟකම් නිසා ඔහුගේ ගොවිපොළවල් පිහිටි ඉඩම් උකස් කර, මගේ පියා මුදල් ලබාගෙන තිබුණා. ඔහු මියයන විට මං මුහුණ දුන්නේ විශාල ආර්ථික අර්බුදයකට.

එක්වරක් මුදල් හදිසියකට මගේ පියා ඔහුට අයත් වතුයායක් වර්තමාන රෙමිංටන් ආදිපාදවරයාට විකුණා තිබුණා. නමුත් ඔහු ඒකෙන් මපියාට ගෙවා තිබුණේ නියමිත මුදලෙන් හතරෙන් එකක් පමණයි. පසුව දෙනවා කී ඉතිරි මුදල අපට කවදාවත් ලැබුණේ නැහැ. මගේ පියා මියගියෙත් ඒ ගැන සිත් වේදනාවෙන්. අප දිළින්දන් බවට පත්වෙද්දී ඔවුන් විශාල ධනවතුන් බවට පත්වුණා. ඉතින් මගේ සිතේ ඔවුන් ගැන වෛරයක් ඇතිවීම පුදුමයක් නොවෙයි නේද? මගේ පියාගේ මරණයෙන් පසු ඉතිරිව තිබූ ඒවාත් විකුණා දමා මම ලන්ඩනයට සංක්‍රමණය වුණා. මං ජීවත්වුණේ ළමයින්ට අමතර ඉගැන්වීමක් කර උපයාගත් මුදලෙන්.

වරින් වර රෙමිංටන් මන්දිරයට එන්න ලැබීම මට සතුටක් වුණා. ඒ මොකද රසවත් ආහාර වේල් එහිදී ලැබෙන බව මං දැන හිටි නිසා. ඒ වගේම සමාජයේ වැදගත් තනතුරු දැරූ අය මට දැන හඳුනාගන්න ලැබුණා. එයින් සමහර දෙනෙක් හරිම සිත් ඇදගන්නා සුලු චරිත. කොහොම වුණත් අවුරුද්දෙන් අවුරුද්ද මට මේ ගැන

තිබුණු උනන්දුව අඩුවී යන්න පටන්ගත්තා. ඒකට ප්‍රධාන හේතුව වුණේ, ඉතාම උද්ධච්ඡ පුද්ගලයෙකු වුණු වර්තමාන ආදිපාදවරයා, ඔහු කොයි වෙලෙත් කථා කළේ, දවසින් දවස ඉහළ ගිය තමන්ගේ ධනස්කන්ධය ගැනයි. මගේ දුප්පත්කම ගැන එයින් මට නිතර නිතර මෙනෙහි වුණා. ඒ නිසා වෙන්න ඇති මගේ මොළය වියරු වැටුණු මොහොතක මා අතින් ඒ අපරාධය සිද්ධ වුණේ. ඇත්තටම මේ දියමන්තියේ නියම අයිතිකාරයන් ඔවුන් නෙමෙයි"

"ඒ කොහොමද?"

"මෙක අපේ පවුල්වල තිබෙන කතන්දරයක්. තුන්වැනි රෙම්ංටන් ආදිපාදවරයා බවට පත්වුණු ඔස්කා මොන්ට්ගොමරි තමයි එය එංගලන්තයට ගෙන ආවේ. නමුත් ඔහු එය තමන්ගේ බාප්පාගෙන් අත්පත් කරගෙන තිබෙන්නේ, බාප්පා එනම් සර් ජෝන් මොන්ට්ගොමරි ඝාතනය කිරීමෙන්."

"මොනවද ඒකට තිබෙන සාක්ෂි?"

"පෙරදිග ඉන්දීය සමාගමේ සේවය කළ හැරී මෝගන් නම් නිලධරයෙකු 1803 දී ඉදිරිපත් කළ දිවුරුම් පෙත්සමක, ඒ බව සඳහන් වෙලා තියෙනවා. මද්‍රාසියේ සාන්ත ජෝජ් බලකොටුවේදී දියමන්තිය මිලට ගෙන තිබෙන්නේ සර් ජෝන් මොන්ට්ගොමරි. ඔහු සහ ඔස්කා එංගලන්තය බලා එන අතරේ, සර් ජෝන් අද්භූත විලසින් නැවෙන් අතුරුදන් වුණා"

"මේ ලියවිල්ල ප්‍රසිද්ධියට පත්වුණේ නැද්ද?"

"නැහැ. එම කාරණය ඔප්පු කිරීමට ප්‍රමාණවත් තරම් සාක්ෂි නොමැති බව නීතිඥවරුන් කියා සිටියා"

මේ අවස්ථාවේ අපේ කතාබහට බාධාවන අයුරින් ඉදිරි දොරේ සීනුව නාදවිණි. දියමන්තිය වහා සඟවන මෙන් හෝම්ස් තම බැල්මෙන් මට සංඥා කළේය. මම එය වහාම මගේ කලිසම් සාක්කුවට දමා ගතිමි. උඩු මහලට පැමිණි හඩ්සන් මහත්මිය බාන්පූර්හි රාජා හෝම්ස් හමුවීමට පැමිණ ඇති බව දැනුම් දුන්නාය.

අපේ විසිත්ත කාමරයට ඇතුළු වූයේ ක්‍රීඩකයෙකුගේ පෙනුම, කළු කොණ්ඩයක් හා දුඹුරු පැහැති ඡවි වර්ණයක් තිබූ පුද්ගලයෙකි. කාමරයට ඇතුළු වෙද්දී ඔහු අනපේක්ෂිත ලෙස දුටුවේ ගරු හැරියට් ඩේවිස් මෙනෙවිය අප සමඟ කතාබහකට වැටී සිටි ආකාරයයි.





"මට සමාවෙන්න" රාජා පැවසීය. "ඔබට තවත් අමුත්තෙකු සිටින බව මං දැනගෙන හිටියෙ නෑ. මේ වෙලාවෙ මගේ පැමිණීම ඔබට කරදරයක්ද?"

"කොහොමටවත් නෑ මහත්මයා" හෝම්ස් කිය.

"හෝම්ස් මහත්මයා. ඔබට හැකිවුණාද නැතිවුණු දියමන්තිය හොයා ගන්න?" මහාරාජා විමසුවේය.

"ඇත්තෙන්ම ඔව්. මේ මොහොතෙ ඒක තියෙන්නෙ හොර බඩු වෙළෙන්දෙකු ළඟ"

"ඔබට හොඳටම විශ්වාසද?"

"හෙට ඉර පායනවා වගේ විශ්වාසයි. මීට මොහොතකට කලින් ඒක තිබුණේ ඔහුගේ කලිසමේ දකුණු සාක්කුවේ. ඔහුගේ නම පටන් ගන්නේ ජෝන්..........! නෑ මං ඉතිරි හරිය හෙළි කරන්නේ නෑ" මගේ මිත්‍රයා කීවේ මුව පුරා සිනාවෙමිනි. ඩේවිස් මෙනෙවියගේ මුහුණේද සිනා රැල්ලක් මතුවිය.

"දැන් මොකක්ද ඒකට කරන්න බලාපොරොත්තු වෙන්නෙ?" අමුත්තා විමසුවේය.

"මං ඒක හෙට උදේම ආදිපාදතුමාට භාර දෙනවා"

"දෙවියන්ට ස්තුති වේවා! එහෙම නම් අපි ඒ ගැන හිත් කරදර කරගන්න උවමනාවක් නෑ. එතකොට පුෂ්පරාගය සහිත මුද්ද?"

"ඒක වෙනත් ගැටලුවක්. ඒක දියමන්තිය සමඟ සොරකම් කෙරුණෙ නෑ. මුද්ද නම් කොහොමටවත් සොරෙකු ගත්තා කියල මං හිතන්නේ නෑ"

"රෙම්ංටන් ආදිපාදවරිය පවා කියන්නෙ ඒක අස්ථාන ගතවෙලා කියලනේ" ඩේවිස් මෙනෙවිය කීවාය.

"ඩේවිස් මෙනෙවිය" මහාරාජා කීය. "ඔබේ ඥාතීන් ගැන මම මෙහෙම කතා කරනවට සමාවෙන්න. ඔවුන්ගේ ආගන්තුක සත්කාර භුක්ති විඳලා මං මෙහෙම කතා කරන එකත් වැරදියි. නමුත් ගැටලු විසඳෙන එක කාටත් හොඳයි.

රෙම්ංටන් මන්දිරය ප්‍රශ්න ගොඩකට මැදිවෙලයි තියෙන්නෙ. දැන් රෙම්ංටන් ආදිපාදතුමා ඒ කාලෙ මං හඳුනාගෙන උන්නු, ආශ්‍රය කළ, එකට සෙල්ලම් කළ පුද්ගලයා නෙමෙයි. ඔහු දැන් හුඟක් වෙනස් වෙලා. ආදිපාදවරිය ඉන්නේ ලොකු අසතුටකින්."

"ඔබට රාජා කියල මං ඇමතුවොත් ඒකෙ වැරැද්දක් නැහැ නේද?" හෝම්ස් විමසීය.

"කොහොමටවත් නෑ මහත්මයා"

"රෙමිංටන් ආර්යාව පුෂ්පරාග මුද්ද කාටහරි දුන්නු බව ඔබ දන්නවා" හෝම්ස් කීය. "නමුත් මේක කාටවත් කියන්නත් ඔබේ හිතට හරි මදි. ඒ මොකද ඒකෙන් ඔබේ පාසලේ මිතුරාට විරුද්ධව ඕපාදූපයක් පැතිරෙන්න ඉඩ තිබෙන නිසා"

"හෝම්ස් මහත්මයා. ඔබ මගේ සිතේ තිබෙන දේවල් කියන්නෙ ඔබේ ඇහැට පෙනෙනවා වගේ" රාජා කීවේ මවිතයෙනි.

"පහුගිය සෙනසුරාදා කොන්රඩ් තෝප් මහත්මයා රෙමිංටන් මන්දිරයට ආවා." හෝම්ස් කීය. "ඔහු ආවෙ ඇයි කියල ඔබ දන්නවද?"

"මට ආරංචි වුණු විදියට ඔහු ආවෙ ආදිපාදවරයාගෙන් ලොකු මුදලක් ණයට ඉල්ලා ගන්න. නමුත් ආදිපාදවරයා ඒක ප්‍රතික්ෂේප කළා" රාජා කීය.

"හොඳයි. ඔබට දැනගන්න ලැබුණද මේ කාරණය? ආදිපාදවරිය ඇගේ පුෂ්පරාග මුද්ද රහසේම තෝප් මහත්මයාට දුන්නා. ඒ මුද්ද ඇපයට තියලා කොහෙන් හරි ණය මුදලක් ලබාගන්න"

"දෙවියනේ! ඔබ ඒ තරම් දේවල් දන්නවද? ඕකෙ තරමක් දුරට දේවල් මං අනුමාන කළා. මැරිලින් සහ තෝප් මහත්මයා සමීප මිතුරන් බවට පත්වී ඇති බව, හැමෝටම වගේ පෙනුණු දෙයක්"

"ඒක නම් මටත් පෙනුණා" ඩේවිස් මෙනෙවිය කීවාය. "මගේ ආදිපාද ඥාතියාට වඩා මැරිලින් ඉතාම හොඳ කෙනෙක්. උද්‍යානයේ කෙළවර මල් වගාවේ ඇති මල් කොන්රඩ්ට පෙන්වන්න, ඇය ඔහු සමඟ එහි ගියා. ඔවුන් සෑහෙන වෙලාවක් ගත කළේ අපට කිසිදෙයක් නොඇසුණු තරම් දුරක. ඔවුනට ඔච්චර කතා කරන්න දේවල් තියෙනවද කියල මට පුදුමත් හිතුණා"

"කොන්රඩ් තෝප් කියන්නේ බොහොම කෙරාටික පුද්ගලයෙක් කියලයි මට හිතෙන්නේ" රාජා කීය. "නමුත් ඕවා අනික් අයට පැහැදිලි කර දෙන එක ඉතාම සංකීර්ණ වැඩක්....... පටන් ගත්තොත් කොහෙන් කෙළවර වේවිද දන්නෙ නෑ"

"රාජා. ඔබ කියන දේට මමත් සම්පූර්ණයෙන්ම එකඟයි" හෝම්ස් කීවේය.

තේ පානයෙන් පසු අමුත්තෝ අප නිවසින් පිට වී ගියෝය. විසිත්ත කාමරයේ දොර වසා අගුළු ඇමූ පසු, මගේ සාක්කුවේ





තිබූ රෙමිංටන් දියමන්තිය සහිත පෙන්ඩනය අතට ගතිමි. මීළඟට එය සවිකර තිබූ රන්දම්වැලෙන් අල්ලාගෙන ගිනිදළුනේ දීප්තිමත් ආලෝකය දියමන්තිය මතට වැටෙන්නට සැලැස්සුවෙමි. එය ආලෝකය ඉදිරියේ කරකැවෙද්දී, වර්තනය හා පරාවර්තනය වූ ආලෝක කිරණ මගින් සෑදුණු අලංකාර දසුන, නැවත වරක් නැරඹුවෙමි. තම පුපුරුදු අසුනේ සිටි හෝම්ස් ද නිහඬව මඳ වේලාවක් එදෙස බලා සිටියේය.

"අපි ජීවත්වෙන්නේ හරිම සංකීර්ණ ලෝකයක වොට්සන්" ඔහු කීවේ නිහඬතාව බිඳිමිනි. "එදා රාත්‍රියේ රෙමිංටන් ආදිපාදවරිය පුස්තකාල කාමරයේ ජනේලයෙන් තෝප්ට කථා කරන්න නොගියා නම්, මේ දේ සිදුවෙන්නේ නෑ නේ. එහෙම නම් මේ දියමන්තිය අතට ගන්න ඩේවිස් මෙනෙවියට කවදාවත් කිසිම අවස්ථාවක් ලැබෙන්නෙ නෑ. ඒ හින්දා දියමන්තියේ සොරකමට බලපෑවෙත් රෙමිංටන් පවුලේ විවාහය නිසා ඇතිවුණු ප්‍රශ්නයක් කියලා, කෙනෙකු තර්ක කරන්න පුළුවනි"

"ඔබ මොනවද ඔහුට කියන්නෙ?"

"දියමන්තිය ගැන නම් කිසි දෙයක් කියන්නෙ නැහැ. නැතිවුණු මුද්ද නම් මට හමුවුණේ නෑ කියනවා. ඒක නම් ආදිපාදවරිය කියනවා වගේ ඉදිරි කාලයේ දිනයක අස්ථාන ගත වී තිබුණු තැනින් හමුවේවි කියනවා. ඔබට මතකද වොට්සන්. මට භාර දුන්නේ නැතිවුණු දියමන්තිය සොයාදීමේ කටයුත්ත පමණයි. එහෙම වෙන්න හේතුව පහදාදීම මට භාර කටයුත්තක් නොමෙයි. ඔවුන් අතර ප්‍රශ්න තියෙනවා නම් ඒවා රෙමිංටන් ආදිපාදතුමා සහ ආදිපාදවරිය විසින්ම විසඳා ගත යුතුයි"

# බ්ලැක්විච් අභිරහස

## පුදුමාකාර ලියුමක්

හැම්ඩන් බේදවාචකය නමින් එකල පුවත්පත් මගින් ප්‍රසිද්ධියට පත්කෙරුණු සිදුවීම, රටවාසීන් බොහෝ දෙනෙකුට තවමත් මතක ඇතුවා නිසැකය. කෙසේ වෙතත් මේ සිද්ධිය ගැන බොහෝ පුවත්පත්වල පළවූයේ, සියයට සියයක් නිවැරදි තොරතුරුම නොවේ. සමහර අවස්ථාවල දී පුවත්පත්වල විශේෂාංග ලේඛකයෝ තම ලිපි රසවත් කිරීමේ ආශාවෙන්, අමතර සිදුවීම් නිර්මාණය කොට, ඒවා අතිශයෝක්තියෙන් විස්තර කළහ. නිවැරදි වාර්තාවක් පළවූයේ "ද ටයිම්ස්" පුවත්පතේ පමණි. එම වාර්තාව නිවැරදි වුවත් අදාළ කාරණා සියල්ල එහිද පළ නොවූ බව පැවසිය යුතුය.

මෙම සිදුවීම නිසා වූස්ටෂයර් ප්‍රාන්තය වටා අන්ධකාර කළු වලාවක් නැගුණු බව රහසක් නොවේ. මුළු රටම භීතියට පත් කළ එම සිද්ධිය ගැන සියලුම තොරතුරු හෙළි කිරීමට මම අන්තිමේදී තීරණය කළෙමි. ෂර්ලොක් හෝම්ස් මහතා යෙදුණු මෙම පරීක්ෂණය ගැන සත්‍යය හෙළිකිරීම, මගේ යුතුකමක් මෙන්ම වගකීමක් ද වේ. ඒ බව රටේ විද්වතුන් කිහිප දෙනෙකුම ලිපි මගින් මා වෙත දැන්වූ බවද සඳහන් කළ යුතුය.

මගේ විවාහයෙන් පසු මා පැඩිංටන් ප්‍රදේශයේ පෞද්ගලික ශල්‍යාගාරයක් අරඹා, වෙනම නිවසක පදිංචියට ගිය බැව් මගේ පාඨකයෝ දනිති. එබැවින් මගේ සුමිතුරු ෂර්ලොක් හෝම්ස් නිතර හමුවීමට මට අවස්ථාවක් නොවීය. නමුත් ඔහු විසඳූ අභිරහස් පරීක්ෂණ වල විස්තර දැන ගැනීමට මගේ තිබූ ආශාව කිසිවිටෙකත් අඩුවූයේ ද නැත. එබැවින් තමන්ට ඉඩ ලැබෙන ඕනෑම දවසක අප සමග දහවල් හෝ රෑ කෑමක් භුක්ති විඳීමට පැමිණෙන මෙන් මම ඔහුට ආරාධනා කළෙමි. එහෙත් ඔහුගේ හිස මත පැටවී තිබූ වැඩ කටයුතු අධික වීම නිසාදෝ, ඔහු අපේ නිවසට පැමිණියේ ඉතාම කලාතුරකිනි. පසුගිය සැප්තැම්බර් මාසයේ එක් සඳුදාවක





වැඩ කටයුතු නිම කොට සැන්දෑවේ මා ආපසු නිවසට ආවේ අධික විඩාවට පත්වය.

"හෝම්ස් මහත්මයා පණිවුඩයක් එවල තිබුණා, අද රෑ කෑමට අපේ ගෙදර එනවා කියල" මගේ බිරිඳ කීවාය.

"ෂා කොයිතරම් හොඳද" මා කීවේ අප්‍රමාණ සතුටකට පත්වය. "වයිට්ලි මහත්මයා ගිය මාසෙ අපට දුන්නු පැරණි වයින් බෝතලේ මතකයි නේද? මට පුළුවනි ඒක ඇරලා හෝම්ස්ට සංග්‍රහ කරන්න!"

මගේ මිත්‍රයා පමා නොවී නියම කරගත් වෙලාවට පැමිණියේය. මුලින් වයින් රස විඳිමින් අප සමග සතුටු සාමීචියේ යෙදුණු ඔහු, රාත්‍රි ආහාරයෙන් පසු නිහඬව කල්පනා කරන්නට පටන් ගත්තේ ය.

"හෝම්ස්. ඔබේ හිතට වධ දෙන මොකක් හරි ප්‍රශ්නයක් ඔබේ ඔළුවෙ තියෙනවා" මම කීවෙමි.

"ඔබේ නිගමනය නිවැරදියි වොට්සන්" ඔහු කීවේ මා දෙසට හැරී සිනාවෙමිනි. "දිගු කලක් සමීපව ආශ්‍රය කළ නිසා, එකෙකුගේ සිතිවිලි විනිවිද දකින්නත් දැන් අනෙකාට පුළුවනි. එහෙම නේද මිත්‍රයා? ඔව්. මගේ හිතේ තිබෙනවා පුංචි ප්‍රශ්නයක්. ඒ ගැන අදහසක් පළ කරන්න ඔබට හැකි නම් මං එය අගය කරනවා."

මේ අවස්ථාවේ මගේ බිරිඳ කෑම මේසයෙන් නැගී සිටියාය. ඒ අප දෙදෙනාට නිදහසේ කථා කිරීමට ඉඩ සැලසීමටත් මේසය මත වූ පිඟන් කුස්සියට ගෙන යාම සඳහාත්ය.

"වොට්සන් මහත්මිය. ඔහොම ඉන්න" හෝම්ස් කීය. "මගේ කතන්දරයට සවන් දීමට මිනිත්තු කිහිපයක් මෙතැන ඉඳීමට ඔබට හැකිද? වොට්සන්ගේ පමණක් නෙමෙයි. ඔබේ අදහසුත් මට ප්‍රයෝජනවත් වේවි."

ඒ අනුව මගේ බිරිඳ යළිත් වරක් අසුන් ගත්තාය.

"මට මේ ලියුම අද දවල් කෑමට මඳ වේලාවකට පෙර තැපෑලෙන් ලැබුණේ" කී ඔහු තම කබායේ ඇතුළත සාක්කුවෙන් ක්‍රීම් පැහැති ලියුම් කවරයක් අතට ගත්තේය. "ඔබට පුළුවන්ද වොට්සන් මේක ශබ්ද නගා කියවන්න?"

බටහිර ලන්ඩනයේ තැපැල් මුද්‍රාව තිබූ එහි කවරයේ අත්අකුරු වැඩිහිටියෙකුගේට වඩා, ළමයෙකුගේ අත් අකුරු වලට සමාන යයි මට සිතිණ.

"මේ ලියුම එවල තියෙන්නේ අවුරුදු දහ හතරක ළමයෙක්" ඔහු කීය.

ලියුම දිගහැර මම එය කියවීමට පටන් ගත්තෙමි.

මා හිතවත් ෂර්ලොක් හෝම්ස් මහතාණනි,

මේ ආකාරයෙන් ඔබට ලියුමක් ලිවීම ගැන මට සමාවෙන්න. මා සමග තරහවෙන්න එපා. ඔබට හුඟක් වැඩ රාජකාරි තියෙන බව මම දන්නවා. ඔබ මාව අඳුනන්නේ නැති බව ඇත්තයි. නමුත් මගේ මේ ප්‍රශ්නය මම වෙන කාට කියන්නද?

මගේ තාත්තාත් අම්මාත් මියගිහින්. මගේ තාත්තාගේ නම මේජර් හියු ගුඩ්රිච්. ඔබ විසඳූ නොයෙක් අභිරහස් ගැන කතන්දර තාත්තා මා එක්ක කියා තිබෙනවා. යම් ගැටලුවකට ඔබේ හිත ඇදී ගියොත් ඔබ ඒක කොහොම හරි විසඳා, දුප්පත් මිනිසුන්ටත් උදව් කරන බව තාත්තා කිව්වා. මේ ලෝකේ කිසිම කෙනෙකුට තේරුම් ගැනීමට පවා බැරි, පැටළුණු ගැටලු විසඳන්න පුළුවන් ඔබට විතරලු. අපට මුහුණ දීමට වෙලා තියෙන්නේ මහා ලොකු අභිරහසකට. මගේ හිතේ හුඟක්ම භය තියෙන්නේ මගේ මල්ලි කෙනත් ගැන. එයාගෙ වයස අවුරුදු දොළහයි. මගේ වයස දාහතරයි. පහුගිය දවසක මල්ලී මරණයෙන් බේරුණේ අනූ නමයෙන්. කවුරු හරි මාව මරන්න ආවොත් ඔහුගෙන් බේරෙන්න මට නම් ශක්තියක් නෑ.

මගේ අම්මාත් තාත්තාත් මියගියේ ඔවුන් ස්කොට්ලන්තය වෙත යද්දී සිදුවූ නාවික අනතුරකින්. ඉතින් අපට අපේ නැන්දා මේබල් සහ ඇගේ සැමියා ජෙරෝම් කැවෙන්ඩිෂ් සමග හැම්ඩන් මන්දිරයේ ජීවත්වීමට සිදුවුණා. නමුත් ඇයත් දැන් අපිව අත්හැර දමා යන්න ගිහින්. දැන් අපට අපේ ප්‍රශ්න ගැන කියන්න කිසිකෙනෙක් නෑ. අපේ කාරුණික ගුරුතුමා වුණු රයින්හාට් මහතාත් ගියා ගියාමයි.

හෝම්ස් මහත්මයා, කරුණාකර මට උදව් කරන්න. සාන්ත ජේම්ස් චතුරශ්‍රයේ තිබෙන ලන්ඩන් පුස්තකාලය වෙත ඔබට පැමිණිය හැකිද? අඟහරුවාදා උදේ දහයට මා එහි එනවා. ඔබට කථා කිරීමට මට ලැබෙන එකම අවස්ථාව එයයි. සමහරවිට නැවත කිසිම දවසක මට ලන්ඩනය වෙත ඒමට අවසර නොලැබෙන්න පුළුවනි. මා එදාට හැඳ සිටින්නේ රතු-දුඹුරු පාට ගවොමක්. මා පැළඳ සිටින හිස්වැස්ම ගෙත්තම් කළ එකක්. මා සමග කවුරුන්





හෝ සිටියොත් මට කථා කරන්න උත්සාහ කරන්න එපා. මං මෙහෙම ලියුමක් එවූ බව කාටවත් කියන්න එපා. මේකට මට පිළිතුරක් එවීමට හදන්නත් එපා. එහෙම කළොත් මොනවා වේවිද කියන්න බැහැ.

මෙයට අවංක

ඔලිවියා ගුඩ්රිච්."

ලියුම කියවීම අවසන් කොට මම මොහොතක් නිහඬව සිටියෙමි.

"මේ ලියුම ගැන ඔබේ අදහස මොකක්ද වොට්සන්?" හෝම්ස් අන්තිමේදී විමසුවේය.

"මට නම් මොකුත් හිතාගන්න අමාරුයි" මම කීවෙමි. "මේ ගෑනු ළමයා සැබැවින්ම මොකක් හරි දෙයක් ගැන භයෙන් ඉන්නෙ. කොහොම වුණත් සමහර ළමයි වැඩිහිටියන් ගේ හැසිරීම ගැන අහේතුකව බියක් සැකයක් ඇතිකර ගන්නවා. ඒ ළමයි කැමතියි තමන් වටා අභිරහස් මවාගන්න"

"ඇත්තෙන්ම ඔව්" හෝම්ස් කීය. "ඔබ මෙ ප්‍රශ්නයේ වෛද්‍ය විද්‍යාත්මක පැත්ත විග්‍රහ කළා"

"ඒ කොහොම වුණත්" මගේ බිරිඳ කීවාය. "මේ ගෑනු දරුවාගේ ආයාචනය ගැන ඔබට නොසලකා ඉන්න බෑ හෝම්ස් මහත්මයා. සමහරවිට ඇය කතන්දර පොත් කියවලා, නොයෙක් බහුබූත අදහස් හිතේ පුරවාගෙන ඉන්න තැනැත්තියක් වෙන්නත් පුළුවනි. ඒක ඉතින් ඇයගෙන් ප්‍රශ්න කරලාම තමා දැනගන්න වෙන්නෙ. නමුත් මට ඉවෙන් වගේ දැනෙනවා; විශේෂයෙන්ම ඇය ලියුම ලියා ඇති ආකාරයෙන්, ඇය බුද්ධිමත් තැනැත්තියක කියා. දෙමව්පියන් අහිමි වී සිටින ඇයට, බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදුවෙලා ද කියල කවුද දන්නෙ?"

"විශිෂ්ටයි වොට්සන් මහත්මිය!" හෝම්ස් කීවේ අත්පොළසන් දෙමිනි. "අගය කළ යුතු කාරණා කිහිපයක්ම ඔබ පැවසුවා. මට පැන නැගී ඇති ප්‍රශ්නයේ දෙපැත්තම ඔබ දෙදෙනා විග්‍රහ කරලයි තියෙන්නේ. එක් අතකින් කුඩා ළමයෙකු කළ ආයාචනයක් නිසා පවුල් සංස්ථාවක් තුළ ඇති ප්‍රශ්නයකට මට බලෙන් කඩා වදින්නත් බෑ. අනික් අතට මේක සිත් වේදනාවෙන් කරන ආයාචනයක්. අනාගතයේ ඇතිවියහැකි අනතුරක සේයාවකුත් මේකෙ පෙනෙනවා. ඒ හින්දා මේක මට නොසලකා හරින්නත්

බෑ. එතැනයි ප්‍රශ්නෙ. තමන්ගේ ප්‍රශ්නය මොන තරම් හදිසි එකක්ද කියන එක ගැන, වැඩිහිටි අයට අවබෝධයක් තියෙනවා. නමුත් කුඩා දරුවන් සමහර විට සුළු දෙයක් පවා බරපතළ දෙයක් ලෙස සලකන්න පුළුවනි"

"තමන්ගේ ප්‍රශ්න ගැන කියලා ළාබාල දරුවන් ගෙනුත් ඔබට නිතර ලියුම් ලැබෙනවාද?" මගේ බිරිඳ විමසුවාය.

"වාසනාවකට වගේ එවැනි ලියුම් මට ලැබෙන්නේ ඉතාමත් කලාතුරකින්" හෝම්ස් කීය. "මට අද තිබුණේ සුළු වෙලාවයි. මේකට අදාළ පුද්ගලයන් ගැන කරුණු මොනවා හරි සොයා ගන්න හැකිවේවිද කියා මං උත්සාහ කර බැලුවා." හෝම්ස් කීවේ තම සටහන් පොත සාක්කුවෙන් එළියට ගෙන එය දිග හරිමිනි.

"චාල්ස් ජෙරෝම් කැවෙන්ඩිෂ් සහ ඔහුගේ බිරිඳ පදිංචිව ඉන්නේ වූස්ටෂයර් ප්‍රාන්තයේ හැම්ඩන් මන්දිරයේ. ඔවුන්ගේ වතුයාය ඉතාම විශාල එකක්. ඔවුන් පැවත එන්නේ වූස්ටෂයර් හි කැවෙන්ඩිෂ් ආදිපාද පෙළපතෙන්. රජවරුන් වෙනුවෙන් ඔවුන් සටන් බිමේ කළ සේවය පොතපතේ සඳහන් වෙනවා. ඒ ආදි කාලෙ ඒවා. වර්තමාන කැවෙන්ඩිෂ් පරපුර ගැන ඔබ දන්නෙ මොනවද වොට්සන්?"

"අශ්ව රේස් ගැන මා දැක්වූ උනන්දුව නිසා, ඔය පුද්ගලයා ගැන මං යම් යම් දේ අහල තියෙනවා"

"ඒ මොනවද වොට්සන්?"

"ජෙරෝම් කැවෙන්ඩිෂ් කියන්නේ එංගලන්තයේ ඉන්නා ප්‍රමුඛ පෙළේ අශ්වාරෝහකයෙක්. ඒ අංශයෙන් ඔහු කුසලාන ගණනාවක් දිනාගෙන තියෙනවා. ඔහුට අයත් විශිෂ්ට ගණයේ අශ්වයින් රැසක් ඉන්නා බව මං පත්තරවල කියවලා තියෙනවා"

"වෙන මොනවද?"

"නමුත් කැවෙන්ඩිෂ් එච්චර ජනප්‍රිය චරිතයක් නම් නෙමෙයි"

"හැබෑට? ඒ මොකද?"

"ඔහු තමන්ගේ අශ්වයිනට සලකන්නේ ඉතා දරුණු විදියටලු. තමන් සමග තරඟ වදින අයට පවා ඉතා අමානුෂික විදියට සලකන බවයි මට අහන්න ලැබිලා තියෙන්නේ"

"හැබෑට? ඔබට අහන්න ලැබුණේ මොන වගේ සිදුවීම් ද?"

"තවත් ඒවා ඇති. නමුත් මගේ මතකයේ තියෙන්නෙ එකයි. මැක්ල්ස්ෆීල්ඩ් තුරඟ තරඟ වලදී ඔහුට ඉදිරියෙන්





ගිය අශ්වයා දිය කඩිත්තකදී කකුල් පැටලී බිම ඇදවැටුණා. අශ්වාරෝහකයාත් බිම වැටුණා. ඔහුව යට නොකර ඉදිරියට යන්න කැවෙන්ඩිෂ්ට පුළුවන්කම තිබුණා. නමුත් කැවෙන්ඩිෂ්, තරුණයාගේ ඇඟ උඩින්ම තම අශ්වයා මෙහෙයුවාලු. ඇහින් දුටු අය කියන්නේ ඔහුට උවමනාවක් තිබුණා නම්, තරුණයාව මඟ හැර යන්න කැවෙන්ඩිෂ්ට හැකියාව තිබුණා කියලයි."

"කවුද මේ අශ්වාරෝහක තරුණයා? ඔහුට දරුණු තුවාල සිදුවුණාද?"

"හැමිල්ටන් බොයිඩ් නම් තරුණයා අශ්වරේස් ලෝකයේ ජනප්‍රියව හිටි චරිතයක්. අනතුර නිසා ඔහු ශල්‍යකර්ම කිහිපයකට භාජනය වුණා. පෙණහැලි වලට සහ අක්මාවට අභ්‍යන්තර තුවාල සිදුවී තිබුණා. ඔහුගේ බිඳී තිබුණු දෙපා නම් බේරුණේ ශල්‍ය වෛද්‍යවරුන්ගේ දක්ෂ කමෙන්. කිහිලිකරු නොමැතිව ඔහුට ජීවිත කාලයටම ඇවිදින්න ලැබෙන්නෙ නැහැලු."

"මහ අපරාධයක් නේ. ඉතින්? මේ අනතුර ගැන කැවෙන්ඩිෂ් කනගාටු වුණාද?"

"මං දන්න තරමින් නම් ඔහු කනගාටුවක් ප්‍රකාශ කරල නෑ. ඔහු කියල තිබූ එකම දේ; මේ වගේ වේගවත් ක්‍රීඩා වලදී ඔය වගේ බරපතළ අනතුරු සිදුවීමට තිබෙන ඉඩකඩ බොහොම වැඩියි කියල"

"ජෙරෝම් කැවෙන්ඩිෂ් කියන පුද්ගලයා ගැන පැහැදිලි චිත්‍රයක් මැවෙනවා නේද ඒ කතාවෙන්ම" හෝම්ස් කීවේ හිස සොලවමිනි.

"එතකොට ගුඩ්රිච්ල ගැන ඔබ මොනවද දන්නෙ?"

"ඉන්දියාවෙ හමුදා සේවයට ගිය මේජර් ගුඩ්රිච් කෙනෙකු ලියූ පොතක් මං කියවා තියෙනවා. නමුත් ඒ ඔය කියන ගැනු ළමයගේ පියාද නැද්ද කියන කරුණ මම දන්නේ නෑ"

"හොඳයි. දැන් අපි දන්න කරුණු එකට ගළපලා බලමු." හෝම්ස් කීය. "මේජර් ගුඩ්රිච් හා ඔහුගේ බිරිඳ හදිසි අනතුරකින් මිය යනවා. දරුවන් දෙදෙනා භාරවෙන්නේ මේජර් ගුඩ්රිච්ගේ නැගණියට හා ඇගේ සැමියාට. ගෙදර ඉන්නා තවත් ළමයි ගැන, මේ ගැනු ළමයා - ඔලිවියා සඳහන් කරන්නේ නෑ. සමහර විට තවත් ළමයි ඉන්නවා වෙන්නත් පුළුවනි. මීළඟට මොකක්ද සිදුවෙන්නේ? නැන්දා ඔවුන් අත්හැර දමා යනවා. ඒකට හේතුව අපි දන්නේ නෑ. ළමයි දෙන්නා

හැම්ඩන් මන්දිරයේ, ඔවුන්ගේ මාමා - ජෙරෝම් කැවෙන්ඩිෂ්ගේ භාරයට පත් වෙනවා. ඔහුට මේ ළමයින් වෙත ලේ නෑ කමක් නෑ. ඔහු ගැන අහන්න ලැබෙන විස්තරවල හැටියට ඔහු අසරණයින්ට පිහිටවෙන, ත්‍යාගශීලී සත්ගුණවත් කෙනෙක් කියල හිතන්න අමාරුයි. එහෙම නේද?"

මගේ මිත්‍රයා කථාව නවත්වා මඳ වේලාවක් කල්පනා කළේය. ඔහුගේ දෙනෙත් යොමුවී තිබුණේ බොහෝ ඈතටය.

"වෙන්න පුළුවන් දේවල් හුඟක් තියෙනවා" ඔහු කීය. "මේ රයින්හාට් ගුරුතුමා කියන පුද්ගලයා කවුද කියල මට හිතාගන්න අමාරුයි වොට්සන්. ඔබට හැකිවේවිද හෙට උදේ මා සමග එන්න? උදේ දහයට?"

"මට මෙහෙම කරන්න පුළුවනි" මම කීවෙමි. "මං ශල්‍යාගාරයට යනවා වෙනදාට වඩා පැය භාගයක් කලින්. එතකොට මගේ වැඩ ටික වෙනදාට වඩා කලින් ඉවර කරන්න මට පුළුවනි."

"ඉතාම හොඳයි. එතකොට ඔබේ තෝරා මහත්මිය?"

"හෝම්ස් මහත්මයා. මගේ පැමිණීමෙන් ඔබට ප්‍රයෝජනයක් ඇතිවේවි කියල මං හිතන්නේ නෑ"

"ඇත්ත තත්ත්වය නම් ඒකෙ අනික් පැත්ත" මගේ මිත්‍රයා කීය. ඔලිවියා ගුඩ්රිච් කුඩා දැරියක්. ඇයට කියන්න තියෙන කාරණා සැනසීමෙන් කියන්න කාන්තාවක සිටීම වඩා හොඳයි."

"හොඳයි හොඳයි" මගේ බිරිය කීවේ සතුටෙනි. "ඔබ සමග යන්න ලැබීම ඇත්තෙන්ම මට සතුටක්"

## ලන්ඩන් පුස්තකාලය

පසුවදා උදේ නවයයි විස්ස වෙද්දී හෝම්ස් ලොකු කුලීරියකින් අපේ නිවස වෙත පැමිණියේය. ඒ වන විට මා මගේ වැඩ අවසන් කොට තිබිණි. වීථි රථවාහන වලින් පිරී තිබූ නිසා සාන්ත ජේම්ස් චතුරශ්‍රයට යාමට අපට සෑහෙන වේලාවක් ගතවිය. පුස්තකාලය වෙත ළඟාවන විට දහයට තිබුණේ මිනිත්තු කිහිපයක් පමණි.

අප රියෙන් බැසීමට සූදානම් වනවාත් සමගම, පිටිපසින් ආ කුලීරියක් ඒ අසලම නවත්වන ලදී. එයින් බිමට බට අය දෙස අපේ අවධානය යොමු කළෙමු. අවුරුදු දහ හතරක හෝ





පහළොවක ගැහැනු ළමයෙක් ප්‍රථමයෙන් රියෙන් බැස්සාය. රතු-දුඹුරු ඇඳුමකින් සැරසී සිටි ඇයගේ හිසේ වුල්වලින් ගොතන ලද හිස්වැස්මක් විය. ඒ සමගම රියෙන් බැස්සේ තරුණ විය නොඉක්ම වූ ඇකුම්කලු කාන්තාවකි.

ඔවුන් දෙදෙනා පදික වේදිකාව මත ඇවිද යද්දී අපි ඔවුන් පසුකරගෙන පුස්තකාලයේ දොරටුව වෙත ළඟාවූයෙමු. වැඩිහිටි කාන්තාව සැරපරුෂ ආකාරයෙන් දැරියට යමක් කියනු අපට අසන්නට ලැබිණි. වැඩිහිටි කාන්තාව කීවේ තමා දහවල් දොළහමාරට එහි පැමිණෙන නිසා, එම වේලාවට සූදානමින් සිටින ලෙසයි.

"ඔන්න පරක්කු වෙන්න එහෙම එපා" කාන්තාව කීවාය. "මට බෑ මෙතැන රස්තියාදු වෙන්න. ඔයා වෙලාවට ආවෙ නැතොත් මං යනවා යන්න. ආපහු ගෙදර යන පිළිවෙළක් ඔයාටම ලෑස්ති කරගන්න වේවි!"

ඊට කිසිවක් නොකී දැරිය හිස නමා එම අවවාදය පිළිගත් බව හැඟවූවාය. ඔවුන් පසුකර යද්දී මම ඔවුන් දෙස දෙනෙත් යොමු කළෙමි.

දැරියගේ මුහුණේ තිබුණේ මෘදු අහිංසක පෙනුමකි. ඇයගේ දෙනෙත්වල ශෝකාකුල බවක් ගැබ්ව තිබුණා යයි ද මට සිතිණ. කාන්තාවගේ මුහුණේ තිබුණේ කුරිරු සැරපරුෂ ස්වභාවයකි. ඇයට තිබුණේ ඇකුම්කලු පෙනුමක් යයි මම මුලින් සඳහන් කළෙමි. එහෙත් එය සම්පූර්ණයෙන්ම වැරැදි විනිශ්චයක් බැව් සමීපව දකිද්දී මට පෙනී ගියේය. ඇයට ඇකුම්කලු පෙනුමක් ව්‍යාජව ලබා දී තිබුණේ, ඇගේ මුහුණ පුරා ආලේප කළ රෝස පැහැති ආලේපන, තොල් සායම් හා ඇස් වටා තැවරූ සායම් වර්ගවලින් බැව් මට පෙනී ගියේය.

අපි පුස්තකාලයට ඇතුළු වූයෙමු. මේ වන විට එහි කියවීම් ශාලාව බොහෝ දුරට හිස්ව පැවතිණ. අපි එහි පාළුවට තිබූ ඈත කෙළවර දෙසට ගමන්කොට එහි විශාල මේසයක් වටා හිඳ ගත්තෙමු. මිනිත්තුවක් ගත වීමට පෙර දැරිය එහි ඇතුළු වූවාය. අප සිටි තැනට පැමිණෙන මෙන් හෝම්ස් ඇයට සංඥා කළේය. මොහොතකට පැකිළුණු ඈ වටපිට බලා, වහා අප සිටි තැනට ආවාය. ඊට ස්වල්ප වේලාවකට පෙරද ඇය හඬා ඇති බවට සලකුණු ඇගේ මුහුණේ මම දුටුවෙමි.

"මේ ගුඩ්රිච් මෙනෙවියද?" හෝම්ස් විමසුවේය. එය එසේ බැව් හැඟවූ ඈ අපට සුරත දිගු කළාය. ඇය අපට අතට අත දුන්නේ ගෞරවයෙන් අපට හිස නමා ආචාර කරමිනි.

"මේ ඔබේ මිත්‍රයා දොස්තර වොට්සන් නේද?" ඇය විමසුවාය. "දොස්තර මහත්මයා ලියූ කතන්දර ගොඩක් මගේ තාත්තා මට කියාදීල තියෙනවා. දොස්තර මහත්මයා. ඔබට පෙනෙන්නෙ මම පිස්සු හැදුණු ගෑනු ළමයෙක් වගේද?"

"මට නම් ඒ බවක් පෙනෙන්නෙ නෑ." මම කීවෙමි. "ඇයි එහෙම දෙයක් ඔබේ හිතට ආවෙ"

"ඇම්බ්‍රෝස් මෙනෙවිය කියනවා මට බාගෙට පිස්සුලු. මගේ පිළිවෙළ වෙනස් කරගත්තෙ නැත්නං, මාව ඉක්මනටම පිස්සන් කොටුවකට දමනවාලු"

"කවුද ඔය ඇම්බ්‍රෝස් මෙනෙවිය?" හෝම්ස් විමසුවේ නළල රැළිකර ගනිමිනි.

"දැන් මාව මෙතැනට ඇරළුවේ ඇය තමා. මේබල් නැන්දා යන්න ගියාට පස්සේ ගෙදර වැඩ කටයුතු බලාගන්න ආවේ ඇය"

"අපට ඇහුණා ඇය ඔබට සැරෙන් කතා කළ හඬ. ඇය හැමවිටම ඔබට කතා කරන්නෙ ඒ විදියටද?"

"හෝම්ස් මහත්මයා. ඔබ සමග නිදහසේ කතා කරන්න මට අවසර තියෙනවද? මං ඇත්ත කථා කළොත් ඔබ මට බණින්නෙ නැහැ නේද?"

"නැහැ. ඕනම දෙයක් බය නැතුව කියන්න"

"මං ඔබට කියන දේවල් වෙන කාටවත් කියන්නෙත් නැහැ නේද?"

"ඔලීවියා. ඔයා කියන දේවල් අපි කාටවත් කියන්නෙ නෑ" මගේ බිරිඳ කීවේ දැරියගේ අතකින් අල්ලා ගනිමිනි. "ඔයා අපට ඇත්තම කියන්න. ඒකට ඔයා බයවෙන්න උවමනා නැහැ"

"මේ වොට්සන් මහත්මිය කියන දේ සම්පූර්ණ ඇත්ත ඔලීවියා" හෝම්ස් කීය. "ඔබේ කතන්දරය ඔක්කොම කියන්න. ලැජ්ජා වෙන්නවත් භය වෙන්නවත් උවමනා නෑ"

"ඔබට ස්තුතියි මහත්වරුනි. එහෙම නම් මං ඔබට හැම දෙයක්ම කියන්නම්. ඇය මට සැර කළේ මං ඉක්මනට කරත්තෙන්





බහින්න හැදූ නිසා. මං ඉක්මනට කරත්තෙන් බහින්න හැදුවෙ ඇයි දන්නවද? කරත්තය ඇතුළෙදි මට කම්මුල් පහරක් දෙන්න, නැත්නම් මාව කොනිත්තන්න ඇය භය නෑ. නමුත් එළියෙදි එහෙම දෙයක් කරන්න ඇය භයයි"

"ඇය කොහොමද ගෘහ පාලිකා තනතුරකට ඇවිත් මෙහෙම හැසිරෙන්නෙ?" හෝම්ස් විමසීය. "ඇය කාගේ කවුද කියල ඔබට අහන්න ලැබිල නැද්ද?"

"මාමා මේබල් නැන්දාව කසාද බඳින්න කලින් ඉඳන් ඇම්බ්‍රෝස් මෙනෙවිය අඳුනනවාලු."

"ඇගේ තනතුරේ වැඩ භාරගන්න ඇය ඔබේ ගෙදරට ආවෙ කවදාද?"

"මේබල් නැන්දා අපේ ගෙදරින් පිටවෙලා ගිහින් දවස් දහයකට විතර පස්සේ. ඒ කියන්නේ ජනවාරි මාසෙ මැද"

"ගෙදර ඉන්න වෙලාවට, ඔබත් ඔබේ මල්ලිවත් පාලනය කරන්නෙ ඇයද?"

"මුලදී නම් ඇය එහෙම දෙයක් කරන්න උත්සාහ කළේ නෑ. නමුත් අපේ ගුරුතුමා වෙලා හිටිය රයින්හාට් මහත්මයා අප්‍රේල් අන්තිමේදී අපේ ගෙදරින් යන්න ගියා නේ. එදා ඉඳන් අපේ පාඩම් උගන්වන වැඩේ ඇය පටන් ගත්තා"

"මේ කතන්දරය හරිහැටි තේරුම් ගන්න නම් තොරතුරු හැම එකක්ම අප දැන සිටිය යුතුයි ඔලීවියා" හෝම්ස් කීය. "ඒ නිසා බය නැතුව හැම දෙයක්ම අපට කියන්න. වැඩිහිටි අයගෙ පිළිවෙළ හෙළිකළා කියල අපි ඔබ ගැන අහිතක් හිතන්නෙ නෑ"

"ඔව් මං කියන්නම්" ඔලීවියා කීවාය. "ඇම්බ්‍රෝස් මෙනෙවිය හොඳටම නූගත් කෙනෙක්. ඒ බව මල්ලිටත් වඩා මට තේරෙනවා. ලෝක සිතියම අරගෙන ඒකෙ ඉන්දියාව තියෙන්නේ කොහේද කියලා එක දවසක් මල්ලි ඇහුවා. මං ඒක දැනගෙන හිටියා වුණත් මං නිශ්ශබ්දව බලාගෙන හිටියා. ඇම්බ්‍රෝස් මෙනෙවිය ඉන්දියාව තියෙනවද කියල බැලුවෙ ග්‍රීසිය අසල. ඊළඟට ඇය බැලුවා මධ්‍යධරණී මුහුදේ. එහෙමත් හමු නොවුණාම ඇය කිව්වා "මේ සිතියම පරණ එකක්. ඉන්දියාව කියන වචනය ඒකෙ මුද්‍රණය කරලා නැහැ" කියලා. ඇය උගත් කියලා අපට පෙන්වන්න ඇය සමහර ප්‍රංශ වචන කියනවා. ඇය ඒවා හරියට උච්චාරණය

කරන්න දන්නෙත් නෑ. ඒවල තේරුම් දන්නෙත් නෑ. අපෙන් ප්‍රශ්න අහලා දැනීම දුර්වලයි කියලා අපි දෙන්නාටම ගහනවා. අපිට අත් දිගු කරන්න කියලා ඇඟිලි කරුවලට අඩි කෝදුවෙ දාරයෙන් ගහනවා. මං ඒ වේදනාව ඉවසගෙන ඉන්නවා. නමුත් ඒ වේදනාවට මල්ලිගේ ඇස්වලින් කඳුළු වැක් කෙරෙනවා."

"රයින්හාට් ගුරුතුමා ඔබේ ගෙදරින් අස්වෙලා ගියේ ඇයි කියල ඔබ දන්නවද?"

"ඔහු එහෙම ගිය එක ගැන මට හරි කනගාටුයි." ඇය කීවාය. "ඔහු ගියේ බොහොම හදිසියෙන්. ඔහු හරි ආචාරශීලී කෙනෙක්. මෙ විදියට යළි නොඑන බව නොකියා ගිය එක ගැන මට හරි පුදුමයි. මේබල් නැන්දා ගෙදරින් යන්න ගියාට පස්සේ, අපට ඉදපු එකම යාළුවා රයින්හාට් ගුරුතුමා පමණයි. කෙනත්ගේ ඒ කියන්නේ මගේ මල්ලීගේ ඉගෙනීම නම් ගුරුතුමා නැතිව සම්පූර්ණයෙන්ම නැවතුණා. ඔහු අපේ ගෙදරින් යන්න ගිය දවසෙ හැන්දෑව මට හොඳට මතකයි. ගුරුතුමාට කවදාවත් අපි එක්ක නම් තරහ යන්නෙ නෑ. එදානම් ගුරුතුමාට හොඳටම තරහ ගිහින් තිබුණා. එදා ඔහු මාමා සමග බහින් බස් වුණේ ලොකු සණ්ඩුවකදී වගේ."

"ඔවුන් කතාවුණේ මොකක් ගැනද කියලා ඔබට ඇහුණාද?"

"මට පැහැදිලිව ඇහුණෙ නෑ. ඒ මොකද ඒ බහින්බස් වීම සිදු වුණේ පහළ තට්ටුවේ පුස්තකාලෙ. මං ඒ වෙලාවෙ හිටියෙ තරප්පු පෙළේ උඩම තරප්පුවේ වාඩිවෙලා. නමුත් ඔවුන් කීප වාරයක්ම බ්ලැක්විච් මෝල ගැන සඳහන් කළා"

"මෝල ගැන? ඒක ගුරු මහත්මයෙකුට තමන්ගේ ප්‍රධානියා සමග සාකච්ඡා කිරීමට සිදුවෙන මාතෘකාවක් නොවෙයි නේද? කමක් නෑ. දැනට ඔය කාරණා අපි තාවකාලිකව අමතක කරමු" හෝම්ස් කිය. "අපි කැමතියි ඔබේ පවුලේ තොරතුරු සම්පූර්ණයෙන්ම දැනගන්න. ඊළඟට ඔබ දැන් මේ ඉන්න තත්ත්වයට පත් වුණේ කොහොමද කියලත් කියන්න"

* * *

"හොඳයි. මං දන්න තරමින් හැම දෙයක්ම කියන්නම්" ඔලිවියා ගුඩ්රිච් මෙනෙවිය කීවාය. "මායි මල්ලියි දෙන්නාම ඉපදුණේ





ඉන්දියාවෙ. අපේ ජීවිතේ වැඩි කාලයක් අපි ගත කළෙත් ඉන්දියාවෙ. අපි එංගලන්තයේ කවුරුවත් අඳුනන්නෙ නෑ. මගේ තාත්තා සේවය කළ හමුදා කඳවුර තිබුණේ ඉන්දියාවෙ ග්වාලියෝර් වල. අපට හමුදා කඳවුරෙන් පිටත නිවසක් තිබුණා. මගේ තාත්තා හමුදා සේවයෙන් විශ්‍රාම ගත්තට පස්සෙත් අපි ඉන්දියාවෙ රැඳුණා. ඒ මොකද තාත්තා ඉන්දියාවෙන් ජූට් මිලට ගෙන ස්කොට්ලන්තයට එව්වා. මගේ තාත්තාගේ ගම ස්කොට්ලන්තයේ ඩන්ඩි වල. ඔහුගේ පරම්පරාවෙ අය දීර්ඝ කාලයක්ම කළේ ජූට් සම්බන්ධ ව්‍යාපාර බව අපට කියා තිබුණා. මෑතක් වෙනතුරු අපි එංගලන්තයේ ජීවත් වෙලා තිබුණෙ නෑ. නමුත් දෙවරක් නිවාඩු ගත කිරීම සඳහා අම්මා සමග එංගලන්තයට ආවා.

අපට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න ආපහු එංගලන්තයට යන බව තාත්තා සහ අම්මා කතාකරමිනුයි හිටියේ. ඉතින් අවුරුදු දෙකකට විතර කලින් ඉන්දියාවේ තාත්තට අයිතිව තිබුණු හැම දෙයක්ම විකුණා දමලා මේ රටට ආවා. තාත්තාගේ ගම ඩන්ඩි වුණත් අපි ලන්ඩනයේ පදිංචි වුණා. ඒ හොඳ පාසල් තියෙන්නේ ලන්ඩන් නගරයේ නිසා. පදිංචිය සඳහා තාත්තා සෙන්ට් ජෝන්ස් වුඩ්ස් වල ලොකු නිවසක් මිලට ගත්තා. අපි ටික කාලයක් හුගක් සතුටින් ජීවත් වුණා.

මේබල් නැන්දා මගේ තාත්තාගේ එකම නංගී. ඇය විවාහ වුණේ අපි ඉන්දියාවේ ඉන්න කාලෙ. ඒ නිසා අපට ඇගේ විවාහ මංගල්‍යයට සහභාගි වෙන්න ලැබුණේ නෑ. මේබල් නැන්දා ඇගේ විවාහය ගැන කියලා තාත්තාට ලියුමක් එවූ දවස මට හොඳට මතකයි. තාත්තා ඒ ලියුම කියවීමට දුන්නේ අම්මා අතට.

"හියු! ඔයා විශ්වාස කරනවද?" අම්මා කිව්වා. "මේබල් ලබන මාසේ චාල්ස් ජෙරෝම් කැවෙන්ඩිෂ් කියලා මිනිහෙක්ව කසාද බඳින්න හදනවා!"

අම්මාත් තාත්තාත් දෙදෙනාම විශ්වාස කළේ ඇය ඩොනල්ඩ් වින්ටර් නම් ගොවිපොළ හිමියා සමග විවාහ වේවි කියලයි. ඔහු ඔවුන්ගේ මිත්‍රයන් ගෙන් කෙනෙකු වගේම ධෛර්යවන්ත කෙනෙකු ලෙසත් ප්‍රසිද්ධව සිටියාලු.

"වින්ටර්ගේ ඔළුවෙ තියෙන්නේ ගොවිපොළ දියුණු කර ගැනීම විතරනේ. ගිය වාරෙ මං එංගලන්තයට ගිය වෙලාවෙ හමුවුණාමත්

එයා කතා කළේ හරකුන් ගොදුරු වුණු මුඛ හා කුර රෝගය ගැන; ඩෙන්මාර්කයේ බටර් හා චීස් අපට වඩා අඩු මිලට නිෂ්පාදනය කිරීම වගේ දේවල්. ඕව අහගෙන ඉඳලාම මේබල්ට අන්තිමට ඩොනල්ඩ්ව එපා වෙන්න ඇති" අම්මා කිව්වා.

අපි එංගලන්තයට ආපහු ආව වෙලාවෙ ඇගේ අලුත් නිවසට - හැම්ඩන් මන්දිරයට එන්න කියලා මේබල් නැන්දා අපට ඇරයුම් කළා. ඒ අනුව අපි එහි ගියා. මීළඟට තාත්තාට උවමනා වුණා අම්මා සමග ස්කොට්ලන්තයේ ඩන්ඩී වෙත ගිහින් එන්න. ඒ ඔහුගේ පවුලේ උරුමයක්ව තිබූ ජූට් මෝලකින්, ඔහුට අයත් කොටස නෑදෑ කෙනෙකුට විකුණා දමන්න. ඒ මීට අවුරුදු එකහමාරකට කලින්. ඔවුන් දෙදෙනා මේ ගමන ගියා. නමුත් නාවික අනතුර නිසා........"

කී ඔලිවියා ගුඩ්රිච් මෙනෙවිය ඉකිගසා හඬන්නට පටන් ගත්තාය. ඇය වෙත නැඹුරු වුණු මගේ බිරිඳ දැරිය සැනසීමට උත්සාහ කළාය. ඇය කතාව යළි ඇරඹුවේ මිනිත්තු කිහිපයකට පසුවය.

දෙමව්පියන් නැතිවුණු අපට අම්මා කෙනෙකු වෙලා, අප ගැන බලාගන්න නැන්දා කැමති වුණා. හැම්ඩන් මැඳුරේ ජීවිතය මුලදී නම් අපට ප්‍රීතිමත් එකක් වුණා. නිවසේ නැවතී අපට උගන්වන්න ගුරුතුමෙකු, ෂෙෆීල්ඩ් පළාතෙන් හොයා ගන්න ඇයට හැකිවුණා. ඒ තමයි රයින්හාට් ගුරුතුමා. ටික කාලයක් හැමදේකම තිබුණේ සතුටුදායක බවක්. රයින්හාට් ගුරුතුමා ඉතා දක්ෂ ගුරුවරයෙක්. ඔහු හැම්ඩන් මැඳුරේ ජීවිතයටත් කැමති වුණා. විටෙක ඔහු අපව වතුයායේ තැන් තැන්වලට කැඳවාගෙන ගියා. ඒ කුරුල්ලන්, සමනලයින් සහ කැලෑමල් ගැන අපට තොරතුරු කියා දෙන්නටයි.

මගේ අම්මාත් තාත්තාත් එකිනෙකාට ආදරයෙන් ජීවත්වුණු අය. මේබල් නැන්දාත් ඇගේ ස්වාමිපුරුෂයාත් ඒ විදියට ජීවත් වෙනවා ඇති කියලයි මං විශ්වාස කළේ. නමුත් ඒක එහෙම නොවෙන බව දින දෙක තුනක් යද්දීම මට පෙනී ගියා.

මගේ මාමා හුඟක් වෙලාවට හිටියේ ගෙදරින් පිට. ඔහු ලන්ඩනයේ හෝ අශ්ව රේස් පවත්වන තැන්වල බොහෝ සෙයින් කාලය ගත කළා. ගෙදර ඉන්න දවස්වලට වුණත් ඔහු පවුලේ අය සමග ඉන්නවාට වඩා කාලය ගත කළේ අශ්වයින් සමග ඉස්තාලයේ.





මාමා මගේ නැන්දා සමග කතාබහක් කළා නම් ඒ බොහොම ස්වල්පයයි. ඔහු ඒ ටිකත් කතා නොකර හිටියා නම් වඩාත් හොඳ නේද කියලයි මට හිතුණේ. ඒ මොකද එවැනි කතාබහකින් පස්සේ ඇය හැඬූ සැටි මට දකින්න ලැබුණා. ඒ නිසා මට මේ කරුණ තේරුම් ගැනීමට හැකිවුණා. ඒ තමයි නැන්දා සතුටෙන් හිටියේ මාමා ගෙදරින් පිටවෙලා කොහේ හරි ගියාම.

ගෙදර ප්‍රශ්න ඇතිවෙන්න එක හේතුවක් වුණේ මාමා ආශ්‍රය කළ හා ඒ නිසාම ගෙදරට කැඳවාගෙන ආ මිත්‍රයන්. මාමාගේ දකුණු අත වගේ මිත්‍රයා වුණේ කපිතාන් ඇන්ඩ්රූ ක්‍රෝලි නම් පුද්ගලයා. ඔහු මාමා සමග හැම්ඩන් මැඳුරේ ඉන්න දවස්වලට, ඔවුන් එක දිගට දවස් ගණන් මත්පැන් බොමින් කාඩ් ක්‍රීඩා කරමින් කාලය ගත කළා. එහෙම දිනවලට ගෙදර කවුරුන් හෝ ඔහුට දකින්නට ලැබුණොත් මාමා ඒ අයට බැණ වැදුණේ පරුෂ වචනයෙන්.

කපිතාන් ඇන්ඩ්රූ ක්‍රෝලි නැන්දාට වගේම මටත් ඉතාම පිළිකුල් සහගත කෙනෙක්. ඔහු ගෙදර ඉන්න වෙලාවට මාමා ගේ හැසිරීම වඩාත් නින්දා සහගත තත්ත්වයට පත්වෙන බවයි නැන්දා කිව්වේ."

"ඔබේ නැන්දා ගෙදර ඉන්න කාලෙ පැවැත්වුණු මේ මත්පැන් සාදවලට ඇම්බ්‍රෝස් මෙනෙවියත් සහභාගි වුණාද?" හෝම්ස් විමසුවේය.

"එහෙම එක් අවස්ථාවක් මට මතක් කරන්න පුළුවනි" දැරිය කීවාය. "ඒ ගිය දෙසැම්බර් මාසේ. කොහේ හරි පවත්වපු තුරඟ තරඟ වලින් පස්සේ ලොකු කණ්ඩායමක් හැම්ඩන් මන්දිරයට ආවා. කපිතාන් ක්‍රෝලි, ඇම්බ්‍රෝස් මෙනෙවිය, ඔග්ඩන් සාමි, සර් ගිල්බට් බෙලිංගර් ආදීන් එදා සිටි බව මට මතකයි. මාමා ඉදිරියෙන් ගිය අසරුවා තරඟයකදී ඇද වැටී ඔහුට තුවාල සිදුවෙලා"

"අපට ඒ සිද්ධිය ගැන අහන්න ලැබුණා."

"ඒකෙදි තුවාල සිදුවුණේ හැමිල්ටන් බොයිඩ් නම් කෙනෙකුට. ඔහුගේ දෙපාවලට බරපතළ තුවාල සිදුවුණු නිසා ඔහුට ජීවිත කාලයටම ඇවිදින්න ලැබෙන එකක් නැහැලු. මේ ගැන මේබල් නැන්දාට අහන්න ලැබුණා. ඇය මාමා සමග කතා කළා. ඇය කිව්වේ ඒ අවාසනාවන්ත මිනිහාට මොකක්වත් රක්සාවක් වත් කරගන්න බැරි නිසා ඔහුට ජීවත්වෙන්න මුදලක් දෙමු කියලයි.

"මං කොහොමටවත් ඔහුට මුදලක් දෙන්නේ නෑ" මාමා කෑගැසුවා. "මං අශ්වයා දක්කාගෙන ගිය මාර්ගය මැදට ඒ මෝඩයා පැන්නා. ඉතින් මං මොනවා කරන්නද?"

එහෙම කියූ මාමා ඉතාම අවඥා සහගත විදියට මහ හඬින් හිනාවුණා. එතැන රැස්වී සිටි ඔහුගේ මිතුරනුත් සිනාවෙන්න පටන් ගත්තා. ඒ අතරින් මුල්තැන ගත්තේ ඇම්බ්‍රෝස් මෙනෙවිය. ඇය ඉස්සරහට ඇවිත් මෙහෙම කිව්වා.

"කැවෙන්ඩිෂ් මහත්මිය. ඔබට පෙනෙනවා නේද? ඔහුට කවුරු බාධා කළත් අන්තිමේදී ජයග්‍රාහකයා ඔබේ සැමියා ජෙරෝම් කැවෙන්ඩිෂ් මහත්මයා තමයි" මේක අහලා කවුරුත් හිනාවෙන්න පටන් ගත්තා. ඉතින් ගිය ඉක්මනින්ම ආපහු එන්න නැන්දාට සිද්ධවුණා.

එදායින් පස්සේ හැමඩන් මැඳුරේ සාමදානයක් තිබුණේම නෑ. මුළු නත්තල් සමයම ඉතා අප්‍රසන්න එකක් බවට පත්වුණා. ඒ මාමාගේ මිතුරන් රාශියක් අපේ ගෙදර නැවතී ඉඳීම නිසා. මාමා සහ නැන්දා අතර සණ්ඩු සිදුවෙන වාරවල් ගණනත් වැඩිවුණා. අලුත් අවුරුද්දට කලින් දවසේ ඔවුන් අතර ඇතිවුණු සණ්ඩුව බොහොම දරුණු විදියට ඇවිළී ගියා. නැන්දා ඇගේ ට්‍රන්ක පෙට්ටියකට ඇඳුම් පැළඳුම් අහුරා ගත්තා. ඒ විදියටම මගෙත් මල්ලීගෙත් ඇඳුම් ට්‍රන්ක පෙට්ටියකට අහුරන්න කියලා නැන්දා සේවිකාවකට නියම කළා. නමුත් අපි ගෙදරින් පිටවී යන්න හැදූ මොහොතේ මාමා ඉදිරියට ඇවිත් අපට බාධා කළා. ඔහු නැන්දාට දිගින් දිගටම බැණ වැදුණා. අන්තිමේදී නැන්දා කඳුළු පුරවාගත් දෙනෙතින් ගෙදරින් පිට වුණේ තනියම. මල්ලීත් මාත් අත්හැර තමන් පමණක් මේ විදියට ගෙදරින් යාම ගැන ඇය මගෙන් සමාව ඉල්ලුවා. තමන්ට නැවතීමට සුදුසු තැනක් ලැබුණු වහාම මල්ලීත් මමත් කැඳවාගෙන යාමට එන බව නැන්දා කිව්වා.

නැන්දා අපව අත්හැර ගිහින් දවස් ගණනක් ගතවුණාට පසු මාමාගේ පිළිවෙළ වෙනස්වුණු බවයි මට පෙනුණේ. තමන්ගේ කටින් පිටවූ නපුරු වචන ගැන පසුතැවිලි වෙන බව ඔහු කිව්වා. ඔහු කිසි කෙනෙකු සමග කතා නොකර තමන්ගේ කන්තෝරු කාමරයට වැදී නිහඬව සිටියා.

"ඔබේ නැන්දා සහ මා අතර හුවමාරු වුණු වචන වලින්, අපි දෙන්නාගේම සිත් වේදනාවට පත්වුණු බවයි මට හිතෙන්නේ"





ඔහු කිව්වා. "නමුත් මේ ප්‍රශ්නය හොඳ අතට විසඳාගන්න අපි තවමත් ප්‍රමාද වැඩි නැහැ. මං ගිහින් ඇයව ආපසු ගෙදර එන්න කැමති කරවා ගන්න උත්සාහ කරන්නම්"

"නැන්දා ගියේ කොහේටද කියලා මාමා දන්නවාද?" මං ඇහුවේ හිතේ ලොකු බලාපොරොත්තු ඇතිකර ගනිමින්.

"ඊයේ උදේ මට ඇයගෙන් ලියුමක් ලැබුණා" ඔහු කීවා. "ඇය නැවතී ඉන්නේ ලන්ඩනයේ හෝටලයක. ඇය ආපහු එනවාට ඔයාලා දෙන්නා කැමතියි නේද?"

"ඇත්තෙන්ම ඔව් මාමෙ. අපට ඊට වඩා සතුටක් නෑ"

ඔහු හිස සෙලෙව්වේ ඒ ගැන තීරණයක් ගත් ආකාරයෙන්. අශ්ව කරත්තය සූදානම් කරන්න කියා ඔහු එවේලේම නියෝග කළා. ඊට පස්සෙ දුම්රිය පොළට යන්න පිටත් වුණා."

"මාමාට ලැබුණු ලියුමේ අඩංගු වුණු කරුණු මොනවාද කියල ඔබට දැනගන්න ලැබුණාද?" හෝම්ස් ඇසීය.

"ඒ ලියුම මටත් බලන්න දෙන්න පුළුවන්ද කියා මං ඔහුගෙන් ඉල්ලුවා. ඒක පෞද්ගලික ලියුමක්. මට අදාළ මොකුත් ඒකෙ නැහැ කියලයි ඔහු පිළිතුරු දුන්නේ"

"හොඳයි. දිගටම ඔබේ කතාව කියන්න"

"දවස් දෙකක් යනතුරු මට කිසිවක් අහන්න ලැබුණේ නෑ. තුන්වැනි දවසෙ හැන්දෑවේ මාමා ගෙදර ආවා. ඔහු ආවෙ තනියම. "ඇය කැමතිවුණේ නැහැ ආපසු අප ළඟට එන්න" මං ඇසූ ප්‍රශ්නවලට මාමා දුන්නු එකම පිළිතුර ඒකයි.

මගේ සිතේ ඇතිවුණු දුක, වේදනාව කලකිරීම මට වචනයෙන් විස්තර කරන්න බෑ. හැඬෙන එක නවත්වාගන්න මට පුළුවන් කමක් තිබුණෙ නෑ. ඒක දුටුවාම මාමාට හොඳටම කේන්ති ගියා. "ඔය කඳුළු අපරාදෙ නාස්ති කරන්න එපා. එයාට වඩා වටිනා කෙනෙකු වෙනුවෙන් හෙළන්න ඔය කඳුළු පරෙස්සම් කරගන්න." එහෙම කියූ ඔහු තමන්ගේ කාමරයට ගිහිං "දඩාස්" ගා දොර වසා දැම්මා. එදා ඉඳන් මටත් මල්ලීටත්, මේබල් නැන්දාගේ නම කියන එක පවා තහනම් වුණා.

එදා රෑ මං නින්දට ගියේ හඬා වැලපෙමින්. මට කොයිවෙලේ හෝ එහෙමම නින්ද යන්න ඇති. එදා සිට තවමත් හැමදෙයක්ම අමාරුවෙන් විඳ දරා ගැනීම ඇර වෙනත් විසඳුමක් නෑ. අපි

ඉන්නේ අපට අයිති නැති අනුන්ගේ ගෙදරක. අප ගැන බලන්න නෑදැයින් හෝ යාළු මිත්‍රයන් කිසි කෙනෙකු නෑ. අපට ඉන්නේ අප ගැන තඹ කාසියකට ගණන් නොගන්නා භාරකාරයෙක් පමණයි. කොහොම වුණත් තවමත් මල්ලීට මමත් මට මල්ලීත් ඉන්න බව මං කල්පනා කළා. අපට අත්වී තිබෙන ඉරණමට අපි කොහොම හරි ධෛර්යයෙන් මුහුණ දිය යුතු බව මං හිතාගත්තා.

අපේ ගුරුතුමා රයින්හාට් මහත්මයා ගැන මං ඔබට කිව්වා. නෑදැයින් මිත්‍රයන් නැතිවුණත් අපේ ගුරුතුමා ගේ කරුණාවන්තකම නිසා අපට ලොකු සැනසීමක් ලැබුණා. ඉතිහාසය, භූගෝලය, උද්භිද විද්‍යාව සාහිත්‍යය ආදී දේ ඉගෙනීමෙන් අපට ලැබුණේ ලොකු ආස්වාදයක්. අපට ඒවා ඉගැන්වීමෙන් ගුරුතුමාටත් ලොකු සතුටක් ලැබුණු බව අපට පෙනුණා. ඒ නිසා මාත් මල්ලීත් හැමවිටම කටයුතු කළේ ඔහුගේ හිත නොරිදෙන විදියට.

මං ඔබට කියූ ආකාරයට ඔහු හදිසියේම යන්න ගියා. එතකොට අපි තව තවත් අමාරුවේ වැටුණා. තනිව ජීවත්වුණු අපට තිබුණු එකම පිහිටත් නැතිවී ගියා. ඊට පස්සේ අපට උගන්වන කටයුතු ඇම්බ්‍රෝස් මෙනෙවිය භාරගත්තා. නමුත් ඇය ඒක කළේ කිසිම උවමනාවකින් නොවෙන බව අපට දකින්න ලැබුණා."

"ඊට පස්සේ ඔබේ නැන්දා ගැන කිසිම ආරංචියක් නැද්ද?"

"ඇය ගිහින් මාස එකහමාරකට විතර පස්සේ මාමා නමට ලියුමක් ලැබුණා. ඒකෙ තැපැල් මුද්‍රාව තිබුණේ ෂෙෆීල්ඩ් ප්‍රාන්තයේ රෙක්ස්ටන් නගරයෙන්. ලියුම් කවරයේ තිබුණේ නම් නැන්දාගේ අත් අකුරු නෙමෙයි. ඒ වුණත් ඒ ලියුමේ ඇය ගැන තොරතුරු මොනවා හරි තියේවි කියා මං හිතුවා. මං ඒ ගැන මාමාගෙන් ඇහුවා. මුලදී ඔහු කිසි දෙයක් කිව්වේ නැහැ. මුහුණ සුදුමැලි කරගත් ඔහු සිටියේ හරි කේන්තියකින්. ඒ ලියුම එවා තිබුණේ ඩොනල්ඩ් වින්ටර් නම් කෙනෙකු බව ඔහු කිව්වා. ඒ මගේ තාත්තාගේ අම්මාගේ සහ මේබල් නැන්දාගේත් යාළුවෙක්ලු. ෂෙෆීල්ඩ්හි ඔවුන්ගේ වතුයායේ ඔහුට අයිති ගෙදරක මේබල් නැන්දා ඉන්නා බව ඔහු දන්වා තිබුණලු. තමන් ඒ ලියුම ගින්නට දමා පිලිස්සූ බව මාමා කිව්වා.

"දැන් ඔබට තේරුම් ගන්න පුළුවන් නේ" මාමා කිව්වේ තරහෙන්. "අපව අත්හැර දමා යන්න ගිහින් ඔබේ නැන්දා අපව





ලැජ්ජාවට පත් කළා. වෙනත් මිනිහෙකුගේ ගෙදර පදිංචියට ගිහින් දැන් ඇය අපට තවත් ලැජ්ජා කරනවා."

මේ වෙලාවේ එතැනට ආව ඇම්බ්‍රෝස් මෙනෙවියට මේ කතාවේ අන්තිම හරිය ඇහුණා. එවිට ඇය මෙහෙම කිව්වා.

"ඔලිවියාට තේරුණා නේද?" ඇය කීවේ මාමා කියූ දේට එකඟ වෙන බව පෙන්වමින්. "ඔබේ නැන්දා සිදු කර තිබෙන පිළිවෙළට කවදාවත් ඔබේ පවුලට ලැජ්ජා වෙන විදියට වැඩ කරන්න එපා! දැන් ඉතින් ඔබේ පන්තිකාමරයට යන්න"

"එහෙමයි ගුරුතුමිය" යනුවෙන් ආචාරශීලීව කියා මං දොර වහගෙන එතැනින් ගියා. නමුත් මගේ හිතේ ඇතිවුණු දුකට හඬා වැටීම නවත්වාගන්න මට පුළුවන් කමක් තිබුණේ නෑ. නැන්දා වෙන ගෙදරක පදිංචි වෙන්න තීරණය කිරීම ගැන මගේ හිතේ ඇතිවුණේ ලොකු වේදනාවක්. ඇය හැමදාමත් මට හුඟක් ආදරය කළා. මට කරුණාවන්ත වුණා. ඇය නරක ගැහැනියක් නොවෙන බව මං දැන හිටියා. මාමා මේ විදියට කතා කිරීම හරිම අසාධාරණයි. ඔහු දරුණු අවිනීත විදියට හැසිරුණේ නැත්නම් නැන්දා කවදාවත් අපිව දාලා යන්නේ නැති බව මං දැනගෙන හිටියා. මුහුණේ සායම් තවරා ගත්තු අර නපුරු අවිනීත ඇම්බ්‍රෝස් මෙනෙවිය කියූ දේවල් ගැන හිතෙන කොටත් මට තරහයි. මේබල් නැන්දා අපේ පවුල ලැජ්ජාවට පත් කළා නෙමෙයි; ඇය තමයි අපේ පවුලෙ ගෞරවය ආරක්ෂා කළේ.

ගෙදර පුස්තකාලයේ දොරටුවෙන් පිටවෙලා මං අඩි දහයක් යන්න නෑ. මට ඇහුණා ඒ දෙන්නා මහ හඬින් හිනාවුණු සද්දෙ. එයාලා හිනාවුණේ කාටද, ඒ මොකක් නිසාද කියන්න මං දැනගෙන හිටියෙ නෑ. ඒ වුණත් මං පත්වෙලා හිටිය කනගාටුදායක තත්ත්වය නිසා ඒ හිනාව මට දැනුණේ මගේ හදවතට කටු ඇනෙනවා වගේ.

තවත් සති කිහිපයක් ගත වී ගියා. මට උවමනා වී තිබුණා මේබල් නැන්දාට ලියුමක් ලියන්න. නමුත් ඒක යැවිය යුත්තේ මාමා හරහා. ඒ ගැන ඔහුගෙන් අහන්නවත් මට හිතුණෙ නෑ. එක දවසක් මගේ හිතට ධෛර්යය අරගෙන මං ඒ ගැන මාමාගෙන් ඇහුවා. එවේලේ ඔහුට හොඳටම තරහා ගියා. ඒ විතරක් නෙමෙයි; ඒ ගැන තවත් කතා කරන්න වත් මාමා කැමතිවුණේ නෑ. ඊට දවස්

කීපයකට පස්සේ මං යළිත් වරක් ඔහුගෙන් ඒ ගැන ඇහුවා. නමුත් ඔහුගෙන් ඊට ප්‍රතිචාරයක් ලැබුණේ මං තුන්වැනි සැරේට ඇහුවාට පස්සේ. අන්තිමේදී ඔහු කිව්වේ නැන්දාට ලියුමක් ලිවීමට ඔහු අවසර දෙන බව. නමුත් එය කියවා බලා තැපැල් කිරීම කරන්නේ තමන් බව.

මේ ගැන මගේ විරුද්ධත්වයක් තිබුණේ නෑ. මට උවමනාව තිබුණේ නැන්දාට අපේ තොරතුරු ටිකක් දන්වා ලියුමක් යැවීමටත්, ඇගේ සැප සනීප අසා ඇගෙන් ලිපියක් ගෙන්වා ගැනීමටත් පමණයි. ඉතින් මේ විදියට ලියුමක් ලියලා මං එය මාමා අතට දුන්නා. ඔහු එය මා ඉදිරිපිටදීම කියවා බැලුවා. මං ලියූ කරුණු ගැන ඔහුට විරුද්ධ වෙන්න තරම් හේතුවක් තිබුණෙ නෑ. නැන්දාගේ ලිපිනය මට කියන්න කැමති·නැති නිසා, ඔහු මගේ ලියුම කවරයකට දමා තැපැල් කරන බව කිව්වා. ඇගේ ලිපිනය මං දැනගත්තොත් ඔහු කැමති නොවෙන තොරතුරුත් එක්ක ලියුමක් මං හොරෙන් ලියාවි කියල ඔහුට බය හිතෙන්න ඇති. මට හිතෙනවා ඔහු මේබල් නැන්දාගේ ලිපිනය මට නොදෙන්න හේතුව එයයි කියලා.

තවත් සතියක් පමණ ගතවුණා. නැන්දා වෙත යැවූ ලියුමට මගේ නමට පිළිතුරක් ලැබී ඇති බව එක දවසක් උදේ මාමා කිව්වා. තමන් ලියුම විවෘත කර කියවා බැලූ බව ඔහු කිව්වා. තමා එය කලින් කියවා බැලුවේ මගේ හිත අවුල් කරන අප්‍රසන්න දේ එහි සඳහන්ව තිබේද කියා දැනගන්න බවයි ඔහු කිව්වේ. ලියුම මුදුනේ ඇගේ ලිපිනය ලියා තිබූ කොටසත් ඔහු ඉරා දමා තිබුණා.

"ලියුමෙ මොනවද සඳහන් වෙලා තිබුණෙ?" හෝම්ස් විමසීය.

"ඒ තරම් දෙයක් තිබුණෙ නෑ" ගුඩ්රිච් මෙනෙවිය පිළිතුරු දුන්නාය. "ඇත්තම කියනවා නම් ඒ කෙටි ලියුම ලැබීමෙන් මගේ බලාපොරොත්තු කඩවුණා. කොහොම වුණත් පාළුවේ තනිවෙලා හිටි මට, නැන්දාගෙන් ලැබුණු කෙටි ලියුමත් වටිනා තෑග්ගක් වගේ දැනුණා. මං එය නැවත නැවතත් කිහිප වාරයක්ම කියෙව්වා. තමන්ට ලියුමක් එවීම ගැනත් තොරතුරු දැන්වීම ගැනත් නැන්දා මට ස්තුති කර තිබුණා. මල්ලී යැවූ පූසෙකුගේ චිත්‍රයටත් ඇය ස්තුති කර තිබුණා. ඇය මට එවන ලියුම මාමා කියවන බව දන්න





නිසා, ඇය තමන්ගේ හැඟීම් අවංකව ලියන්න නැහැ කියලයි මට හිතෙන්නේ.

අනික් හැම දෙනෙකුගෙන්ම ඈත්වෙලා තමන් නිශ්ශබ්ද ජීවිතයක් ගත්කරන බව ඇය කියා තිබුණා. හැම්ඩන් මන්දිරයෙන් පිටවී ඒමට තමන් ගත් හදිසි තීරණය ගැන තමන් විටෙක පසු තැවෙන බවත්, එය යළි නිවැරදි කර ගැනීමට අවස්ථාවක් ලැබුණොත් තමන් එසේ කරන බවත් ඇය ලියා තිබුණා. ඇය තවදුරටත් කියා තිබුණේ ජෙරෝම් මාමාට කීකරුව ඔහු නියෝග කරන හැටියකට ජීවත්වීමටත් ඔහුට ගෞරවයෙන් සලකන ලෙසත්. ලියුමේ අන්තිමට ඇය කියා තිබුණේ මින් ඉදිරියට ඇයට ලියුම් නොඑවන ලෙසත් වැදගත් තොරතුරු තිබුණොත් තමන් ලියුමකින් දන්වන බවත්.

මේබල් නැන්දාට යළිත් වරක් ලියුමක් යැවීමට මං කැමති බව මාමාට කිව්වා. නමුත් මාමා ඒකට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. ඇය ගියාට පස්සේ හැම්ඩන් මන්දිරයේ සිදුවුණු වෙනස්කම් ගැන නැන්දාට දැනුම් දෙන්නයි මට උවමනා වුණේ. ඒ කරුණු ඇය දැනගත්තා නම්, ඇගේ මානය යටපත් කර අඩු ගණනේ අප බලල යන්නවත් නැන්දා හැම්ඩන් මැඳුරට ඒවි කියා මට හිතුණා."

"ඔව්. හැම්ඩන් මැඳුරේ සිදුවෙන දේවල් ඔබේ නැන්දාට දැනුම් දීමට ක්‍රමයක් ඔබට නෑ" හෝම්ස් කීය. "ඔබ කැමති නම් ඒවා අපට කියන්න."

"රයින්හාට් ගුරුතුමා හදිසියේම අපේ ගෙදරින් යන්න ගිය බව මං ඔබට කිව්වා. නැන්දා ගියාට පස්සේ තවත් කනගාටුදායක තත්ත්වයකට අපි මුහුණ දුන්නා. ඒ තමයි කපිතාන් ක්‍රෝලි වෙනදාටත් වඩා වැඩි කාලයක් හැම්ඩන් මන්දිරයේ ගත කරන්න පටන් ගැනීම. සමහරදාට මාමා සහ කපිතාන් ක්‍රෝලි අශ්වයින් පිට නැගී හැන්දෑ කාලයේ ගෙදරින් පිටවී යනවා. ඔවුන් ආපසු එන්නේ මධ්‍යම රාත්‍රියත් පහුවෙලා"

"ඔවුන් එහෙම යන්නේ කොහේටද කියලා ඔබ දන්නවද?"

"නැහැ. නමුත් ඊට අපේ මැඳුර සමීපයේ තවත් දේවල් සිදුවෙනවා. එයින් නිකුත් වූ ශබ්දවලින් හා දුටු දේවල්වලින් කෙනත් බයවෙලයි ඉන්නෙ"



"උද්‍යානය මැදින්ම ඉදිකර තිබෙන්නේ සන්ඩයලයක්"





"ඒ මොන වගේ දේවල්ද?"

"හැම්ඩන් මන්දිරයේ පිටුපස තිබෙන්නේ බිමට ගල් අතුරා සකස්කළ මුදුබිමක්. ඒක තමයි ගේ පිටුපස උද්‍යානය. මේ උද්‍යානය මැදින්ම ඉදිකර තිබෙන්නේ සන්ඩයලයක් (සූර්ය ඝටයක්) මගේත් මල්ලීගේත් කාමරවල ජනේලවලින්, මේ සූර්ය ඝටය දැකගන්න පුළුවනි. එක් රාත්‍රියක මට තදින්ම නින්ද ගිහින් තිබුණා. කෙනත් ඔහුගේ කාමරයේ සිට භයෙන් වෙව්ළමින් මගේ කාමරයට ඇවිත් මාව අවදි කළා. මුලින් ඔහුට කතාකර ගන්නවත් පුළුවන් කමක් තිබුණෙ නෑ. ඔහුට කතාකරලා ටිකෙන් ටික ඔහුව සන්සුන් කරන්න මට හැකිවුණා. ඔහුට එදා රෑ නිඳා ගැනීමට අපහසු විදියට ශබ්ද පිටුපස ගෙළයන දෙසින් ඇහුණාලු. ඔහු ජනේලයෙන් බැලුවාම දුටුවාලු, මන්තරකාරියක් ඇවිත් සන්ඩයලය ළඟ මොනවා හරි කරනවා. මං මගේ ජනේලයෙන් බැලුවා. නමුත් එතැන තිබුණේ ඝන අඳුරක්. මට නම් කිසි කෙනෙකුව පෙනුණේ නෑ. මං කිව්වා "ඒක මල්ලි දැකපු නරක හීනයක් වෙන්න ඇති. ගිහින් බය නැතුව නිදාගන්න" කියා. මං කියූ දෙයින් තරමක් සන්සුන්වුණු ඔහු ආපසු තම කාමරයට ගියා.

පහුවදා උදේ මට ඇහැරුණේ වෙනදාට වඩා කලින්. මං ජනෙල් තිර ඉවතට ඇද්දා. මගේ දෙනෙත් යොමුවුණේ සන්ඩයලය වෙත. ඒ මත කඩදාසියක් සහ එය සුළඟේ ගසාගෙන යනු වැළැක්වීමට ගල් කිහිපයක් තබා ඇති ආකාරය මට දකින්න ලැබුණා. මං ඉක්මනට ඇඳුම් මාරු කරගෙන පහළ තට්ටුවට දිව්වා. මීළඟට දොරවල් ඇරගෙන ගෙවත්තට ගියා. නමුත් සන්ඩයලය මත කිසිවක් දකින්න ලැබුණේ නෑ. කඩදාසියක් තබා කුඩා ගලක් වත් තිබුණේ නෑ. මං ඒ අවට පරීක්ෂාවෙන් බැලුවා. සන්ඩයලය කිට්ටුව සිනිඳු වැලි තිබුණු තැනක කුඩා ගල් තුනක් මට දකින්න ලැබුණා. ඒවා ඒ අවට තිබුණු ගල්වලට වඩා වෙනස් පාටක ඒවා. සිදුවෙන්න ඇත්තේ කුමක්ද කියා මං අනුමාන කළා. මං දුටු කඩදාසිය ඇත්තටම එතැන තියෙන්න ඇති. නමුත් මං ඇඳුම් මාරු කරගෙන පහළ තට්ටුවට බහින අතරේ කවුරු හරි ඒක අරගෙන.

මං මේ ගැන මල්ලිට කියන්න ගියේ නෑ. ඒ මොකද ඔහු දුටු "මන්තරකාරි" සන්ඩයලය මත යම් ඉන්ද්‍රජාලික වැඩක් කර ඇතැයි ඔහු කියනවාට සැක නැති නිසා.

මේ සිද්ධිය යළිත් සිදුවේද කියා මං සිටියේ අවධානයෙන්, කුමක් හෝ ශබ්දයක් ඇසී එක් රාත්‍රියක මට ඇහැරුණා. මං වහාම ගියේ ජනේලය ළඟට. එදා සඳ බැබළුණු රාත්‍රියක්. ජනෙල් තිරය ඉවතට ඇදලා මං සන්ධ්‍යලය දෙස බලාගෙන හිටියා. උද්‍යානයේ උස වැටක් තිබූ අන්ධකාරය දෙසින්, කෙනෙකු එළිමහනට ආ හැටි මං එක්වරම දුටුවා. ඒ මඳක් කුදුගැහුණු උස ගැහැනියක් බව මට පෙනුණා. කකුලේ ආබාධයක් නිසා වෙන්න ඇති; ඇය සන්ධ්‍යලය දෙසට ඇවිද්දේ කොර ගසමින්. මීළඟට එතැන නැවතී හිස ඒ දෙසට පහත් කරගෙන යම් කටයුත්තක යෙදුණා. නමුත් ඒ මොකක්ද කියා මට පෙනුණේ නෑ. මොහොතකින් වලාකුළු පාවී ඇවිත් සඳ වැසෙන්නට පටන් ගත්තා. එතැනට ආ තැනැත්තිය ආපසු ඇවිද ගිය ආකාරය මං දුටුවා. නමුත් ඒ වනවිට එතැන හොඳටම අඳුරු වී තිබුණු නිසා සන්ධ්‍යලය මට පෙනුණේ නෑ......"

"මොහොතක් ඉන්න" හෝම්ස් ඇයගේ කථාවට බාධා කළේය. "එදා ගේ උයනේ ඔබ දුටු මේ ගැහැනිය, මීට කලින් ඔබ දැක ඇති කෙනෙක් කියා ඔබට හිතෙනවාද?"

"මං හිතන්නේ මා ඇය මීට කලින් දැක නැහැ කියලයි. කොහොම වුණත් මට විශ්වාසෙට කියන්න බැහැ. ඒ මොකද ඇය සන්ධ්‍යලය වෙත වකුටු වී සිටියේ, මුහුණ අපේ ගෙදරින් ඉවතට හරවා ගෙන. ඇගේ පෙනුම මල්ලී විස්තර කළ හැටි නිවැරැදියි. ඇයට තිබුණේ කතන්දර පොත්වල ඇඳ තිබෙන මන්තරකාරියන් ගේ චිත්‍ර වලට සමාන පෙනුමක්."

"හොඳයි. ඔබේ කතාව දිගටම කියන්න"

"එදා රෑ හරි හැටි නින්ද නොගිය නිසා මට ඇහැරුණේ ප්‍රමාද වෙලා. රාත්‍රියේ සිදුවීම ගැන මට මතක්වුණු වහාම මං ඇඳෙන් බැස්සා. මං ගියේ ජනේලය ළඟට. සන්ධ්‍යලය මත සුදු කඩදාසියක් තිබුණු බව මං පැහැදිලිවම දුටුවා. මං බලා සිටියදීම කිසිවෙකු අපේ ගෙදරින් පිටවී ඒ පැත්තට ගමන් කළා. ඔහු ගල් ඉවතට දමා කඩදාසිය අතට ගෙන එය කියවා බලමින් ආපසු ආවා. ඒ පුද්ගලයා කපිතාන් ක්‍රෝලි බව මට හඳුනා ගැනීමට හැකිවුණා."

"ඔහු ගෙදරින් එළියට ආවේ කොතැනින්ද?" හෝම්ස් විමසුවේය.





"ඔහු ඇවිත් තිබුණේ උදැසන කාමරය හරහා. ඒකෙ තියෙන්නේ ප්‍රංශ මාදිලියේ උස ජනේල."

"මෙ සිද්ධිය කිහිප වාරයක්ම සිදුවුණාද?"

"සිදුවෙන්න ඇති. මං දන්නෙ නෑ. නමුත් තවත් දේවල් සිදුවුණා."

"ගුඩ්රිච් මෙනෙවිය. ඔබ කිව්වා ඔබේ සොහොයුරා මැරෙන්න ගිහිං බේරුණා කියල. දැන් අපට ඒ ගැන තොරතුරු කියන්න. නමුත් ඔබ ඉක්මනින් කිව යුතුයි. අපට තියෙන්නේ තවත් මිනිත්තු කිහිපයක් පමණයි"

"රයින්හාට් ගුරුතුමා අපට සොබාදහම ගැන හුඟක් පාඩම් ඉගැන්වූ බව මං ඔබට කිව්වා. හැම්ඩන් වතුයායේ බොහොමයක් තැන්වලට ඔහු අපව කැඳවාගෙන ගියා. ගුරුතුමා අපෙන් වෙන් වී ගියාට පස්සේ දීර්ඝ වැහි කාලයක් ආවා. අපි සති කිහිපයක්ම ගේ ඇතුළට කොටු වෙලයි හිටියේ. වැහි නැවතිලා අව්ව පායන්න පටන් ගත්තාම අපට දැනුණේ සතුටක්. කෙනත් මං එනතුරු වත් පමා නොවී තනියෙන් ඇවිදින්න යන්න පටන් ගත්තා. "ගවේෂණ චාරිකා" කියල නමකුත් දමාගෙන, ඔහු හැම්ඩන් වතුයායේ ඈත තැන්වලට පවා ගියා. ඔහු පරෙස්සමෙන් කටයුතු කරන බුද්ධිමත් ළමයෙක්. ඒ නිසා එහෙම තනියම යාමේ වරදක් මං දුටුවේ නෑ. නමුත් මල්ලී මේ විදියට වතුයාය පුරා ඇවිදින්න යන බව දැනගත්තාම මාමාට හරියට කේන්ති ගියා.

"මං තමුසෙට කියල තියෙනවා නේද තනියෙන් කොහේවත් යන්න එපා කියල?" ඔහු කෝපයෙන් වෙවුළමින් කෑගැසුවා. "තමුසෙ පැය ගණන් මේ ගෙදරින් පිටවෙලා ඉන්නවා. කොහේ ගිහින්ද කියලා මේ ගෙදර සේවකයන් කිසි කෙනෙක් දන්නෙ නෑ. ඉතාම අනතුරුදායක දේවල් සිදු වෙන්න පුළුවනි. විශේෂයෙන්ම මතක තියා ගන්නවා. ගඟ පැත්තෙ හෝ මෝල හරියට කොහොමටවත් යන්න එපා. ඒවා ඉතාම අනතුරුදායක තැන්. කියන දේ අහන්නේ නැති මෝඩ ළමයි හදන්න ඕන පිළිවෙළ මං දන්නවා. ආයෙ සැරයක් මං කියන දේ නාහා අකීකරු වුණොත්, තමුසෙට කරන දේ මං කියන්නම්. අශ්වයින්ට තලන කසයෙන් තමුසෙගේ පස්සා පැත්තට තලන්නේ මාසක් යන තුරු වාඩිවෙන්න බැරි වෙන විදියට! මං කියූ දේ ඇහුණද?"

මාමා මේ විදියට මල්ලී එක්ක කේන්ති අරගෙන ඉන්නවා මං කවදාවත් දැකල නෑ. මාමාගේ මුහුණ කේන්තියෙන් කළු වී තිබුණා. මල්ලී භයෙන් සුදුමැලි වුණා. මං හිතුවා මාමා එවේලේම මල්ලිට පහර දේවි කියලා. නමුත් එහෙම කළේ නෑ"

"මොහොතක් ඉන්න" හෝම්ස් කීය. "ඔබ සඳහන් කළා මෝලක් ගැන. මේ කියන්නේ රයින්හාට් ගුරුතුමා පිටවී යන්න කලින් ඔබේ මාමා සමග සාකච්ඡා කළා කියූ මෝලමද? ඔබ කිව්වේ එහි නම බ්ලැක්විච් මෝල කියලා?"

"අන්න හරි. ඒක තමයි" ඔලීවියා මෙනෙවිය කීවේ හිස සොලවමිනි. "ඒක තියෙන්නේ හැම්ඩන් මන්දිරයේ සිට සැතපුම් තුනක් පමණ ඈතින් ගඟ අයිනේ. ඒක ජල බලයෙන් ක්‍රියාකරන අති විශාල මෝලක්. මාමා තමයි ඒකෙ අයිතිකාරයා. ඒකෙන් ඔහුට විශාල ආදායමක් ලැබුණු බව මං අහල තියෙනවා. ගඟේ වතුර පාරට ජල රෝද කරකැවෙන කොට මෝල ක්‍රියා කරනවා."

"මෝල යොදා ගත්තේ මොනව සඳහාද?"

"මේ පළාතේ වැවෙන ධාන්‍ය පොතු යවා පිරිසිදු කිරීමත්, පිටි නිෂ්පාදනයට ධාන්‍ය කෙටීමත් කළේ ඒ මෝලෙන්. දැව කැපීමේ යන්ත්‍රත් ඒකෙන් ක්‍රියා කරාලු. මේ පළාත්වල හුගක් ඉඩම් අයිති මාමාට. ගොවීන් කරන්නේ ඒවා බද්දට ගෙන වගා කිරීම. ඔවුන්ගේ ධාන්‍ය කෙටීම සඳහා බ්ලැක්විච් මෝලට ගෙන ඒම ඔවුනට අනිවාර්ය වුණා. නමුත් නිතරම වාගේ යන්ත්‍ර කැඩී යාම නිසාත්, අයකළ ඉහළ ගාස්තු නිසාත්, ගොවීන් හිටියේ හරි තරහෙන්. මේ අතරෙ තමයි ටොන්බ්‍රිජ්වල අලුත් මෝලක් ඇරුණේ. එතැන වැඩ කටයුතු ඉක්මන් වගේම කාර්යක්ෂමයිලු. අනික අඩු ගාස්තුවක්ලු අය කළේ. මේ ගැන මාමා හිටියේ හරි කෝපයෙන්"

"ඔබ මේ කාරණා ගැනත් හොඳින් දන්නා බවයි මට පෙනෙන්නේ"

"මට අහන්න ලැබුණු කාරණා අප්‍රමාණයි. මං ඒවාට හොඳින් කන් දෙන්නේ වෙනත් කළ යුතු දේ මට නොමැති නිසා. තමන්ගේ ධාන්‍ය ටොන්බ්‍රිජ් මෝලට ගෙනියන්න ගොවීන් මාමා ගෙන් අවසර ඉල්ලුවා. නමුත් ඔහු එය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා.

අවුරුද්දකට විතර කලින් ඒ ප්‍රශ්නය විසඳුණා. එක දවසක් රාත්‍රියේ කවුදෝ බ්ලැක්විච් මෝලට ගිනි තබා තිබුණා. එයින්





යන්ත්‍ර සූත්‍ර සියල්ලමත් ගොඩනැගිල්ලෙන් කොටසකුත් විනාශ වුණා. එය කළ ගැමියන් අල්ලා එල්ලුම් ගස් යවන බව කෝපාවිෂ්ඨ වුණු මාමා කිව්වා. නමුත් කිසිවෙකු අල්ලාගන්න බැරි වුණා. දැන් එය අත්හැර දමලයි තිබෙන්නේ. ඒකෙ දැවමය කොටස් දිරා ගිහින් නිසා ඒක ඉතා අනතුරු දායක තත්ත්වයක ඇති බවත්, දවසින් දවස එය වඩාත් අයහපත් අතට හැරෙන බවත් අපට අහන්න ලැබුණා."

"නමුත් ඔබේ ගුරුතුමා මේකට පටළැවුණේ කොහොමද?" හෝම්ස් විමසීය. "ඔබ කිව්වා ඔහු ඉවත්වුණේ වසන්ත සෘතුවේදි බව?"

"ඔව්. අප්‍රේල් මාසයේ"

"එතකොට මෝල වසා දමා මාස හයක් පමණද?"

"ඔව්. එහෙම විය යුතුයි" ඔලීවියා කීවාය. "ගුරුතුමා බ්ලැක්විච් ගම පැත්තේ ඇවිදින්න ගිය වෙලාවක, මෝල තිබුණු ගොඩනැගිල්ලට ගිහින් තිබුණා. මෙවැනි අබලන් ගොඩනැගිල්ලක් මෙසේ තිබීම අවදානම් නිසා එය කඩා ඉවත් කළ යුතු බවයි ගුරුතුමාගේ අදහස වුණේ. ගුරුතුමා එහෙම කියන්න ඇත්තේ, ඔස්ටින් සයික්ස්ට සිදුවුණු දේ නිසා වෙන්න ඇති. මල්ලී මුහුණ දුන් හදිසි අනතුර නිසා ගුරුතුමා කී දේ ඉතාම නිවැරදි බව ඔප්පු වෙනවා. මල්ලී මුහුණ දුන්නේ හදිසි අනතුරකට බව කිව්වේ ඔවුන්. ඒක නම් මට විශ්වාස කරන්නත් අමාරුයි. එය හදිසි අනතුරක් නම් මාමාට තිබුණේ මල්ලීට අනුකම්පා කරන්න. නමුත් ඒ වෙනුවට කළේ මොකක්ද? කෙනන්ට දඬුවමක් හැටියට ඔහුව කාමරයට දමා දොර අගුළු දමා තිබීම. මට සති දෙකකින් මල්ලීව දකින්න ලැබුණේ නෑ. ඔහු අසනීප වෙලාද කියා මගේ හිතේ භයක් තියෙනවා."

"මොහොතක් ඉන්න" හෝම්ස් කීවේ ඔලීවියා මෙනෙවිය නොනවත්වා කියූ කතන්දරයට මඳකට බාධා කරමිනි. "ඔස්ටින් සයික්ස් කියුවේ කවුද? ඔහුට මොකක්ද සිදුවුණේ?"

"බ්ලැක්විච් මෝල ක්‍රියාත්මක වෙද්දී ඔහු තමා ඒකෙ කළමනාකරු වුණේ. පසුගිය ශීත සෘතුවේ තිබුණු ගංවතුර කාලෙ සයික්ස් දියේ ගිලී මියගිහින් තිබිල ඔහුගේ මිනිය හමුවුණා"

"හරියටම කොයි කාලෙද?"

"මට මතක හැටියට පෙබරවාරි මාසෙ අන්තිම විය යුතුයි"

"එය සිදුවුණේ කොහොමද කියල සොයා ගත්තද?"

"ඔහු පදිංචි වෙලා හිටියෙ මෝල තිබුණු ගොඩනැගිල්ලෙමයි. එදා රෑත් ඔහු බ්ලැක්විච්වල තැබෑරුමක මත්පැන් පානය කරමින් ඉඳල තියෙනවා. ගොඩනැගිල්ලේ එක් පැත්තකට යන දොරටු තියෙන්නේ ගඟට මුහුණ දාලා. ඒවාට යන අඩිපාරක් තියෙනවා ගං ඉවුර දිගේ. ගංවතුර කාලෙට මේවා මඩ සහිතයි. මත්පැනින් වෙරි වී ගෙදර ගිය ඔහු, පය ලිස්සා ගඟට ඇද වැටෙන්න ඇති කියලයි තීරණය වුණේ. සයික්ස් බේබද්දෙකු හැටියට ප්‍රසිද්ධයි. මරණයට සති කීපයකට කලින් ඉඳලා ඔහු අධික වශයෙන් මත්පැන් පානය කළ බවට කීප දෙනෙකුම සාක්ෂි දුන්නා. ඉතින් ඔහුගේ මරණය ගැන කාගේ වත් සිත්වල පුදුමයක් හෝ කනගාටුවක් ඇතිවුණේ නැහැ."

"හොඳයි. ඔබේ සොහොයුරා මුහුණ දුන් හදිසි අනතුර මොකක්ද?"

"මේක සිදුවුණේ මාස දෙකකට පමණ කලින්" ඔලිවියා කීවාය. "ජේන් අයර් කතන්දරය මං කිහිප වාරයක් කියවා තිබුණත්, යළිත් වරක් එය කියවන්න මට ආසා හිතුණා. මා කාමරයේ සිට කියවූ ජේන් අයර් පොතේ අකුරු කුඩායි. ඒ නිසා කියවීමට අපහසුයි. ලොකු අකුරු සහිත පොතක් පුස්තකාලයේ තිබෙන බව මට මතක් වුණා. ඉතින් මං උඩුමහලින් බැස හෙමින් හෙමින් පුස්තකාලයට ආවා.

මාමා සහ ඇම්බ්‍රෝස් මෙනෙවිය පුස්තකාලයේ හිඳගෙන ලොකු කතාවකට වැටී හිටියා.

"හොඳින් හෝ නරකින් පුළුවන් ඉක්මනින්, අද හෙටම, මං උන් දෙන්නාගෙන් නිදහස් වෙනවා" මාමා කිව්වා. මං එහි ඇතුළු වුණේ ඔවුන් බලාපොරොත්තු නොවූ මොහොතක. ඉතින් ඔහු කතාව වෙනත් පැත්තකට හැරෙව්වා. වේගයෙන් දුවන්න බැරි අශ්වයින් තබාගෙන උන්ට කන්න බොන්න දෙන එක පාඩුවක් කියා ඔහු කතාව නිම කළා. නමුත් මුලින් ඔහු කියමින් සිටියේ මා සහ මල්ලී ගැන බව මට හොඳටම විශ්වාසයි."

"කෙනත්ට මොකක්ද සිදුවුණේ?"

"මාමා කළ දරුණු අනතුරු ඇඟවීම් නිසා, මල්ලී තනිවම කළ "ගවේෂණ චාරිකා" අත්හැර දැම්මා. කොහොම වුණත් ඔහු මෑතකදී යළිත් වරක් අපට නොකියා ගෙදරින් පිටවී ඇවිදින්න යන්න පටන්





ගත්තා. ඔහුව එයින් නවත්වන්න මං කොයි තරම් උත්සාහ කළත් එයින් වැඩක් වුණේ නෑ. ඔහු කිව්වේ වියළා කල්තබා ගැනීම සඳහා ඔහු කැලෑමල් වර්ග එකතු කරන බව.

රයින්හාට් ගුරුතුමා සමග එක්වී අප හැම්ඩන් වතුයායේ සිතියමක් නිර්මාණය කළා. මල්ලී වත්තේ ඇවිදින්න ගියේ ඒකත් අරගෙන. මේක වුණේ මීට සති දෙකකට කලින් සෙනසුරාදා දිනයක. මං මගේ කාමරයේ පුටුවක හිඳගෙන පොතක් කියවමින් හිටියා. මුළු ගෙදරම තිබුණේ දැඩි නිශ්ශබ්දතාවයක්. එක්වරම මහා කලකෝලාහලයක ශබ්දය පහළ තට්ටුව දෙසින් ඇහුණා. මං වහාම පහළ තට්ටුවට දිව ගියා.

කපිතාන් ක්‍රෝලි හරහට ඔසවා ගත් පොදියක් සමග සිටියේ දියෙන් පෙඟී බත්වෙලා, වතුර බේරෙමින්. වතුරෙන් පෙඟුණු මේ පොදිය මගේ මල්ලී බව මට එක් මොහොතකින් වැටහුණා. ඔහු සිටියේ සිහි විසඥව අප්‍රාණිකව.

ඒ වෙලාවේ ක්‍රෝලිගේ ඉදිරියට ආවේ මගේ මාමා "මූව එවේලෙම ඉවරයක් කරන්න තමුසෙට බැරිවුණු එක තමයි කනගාටුවට කරුණ" මාමා කිව්වේ මා පහළට ඇවිත් සිටි බව නොදැක.

"ගමේ මිනිස්සු එවේලේ එතැන වට වුණා" ක්‍රෝලි කිව්වා. ඔහු තවත් යමක් කියන්න සූදානම් වුණත් මා එනවා දුටුවාම එය නැවැත්වූවා.

"මල්ලිට මොකද වුණේ?" මට කෑගැහුණා.

"මෝල ළඟදි ඔහුගේ පය ලිස්සලා ඔහුව ගඟට වැටිලා" මාමා කිව්වා. "එයාගෙ වාසනාවකට තමයි කපිතන් ක්‍රෝලි ළඟපාතක හිටියේ. කෙනත් උදව් ඉල්ලා කෑගහනවා ඇහිලා ක්‍රෝලි ගිහින් ළමයාව බේරගෙන. එහෙම නොවෙන්න මේ යකා අනිවාර්යයෙන්ම දියේ ගිලිල මැරෙනවා. මං ඔහුට නැවත නැවතත් කියා තියෙනවා ඔය ගඟ පැත්තේ සෙල්ලමට යන්න එපා කියලා. අනික් අවදානම් තැන මෝල. ඔය තැන් වලට යාම මං මේ මිනිහට තහනම් කරල හුඟක් කල්. එහෙමත් තියෙද්දි නේ එයා එහි ගිහින් තියෙන්නේ. බලන්න ඔලිවියා දැන් සිදුවෙලා තියෙන දේ."

"එයාට ඒ පැත්තට යන්න කියලා මම නම් කිව්වේ නෑ" මං කිව්වේ මාමා එහි වැරැද්ද මගේ පිට දමන බව මට තේරිලා.

"එයාට එහේ යන්න එපා කියලත් ඔයා කිව්වෙ නැහැනේ" ඔහු කීවේ තරහෙන්. "ඔයාලා දෙන්නගෙම ඇඟවල් නිල්පාට වෙන තුරු තලන්න මට දැන් හිතිලයි තියෙන්නේ! ක්‍රෝලි එයාව අරගෙන යන්න එයාගෙ කාමරයට. එයා බලා කියාගන්නා වැඩේ මං ඇඩ්ලේඩ්ට පවරන්නම්"

එදා ඉඳන් අද වෙනතුරු පහුගිය සති දෙකම මට මල්ලීව දකින්නවත් ලැබුණේ නෑ. මාමාට ඔහු අකීකරු වීමට දඬුවමක් හැටියට, මල්ලීව බලන්න යන්න මට ඉඩ දෙන්නෙත් නැහැ"

"ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය කොහොමද කියලා ඔබට දැනගන්න හැකිවුණාද?" හෝම්ස් ඇසීය.

"ඔහු ක්‍රම ක්‍රමයෙන් සුව අතට හැරෙනවා කියලයි මට දැනගන්න ලැබුණේ. නමුත් ඒ කතා විශ්වාසයට ගන්න පුළුවන්ද කියලා මට සැකයි. ඒ මොකද මැදියම් රැයේ ඔහු වේදනාවෙන් කෑගහන හඬ මට අහන්න ලැබිල තියෙනවා. මල්ලීගේ අසනීප තත්ත්වය ගැන කියලා මේබල් නැන්දාට ලියුමක් යවන්න මට උවමනා වුණා. මාමාගෙන් ඊට අවසර ඉල්ලුවා. මටත් නැන්දාටත් බැණ වැදිලා ඔහු ඒක කෙළින්ම ප්‍රතික්ෂේප කළා.

"කෙනත්ට හෙට අනිද්දා වෙද්දි සම්පූර්ණයෙන්ම සුව වේවි" මාමා කිව්වා. "අනෙක ඔහේගේ නැන්දා මෙහේ ඇවිත් මොනවා කරන්නද? ඔගස්ටා සහ ඇඩ්ලේඩ් කෙනත්ට හොඳින් සාත්තු සප්පායම් කරනවා"

"කවුද ඒ දෙන්නා?"

"මේබල් නැන්දා ගෙදර ඉන්න කාලේ ගෘහ පාලිකාව වුණේ ඔගස්ටා. ඇය තමන්ගේ රාජකාරි හොඳින් ඉටු කළා. නමුත් ඇම්බ්‍රෝස් මෙනෙවිය ආවට පස්සේ ඔගස්ටා ගේ රාජකාරි වෙනස් වුණා. ඇයට වැඩ කටයුතු කිරීමට සිදුවුණේ ඇම්බ්‍රෝස් මෙනෙවියගේ නියෝගවලට අනුව. පහුගිය අවුරුදු දෙකේ හැම්ඩන් මන්දිරයේ වුණු සිදුවීම් ගැන ඔගස්ටා ඉන්නේ හරි කනගාටුවෙන්. ගෘහ පාලක වෙස්ට්‍රෝ සමග ඇය ඒ බව කියනවා මට අහන්න ලැබිල තියෙනවා. ඔවුන් දෙදෙනාම හැම්ඩන් මන්දිරයේ දිගු කලක් සේවය කර ඇති හුඟක් වයස්ගත අය. ඒ නිසා ඔවුනට වෙනත් තැනක රැකියාවක් ලබා ගැනීම අමාරුයි. එහෙම නොවෙන්න ඔවුන් මේ ගෙදරින් යන්නේ මීට කලින් කියා මට හිතෙනවා.





ඔගස්ටා කරුණාවන්ත, ඒ වගේම මිත්‍රශීලී තැනැත්තියක්. ඒ නිසා මල්ලීට සාත්තු සප්පායම් කෙරෙන්නේ ඇය අතින් නම් මට බය වෙන්න දෙයක් නෑ. නමුත් ඇගේ නම සඳහන් කරලා මාමා කළේ බොරුවක්. මල්ලීගේ අසනීප තත්ත්වය දැන් කොහොමද කියා පහුගිය සතියේ දවසක මං ඔගස්ටාගෙන් ඇහුවා. ඇය මං දිහා බලාගෙන හිටියේ පුදුමයෙන් වගේ.

"ඔබට දේවාශීර්වාද ලැබේවා ඔලිවියා මෙනෙවිය" ඔගස්ටා කිව්වා. "කෙනත් පුංචි මහත්තයාගේ තත්ත්වය ගැන මම කිසිම දෙයක් දන්නේ නෑ. ඒ මොකද ඔහු ඉන්න කාමරයට යන්න වත් මට අවසර නෑ. කාමරයේ දොර යතුරු දමලා. යතුර තියෙන්නේ ඇඩ්ලේඩ් ළඟ."

"ඇඩ්ලේඩ් කොහොම තැනැත්තියක්ද?" හෝම්ස් විමසුවේය.

"එයා ඔගස්ටාට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් විදියේ ගැහැනියක්. තරබාරු සිරුරක් තිබෙන ඇය කිසිම උගත් කමක් නැති ඉතා අවලක්ෂණ තැනැත්තියක්. අනික් සේවක සේවිකාවන්ට බැණ වදිමින් ඔවුනගේ නිවාසයේ කලබල ඇති කරන්නේත් ඇඩ්ලේඩ් බව ප්‍රසිද්ධයි. කෙනත් හැමදාමත් ඇයට හරි බයෙන් හිටියේ. ඇයත් ඇගේ නංගී වන ඩේසිත් දෙදෙනාම මේ ගමේ බාට්ලට් පවුලේ සාමාජිකාවන්. ඇගේ ස්වාමිපුරුෂයා දැනටත් ඉන්නේ එක්සිටර් හිරගෙදර. ඔහු එහි මිනීමැරීමේ චෝදනාවකට සිර දඬුවම් විඳිනවා. මල්ලීව බලා ගැනීම මේ වගේ ගෑනියෙකුට මාමා බාර දුන්නෙ ඇයි කියලා මට නම් තේරුම් ගන්න බෑ. ඇඩ්ලේඩ්ගේ නංගි ඩේසි බාට්ලට් බාගෙට උන්මාද ගැහැනියක්. පහුගිය කාලෙ ඇය පොලීසිය විසින් අත් අඩංගුවට ගෙන තිබුණා. ඒ අධික ලෙස බීමත්ව ගෙවල් වලට ගල්වලින් ගසා අලාභ හානි සිදු කිරීම ගැන."

"ඔබට ලන්ඩන් නගරයට එන්න අවස්ථාවක් සැලසුණේ කොහොමද?" හෝම්ස් විමසුවේය.

"එයාගෙ පෞද්ගලික වැඩකට ඇම්බ්‍රෝස් මෙනෙවිය ලන්ඩනයට එන බව මට දැනගන්න ලැබුණා" ඔලිවියා මෙනෙවිය කීවාය. "අපි මේ වැටී තිබෙන අමාරුවෙන් අපව බේරාගන්න පුළුවන් ඔබට පමණයි කියා මට හිතිලා හුඟක් දවස්. නමුත් ඔබ හමුවෙන්න ක්‍රමයක් තිබුණෙ නැහැ. ඇය ලන්ඩන් යනවා නම් මාවත් එක්ක

යන්න කියලා මං ඇයට ආයාචනා කළා. මං කිව්වේ මගේ පියාගේ පරපුර ගැන තොරතුරු, ලන්ඩන් පුස්තකාලයෙන් ලබා ගැනීමට මට අවශ්‍යයි කියලයි. හෝම්ස් මහත්මයා. ඔබ අපට උදව් කළොත් හරි. නැත්නම් මටත් මල්ලීටත් මොනවා වේවිද කියන්න බැහැ"

"හොඳයි. මට පුළුවන් සෑම අයුරකින්ම ඔබට පිහිට වෙන්න මං බලනවා." හෝම්ස් කීය. "මං මගේ සම්පූර්ණ උත්සාහය යොදනවා. ඔබේ මේබල් නැන්දාගේ ලිපිනය ඔබ ළඟ තියෙනවද?"

"නැහැ. ෂෙෆීල්ඩ් ප්‍රාන්තයේ රෙක්ස්ටන් නගරයේ කියන එක පමණයි දන්නේ"

"ඔව්. ඒක හරි. එතකොට රයින්හාට් ගුරුතුමාගේ ලිපිනය?"

"ඒක නම් මට යන්තමින් මතකයි" ඇය කීවාය. "ඔහු විල්ට්ෂයර් ප්‍රාන්තයේ කෙනෙක්. මට මතකයි ඔහු කිව්වා තමන් ගොඩැල්මිං නගරයට කිට්ටු බ්‍රැඩ්ලි ගමේ පදිංචිකරුවෙකු බව. ඔහුගේ මව එහි බ්ලූබෙල් කොටේජ් නම් නිවසේ ජීවත්වෙන බව වරක් දෙවරක් සඳහන් කළා මට මතකයි. ඔහුගේ පියාත් ගොඩැල්මිං හි ගුරුවරයෙක්ලු. නමුත් අවුරුදු කිහිපයකට කලින් මියගියාලු. ඔහුගේ මව පදිංචි බ්ලූබෙල් කොටේජ් නිවස තියෙන්නේ ගමේ දෙව් මැඳුර කිට්ටුවම බව ඔහු අපට කිව්වා."

"විශිෂ්ටයි." හෝම්ස් කීවේ එම කරුණ ඔහුගේ සටහන් පොතේ ලියා ගනිමිනි. "ඇම්බ්‍රෝස් මෙනෙවිය එනවා කිව්වෙ දොළහමාරට නේද? වොට්සන්. කරුණාකර ඔබට පුළුවන්ද දොර ළඟින් ඉන්න. ඇය ඈත එනවා දුටු වහාම මට සංඥාවක් කරන්න. ඒ අතරේ ම ලියාගත යුතු තොරතුරු ස්වල්පයක් තිබෙනවා. ගුඩ්රිච් මෙනෙවියගෙන් විමසා ඒවා ලියා ගන්නම්"

ඔහුගේ ඉල්ලීම අනුව මම පුස්තකාලයේ දොරටුව අසල රැඳුණෙමි. ඔවුන් පැමිණි රථය යළිත් වරක් පුස්තකාල භූමියට ඇතුළු වෙනු දුටු මම මගේ බිරිඳට සංඥා කළෙමි. ඇය වහාම ඒ බැව් හෝම්ස්ට ඇනුම් දුන්නාය. මේසයෙන් නැගී සිටි ඇරිය ඉක්මනින් පොත් රාක්කයක් වෙත ගොස් එහි පොත් පරීක්ෂා කරන ආකාරයෙන් හැසිරුණාය. මා පසුකර ගිය ඇම්බ්‍රෝස් මෙනෙවිය ඇරියද කැඳවාගෙන රිය දෙසට ආපසු ගමන් කළාය.

"මං ඔයාට කිව්වෙ දොර ළඟට වෙලා ඉන්න කියල නේද?" වැඩිහිටි ගැහැනිය ඇරියට කීවේ තරවටු කරන ස්වරයකිනි. මම හෝම්ස් අසුන් ගෙන සිටි තැනට ගියෙමි.





"ඔලිවියා ගුඩ්රිච් මෙනෙවිය හා ඇම්බ්‍රෝස් මෙනෙවිය සිකුරාදා හවස ආපහු වූස්ටෂයර් බලා යනවලු." හෝම්ස් කීය. "චෙල්සීහි සාන්ත මේරි දෙව් මැඳුරේ තිබෙනවලු ගුඩ්රිච් පවුල වෙනුවෙන් ඉදිකළ කුඩා ස්මාරකයක්. ලන්ඩන් නගරයෙන් පිටවෙලා යන්න කලින් තමන්ට එතැනටත් යන්න ඉඩ දෙන්න කියලා, ඇය ඇම්බ්‍රෝස් මෙනෙවිය ගෙන් ඉල්ලා හිටියලු. මං ඇයට කිව්වා මං සිකුරාදා උදේ දෙව් මැඳුරට එන බව. මට සොයා ගැනීමට හැකිවෙන තොරතුරු සමග ඇය සමග මිනිත්තු කිහිපයක් කතා කිරීමට මං බලාපොරොත්තු වෙන බව මං ඔලිවියාට කිව්වා. වොට්සන් ඔබ එනවද මා එක්ක එහි යන්න?"

"ඔබට මා අවශ්‍ය වෙනවා නම් මං නොවැරදීම එන්නම්"

"එහෙම නම් අපි දහයයි හතළිස් පහට හමුවෙමු. ඔබ එන්න චෙල්සී වෙත යන අශ්ව කෝච්චිය ෆ්ලීට් වීදියට හරවා නවත්වන නැවතුම්පළට"

## චෙල්සීහි සාන්ත මේරි දෙව්මැඳුර

එදා සවස් වරුවේ මා මගේ බිරිඳ සමග කතාබස් කළේ අපට අසන්නට ලැබුණු ඉතා අසාමාන්‍ය කථාන්තරය ගැනයි. ජෙරෝම් කැවෙන්ඩිෂ් දරුණු ස්වභාවයක සැරපරුෂ පුද්ගලයෙකු බැව් පැහැදිලිය. එහෙත් ගුඩ්රිච් දරු දෙදෙනා සම්බන්ධයෙන් ඔහු ක්‍රියාකර ඇති ආකාරය ගැන කෙනෙකුට දොසක් කීමට නොහැක. ළමයින් අකීකරු නම් ඔවුන්ගේම ආරක්ෂාව තකා, තර්ජනාත්මක අයුරින් අනතුරු ඇඟවීමක් කිරීමට සිදුවේ. දරුවන්ගේ ලේ ඥාතිවරිය වූ කැවෙන්ඩිෂ් මහත්මිය දරුවන් අත්හැර දමා ගියවිට ඔවුන් කෙරෙහි අවධානය යොමු කිරීමට සිදුවීම ඔහුට අමතර හිසරදයක් වූවා නොඅනුමානය.

අනෙක් අතට ගුඩ්රිච් දරුවන් දුටු අද්භූත සිදුවීම් තේරුම් කරන්නේ කෙලෙසද? රාත්‍රී කාලයේ සන්ධ්‍යලය වෙත ආ මන්තරකාරියක් වැනි ගැහැනිය කවුද? ඇය එහි තබා යන කඩදාසිය හෝ ලියමන කා සඳහාද? ඇගේ අරමුණ කුමක්ද? මේ ලියුම කපිතාන් ක්‍රෝලි විසින් ලබාගත් අයුරු ඔලිවියා දැක ඇත. එයින් වැටහෙන්නේ රාත්‍රියේ පමණක් පැමිණෙන මේ අද්භූත 'මන්තරකාරිය' සහ කපිතාන් ක්‍රෝලි අතර යම් ගනුදෙනුවක් ඇති

බවයි. එය කුමන ආකාරයේ එකක් දැයි සිතා ගැනීමට අපහසුය. ඒ ගැන මගේ සිතට නැගෙන්නේ මෙවැනි අදහසකි. මොවුන් සැම දෙනාම මුදල් විශාල ප්‍රමාණ ඔට්ටු අල්ලා අශ්ව රේස් තරඟ පවත්වන්නන්ය. රාත්‍රියේ ඔවුන් වෙත ලැබෙන්නේ මීළඟ දිනවල පැවැත්වෙන තරඟ වල ජයග්‍රාහක අශ්වයන් ගැන රහසිගතව හුවමාරු කරගන්නා තොරතුරු වීමට ඉඩ ඇත.

සිකුරාදා උදයේ ෂර්ලොක් හෝම්ස් හමුවීමට යද්දී මෙම කරුණු යළි යළිත් මගේ සිතට නැගිණ. එදා තද වර්ෂාව සහිත දිනයක් විය. පාර පුරා වාහන තිබූ බැවින් ගමනාගමනය සිදුවූයේ ඉතා සෙමින් ය. බඩු ප්‍රවාහණ අශ්ව කරත්තයක රෝදයක් ගැලවී ගොස් කටතතය පාර මැද ම පෙරළී තිබිණි. එයින් ප්‍රවාහණය කරමින් තිබූ ධාන්‍ය ගෝනි සහ පීප්ප රැසක් පාර අවහිර කරමින් සැම තැනකම විසිරී ගොස්ය. මගේ ගමන සම්පූර්ණයෙන්ම නවතිද්දී මට ඉතිරි වී තිබුණේ තවත් මිනිත්තු පහක් පමණි. කුලීරථ රියැදුරාට මුදල් ගෙවා ගමනේ ඉතිරි කොටස ඒලීට් වීදිය දිගේ පයින්ම යෑමට මම තීරණය කළෙමි. මා මංසන්ධිය වෙත ළං වෙද්දී ගුවන් පාලම මතින් දුම්රියක් වේගයෙන් ගමන් කළේ, එහි දුම් රොටුවෙන් සාන්ත මේරි දෙව් මැඳුර ආවරණය කරමිනි. ඒලීට් වීදිය කෙළවරදී මට මගේ මිත්‍රයා හමුවිය.

"ඔලිවියා මෙනෙවිය තවමත් ඇවිත් නෑ" හෝම්ස් කීය. "අපි මෙහෙම කරමු වොට්සන්. අපි පාර හරහා ගිහින් කඳු පාමුල නැවතී බලා ඉඳිමු. ඇය ඇත එද්දීම අපට පුළුවනි බලාගන්න. ඒ අතරෙම අපව වෙනත් කෙනෙකුට නොපෙනෙන විදියට සැඟවී ඉන්නත් අපට පුළුවනි."

"ඔබ කළ විමසීම් වලින් සාර්ථක ප්‍රතිඵල ලැබුණද?" මම ඇසීමි.

"බොහොම ස්වල්පයයි" හෝම්ස් කීය.

"ඔලිවියා මට කියූ ලිපිනයට මං රයින්හාට් ගුරුතුමා නමට ලිපියක් යැව්වා. ඒකට පිළිතුරක් ලැබුණා. නමුත් ඒ රයින්හාට් ගෙන් වත් ඔහුගේ මවගෙන් වත් නෙමෙයි. ඒ ලිපිය එවා තිබුණේ බ්‍රැඩ්ලිහි දෙව් මැඳුරේ දේවගැති ජේම්ස් ග්‍රෙගරි මහත්මයා. මගේ ලිපියට පිළිතුරු එවන්න කියලා රයින්හාට්ගේ මව දේවගැතිතුමාගෙන් ඉල්ලා හිටියලු. ඇය ඉන්නේ හිතේ හරි කැලඹීමෙන්ලු. ඇය





"ඔලිවියා මෙනෙවිය තවමත් ඇවිත් නෑ.
අපි පාර හරහා ගිහින් කඳු පාමුල නැවතී බලා ඉඳිමු"

අවුරුද්දක පමණ කාලයකින් තමන්ගේ පුතා දැකල නැහැ. මාස හයකට වැඩි කාලයක ඉඳලා ඔහු ගැන කිසිම ආරංචියක් නැහැලු. පහුගිය ජූලි මාසෙ රයින්හාට්ගේ මව වෙනුවෙන්, දේවගැතිතුමා ජෙරෝම් කැවෙන්ඩිෂ් වෙත ලියුමක් යවල තියෙනවා. ඒ ගුරුතුමා ගැන විමසීමක් කරලා. ඒකට කැවෙන්ඩිෂ් එවල තියෙන්නේ කෙටි පිළිතුරක්ලු. පසුගිය වසන්ත කාලයේදී රයින්හාට් ගුරුතුමා හැම්ඩන් මන්දිරයේ සේවයෙන් ඉවත් වී ගිය බවත්, දැනට ඔහුගේ ලිපිනයක් හෝ වෙනත් තොරතුරු තමන් නොදන්නා බවත් කැවෙන්ඩිෂ් සඳහන් කර තිබුණාලු."

"ගුරුතුමා මේ තරම් දීර්ඝ කාලයක් තමන්ගේ අම්මාට වත් ලියුමක් නො එව්වේ ඇයි කියන කාරණය හිතාගන්න අමාරුයි නේද?" මම ඇසීමි. "කැවෙන්ඩිෂ් ගුරුතුමාව වහාම රැකියාවෙන් අස්කර දැම්මා කියන කරුණ ගැන නම් සැකයක් නෑ. සමහරවිට හොඳ වැටුපක් ලැබුණු රැකියාවකින් එක්වරම පහකර දැමීම ගැන ඔහුගේ හිතේ ලැජ්ජාවක් ඇති. ඔබට මොකක්ද හෝම්ස් ඒ ගැන හිතෙන්නෙ?"

"තවමත් කියන්න අමාරුයි" හෝම්ස් කීය. "ඒකට හේතු ගණනාවක් තියෙන්න පුළුවනි. ඒ අතරේ මං ලියුමක් යැව්වා ඩොනල්ඩ් වින්ටර්ට; ඔහු භාරයේ මං මේබල් කැවෙන්ඩිෂ් මහත්මියටත් ලියුමක් යැව්වා. හැම්ඩන් මන්දිරයේ ඇති වී තිබෙන තත්ත්වය සඳහන් කර, ගුඩ්රිච් දරුවන් දෙදෙනා වෙනුවෙන් යමක් කිරීමට මං ඔවුන්ගෙන් උදව් ඉල්ලා යැව්වා. ඔබට මතක නේ ඩොනල්ඩ් වින්ටර්. ඔහුනේ මේබල් මහත්මිය විවාහ කර ගැනීමට බලාපොරොත්තු වූ ගුඩ්රිච් පවුලේ මිත්‍රයා? නමුත් ඔවුන් දෙදෙනාගෙන්ම මෙතෙක් පිළිතුරු නැහැ.

කොහොම වුණත් එක්තරා කරුණක් නම් සනාථ කර ගන්න මට හැකිවුණා. ගුඩ්රිච් ළමයි දෙදෙනා විශාල ධනස්කන්ධයක උරුමකරුවෝ. ඔවුන්ගේ මියගිය පියාගේ අන්තිම කැමති පත්‍රයේ තොරතුරු මට දැනගන්න ලැබුණා. හිටපු ගුඩ්රිච් මහතාගේ මුළු මුදලයෙන් අටෙන් එකක ප්‍රමාණයක් ඔහු තමන්ගේ සොයුරිය වන මේබල් ගුඩ්රිච් කැවෙන්ඩිෂ්ට ලියා තිබෙනවා. ඉතිරි සම්පූර්ණ මුදලයම හිමිවන්නේ ළමයි දෙදෙනාට. එහි වටිනාකම රන් පවුම් පන් ලක්ෂයක පමණ මුදලක්"





"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" මට කියැවිණි.

"ඉතාම විශාල මුදලක්. එහෙම නේද. මේ ගැන කිසිම දෙයක් මෙ ළමයින් දන්නවාද කියලා මට සැකයි. නමුත් ජෙරෝම් කැවෙන්ඩිෂ් නම් ඒ ගැන හොඳින් දන්නා බවට සැක නැහැ. ගුඩ්රිච් යුවළගේ මරණයෙන් පසු, දරුවන්ගේ භාරකරුවන් ලෙස නීතිමය වශයෙන් පත්කර ඉන්නේ කැවෙන්ඩිෂ් මහතා සහ මහත්මිය. ඒ නිසා ගුඩ්රිච් මුදලය නිසා ලැබෙන ආදායම, කැවෙන්ඩිෂ්ලාට සම්පූර්ණයෙන්ම වුණත් භුක්ති විඳින්න පුළුවනි; හැබැයි ඒ ළමයි දෙදෙනා ඔවුන් සමග ඉන්නා තුරු පමණයි.

ගුඩ්රිච් පවුලේ නීතිඥයන් ග්‍රේස් ඉන්හි ක්‍රිස්ටෝෆර් මෙනාඩ් සහ සමාගම. ඔවුන් සමග එකඟතාවයකට එන්නේ නැතුව, ගුඩ්රිච් පවුලේ මුල් මුදලයට අත තියන්නවත් කැවෙන්ඩිෂ්ලාට බැහැ.

මං හිතනවා වොට්සන් මෙන්න මේ කාරණය නිසයි, ජෙරෝම් කැවෙන්ඩිෂ් ළමයින්ගේ පරෙස්සම ගැන හිතා බැලුවේ කියලා. ඒ නිසාමයි ඔහු තමන්ගේ නැන්දා සමග යන්න නොදී ළමයින් දෙදෙනා ගෙදර රඳවා ගත්තෙත්. ළමයි දෙන්නා ඔහුට අහිමිවුණා කියන්නේ අප අර කියූ මුදලත් ඔහුට අහිමි වෙනවා.

හරි විධියට නම් ගුඩ්රිච් මුදලයෙන් ලැබෙන ආදායම ඔහු යෙදිය යුත්තේ ළමයින්ගේ යහපත සඳහා. නමුත් එහෙම නොකර ඔහු ඒ මුදල් යොදවන්නේ තමන්ගේ ප්‍රයෝජනයට. එතැනදී ඔහුට ගැලවී යා හැකි සිදුරු තියෙනවා.

කොහොම වුණත් මට දැනගන්න ලැබුණු විධියට දැන් ඔහුගේ අතමිට නම් එච්චර සරුසාර නැහැ. අශ්වරේස් වලට සහභාගී වෙනවා කියන්නේ අධික ලෙස මුදල් වියදම් වෙන විනෝදාංශයක්. මට තොරතුරු ලබාදුන් පුද්ගලයා කියන හැටියට, පහුගිය අවුරුදු කිහිපයේ ජෙරෝම් කැවෙන්ඩිෂ් මුදල් වියදම් කරලා තියෙන්නේ තමන්ට ලැබෙන ආදායමට වඩා වේගයෙන්. මේ කාලයේ කෘෂිකාර්මික අංශයෙන් ලැබෙන ආදායම් මේ රටේ සැම කෙනෙකුටම අඩුවෙලා. ඊට අමතරව ගුඩ්රිච් මෙනෙවිය කිව්වා වගේ අර මෝල පිළිබඳ ප්‍රශ්නයත් ඔහුට තියෙනවා නේ. ඉන්ධන සඳහා කිසිම මුදලක් වියදම් නොකර, ගලා බහින ගඟේ වතුරෙන් මෝල ක්‍රියාත්මක කරලා ඔහු ලොකු ආදායමක් ලබාගත්තා. දැන්

ඒක මුළුමනින්ම ඇණ හිටලා. මට වැරැදීමක් නොවෙයි නම් මෙ එන්නේ ගුඩ්රිච් මෙනෙවිය කැඳවාගෙන ආ අශ්ව කරත්තය"

සාන්ත මේරි දෙව්මැඳුරේ දොරටුව අසල පාරේ අයිනට අශ්ව කරත්තය ළඟාවිය. මොහොතකට පසු ඇරිය, රියෙන් බැස පදික වේදිකාව හරහා ගොස් දෙව්මැඳුරු බිමට පා තැබුවාය. පියවරක් ඉදිරියට තබා මම කන්ද නැගීමට සූදානම් වූයෙමි. එහෙත් හෝම්ස් එක්වරම මගේ කබා අතෙන් ඇද්දේය.

"වොට්සන්! මොහොතක් ඉන්න. ඇය ගැන අවධානය යොමු කරන්නෙ අප දෙන්නා පමණක් නොවෙයි. බලන්න ෆ්ලීට් වීදිය කෙළවරේ නවත්වා තිබෙන ලොකු කුලීරිය දිහා. ගුඩ්රිච් මෙනෙවිය වෙත ඔහුත් දක්වනවා අසාමාන්‍ය උනන්දුවක්"

එක්වරම ඒ දෙස නොබලා මගේ දෙනෙත් ඉතා සෙමෙන් ඔහු පැවසූ දිශාවට යොමු කළෙමි. කුලීරියේ හිඳගෙන සිටියේ උස හැඩිදැඩි පුද්ගලයෙකි. රැවුල් කිසිවක් නොමැති වන සේ මුහුණ සම්පූර්ණයෙන්ම මුඩුකොට සිටි ඔහු, "ටොප්හැට්" වර්ගයේ හිස් වැස්මක් පැළඳ සිටියේය. මා ඔහු දෙස බලා සිටින්නට ඇත්තේ තත්පරයක් හෝ දෙකක් පමණි. එක් ක්ෂණයකින් ඔහු මා දෙස බැලීය. මම හිස පහත්කොට මගේ ඔරලෝසුව පරීක්ෂා කරන ආකාරයක් ඇඟවීමි. ඊළඟ මොහොතේ පාර හරහා ගමන් කළ ඒ රථය වේගයෙන් කන්ද උඩට ගමන් කොට ඉක්මනින් නොපෙනී ගියේය.

"දැන් මං කල්පනා කරන්න ඕන, ඒ සිදුවීමෙන් ඇඟවෙන්නෙ මොකක්ද කියන එක" හෝම්ස් කීය.

"මට නම් කිසිම දෙයක් හිතාගන්න බෑ"

"වොට්සන්. මෙතැන සිදුවෙනවා කෙනෙකුට තේරුම් ගන්න අමාරු විදියේ මොකක් හරි කුහක වැඩක්. ඊට අමතරව විනිවිද දැකිය නොහැකි අන්ධකාර බවකුත් තියෙනවා"

"ඒකෙ නම් සැකයක් නෑ"

අපි සෙමෙන් ඉදිරියට ගොස් දෙව්මැඳුරට ඇතුළු වූයෙමු. එළියේ තිබූ කලබලයෙන් තොරව දෙව්මැඳුර තුළ වූයේ නිසංසල බවකි. බංකු පේළියේ කෙළවරක හිඳගෙන සිටි ඔලිවියා ගුඩ්රිච් මෙනෙවිය හිස පහත් කරගෙන තම මුහුණ පොතක් වෙත යොමු කරගෙන සිටියාය.





"මගේ හිතවත් වොට්සන්" හෝම්ස් කීවේ මෘදු ස්වරයකිනි. "අපට අද සාකච්ඡා කරන්න එච්චර වෙලාවක් නෑ. අර ගෑනි කොයි මොහොතෙ හරි ආපහු ඒවි. ඔලිවියා මා සමග කතා කරනවා ඇම්බ්‍රෝස් ගෑනි දුටුවොත් හොඳ නෑ. ඒක ඔලිවියාට අහිතකර ලෙස බලපාන්න ඉඩ තියෙනවා. මට කනගාටුයි. නමුත් මට ඔබෙන් ඉල්ලා සිටින්න සිදුවෙලා තියෙන්නෙ, දොරටුව ළඟට වෙලා මුරකාරයා ලෙස කටයුතු කරන්න කියලයි."

"හරි හරි. මං ඒක කරන්නම්" කී මම දෙව්මැඳුරේ දොරටුව අසලට ගමන් කළෙමි. ඉන්පසු වෙල්සි ප්‍රධාන පාරේ ඉහළ පහළ ගමන් කළ රථපේළි දෙස හොඳින් බලා සිටියෙමි.

ගුඩ්රිච් මෙනෙවිය මීට දින කිහිපයකට පෙර අපට පැවසූ සංකීර්ණ ගැටලුව දිගින් දිගටම මගේ සිතට නැගිණ. දරුවන්ගේ සිත් දිනාගත් මේබල් කැවෙන්ඩිෂ් මහත්මිය සහ රයින්හාට් ගුරුතුමා, ජෙරෝම් කැවෙන්ඩිෂ්ගේ තර්ජන හමුවේ දරුවන් අත්හැර දමා ගිය හැටි; මොහොතකට පෙර සැඟවී බලාසිට අප දුටු විගස පැන ගිය හැඩිදැඩි පුද්ගලයා; රත්පවුම් පන් ලක්ෂයක මුදලයක් වංචනික ලෙස තමන් සතුකර ගැනීමේ කූට ව්‍යාපාරයක, අපට තේරුම් ගැනීමට නොහැකි තැන්ද මේ? මීළඟට අප කළ යුත්තේ වහා වූස්ටෂයරය බලා ගමන් කිරීම නොවේද? එහෙත් ජෙරෝම් කැවෙන්ඩිෂ්ගේ රූදුරු ආරක්ෂකයන්ගෙන් බේරී අපට හැම්ඩන් වතුයායට ඇතුළු වීමට හැකි වේවිද?

එක්වරම මා සිහිනයෙන් අවදිවූයේ, දෙව්මැඳුරු බිමට ඇතුළු වූ කුලීරියක් මා ඉදිරිපිටම නවත්වනු දැකීමෙනි. එහි පැමිණියේ ඇම්බ්‍රෝස් මෙනෙවිය බැව් රියේ විවෘත වූ දොරෙන් දුටුවෙමි. විදුලි වේගයෙන් ආපසු හැරුණු මම දෙව්මැඳුර තුළට පියවරක් තබා එහි බංකුවක් මතට ඇඟිලි පුරුක් වලින් කිහිප වාරයක් තට්ටු කළෙමි.

ගුඩ්රිච් මෙනෙවිය මා කලින් දුටු තැනම හිඳගෙන සිටියාය. හෝම්ස් හිඳගෙන සිටියේ ඇයට ඉතා සමීපයෙනි. ඔවුන් ගැඹුරු සාකච්ඡාවකට වැටී සිටි බැව් මම තේරුම් ගතිමි. මගේ සංඥාවට ඔවුහු හිස ඔසවා බැලූහ. තත්පර කිහිපයකින් මා පිටුපස තිබූ දොර විවෘත වන අයුරු මට ඇසිණ. ඒ සමගම ගැහැනිය මා පසුකර ගියාය. මම හිස ඔසවා නෙත් කොණෙන් බැලීමි.

මේ වනවිට නැගිට සිටි දැරිය බිත්තියට සවිකර තිබූ ලෑල්ලක සඳහන්ව තිබූ දෑ කියවමින් සිටියාය. මගේ මිත්‍රයාගේ සලකුණක් හෝ නොවිය. ඇම්බ්‍රෝස් මෙනෙවියගේ පිය ගැටෙන හඬට දැරිය හිස ඔසවා බැලුවාය. අනතුරුව ඇය දොරටුව දෙසට පැමිණෙන ආකාරය මම දුටුවෙමි.

"ඉක්මන් කරන්න!" ගැහැනිය කීවේ තරවටු කරන හඬකිනි. "ඔහොම ගියොත් නම් අපේ දුම්රිය අල්ලා ගන්න ලැබෙන එකක් නෑ"

මඳ වේලාවකින් මා පසුපසින් දෙව්මැඳුරේ දොර වැසෙන ශබ්දය ඇසිණ. ඒ සමග මා දුටුවේ මගේ මිත්‍රයා මා ළඟම සිටගෙන සිටිනා ආකාරයයි.

"හලෝ!" මම කීවෙමි. "ඔබ කොහේටද අතුරුදන් වුණේ?"

"මං ඉක්මනට පහත්වෙලා බංකු පේළි දෙකක් අතරට රිංගුවා. අර ගෑනි මා දැක්කා කියල මං හිතන්නේ නෑ"

"ඇය එකපාරටම ආවා" මම කීවෙමි.

"මටත් හැංගෙන්න වෙලාවක් තිබුණෙ නෑ. ඇය මා දිහා බැලුවෙවත් නෑ කියලයි මට හිතෙන්නෙ"

"ගුඩ්රිච් මෙනෙවියට කියන්න තිබුණු දේ ගැන මං තවත් වරක් කන් දුන්නා වොට්සන්. ඒ අතරින් පතර ඇයගෙන් ප්‍රශ්න අහමින්. මේ කතන්දරය අහන්න අහන්න, මට මේ පුද්ගලයන් ගැන ඇතිවෙන්නෙ දැඩි පිළිකුලක්. ඒ වගේම මේ දරුවන් දෙන්නා ගැන හයක්. අපි දෙන්නා මොන තරමක් පරීක්ෂණ වල යෙදිල තියෙනවද වොට්සන්. ඒ වුණත් කුඩා දරුවන් දෙදෙනෙකුගේ ජීවිත, මේ විදියට අවදානමකට ලක්වුණු එකක් ගැන මට මතක් කරන්නත් බෑ"

"ඔබ මොකක්ද ගත් තීරණය"

"මං තීරණයකට ආවා. කැවෙන්ඩිෂ්, ක්‍රෝලි, ඇම්බ්‍රෝස් මෙනෙවිය ඇතුළු කණ්ඩායම හෙට පිට පළාතකට යාමට නියමිතයිලු. ඒ වොරික්ෂයර් ප්‍රාන්තයේ එට්ංටන් හි අශ්වරේස් තරඟවලට. ඔවුන් ආපහු ඒමට නියමිත කීයටද කියලා ඇය දන්නෙ නෑ. නමුත් අපි මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත යුතුයි. හෙට උදේ හතරට පිටත්වෙන දුම්රියෙන් මං වූස්ටෂයර් වෙත යනවා. ඔබටත් මා සමග පැමිණිය හැකි නම් මං එය අගය කරනවා"





"මගේ ශල්‍යාගාරය වහල දාලා මං සහතිකෙන්ම එනවා. මගේ රිවෝල්වරයත් අරගෙන එන්නද?"

"මං මේ ඔබට ඒ ගැන මතක් කරන්න හැදුවා විතරයි. ඔබේ රිවෝල්වරය නොවරදවාම ගෙන එන්න." හෝම්ස් කීය. "අපට කටයුතු කරන්න සිදුවෙලා තියෙන්නෙ, මනුෂ්‍යත්වය ගැන තැකීමක් නොකරන භයානක පුද්ගලයන් සමග. ඔබේ පැමිණීම මට විශාල ශක්තියක් වොට්සන්. අපි යන්නේ නීති විරෝධී කටයුත්තකට"

"ඒ කියන්නෙ?"

"නීතිය පැත්තෙන් බැලුවොත් අපි යන්නේ නීතියට එරෙහිව. අනුන්ට අයත් තැනකට අපි බලෙන් කඩාවැදීමක් කරන්නෙ. මොකද ඔබ කියන්නෙ? ආයුධ සන්නද්ධව මංකොල්ල කෑම යන චෝදනාව යටතේ, අපව අත්අඩංගුවට ගන්න වුණත් පොලීසියට පුළුවනි"

"ඒ ඕනෑ එකක්. මං එනවා හෝම්ස් ඔබ සමග. අපේ අරමුණ පිරිසිදු එකක්"

"ඔබට ස්තූතියි මගේ හිතවත් වොට්සන්. උදේ 3.50 වෙන කොට මං කුලීරියකින් ඔබේ නිවස ළඟට එනවා. සූදානමින් ඉන්න"

හෝම්ස් තම සැලැස්ම හෙළිකළේ පසුවදා උදයේ අප යූස්ටන් දුම්රියපොළෙන් දුම්රියට නැගුණු පසුවය.

"අපි පුළුවන් තරම් කල් ඇතුව ගිහිං, හැම්ඩන් වතුයායේ හැංගිලා ඉන්න ඕන. ඒ හැම්ඩන් මන්දිරයෙන් පිටවීමට තිබෙන ගේට්ටුව පෙනෙන තෙක් මානයෙන් විය යුතුයි.

අයිතිකාරයා ගෙදර නැති වෙලාවෙ හැම්ඩන් මන්දිරයට ඇතුළුවෙන්නයි මගේ බලාපොරොත්තුව. අපිව මන්දිරය ඇතුළට ගන්න ගුඩ්රිච් මෙනෙවිය පොරොන්දු වුණා. මිනීකන බල්ලන් ඉන්නවා නම් උන්වත් කූඩුවලට දමා අපට ආරක්ෂාව සලසන්න ඇය පියවර ගනීවි. ඇය අපට උදව් කළා වුණත් නීතිය ඉදිරියේ එයින් අපට පිහිටක් ලැබෙන්නේ නෑ. ඒ මොකද ඇය බාල වයස්කාරියක්."

"ඔවුන්ගේ මැඳුරට ඇතුළුවෙලා මොකක් කරන්නද ඔබ බලාපොරොත්තු වෙන්නෙ?"

"මට එතැනදී සොයා ගැනීමට හැකිවෙන්නේ මොනවාද කියන එක මතයි එය තීරණය වෙන්නෙ. හැම දේකටම කලින් අපි සොයා



"මිනී කන බල්ලන් ඉන්නවා නම් ........"





බලන්න ඕන අර දරුවා - ඔලිවියා මෙනෙවියගේ සොහොයුරාගේ සෞඛ්‍ය තත්ත්වය ගැන. ඔහු පරීක්ෂා කර බැලීමට අවශ්‍ය වෙන ඔබේ වෙද නළාව ඇතුළු උපකරණ ගෙන එන්න කියලා ඔබට මතක් කිරීමට සිතා සිටියත්......."

"........ ඔබ නොකිව්වත් මං අත්‍යවශ්‍ය ඖෂධ හා උපකරණ සමහරක් ගෙන ආවා හෝම්ස්"

"විශිෂ්ටයි මගේ මිත්‍රයා. මේ වෙලාවේ ඔබේ සහයෝගය වචනයෙන් විස්තර කරන්න අමාරුයි. තමන්ගේ සොයුරා ගැන ඔලිවියා මෙනෙවිය මට කිව්වේ කඳුළු වගුරුවමින්. ඇය හිතනවා ඔවුන් උත්සාහ කරන්නේ ඔහුව මරා දමන්න කියලා. ඒ සැකය සාධාරණයි කියලා මටත් හිතෙනවා. අනුන්ගෙන් මුදල් පැහැරගන්න උවමනා වුණාම, සමහර මනුෂ්‍යයින් හැසිරෙන්නේ අමනුෂ්‍යයින් නැත්නම් තිරිසනුන් වගේ."

"මොනවා? මං හිතුවා හැකිතරම් කාලයක් ළමයින් හොඳ ශරීර සෞඛ්‍යයෙන් තමන් ළඟ තබා ගැනීම කැවෙන්ඩිෂ්ට වාසියක් කියලා. එතකොට ඔහුට ඔවුන්ගේ මුදලයෙන් ලැබෙන ආදායම හිතේ හැටියට පරිහරණය කරන්න පුළුවන් නේ.

"ඔව්. නමුත් ඔහුට ඒ සුදුසුකම ලබන්න එක ළමයෙක් ජීවතුන් අතර තබා ගත්තත් එය ප්‍රමාණවත් වෙනවා. පිරිමි ළමයා මියගියත් කැවෙන්ඩිෂ්ගේ ආදායමේ අඩුවීමක් වෙන්නෙ නෑ. අන්න ඒකයි මගේ හිතේ තිබෙන ලොකුම බය. අන්න ඒ නිසයි අපි අප්‍රමාදව, නීති විරෝධී ලෙස වුණත් කටයුතු කළ යුත්තේ"

## හැම්ඩන් මන්දිරය

"මේ පළාතේ සිතියමක් මං මිලට ගත්තා" හෝම්ස් කීවේ තම කබා සාක්කුවෙන් ගත් සිතියම දිග හරිමිනි. "මේ තියෙන්නේ හැම්ඩන් මන්දිරය. මේ වගාබිම් හා තණකොළ වැවූ ප්‍රදේශයක් ලෙස සලකුණු වෙන්නේ හැම්ඩන් වතුයාය. මේ වූස්ටෂයර් ප්‍රාන්තය හරහා ගලා බහින සෙවර්න් ගංගාව. බ්ලැක්විච් මෝල පිහිටා තියෙන්නේ සෙවර්න් ගඟේ ඉවුරක විය යුතුයි. හැම්ඩන් මන්දිරයේ සිට මෝලට සැතපුම් තුනක පමණ දුරක් තියෙනවා කියලයි අපට අහන්න ලැබුණේ. මේ පාරවල් නම් කුමන තත්ත්වයේ ඒවාද කියා

හිතාගන්න අමාරුයි. සිතියමේ නම් සඳහන් වෙන්නේ කරත්ත පාරවල්. කියා. ගඟට හුඟක් කිට්ටු නිසා ගංවතුර කාලෙට මේව යටවෙලා, පාර මතුපිට මඩ තට්ටු රැඳෙනවාත් ඇති."

"දුම්රියපොළේ ඉඳන් ඔවුන්ගේ වතුයායටම කුලී රියක යෑම අවදානම් නේද හෝම්ස්?"

"ඇත්තෙන්ම ඔව්. සිතියමේ හැටියට දුම්රියපොළේ ඉඳල එන පාර එක තැනකදී දෙකට බෙදෙනවා. ඒකෙ දකුණට ගියාම තමයි හැම්ඩන් මන්දිරයට යන්නේ. වමට ගියොත් ලෙඩ්බරි. අපි එතැනදී කුලීරිය ආපහු හරවා යවමු. එතකොට අපට පයින් යෑමට සිදුවෙන්නේ හැතැක්ම දෙකක පමණ දුරක්"

"එටිංටන් තුරඟ තරඟ පිටිය දක්වා සම්පූර්ණ දුරම, ඔවුන් අශ්ව කරත්ත වලින් යාවි කියා හිතන්න අමාරුයි නේද?" මම ඇසීමි.

"මටත් හිතුණේ එහෙමයි." හෝම්ස් කීය. "ඔවුනට යාමට තිබෙන සම්පූර්ණ දුරම හැතැක්ම අනූවකට අඩුවෙන්න බෑ. මට හිතෙනවා ඔවුන් දුම්රියෙන් එව්ශාම් දක්වා යාවි කියල. එතැනින් දුම්රිය මාරු කරලා ශාඛා මාර්ගයක රැග්ලිහෝල් දක්වා ගිහින් ඉන්පසු එටිංටන් යෑමට තවත් දුම්රියක යෑමට සිදුවේවි. ඒ කියන්නේ ඔවුන් සෑහෙන වෙලාවක් ගෙදරින් ඇත්වෙලා ඉඳීවි කියල මං විශ්වාස කරනවා. කොහොම නමුත් ඔවුන් ආපහු එන්න කලින් අපට කරන්න තිබෙන වැඩ කොටස විශාලයි. ඒකට අපට කාලය ප්‍රමාණවත් වේවි කියා හිතමු"

ඒ සමගම මගේ මිත්‍රයා යළිත් වැටුණේ නිහඬතාවයකටයි. මම මගේ සිතුවිලිවල අතරමං වීමි. අපේ දුම්රිය ගමනේ මුල් කොටසේ දී එතරම් වර්ෂාවක් දක්නට නොලැබිණ. එහෙත් මධ්‍යම එංගලන්තයේ ප්‍රාන්ත වලට පිවිසෙත්ම තත්ත්වය වෙනස් විය. ගත වූ දින කිහිපයේම ඔවුනට දැඩි වර්ෂාපතනයක් ලැබී තිබූ බව පෙනිණ. දුම්රිය මාර්ගය දෙපස වූ වගාබිම් දිස්වූයේ ජලාශ විලසිනි.

අප්ටන් දුම්රියපොළේ දී අපි ගමන් කරමින් සිටි දුම්රියෙන් බැස ශාඛා මාර්ගයක දුම්රියකට නැඟුණෙමු. කුඩා මැදිරි දෙකක් පමණක් තිබූ එම දුම්රියට නැඟුණු මගීන් වූයේ අප දෙදෙනා පමණි. පැය භාගයකට පසු ලිට්ල් මැල්වර්න් දුම්රියපොළෙන් බසින විට එළිය වැටී තිබිණි. දුම්රියපොළේ අවන්හලට ගොස් අපි උදේ ආහාරය ගත්තෙමු.





"අපට යන්න උවමනා කරන්නේ ලෙඩ්බරි වලට........"

දුම්රියපොළේ තිබූ එකම කුලීරිය පැදවූයේ වයස්ගත ගැමියෙකි.

"අපට යන්න උවමනා කරන්නේ ලෙඩ්බරි වලට හැරෙන මංසන්ධියට පමණයි" හෝම්ස් කීවේ රියැදුරාටයි.

"ඒ හරියට මොකට යනවද මහත්තයලා? පාළු පලාතක් නේ?" රියැදුරා විමසුවේ ගමනට සූදානම් වෙමිනි.

"අපි ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන්. මේ ප්‍රදේශයේ වනගත පක්ෂීන් ගැන අපි පර්යේෂණයක් කරනවා. ඒකටයි මෙහේ ආවේ" හෝම්ස් කීය.

"මහත්තයලා ඇවිත් තියෙන්නේ අපූරු කාලෙක නේ" රියැදුරා කීය. "පහුගිය කාලෙ වැස්සට හැමතැනකම වගේ ගංවතුර ගලලා. අනෙක් පක්ෂීන් ගැන මං දන්නෙ නෑ. පාත්තයො නම් ඉන්නවා වැලි කැට ගණනට. හැම අවුරුද්දකම ගංවතුර කාලෙට පාත්තයො එන්නෙ ලක්ෂ ගණනින්. කොහෙන් එනවද මං දන්නෙ නෑ. මහත්තයලට එන්න තිබුණෙ පාත්තයින් දඩයමේ" රියැදුරා කීය.

"ඒක ඇත්ත. ඒකට වෙනම ගමනක් එන්න ඕන" හෝම්ස් පිළිතුරු දුන්නේය.

රියැදුරා පැවසූ දේ සත්‍යයක් බැව් අපට පෙනිණ. මාර්ගය වසාගෙන සිටි දහස් ගණනක් පාත්තයෝ. රියේ ශබ්දයට කලබල වී මඳ දුරක් අහසට පියැඹූහ. අප යන මාර්ගයේ තැන් කිහිපයකදීම මෙම දර්ශනය අපට දැකගන්නට ලැබිණ.

"මහත්තයලට එන්න උවමනාය කිව්වෙ ලෙඩ්බරි හන්දියට විතරයි නේ" රියැදුරා කීවේ රිය නවත්වමිනි.

අපි ඔහුගේ ගාස්තුව ගෙවා රියෙන් බැස්සෙමු. ඔහු සෑහෙන දුරක් පිටත් වී යනතුරු අප දෙදෙනා එතැනම රැඳී සිටිය යුතු බැව් හෝම්ස් සංඥා මගින් කීය. මිනිත්තු කිහිපයක් ගතවෙද්දී ආපසු ගිය කුලීරිය නොපෙනී ගියේය.

"අපි ඉක්මන් කරලා යමු වොට්සන්. මෙතැන ඉඳන් ඉදිරියට දිගටම හැම්ටන් වතුයාය - කැවෙන්ඩිෂ්ගෙ දේපළ. එයාගෙ වත්තට ඇතුළු වෙන්න එපා කියල අපව එළවා දමන්නත් ඉඩ තියෙනවා. දෙපැත්තෙම මුඩුබිම්. අපට තියා බළලෙකුටවත් හැංගෙන්න තැනක් නෑ"

අපි ඉක්මන් ගමනින් ඉදිරියට ගියෙමු. යාර දෙසීයක් පමණ යද්දී පාර දෙපස ස්වභාවය වෙනස් විය. මුලින්ම ළඳු කැලෑ තිබූ





අතර පසුව වඩාත් විශාල ගස් ද දක්නට ලැබිණ. තවත් ඉදිරියට යාමේදී ඕක්, බීච් ආදී දැවැන්ත ගස් වැවුණු කැලෑබද පෙදෙසකට අපි පිවිසියෙමු.

"මේ හරියෙදි නම් කවුරුවත් ආවොත් හැංගෙන්න තැන් තියෙනවා" මම කීවෙමි.

"නමුත් පාත්තයින් ගැවසෙන දියකඩිති සහිත මුඩුබිම් එහෙමත් තැනින් තැන තියෙනවා" හෝම්ස් කීය.

පාර ඉතා පුළුල් එකක් නොවූවත් වංගු නොමැති සතුටුදායක එකක් විය. "මං සිතියම කියෙව්වා නිවැරදි නම්, අපි දැන් ඉන්න ඕන හැම්ඩන් මන්දිරයට පිවිසෙන පුද්ගලික පාරේ, ගේට්ටුවට බොහොම ළඟින්" හෝම්ස් කීවේ සාක්කුවේ තිබූ සිතියම එළියට ගෙන යළිත් වරක් පරීක්ෂා කරමිනි.

"හරියට හරි. අර තියෙන්නෙ." ඔහු පෙන්වා දුන්නේ පාරට මඳක් උසින් පිහිටි බිමක තිබූ දැවැන්ත ගේට්ටු කුලුනු දෙකකි. යකඩෙන් තැනූ ගේට්ටු පියන් විවෘතව තිබිණි. ගේට්ටු කුලුනු දෙක මත සිමෙන්තියෙන් තැනූ සිංහ රූප දෙකක් විය. කෙසේ වෙතත් එම ප්‍රදේශය ගස්වලින් වැටුණු කොළවලින් අපවිත්‍ර වී තිබිණ.

ගේට්ටුවෙන් ඇතුළත වූ මාර්ගය සෑහෙන තරම් පුළුල් එකක් විය. ගංවතුර නොතිබුණෙත් පාත්තයින් හා වලිකුකුළන් විශාල රංචු පාර වසාගෙන කෑම සෙවූ ආකාරය අපි දුටුවෙමු. අප තවත් ඉදිරියට ඇවිද යන්නට ඇත්තේ යාර සියයකටත් අඩු දුරකි. පාර වසාගෙන සිටි පක්ෂීන් ගුවන් ගතවෙන ආකාරයක් දක්නට ලැබිණ.

"ඉක්මන් කරන්න වොට්සන්! උන් අපට වඩා සංවේදියි. අශ්ව කරත්තයක් මේ පැත්තට එනවා විය යුතුයි. වැඩි ඈතක වෙන්න බෑ" කී හෝම්ස් මගේ අතින් ඇදගෙන ඕක්ගස් කිහිපයක් අතර වූ ළඳු කැලෑවකට ඇදුණේය. අප සැඟවී ගතවන්නට ඇත්තේ මිනිත්තුවකටත් අඩු කාලයකි. මහහඬක් නංවමින් ඉදිරියට ආවේ විශාල ප්‍රමාණයේ අශ්ව කරත්තයකි. එහි පිටුපස මගීනට වෙන් වූ කොටස විවෘතව තිබිණි. ඒ උදෑසන සුන්දරත්වය නැරඹීම සඳහා විය යුතුය. අපි ගස් අතර පහත් වී දෙනෙත් යොමු කරගෙනම සිටියෙමු.

"අර යන්නෙ ඇම්බ්‍රෝස් ගැති. අර හැඩිදැඩි මිනිහා වෙන්න ඇති ජෙරෝම් කැවෙන්ඩිෂ්. තවත් දෙන්නෙක් ඉන්නවා. එයින්

ක්‍රෝලි කියන්නෙ කොයි මිනිහද දන්නෙ නෑ. කවුරු වුණත් කමක් නෑ. ඔක්කොම මෙහෙන් ගියොත් අපට පහසුයි." හෝම්ස් කීය.

එය පිටත්ව ගිය පසු සැඟවී සිටි තැනින් එළියට ඒමට අපි සූදානම් වූයෙමු.

"අපි තවත් මිනිත්තුවක් බලමු වොට්සන්. කවුද දන්නෙ තවත් වාහනයක් පිටුපසින් එනවද කියලා"

ඔහුගේ ඒ නිගමනය නිවැරදි බැව් පෙනිණ. අශ්වයින් ප්‍රවාහණය කරන වර්ගයේ විශාල එමෙන්ම විවෘත රියක් වේගයෙන් ඉදිරියට ගමන් කළේය. එහි රියැදුරා සහ තවත් අයෙකු සිටි බැව් දක්නට ලැබිණ.

"දැන් ඉතින් අපි පුළුවන් ඉක්මනින් ඉදිරියටම යමු වොට්සන්. සෑම මිනිත්තුවක්ම වටිනවා"

දෙපස විසල් ගස්වලින් සෙවණ වූ මාවතේ අපි ඉදිරියට ගමන් කළෙමු. මඳ දුරක් යද්දී හැම්ඩන් මන්දිරය අපට දැකීමට හැකිවිය. එය රතු පැහැති ගඩොල් වලින් ජෝජියානු යුගයේ ගෘහ නිර්මාණ ශිල්පයට ඉදි කළ එකක් බැව් තවත් ළංවෙද්දී පෙනිණ. ගස් පිහිටි අඩවිය පසුකළ විට අප ළඟාවූයේ විවෘත පෙදෙසකටයි.

නිවස ඉදිරිපිට තණකොළ වැවූ තරමක් ලොකු මිදුලක් විය. රෝස පැහැති දිග ගවොමකින් සැරසුණු ඇරියක් එය මැදට වී මඟ බලාසිටින ආකාරය අපි දුටුවෙමු. හෝම්ස් තම හිස්වැස්ම අතට ගෙන ඇයට සංඥා කළේය. ඇය තම දෑතම සතුටින් දෙපසට වැනුවාය.

"ඔබ දෙදෙනාට මෙහේ එන්න හැකිවුණු එක ගැන මට හරිම සන්තෝෂයි" අප ඉදිරියට දිව ඇවිත් අප දෙදෙනාගේම අත් තම දෑත් වලින් ගෙන ඔලිවියා ගුඩ්රිච් මෙනෙවිය කීවේ අප්‍රමාණ සන්තෝෂයකිනි.

"ඔබ මේ විදියට දකින්න ලැබීම ගැන අපටත් සන්තෝෂයි" හෝම්ස් කීය. "ඔබේ මාමා ඔහුගේ පිරිවර සමග පිටත්ව යනවා අප දුටුවා. නමුත් ඔහුට අපව නොපෙනෙන්න අපි පරෙස්සම් වුණා. අපි ප්‍රමාද වෙන්න හොඳ නෑ. අපව ඉක්මනින්ම කැඳවාගෙන යන්න ඔබේ මල්ලීගේ කාමරයට"

ඔලිවියා මෙනෙවිය දොරෙන් ඇතුළු වී නිවස තුළට යද්දී අපි ඇය පසුපස ගියෙමු. සේවිකාවක් සාලයේ තිබූ අරුමෝසම් බඩු





ඔපදමමින් සිටියාය. ඇය හිස ඔසවා කුතුහලයෙන් අප දෙස බැලුවාය. එහෙත් ඒ ගැන තැකීමක් නොකළ ඔලිවියා අප ප්‍රධාන තරප්පු පෙළ වෙත කැඳවාගෙන ගියාය. ඇය උඩුමහලට නැඟුණේ තමා පසුපස එන මෙන් අපට ද සංඥා කරමිනි.

අප ඉදිරියට පැමිණි නිල-ඇඳුමකින් සැරසී සිටි සේවකයෙකු සිටි තැනම නැවතී, අප දෙස බලා සිටියේ මවිතයට පත්වය. ඔහු දෙසවත් නොබලා අපි ඔලිවියා පිටුපස ගමන් කළෙමු. මේ අයුරින් ඇය තුන්වැනි තට්ටුව දක්වා අප කැඳවාගෙන ගියාය.

"මේක තමයි මගේ මල්ලි රඳවා තිබෙන කාමරය" ඇය කීවේ කොරිඩෝවේ මැද හරියේ වූ වසා තිබූ දොරක් පෙන්වමිනි. අප දොර විවෘත කිරීමට උත්සාහ කළද, එය යතුරු දමා වසා ඇති බැව් පෙනිණ. යතුර පෙනෙන තෙක් මානයක නොවීය. හෝම්ස් පහත්වී යතුරු සිදුරට ඇස තබා බැලුවේ, වසා දැමීම කාමරය තුළින් සිදුකර ඇතිද යන්න දැන ගැනීමටයි. ඒ සමගම කොරිඩෝවේ ඈත කෙළවරේ කාමරයක දොර විවෘත විය. හැඩිදැඩි එමෙන්ම තරබාරු සිරුරක් සහ අසංවර පෙනුමක් තිබූ කාන්තාවක් ඒ දොරෙන් මතුවූවාය. ගුඩ්රිච් මෙනෙවිය නැතිගෙන කෑගැසුවාය. මීළඟට අඩියක් පිටු පසට තැබූ ඇය කෙඳිරිලි හඬින් ඒ ඇඩිලේඩ් බාට්ලට් යයි කීවාය.

ඔලිවියාගේ සොහොයුරා වූ රෝගීව සිටින කෙනත් ගුඩ්රිච් දරුවා යහපත් සෞඛ්‍ය තත්ත්වයකට යළි ගෙන ඒමේ කර්තව්‍යය බාරවී ඇත්තේ මේ ඇඩිලේඩ් ට ය. එහෙත් ඇයගෙන් පිළිබිඹු වූයේ නුගත්බව හා කෲරත්වය පමණි.

"ඔහේ කවුද?" ඇය විමසුවේ රළු තර්ජනාත්මක හඬකිනි.

"මම තමයි අර කාමරයට ඇතුළුවෙන්න ආ මිනිහා" හෝම්ස් කීය. "කෝ ඒකෙ යතුර?"

"යතුර?" ඇය කීවාය. "ඒක මා ළඟ තියෙනවා. ඒත් මං ඒක කොහොමටවත් ඔහේට දෙන්නේ නෑ"

හෝම්ස් උත්සාහ කළේ ඇයගේ කාමරයට වැදී යතුර සොයා ගැනීමටයි. එහෙත් තම කාමරයට ගොස් හෝම්ස් එළියට තල්ලු කළ ඇඩිලේඩ් තම දොර වසාගෙන යතුරු දමා ගත්තාය.

"අපට යතුර ගන්න විදියක් නෑ වොට්සන්. අපි මේ දරුවාගේ කාමරයේ දොර කඩමු" මගේ මිත්‍රයා කීය.

පියවර කිහිපයක් පිටුපසට ගිය ඔහු මීළඟට වේගයෙන් ඉදිරියට දිවැවිත්, දොරේ අගුළ තිබූ තැනට වේගවත් පා පහරක් එල්ල කළේය.

වේදනාවෙන් පසුවෙන දරුවෙකු නැගූ අඳෝනා හඬක්, කාමරය ඇතුළතින් අසන්නට ලැබිණ.

ඕක් ලෑලිවලින් සාදා තිබූ දොර ශක්තිමත් එකක් බැව් පෙනිණ. මීළඟට මමත් මගේ මිත්‍රයා අනුගමනය කළෙමි. අප කිහිප වරක් දොරේ අගුළ ප්‍රදේශයට පහර එල්ල කිරීම නිසා, අගුළ කැඩීගොස් දොර විවෘත විය.

ගුඩ්රිච් මෙනෙවිය ගේ මුවෙන් නැගුණු කෑගැසීමක හඬෙන් මම ආපසු හැරී බැලුවෙමි. දිගු ලීයක් ද අතැතිව ඇඩ්ලේඩ් ඉදිරියට දිව ආවාය. ඇයට උවමනා වී තිබුණේ හෝම්ස්ට එයින් පහරක් එල්ල කිරීමය. මම කෑ ගසාගෙන ඉදිරියට පැන්නෙමි. එහෙත් ක්ෂණිකව ක්‍රියාත්මක වූ හෝම්ස් ආපසු හැරී ඇයගේ අතේ තිබූ ලීය උදුරා ගත්තේය. එයින් තමාට පහරක් එල්ල වෙතැයි බිය වූ ගැහැනිය අපට ශාප කරමින් පැන දිවුවාය. අනතුරුව තම කාමරයට වැදුණු ඇය එහි දොර වසා ඇතුළෙන් යතුරු දමා ගත්තාය. දරලීය තම දණහිසට තබා දෙකට කැඩූ හෝම්ස් එය ඉවතට විසි කළේය.

"අපි ඉක්මන් කරමු" හෝම්ස් කීය. "අපට එරෙහිව තවත් ප්‍රහාර එන්න පුළුවනි." කැඩූ දොරෙන් අප ඇතුළු වෙද්දී ගුඩ්රිච් මෙනෙවියද එහි දිව ආවාය.

කාමරය ඇතුළත තිබුණේ සෑහෙන තරම් අන්ධකාරයකි. ඊට හේතුව එහි ජනේලය සම්පූර්ණයෙන්ම ආවරණය වන සේ සවිකර තිබූ ඝනකම් රෙද්දය. දැන් දොර කඩා විවෘත කළ නිසා කාමරය තුළට යම් තරමක ආලෝකයක් ලැබිණි. එයින් මා දුටු දසුනෙන් මම ඇඩි කම්පාවකට පත්වීමි.

අපිරිසිදු කොට්ටයක් මත හිස තබාගෙන කුඩා දරුවෙක් උඩුබැලි අතට ඇඳ මත වැතිරී සිටියේය. ඔහුගේ සිරුර වැසී තිබුණේ එක් අපිරිසිදු රෙද්දකිනි. භීතියෙන් සසල වූ දෙනෙත් ඔහු අප දෙසට යොමු කරගෙන සිටියේය. ඔහුගේ මුහුණේ පහළ කොටස වෙළුමක් යොදන ආකාරයට රෙදි කඩකින් බැඳ තබා තිබූ සැටි දැක මම විමතියට පත්වීමි. ඔහුගේ බෙල්ලට යටින් තිබූ ගැටය ලිහා දමා එම කිළිටි රෙදි කඩ ඉවත් කළෙමි. ඒ කුමක් දැයි





තේරුම් ගත හැකි වූයේ එවිටය. අසරණ දරුවා වේදනාවෙන් හඬ නගනු වැළැක්වීමට ඔවුන් යොදා තිබූ මුඛවාඩමකි ඒ.

කාමරයට එළිය වැටෙන සේ ජනේලය ආවරණය කරමින් තිබූ ඝන රෙද්ද හෝම්ස් ඉවත් කළේය. කාමරය තුළට සතුටුදායක ආලෝකයක් ලැබිණි. මේ වනවිට ඔලිවියා මෙනෙවියද කාමරය තුළට පැමිණ, සිය සොහොයුරාගේ දුක්ඛිත තත්ත්වය දැක හඬමින් සිටියාය. එහෙත් ඇඳේ වැතිර සිටි දරුවා ඇඳ මත හිඳ ගැනීමට උත්සාහ නොකෙළේය. එයට හේතුව ඔහුගේ ශාරීරික දුබලතාවය යයි මට සිතිණි. ඔහුගේ සිරුර වසා තිබූ කිළිටි රෙද්ද මම ඉවත් කළෙමි. ඔහු හිඳ නොගත් හේතුව එවිට පැහැදිලි විය. දරුවාගේ පපුව මතින් යැවූ ලණු පොටවල් කිහිපයකින් ඉතා අමානුෂික ලෙස ඔහු ඇඳට බැඳ දමා තිබිණි. ඔහුගේ දෑත් මැණික් කටු වලින්ද දෙපා වළලු කර පෙදෙසින්ද බැඳ දමා තිබුණේ ඔහුට සෙලවීමටත් නොහැකි වන අයුරෙනි. හෝම්ස් තම දුනු පිහිය ගෙන සියලුම බැමි කපා දැම්මේය.

"වොට්සන්. බලන්න ඔහුගේ ඇඟට දමාගන්න ඇඳුම් මොනවා හරි හොයාගන්න පුළුවන්ද කියල. අපි වහාම මොහුව අරගෙන යමු. සෞඛ්‍ය තත්ත්වයයි වෛද්‍ය ප්‍රතිකාරයි ගැන හිතන්න ඕන ඊට පස්සේ."

කම්පාවට පත්ව සිටි ඔලිවියා තම මලණුවන් අමතා කිහිප වාරයක්ම කථා කළාය. එහෙත් ඔහු ඊට කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වීය.

"ඔබට මොකක්ද හිතෙන්නෙ වොට්සන්? මේ අන්දමින් ඔහු ගෙනයාම ඔහුගේ ජීවිතයට අනතුරක්ද?" මගේ මිත්‍රයා විමසුවේ කැලඹුණු මුහුණෙනි.

"සෑහෙන කාලයක් සතුටුදායක ආහාරයක් නොමැතිවයි ඔහු ඉඳලා තියෙන්නේ. ඊට අමතරව ඔහුට ලැබිල තියෙන වධ හිංසා. අපි ඔහුව හැකි විදියකට අරගෙන යමු. මේ අපායෙන් ඔහුව මුදාගත්තොත්, ඒකම ඇති සෞඛ්‍ය තත්ත්වය යහපත් අතට හැරෙන්න."

අල්මාරියක තිබූ පරණ බ්ලැන්කට්ටුවකින් ඔතාගෙන මම දරුවා කර මත හොවා ගත්තෙමි.

"විශිෂ්ටයි මගේ හිතවත් වොට්සන්!" මගේ මිත්‍රයාට සතුටෙන් කෑගැසිණි. "ගුඩ්රිච් මෙනෙවිය. දැන් අපට කියන්න ප්‍රධාන විසිත්ත

කාමරයට හෝ සාලයට නොයා, මෙතැන සිට ඔබේ මාමා ගේ කන්තෝරු කාමරයට යා හැකි කෙටි පාරක් තියෙනවද?"

ඔලිවියා මොහොතක් කල්පනා කළාය. ඇයගෙන් පිළිතුරු ලැබුණේ ඉන්පසුවය. "අර කෙළවරේ තියෙන තරප්පු පෙළෙන් පහළට යමු. ඒක කෙළින්ම යන්නෙ බිම් මහලට; හරියටම මාමගේ කන්තෝරු කාමරයේ දොර අසලට."

අපි ඇය පිටුපසින් පහළට බැස්සෙමු. මේ අතර මැඳුරේ සෑම දෙසකින්ම නොයෙක් දෙනා කථා කරන ශබ්ද හා පියගැට පෙළ වල ඉහළ පහළ ගමන් කරන ශබ්ද අපට අසන්නට ලැබිණ. එහෙත් කිසිවෙකු ඉදිරියට හමු නොවී, කිසිවෙකුගේ බාධාවකින් තොරව අපි බිම් මහලට බැස්සෙමු. අනතුරුව විවෘතව තිබූ කන්තෝරු කාමරය තුළට ද පිවිසියෙමු.

එය සෑහෙන තරම් විශාල කාමරයක් විය. එහි බිත්ති තුනක් පුරාම පොත් හා ලිපි ගොනු අඩංගු රාක්ක තිබූ අතර, මහෝගනි ලීයෙන් තැනූ විශාල මේසයක් කාමරය මධ්‍යයේ විය. හෝම්ස් එහි ලාච්චු එළියට අදිමින් යම් පරීක්ෂාවක නිරත විය. ඒ අතරේ කාමරයේ පැත්තක වූ සුවපහසු කව්ච්චියක් මත මම දරුවා හාන්සි කළෙමි.

"මේ මේසෙ ලාච්චු සෝදිසි කර බලන්න මුලින් මං හිතාගෙන හිටියෙ නෑ" හෝම්ස් කීවේ සාක්කු ඔරලෝසුව ඇද වේලාව පරීක්ෂා කර බලමිනි. "නමුත් අපි දැනටමත් නීති නොසෑහෙන්න කඩලා. නීතිවිරෝධී ලෙස නිවසකට ඇතුළුවීම; ළමයෙකු පැහැරගෙන යාම; තව මොනවද? හො හෝ මේ තියෙන්නෙ. මේක මං හිතුවා වගේමයි."

මේස ලාච්චුවක තිබූ කඩදාසි ගොන්නක් හෝම්ස් මේසය මතට ගත්තේය. ගුඩ්රිච් මෙනෙවිය එතැනට හිස පොවද්දී මම ද එහි ළං වී බැලුවෙමි. කඩදාසි පුරා නැවත නැවතත් දක්නට ලැබුණේ මේබල් පැට්‍රීෂියා කැවෙන්ඩිෂ් නමින් යෙදූ අත්සන්ය. හෝම්ස් එම කඩදාසි නමා තම කබා සාක්කුවට දමා ගත්තේය.

"මේ අහන්න ගුඩ්රිච් මෙනෙවිය" හෝම්ස් කීවේ කාරුණික ස්වරයෙනි. "අපි දැන් වහාම මේ ගෙදරින් පිටවී යා යුතුයි. ඔබත් ඔබේ සොහොයුරාත් මේ අපායෙන් ගලවාගන්න පුළුවන්, මෙහෙන් ඉක්මනින් ගිය තරමටයි. ඉස්තාලය තියෙන්නෙ හුගක් ඈතද?"





"නැහැ. එච්චර දුරක් නැහැ" ඇය කීවාය.

"හතර දෙනෙකුට යන්න පුළුවන් අශ්ව කරත්තයක් අපට අවශ්‍යයි. අශ්වයෙකු ගැට ගහල අශ්ව කරත්තය දෙන්න කියල ඔබ ඉල්ලා සිටියොත්, ඉස්තාලයේ සේවකයා ඒක ඉටුකරාවි කියල ඔබ හිතනවද?"

"එහෙම කරාවි කියල මං හිතනවා"

"එහෙම නම් වහාම යන්න. ගිහින් ඒ විදියට අශ්ව කරත්තයක් සූදානම් කරගෙන, ගෙදර ඉස්සරහ දොරටුව ළඟට අරගෙන එන්න. කියන්න ඔබේ සොහොයුරාට බරපතළ ලෙස අසනීපයි. ඔහුව වහාම රෝහලකට ගෙන යාමට අවශ්‍ය බව වෛද්‍යවරයෙකු කියනවා කියල. මේ ඔක්කොම ඇත්ත. කිසිම බොරුවක් නෑ"

ඇය දොරටුව වෙත යද්දී හෝම්ස් ඇය ආපසු කැඳෙව්වේය. "ඔබ විසිත්ත කාමරයට නොගිහින්, මේ පැත්තෙන් ගියොත් ඔබේ ගමන වඩාත් පහසු වේවි, වඩාත් ඉක්මන් වේවි කියලයි මට හිතෙන්නෙ" කී මගේ මිත්‍රයා කන්තෝරු කාමරයේ වූ ප්‍රංශ මාදිලියේ විශාල ජනේලයක් විවෘත කළේය. දැරිය එතැනින් එළියට පැන දිව ගියාය.

"වොට්සන්. මැඳුරේ දොරටුව ළඟ සේවකයන් එක්රැස් වෙලා ඉන්න බව මට විශ්වාසයි. ඔවුන්ගෙන් ගැලවී මෙහෙන් පැන ගැනීම තමයි අපට මුහුණ දෙන්න වෙන මීළඟ අභියෝගය."

"ඔව්. මටත් ඔවුන්ගේ කෑකෝ ගැසීම් සහ අඩි ශබ්ද ඇහුණා. මොකක්ද ඔබ කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"වොට්සන්! ඉක්මන් කරන්න! දරුවාව ඔසවාගන්න. අපි පිටත් වෙමු!" හෝම්ස් කීවේ කලබලයෙනි.

ඔහු එසේ කියද්දීම මම දරුවා කරට ගෙන බ්ලැන්කෙට්ටුවෙන් ඔහු ඔතා ගතිමි. ඒ මොහොතේම ඔවුහු ඇතුළට කඩා වැදුණහ. ඒ හැම්ඩන් මන්දිරයේ සේවක පිරිසෙන් කොටසකි. සමහරුන් අතේ පොලු මුගුරුද තිබූ බැව් මම දුටුවෙමි. ඔවුන්ගෙන් සමහරු පැසුණු කෙස්වැටි සහිත වැඩිහිටි අය වූ අතර, දඩබ්බර පෙනුමක් තිබූ තරුණයෝද එහි සිටියහ.

"මහත්වරුනි. මං මෙහෙන් පිටවී යන්න කලින් ඔබ හැමදෙනා අමතන්නයි සිටියේ" හෝම්ස් කීවේ කිසිදු කැලඹීමක සලකුණු නොපෙන්වමිනි. "මට පුළුවන්ද ගෘහපාලක වෙස්ට්‍රෝට හා

ඔගස්ටා ට කථා කරන්න? ඔබ දෙදෙනාද? කරුණාකර ඉදිරියට එන්න. බොහොම හොඳයි. මට කියන්න තියෙන්නේ ඉතාම දීර්ඝ කතාවක්. නමුත් මං ඒක පුළුවන් තරම් කෙටියෙන් කියන්නම්.

ඔබ බොහොමයක් දෙනා ඉතා දීර්ඝ කාලයක් තිස්සේ මේ කැවෙන්ඩිෂ් පවුලට අවංකව සේවය කරන අය වෙන්න ඇති. කාලයක් ඔබේ ස්වාමිදූවව සිටි මේබල් මහත්මියත් මේ දරු දෙදෙනාත් ගුඩ්රිච් පවුලේ අය බව ඔබ අහල ඇති. බ්‍රිතාන්‍ය රජ පවුලේ සමීප ඥාතිවරයෙකු වන ඩැල්රිම්පල් සාමිවරයා ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට පැමිණිල්ලක් කළා. ඔහු ඔබේ ස්වාමියා වන කැවෙන්ඩිෂ් මහතාට විරුද්ධව බරපතළ චෝදනාවක් කර තිබෙනවා. අප මෙහේ ආවේ ඒ වෙනුවෙන්. මම ලන්ඩන් නගරයේ අපරාධ පරීක්ෂක වරයෙක්. මෙන්න මගේ හැඳින්වීමේ පත්‍රය. උවමනා කෙනෙක් ඉන්නවා නම් බලන්න පුළුවනි."

මෙසේ කී හෝම්ස් තම ආගන්තුක පත්‍රයක් ගෙන ප්‍රධාන ගෘහ සේවක වෙස්ට්‍රෝ් අත තැබුවේය.

"ඒ චෝදනාව මොකක්ද කියා මං වචනයෙන් කියන්න උවමනා නැහැ. ඔබේ ඇස්වලින්ම දැකගන්න පුළුවනි.

දොස්තර මහත්මයා. ඔබ බ්ලැන්කේට්ටුව ඉවත් කර දරුවාගේ ඇඟේ තිබෙන දරුණු තුවාල මේ මහත්වරුනට හා නෝනාවරුනට පෙන්වන්න."

කිහිප දෙනෙක් ඉදිරියට පැමිණ දරුවාගේ තුවාල දෙස නෙත් යොමු කළහ. දරුවාගේ තත්ත්වය තේරුම් ගෙන ඔවුන් අතිශය කම්පාවට පත්වූ බව තේරුම් ගතිමි.

"සැම අතකින්ම නිරෝගීව සිටි අවුරුදු දොළහක දරුවෙකුට අර ඇඩ්ලේඩ් නම් විකෘති මනසක් ඇති කෲර ගැහැනිය කර ඇති දේ බලන්න. ඔබ හැම දෙනෙකුම වගේ දරුවාගේ තත්ත්වය මේ තරම් බරපතළ බව නොදන්නා බව මට විශ්වාසයි. නමුත් එහෙම කියල ඔබට නීතියෙන් ගැලවීමක් නෑ.

මේ අසරණ දරුවාට මේ වගේ තුවාල ඇතිවුණේ කොහොමද කියල ඔබ කාට හරි කියන්න පුළුවන්ද?" හෝම්ස් විමසීය. එතැන තිබුණේ තරමක නිහඬතාවයකි. අනතුරුව තරුණ සේවකයෙක් තම අදහස ඉදිරිපත් කළේය.

"මේ පුංචි මහත්තයා මඩේ ලිස්සලා ගඟට වැටුණු බව අපට අහන්න ලැබුණා"





"මඩේ වැටුණත් ගඟට වැටුණත් මේ වගේ තුවාල ඇතිවෙන්න හේතුවක් නෑ" හෝම්ස් කීය. "මේකට හේතුව ඇඩිලේඩ් නම් සේවිකාව මේ දරුවාට එල්ල කළ ප්‍රහාරය. ඒ ඔබේ ස්වාමියාගෙ උපදෙස් පිට. ඒකට යොදාගත් ලී කෝටුව මං දෙකට කැඩුවා. ඒව ඔබට දකින්න පුළුවන් බරාඳයේ.

මගේ මේ මිත්‍රයා කලක් යුද්ධ හමුදාවේ සේවය කළ වෛද්‍යවරයෙක්. ලී වලින් පහර දීමෙන් ඇතිවුණු මේ වගේ තුවාල, ළමයින්ගේ තබා වැඩිහිටි සොල්දාදුවන්ගේ වත් ඔහු දැක නැහැලු"

"මේ දරුවා වේදනාවෙන් විලාප නගන හඬ මට අහන්න ලැබිල තියෙනවා" සේවිකාවක් කීවාය.

"මේ දරුවා මේ ගෙදර මියගියොත්, පොලීසිය ඔබ සැම දෙනෙකුම අත්අඩංගුවට ගන්නේ මිනීමැරීමේ චෝදනාව උඩ. කිහිප දෙනෙකු සිර භාරයට පත්වේවි, මිනීමැරීමට ආධාර හා අනුබල දීම මත. එයින් ඔබට ගැලවීමට හැකිවෙන්නේ ශ්‍රීමත් ට්‍රෙවෝ හම්ප්‍රීස් වැනි ලන්ඩනයේ ඉහළම පෙළේ අධිනීතිඥයන් අල්ලා ගැනීමට සහ ඔවුන්ගේ ඉහළ ගාස්තු ගෙවීමට හැකිනම් පමණයි."

හෝම්ස් මඳකට නිහඬ විය. සේවක සේවිකාවන් එකිනෙකා ඔවුනොවුන් සමග අදහස් හුවමාරු කරගත් ආකාරය අපට අසන්නට ලැබිණ. හෝම්ස් යළිත් කථාව ඇරඹිය.

"ඔබේ ස්වාමියා හැමිල්ටන් බොයිඩ් නම් අශ්වාරෝහකයාට කළ කෲර අපරාධය මුළු එංගලන්තය පුරාම ප්‍රසිද්ධයි. දැන් ඔබේ ස්වාමියා සූදානම් වෙන්නේ කෲර ලෙස වධ දී මේ දරුවා මරා දමන්න. ඔබ සමහර දෙනාට මේ වයසේ දරුවන් මුණුබුරන් ඇති.

මං ඔබෙන් ඉල්ලා සිටින්නේ එක් දෙයයි. බරපතළ ලෙස රෝගීව සිටින මේ දරුවා වහාම ආරෝග්‍ය ශාලාවකට ගෙන යාමට මට ඉඩ දෙන්න. ඔහු සමග ඔහුගේ සොයුරිය පැමිණෙන්නේ ඇගේ කැමැත්තෙන්. ඒ රෝහලට භාර දීමේදී ඔහුගේ සමීපතම ඥාතිවරිය වශයෙන්. මගේ මේ කටයුත්තට විරුද්ධව කවුරු හරි ඉන්නවද?"

කිසිවෙකු විරුද්ධ නොවූ බැව් පෙනිණ. වැඩිහිටි සේවිකාව වූ ඔගස්ටා ඒ බැව් අපට පැවසුවාය. දරුවා රෝහලට ගෙන යාමට අශ්වකරත්තය සූදානම් කරගෙන ඔලිවියා මෙනෙවිය ඉදිරි දොරටුව

අසල සිටින බවද ඔගස්ටා කියා සිටියාය. අපි වහාම නිවසින් පිටවීමට තීරණය කළෙමු.

අශ්ව කරත්තය ගොඩනැඟිල්ලේ කෙළවරටම පැමිණ තිබිණි. ඔලීවියා මෙනෙවිය එහි පිටුපස හිඳගෙන සිටියාය.

"චොටිසන් දරුවාත් රැගෙන ඔබ පිටුපසින් හිඳගන්න. රේන්ස් පටි මං මගේ අතට ගන්නම්" හෝම්ස් කීය.

"අපිම මේ අශ්ව කරත්තය පදවාගෙන යන්නම්" හෝම්ස් කීවේ අශ්ව කරත්තයේ රියැදුරාටයි. එයට එක්වරම කැමැති නොවූ ඔහු රථය අප අතට දීමට මැලි විය.

"මේ රථය අපි කැවෙන්ඩිෂ් මහත්මයාට ගෙදරටම ගෙනත් භාර දෙනවා. මේ ඔලීවියා මෙනෙවිය තමයි ඒක සහතික කරන්නේ" හෝම්ස් කීවේ ඔහුගේ අතින් රේන්ස් පටි ගනිමිනි. "මෙකා ඉතා අලංකාර අශ්වයෙක්. මොකක්ද මූගේ නම?"

"මහත්මයා උගේ නම කොටින්හෝල්"

"ආ අපූරු නමක් නෙ. අපි කොටින්හෝල්ව හොඳින් බලා ගන්නවා. ඊට පස්සේ ඔබට ආපසු භාරදෙනවා"

වෙස්ට්‍රෝ සහ ඔගස්ටා තදින්ම ඉල්ලා සිටි නිසා අන්තිමේදී රියැදුරා අශ්ව කරත්තය අපට භාරදී එතැනින් ඉවත්ව ගියේය. අපි වහා එතැනින් පිටත් වී ආවෙමු.

"දැන් අපි යන්නේ දුම්රියපොළට ද?" ගුඩ්රිච් මෙනෙවිය සිනා පිරුණු මුහුණකින් විමසුවේ තම සොහොයුරාගේ එක් අතක් අල්ලා ගෙනය.

"නැහැ" හෝම්ස් කීය. "මෙකෙ අප සොයා බැලිය යුතු තවත් කොටසක් තියෙනවා. ඒක සම්පූර්ණ කර නොගෙන අපට මෙහෙන් යන්න පිළිවෙළක් නෑ. දැන් අපි යන්නේ බ්ලැක්විච් මෝලට" හෝම්ස් කීවේ කරත්තය දක්කන අතර තම සාක්කුවේ තිබූ සිතියම දිග හරිමිනි.

## බ්ලැක්විච් මෝල

හැම්ඩන් මන්දිරයෙන් පිටවී අප ආපසු එන අතරේ විශාල ගස් වැවුණු කලාපයට ඒමට පෙර මම ආපසු හැරී බැලුවෙමි. හැම්ඩන් මැඳුරේ කාර්ය මණ්ඩලයේ විශාල පිරිසක් ඉදිරි දොර අසල රැස්වී බලා සිටි අයුරු මට දැකගන්නට ලැබිණ. අප දැන් කටයුතු කර





ඇත්තේ නීතියට එරෙහිවය. අප එහි පැටළී ඇත්තේ තියුණු කටු සහිත කටු පඳුරක පැටළෙන ආකාරයෙනි. කෙසේ වෙතත් වඩාත් සුදුසු මෙන්ම නිවැරදි මාර්ගය තීරණය කිරීමට හෝම්ස්ට තිබූ දක්ෂතාවය ගැන මගේ විශ්වාසයක් තිබිණ.

මංසන්ධියකට පැමිණි පසු අශ්ව කරත්තය මඳකට නැවැත්වූ හෝම්ස් තම කබා සාක්කුවෙන් සිතියම ඉවතට ගෙන එය පරීක්ෂා කළේය. මේ වනවිට අහස කළු වලාකුළින් බරවී තිබූ අතර මහ වැස්සක් ඉක්මනින් කඩා හැළෙන ලකුණු පහළ විය.

එක් ක්ෂණයකින් තීරණයක් ගත් හෝම්ස් රිය හැරවූයේ දකුණු පැත්තෙන් තිබූ අතුරු පාරටය. අප එම පාරේ ඉදිරියට යද්දී මහ වැසි ඇද හැළෙන්නට පටන් ගත්තේය. ඒ සමගම දැනුණේ දැඩි ශීතලකි. තුනී ගවොමකින් පමණක් සැරසී සිටි ගුඩ්රිච් මෙනෙවිය වෙව්ලීමට පටන් ගත්තාය. මගේ දණ හිස් මත සිටි කුඩා කෙනත්ට මේ වනවිට යම් තරමක සුවයක් ලැබී තිබිණි. ළමුන් දෙදෙනා එකට ළංකොට බ්ලැන්කේට්ටුවෙන් දෙදෙනාම වසා දැමූ විට ඔවුනට ශීතලෙන් යම් ආවරණයක් ලැබිණි.

"හෝම්ස් මහත්මයා. මං ප්‍රශ්නයක් අහන්නද?" මෙතෙක් වේලා නිහඬව සිටි ඔලීවියා විමසුවාය.

"ඔව්. ඔබ කැමති ඕනෑම දෙයක් අහන්න"

"මාමා, මේබල් නැන්දාගේ නම කඩදාසි ගණනාවක නැවත නැවතත් ලියා තිබුණා නේ. ඒ ඇයි?"

"කිසි සැකයක් නෑ. ඔබේ නැන්දාගේ අත්සන හොරට යොදන්න මාමා පුරුදු වෙලා"

"ඒ මොකටද?"

"කෙනත් සහ ඔබ සම්බන්ධයෙන් කාරණා වලදී, මාමා සහ නැන්දා දෙදෙනාගේම අත්සන් යෙදීමට නීතිමය අවශ්‍යතාවයක් ඇති. නමුත් ඇය මෙහේ නැති නිසා, ඇගේ අත්සන මාමා හොරට යෙදුවා කියා හිතන්න පුළුවනි"

"මගෙත් මල්ලීගෙත් වියදම් සඳහා තාත්තා සුළු මුදලක් වෙන් කර ඇති බව මට අහන්න ලැබුණා"

"ඒ මුදල් ප්‍රමාණය ඔබ හිතාගෙන ඉන්නවාට වඩා හුඟක් විශාලයි" හෝම්ස් කීය. "ඔබේ තාත්තාගේ බූදලයේ කටයුතු බලා ගන්නේ ලන්ඩනයේ ක්‍රිස්ටෝෆර් මේනාඩ් සහ සමාගම. මං

බලාපොරොත්තු වෙනවා හෙට ඔවුන් හමුවීමට යන්න. ඔබේ මේබල් නැන්දා තවදුරටත් හැම්ඩන් මන්දිරයේ නොමැති බව ඔවුන් දන්නේ නැහැ කියලයි මට හිතෙන්නේ.

ගුඩ්රිච් මෙනෙවිය. දැන් මං කැමතියි ඔබෙන් ප්‍රශ්නයක් අහන්න. ඔබේ ගුරුතුමා මෙහේ ගෙදරින් පිටවී ගිය දවසේ ඔහු යන්න ගිය ආකාරයට ඔබට මතකද?"

"ඔව්. ඔහු දුම්රියපොළට යෑමට ගෙදරින් ගියේ මේ අශ්ව කරත්තයේ නැගිලා. මං උඩ තට්ටුවේ ජනේලයකින් බලාගෙන හිටියේ"

"අශ්ව කරත්තය පැදෙව්වේ සාමාන්‍ය රියැදුරාමද?"

"නැහැ. කපිතාන් ක්‍රෝලි තමයි රිය පැදෙව්වේ"

"හොඳයි. අර කැලෑබද පෙදෙසට උඩින් පෙනෙන්නෙ බ්ලැක්විච් මෝලද?"

"හරියට හරි. ඒක තමා" ඇරිය කිවාය. "මේ පාර දිගටම යනවා ගඟ ළඟටම. ඊට පස්සෙ පාර හැරිලා මෝල පහු කරගෙන බ්ලැක්විච් ගම්මානයට යනවා"

"මේ ඉන්නෙ මේ හරියෙත් පාත්තයින් දහස් ගණනින්" මම කීවෙමි.

දැන් අප ගමන් කළ පාර දෙපස වූ වගාබිම් සියල්ල ජලයෙන් පිරී තිබිණ. මෙම ගංවතුර මත ඇවිදිමින් පියාඹමින් ගොදුරු සෙවූ වල් පාත්තයින් හා වලිකුකුළන් දස දහස් ගණනක් අපි දුටුවෙමු. පක්ෂීහු උන්ගේ "ගුමු ගුමු" නාදය නොනවත්වාම නැංවූහ.

"මට පුදුම මේ කරත්තෙ සද්දෙට උන් අහසට පියෑඹුවේ නැති එක" මම කීවෙමි.

"ඔය කියන කොටම පියාඹන්නෙ" හෝම්ස් කීය. මුලින් තුන් හතර දෙනෙක් ඉන්පසු දහ දොළොස් දෙනෙක් ඉන්පසු සිය ගණනින් අහසට නැඟුණහ.

"කුරුල්ලන් මේ විදියට ගුවන්ගත වීමෙන් එක ප්‍රශ්නයක් ඇතිවෙනවා" හෝම්ස් කීය. "අශ්ව කරත්තයක් එන බව ඈත තියාම කාට හරි තේරුම් ගන්න පුළුවනි."

තවත් මිනිත්තු කිහිපයක් ගත වෙද්දී අපි ගංගාව වෙත ළඟාවූයෙමු. මෑතදී තිබූ වර්ෂා සමය නිසාදෝ, ගඟ දුඹුරු පැහැති දියෙන් පිරී තිබූ අතර, දිය පහර වේගයෙන් ගලා බැස්සේය.





ගං ඉවුරේ ගමන් කළ අපට මීළඟට යෑමට සිදුවූයේ වන රොදක් මැදිනි. අනතුරුව අපට එක්වරම දකින්නට ලැබුණේ, අප යෝධ ගොඩනැගිල්ලක් සමීපයට පැමිණ ඇති බවය.

මෙම දැවැන්ත ගොඩනැගිල්ල එක් කෙළවරක සිට අනෙකට යාර හැටක් පමණ විය. එය තට්ටු තුනකින් සමන්විත විය. එකල එය අලංකාර ගොඩනැගිල්ලක් වන්නට ඇත. නමුත් දැන් නම් එය දිස්වූයේ ඈත අතීතයේ ඉදි කිරීමක නෂ්ඨාවශේෂ ලෙසය. වහලෙන් භාගයක පමණ උළුකැට නොවීය. ජනේල විශාල ප්‍රමාණයක් කැඩීගොස් එම තැන් විවෘතව තිබිණි. ගොඩනැගිල්ලේ දකුණු අර්ධය මුළුමනින්ම වාගේ විනාශයට ගොස් තිබූ අයුරු අපි දුටුවෙමු. එහි වහලක් නොවූ අතර, පිටතට දිස්වූයේ ඇවි කළු පැහැ ගැන්වුණු බාල්ක හා යට ලී වල නටබුන්ය.

මේ වේලාව වනවිට ඔලිවියාගේ සොහොයුරා - කෙනත්ගේ තත්ත්වය වඩාත් සුව අතට හැරී තිබිණි. ඔහු තවමත් නිහඬවම සිටියේ තම අක්කාගේ අතක් තදින් බදාගත් ගමන් ම ය. අශ්ව කරත්තයෙන් බැසීමට මම ඔවුනට උදව් කළෙමි. අප රියෙන් බැස්සා පමණි. ගොඩනැගිල්ලේ බිම් මහලේ වසා තිබූ කාමරයක දොරක් එක්වරම විවෘත විය. එයින් එළියට ආවේ ඉතාමත් අපිරිසිදු එමෙන්ම යක්ෂණියකගේ පෙනුමක් තිබූ ගැහැනියකි. ඇය දුටු වහාම ලාබාල කෙනත්ට කැගැසුණු අතර, ඔහු දැතින්ම මා බදා ගත්තේය.

"ඒ තමයි ඩේසි බාට්ලට්; ඇඩ්ලේඩ්ගෙ නංගි" ඔලිවියා කීවාය. "මේ ගෑනිට බාගෙට පිස්සු කියලා අපේ සේවකයින් කියනවා."

දොර විවෘත කොට මිදුලට බට ඇය විමතියෙන් අප දෙස බලා සිටියාය. එහෙත් කාරණා වහා තේරුම් ගත් හෝම්ස් ඉක්මනින් ක්‍රියාත්මක විය.

"මේක ගොඩනැගිල්ලට ඇතුළුවෙන ප්‍රධාන දොරටුව බවට සැකයක් නෑ" හෝම්ස් කීය. "ඔය ගෑනි දොර වහල ඇතුළෙන් යතුරු දමා ගත්තොත් අපේ වැඩ කටයුතු එච්චර පහසු වෙන්නෙ නෑ" කී ඔහු රේන්ස් පටි අත්හැර ඇය සිටි තැනට වේගයෙන් දිව ගියේය. ඇක නුපුරුදු පුද්ගලයකු තමා වෙත එන ආකාරයෙන් ඇය බියට පත්වන්නට ඇත. වහා කාමරයට ඇතුළු වූ ඇය දොර වසා දැමීමට උත්සාහ කළාය. එහෙත් ඊට පෙර තම සපත්තුව උළුවස්ස මත තබා ඇගේ උත්සාහය වැළැක්වීමට ඔහු සමත් විය. නමුත්

ඇය උත්සාහ කළේ කෙසේ හෝ දොර වසා දැමීමටයි. මම මගේ මිත්‍රයාගේ සහායට ගියෙමි. ඇය තම උත්සාහය අත්හැර දමා පැන දුවද්දී දොර විවෘත වී ඇතුළට කඩා වැදිණි.

"වොට්සන්. වහාම ඔය යතුරු අතට ගන්න. නැත්නම් අපව මේක ඇතුළෙ දාලා මේ පිස්සි යතුරු දාන්න ඉඩ තියෙනවා"

ඒ මොහොතේ දිගු ලීයක් ඔසවා ගෙන ඇය එතැනට කඩා වැදුණේ අපට පහරදීමටයි. නමුත් ඇගේ අතේ තිබූ ලීය උදුරා ගැනීමට මගේ මිත්‍රයා සමත් විය. ඔහු එය තම දණහිසට තබා කැලි දෙකකට කඩා එක් කැබැල්ලක් ළඟ තබාගෙන අනෙක මා අතට දුන්නේය. ඉන්පසු ඇය ගොඩනැගිල්ලේ අන්ධකාරය තුළ අතුරුදන් වූවාය.

"මේ යක්ෂණී අපව මේක ඇතුළට දාල ගිනි තියාවිද දන්නෙ නෑ වොට්සන්. කොයි එකටත් එළියට පනින්න සූදානමෙන් ඉමු" හෝම්ස් කීය.

"මොකක් කරන්නද ඔබ සූදානම් වෙන්නෙ?" මම මිත්‍රයාගෙන් ඇසීමි. "මම ළමයි දෙන්නත් එක්ක එළියෙන් ඉන්නද? මේක ගරා වැටුණු හොල්මන් මන්දිරයක් වගේ. හැමතැනම ලෑලි දිරලා. කොහෙන් කඩා වැටේවිද දන්නෙ නෑ"

"ඔබ ළමයින් දෙදෙනා එක්ක එළියේ තනියෙන් ඉඳීමත් ආරක්ෂා සහිත නෑ. ළමයින් අරගෙන ඇතුළට එන්න"

"ඒ මොකටද?"

"මෙතැනත් සෝදිසි කර බැලුවෙ නැත්නම්, අපේ පරීක්ෂණය සම්පූර්ණ වෙන්නෙ නෑ. මේ හරියෙ නම් කුණු ගොඩවල් ඇරෙන්න වෙන මොකුත් නෑ. උඩට නැගල බැලුවොත් හොඳයි කියලයි මට හිතෙන්නෙ" හෝම්ස් කීවේ දිරාගිය පෙනුමක් තිබූ ලීයෙන් සෑදූ පියගැට පෙළක් පෙන්වමිනි. එහි අයින්වල තිබිය යුතු ආරක්ෂක අත්වැල් දිරායාම නිසා කැඩීගොස් තිබිණ.

මගේ මිත්‍රයාට ඉදිරියෙන් යාමට ඉඩදී මම මඳක් පසුපසින් ගියෙමි. දරු දෙදෙනා මගේ කබායේ එල්ලී සිටියහ. දෙවැනි තට්ටුව තිබුණේ ද තරමක අඳුරකය. හෝම්ස් එහි තිබූ දොරක් විවෘත කළේය. එවිට අප පිවිසියේ විශාල ශාලාවකටයි. එහි ජනේල කැඩීගොස් තිබුණෙන් ඇතුළට ආලෝකය ලැබිණ. ගංගාව ගලා බස්සේ ගොඩනැගිල්ල ළඟින්ම බැව් විවෘත ජනේලයෙන් අපි දුටුවෙමු.





"මේකෙත් කිසිවක් නෑ" හෝම්ස් කීය. "නමුත් අර ගෑනි මේකෙ පදිංචි වෙලා ඉන්න එකෙන් තේරෙන්නෙ, මං හොයන දේ මේකෙ තිබෙන බවයි. අහා! ඊළඟ තරප්පු පේළිය ළඟදි පාවිච්චි කළ බවට සලකුණු තියෙනවා. අපි ඊළඟ තට්ටුවට නැගල බලමු"

යළිත් වරක් ඔහු පිටුපස ඊළඟ තට්ටුවට නැගුණෙමු. සමහර පඩි තදින්ම දිරා ගොස් තිබූ නිසා ඒවාට නැගීම අවදානම් කටයුත්තක් විය.

එම තට්ටුවේ තිබුණේද අපිරිසිදුකම හා තෙතමනය නිසා නැගුණු දුර්ගන්ධයයි. පෙර තට්ටු වල විලසින් මෙහිද බිමට යොදා තිබූ ලෑලි, වේයන් හා කාවුන් විසින් කා දැමීමෙන් දිරා ගොස් තිබිණ. එහි ශාලාවේ වසා තිබූ දොරක් අසල බිම නිතර ආ ගිය බවට සලකුණු දක්නට ලැබිණ. හෝම්ස් එය විවෘත කිරීමට උත්සාහ කළද එය යතුරු දමා තිබිණ.

"මේකෙ යතුර ඇත්තෙ අර ගෑනි ළඟ වෙන්න ඇති. ළමයි දෙන්නා ටිකක් ඈතින් තියාගන්න වොට්සන්" කිව් මගේ මිත්‍රයා දොරේ අගුළට දෙවරක්ම බූට් සපත්තුව දැමූ පයින් වේගවත් පහරවල් එල්ල කළේය. තුන්වැනි වාරයේ දී අගුළ කැඩී ගොස් දොර විවෘත විණි. ඒ සමගම ඇතුළතින් අසන්නට ලැබුණේ කෑගැසීමක් වැනි ශබ්දයකි. එහි තිබූ අසාමාන්‍ය හඬ නිසා, එය මනුෂ්‍යයෙකුගේ ද සතෙකුගේ ද යන්න මට සිතා ගැනීම අපහසු විය. මිත්‍රයා පසුපස ඇතුළට ගිය අපට දක්නට ලැබුණේ සිත් කම්පා කරවන දර්ශනයකි.

එය ප්‍රමාණයෙන් විශාල කාමරයක් විය. එහි වම් පැත්තේ ජනේල රැසක් වූ අතර ඒවායින් දැකගත හැකිවූයේ ගංගාවය. දකුණු පැත්තේ බිත්තියේ කැඩී ගිය ජනේල හරහා වනරොද දක්නට ලැබිණ. මුළු කාමරය පුරාම විසිරී තිබූ කුණු කසළ හා දූවිලි වලින් දුගඳක් හමා ගියේය. එහෙත් අපගේ අවධානය යොමු වූයේ කාමරයේ එක් පැත්තක වූ මේසය, පුටුව හා ඇඳ වෙතය. පරණ ගෝනිවලින් සැකසූ රළු ඇඳ අසලම දිරාගිය මේසයක් හා පුටුවක් තිබිණ. නිල් පැහැති ඇඳුමකින් සැරසුණු කාන්තාවක් ඒ පුටුවේ හිඳගෙන සිටියාය!

අප එහි ඇතුළු වෙද්දී ඇය තම අසුනෙන් නැගිට්ටාය. ඇටසැකිල්ලක් මෙන් කෙට්ටු වී සිටියත්, ඇය වැදගත් පෙනුමක් තිබූ වයස තිස්පහක පමණ කාන්තාවක බැව් දුටුවෙමි. ඇගේ

මුහුණ හා ඇඳුම් ඉතා අපවිත්‍ර වූ අතර කොණ්ඩය අවුල් වී තිබිණි. මොහොතක් ඇසිපිය නොහෙළා ඇය දෙස බලා සිටි ඔලිවියා ඊළඟ මොහොතේ මා අතහැර කාන්තාව දෙසට දිව ගියාය. ඒ "මේබල් නැන්දා!" යයි හඬ නගමිනි. මගේ කබායේ මුහුණ සඟවා ගෙන සිටි කෙනත් හිස හරවා ඒ දෙස බැලීය. ඔහුද ඇය දෙසට දිව ගියේ "නැන්දා!" යයි සතුටින් කෑගසමිනි.

"කවුද මේ මහත්වරු" යයි විමසමින් සැකයෙන් අප දෙස බැලූ කාන්තාව දැතින්ම දරුවන් දෙදෙනා බදා ගත්තාය.

"මේ හෝම්ස් මහත්තයයි වොට්සන් මහත්මයයි." දැරිය කීවාය. "එයාල ඇවිත් ඉන්නේ අපිව බේරගන්න"

"ඔය ඇත්තද?" කාන්තාව ඇසුවාය. "මට මේක විශ්වාස කරන්නත් අමාරුයි"

"ඔලිවියා කියූ දේ ඇත්ත තමා" හෝම්ස් කීය. "නමුත් අද උදේ ලන්ඩන් නගරයෙන් පිටවෙලා එද්දි නම් මෙහෙම තත්ත්වයක් අපි බලාපොරොත්තු වුණේ නෑ. කොහොම නමුත් දැන් අපේ එකම අරමුණ ඔබත් බේරාගෙන මේ පළාතෙන් පිටවී යාමයි"

"එහෙම නම් මෙන්න මේවට මොනවා හරි කරන්න ඔබට සිද්දවෙනවා" ඇය කීවේ එක් කකුලක වළලු කරට දමා තිබූ යකඩ විලංගුවක් පෙන්වමිනි. එය යකඩ දම්වැලකින් බිත්තියේ සවිකළ යකඩ වළල්ලකට සම්බන්ධ කර තිබිණි.

"මේවා කාගේ වැඩද කියා ඔබට තේරුම් ගන්න පුළුවන් ඇති. ඒ ගැන මට සැකයක් නෑ" කාන්තාව කීවාය. "ඔව්. මේවා මගේ ආදරණීය ස්වාමිපුරුෂයාගේ වැඩ තමා. මරා දමන්න ඉන්න කකුල් කැඩුණු ඔහුගේ අශ්වයෙකුටවත්, ඔහු මේ විදියට සලකන්නෙ නෑ. ඔහුට උවමනා වුණේ මට පැනල යන්න බැරි විදියට, විශ්වාසෙටම මාව හිරකරල තියන්න. නමුත් මේ විලංගු වලින් මගේ ජීවිතේ බේරුණා කියල මං කිව්වොත් ඔබට පුදුම හිතේවි. ජනේලයකින් පහළට පැනලා මේ දුක්ඛිත ජීවිතයේ අවසානයක් කරගන්න මට හිතුණු වාර අනන්තයි. ඔබ වගේ අය මා වෙත එවන්න තරම් දෙවියන් වහන්සේ කාරුණික වේවි කියල මං හිතුවේ නෑ."

"ෂඃ ෂඃ එහෙම දෙයක් හිතන්නවත් එපා" හෝම්ස් කීය. "මේවට යතුරු පහළ තට්ටුවේ ඉන්න උමතු ගැහැනිය ළඟ ඇති නේද?"

"ඔව්. ඇය ළඟ තමා යතුරු තියෙන්නෙ"





"මං ඉක්මනට එන්නම්" කී හෝම්ස් පහළ තට්ටුවට බැස ගියේය. මිනිත්තු දහයක් ගත වීමට පෙර ඔහු ආපසු පැමිණියේය. අවශ්‍ය යතුරු ඔහු අතේ නොතිබිණි. ඒ වෙනුවට ඔහු ගෙනැවිත් තිබුණේ විලංගු බිඳ දැමිය හැකි ආයුධ කිහිපයකි.

"මං හැම තැනකම හෙව්වා. නමුත් ඒ ගෑනිව හොයා ගන්න බැරිවුණා. මං හිතන්නේ හැංගිලා වෙන්න ඇති. මේවට යතුරුවත් පේන හරියක තිබුණෙ නෑ. නමුත් ජල රෝද ක්‍රියාත්මක කරන කාමරයෙ තිබිලා මට ප්‍රයෝජනවත් විය හැකි බඩු ටිකක් හම්බවුණා" ඔහු කීවේ තමා රැගෙන ආ බර මිටියක්, නියන් දෙකක්, කටර්-අඬු සහ තවත් උපකරණ කිහිපයක් පෙන්වමිනි.

"වොට්සන්. තරහ නැතුව ලී කොට කෑලි දෙකක් ඉක්මනට හොයා ගෙන එන්න."

විලංගුවල අගුළු ක්‍රියාත්මක වන කොටස ලී කොට මත තබා, ඒ උඩට නියන් තබා හෝම්ස් මිටියෙන් පහර කිහිපයක් එල්ල කළේය. විලංගු කම්පනය වෙද්දී දැනුණු වේදනාව, කාන්තාව අපහසුවෙන් විඳ දරාගත් බැව් අපි දුටුවෙමු. පැය කාලක් පමණ ගතවෙද්දී ඇය නිදහස් කර ගැනීමට අපට හැකි විය.

"දැන් ඉතින් අපේ සටන තියෙන්නේ කාලය සමග" මගේ මිත්‍රයා කීවේ සාක්කු ඔරලෝසුව පරීක්ෂා කරමිනි.

"කැවෙන්ඩිෂ් මහත්මයා අශ්ව රේස්වලට ඉදිරිපත් කළ අශ්වයින් ජය ගත්තොත් අපටත් හොඳයි. ඒ මොකද ඔහු ඉක්මනින් ආපහු එන එකක් නෑ. ක්‍රීඩාගාරයේදී හා සමාජ ශාලාවේදී සාද පවත්වලා ජයපැන් බීලා ආපහු එන්න පිටත්වෙද්දී රෑ වේවි. සාමාන්‍ය සිරිත ඒක නේ. නමුත් ඔහුගේ අශ්වයින් පරාජය වුණොත් ඔහු ඉක්මනින්ම ආපහු හැරෙන්න ඉඩ තියෙනවා. එහෙම වුණොත් අපේ ආපසු ගමනට ප්‍රශ්නට ඇතිවෙන්න පුළුවනි"

"ඔහුගේ අශ්වයිනට ජය ලැබෙන්න කියල ප්‍රාර්ථනා කරමු" මම කීවෙමි. "කොහොම වුණත් අපි වහාම පිටත්වෙමු"

"මේබල් මෙනෙවිය" හෝම්ස් කීය. "මං දන්නවා ඔබට කීමට දීර්ඝ කතන්දරයක් ඇති බව. ඒක අපි අත්‍යවශ්‍යයෙන්ම දැනගත යුතුයි. ඔබට ප්‍රශ්න ඉදිරිපත් කරමින් විස්තර සහිතව දැනගත යුතුයි. ඒ නිසා මේ තිබෙන කලබලේ එයට කන්දීමට මා කැමති නෑ. නමුත් මේ හදිසියේ මා අත්‍යවශ්‍යයෙන්ම දැනගත යුතු

කරුණක් තිබෙනවා. රයින්හාට් ගුරුතුමාට අත්වුණු ඉරණම ගැන ඔබ කිසිවක් දන්නවද?"

"රයින්හාට් මහතාට?" ඇය විමසුවේ පුදුමයෙනි. "ඇයි මොනවද ඔහුට සිදුවෙලා තියෙන්නෙ?"

"කිසිම සලකුණක් ඉතිරි නොකර ඔහු සම්පූර්ණයෙන්ම අතුරුදන් වෙලා." හෝම්ස් කීය. "ඔබ විදියටම ඔහුත් මේ ගෙදර සිරකාරයෙකු හැටියට ඉන්නවද? එහෙම නම් ඔහු බේරාගැනීමට මේ මොහොතෙම අපි සම්පූර්ණ උත්සාහය යොදන්න ඕන"

ජෙරෝම් කැවෙන්ඩිෂ් හා ගුරුතුමා අතර සණ්ඩුවක් ඇතිවූ අයුරුත් ඔලිවියා මෙනෙවියට අහම්බෙන් එය අසන්නට ලැබුණු අයුරුත් හෝම්ස් විස්තර කළේය.

"මෙහේ වෙන කිසි කෙනෙක් හිර කරල ඉන්නවා කියල මං හිතන්නෙ නෑ" මේබල් මහත්මිය කීවාය. "ඒ මොකද කිසිම මනුස්සයෙකු වේදනාවෙන් හෝ කලකිරීමෙන් කෑගහන හෝ කථාකරන ශබ්දයක් පහුගිය කාලෙ කවදාවත් මට ඇහිල නෑ. මහත්මයා ඔබ සෑම තට්ටුවකටම ගියානේ. වසා තිබුණු කාමර කිසිවක් ඔබට දකින්න ලැබුණද? නැහැනේ. ඒ වුණත් කාලය ගත වුණත් කමක් නෑ. ඒ කාරුණික පුද්ගලයා ගැන ඔබ සොයා බැලිය යුතුයි. මේ සණ්ඩුව සිදුවුණේ කොයි කාලෙ කියලද ඔබ කිව්වෙ?"

"පහුගිය වසන්ත ඍතුවේ"

"වසන්ත ඍතුවේ නේද?" මේබල් මහත්මිය විමසුවේ කල්පනාකාරී වෙමිනි. "මං හිතන්නේ ඒ ගැන ඔබට යමක් කියන්න මට හැකිවේවි.

අර දොරට එහා පැත්තෙ බිත්තිය අයිනෙ ලෑලිවලින් ඉදිකළ වේදිකාවක් තියෙනවා. ඒකට සම්බන්ධව එළියෙන් පියගැට පෙළක් තියෙනවා, පොළොවේ ඉඳල උඩම තට්ටුවට. එක දවසක් හැන්දෑවෙ බාගෙට කළුවර වැටුණු වෙලාවෙ කවුදෝ ඔය පියගැට පෙළ දිගේ ඉහළ නැගල, කැඩුණු ජනේලය හරහා මේ පැත්ත බැලුවා. මං හුඟක් බයවුණා. ඒ මොකද ඒ වෙලාවෙ තිබුණු අඳුර නිසා, මට ඒ කවුද කියල අඳුනගන්න බැරිවුණා. මට එක්වරම හිතුණෙ ඒ බ්ලැක්වීච් ගමේ මිනිහෙක් වෙන්න ඇති කියලයි. ඔහු ජනේලය හරහා ඇතුළට පනීවි කියන භය නිසා මං නොසෙල්වී





සිටියා. මේක ඇතුළෙ තිබුණු අන්ධකාරය නිසා ඔහුට කිසිවක් පෙනෙන්න නැහැ. වේදිකාව මතට ඇවිත් ඔහු අර දොර අරින්නත් උත්සාහ කළා. ඇතුළෙන් දොරට සොයිබ දමා වසා ඇති නිසා ඒක හරිගියෙත් නෑ. ඊළඟට තිබුණේ නිහඬතාවයක්.

මේ රයින්හාට් මහත්මයා විය යුතුයි කියන සැකය මගේ හිතේ ඇතිවුණේ මිනිත්තුවකට දෙකකට පස්සේ. එතකොට මං ඔහුගේ නම කියා කෑගැහුවා. නමුත් එතකොට ප්‍රමාද වැඩි වෙන්න ඇති. ආව පුද්ගලයා තරප්පු බැස යන ශබ්දය මට ඇහුණා. ඔහු මේ ගැන කාට හරි කියලා යමක් සිදුවේවි කියන බලාපොරොත්තුවෙන් මං දවස් ගණනක් බලාගෙන හිටියා. නමුත් කිසිවක් සිදුවුණේ නෑ. සිරකාරියක ලෙස මං මෙහේ සිටි බව ඔහුට වැටහෙන්න නෑ"

"මොකක් හරි හේතුවක් නිසා රයින්හාට් ගුරුතුමාගේ කුතුහලය ඇවිස්සෙන්න ඇති" හෝම්ස් කීය. "හැමදාමත් ඔබට පක්ෂපාත ඔගස්ටා, වෙස්ට්‍රෝ වගේ සේවක සේවිකාවන් තවමත් හැම්ඩන් මන්දිරයේ ඉන්නවා. ඔවුන් කවුරු හරි ගුරුතුමාට රහසිගතව යමක් කියුවා වෙන්නත් පුළුවනි. ඒ කුමක් වුණත් මට හිතෙනවා ඔහු ඔබව හඳුනාගන්න ඇති කියලා. ඒකයි ඔහු ඔබේ ස්වාමි පුරුෂයා සමග බහින්බස් වීමක් වුණේ. වැරැදි දේ පෙන්වන්න බැරි හැමදාමත් යුක්තිය වෙනුවෙන් සටන් කරන අවංක අය මේ ලෝකෙ ඉන්නවා. නමුත් ඔවුන් දන්නෙ නැති දෙයක් මේ ලෝකෙ තියෙනවා. ඒ තමයි භයානක දුෂ්ඨයන්ට ඔවුන්ගේ වැරැදි පෙන්වා දී ඒවා නිවැරැදි කිරීමට යාමෙන්, ජීවිතයෙන් වන්දි ගෙවන්නට වෙන්නේ තමන්ට බව. එහෙම නම් අපි වහාම පිටත්වෙමු"

ශාරීරිකව දුර්වලව සිටි මේබල් මහත්මිය පහළට කැඳවාගෙන ඒමට අපට තරමක වේලාවක් ගත වන බැව් අපි දැන සිටියෙමු. ළාබාල කෙනත් ගුඩ්රිච් ගැනද අපි වැඩි අවධානයක් යොමු කළ යුතු විය.

"මොකක්ද ඒ ශබ්දෙ?" හෝම්ස් විමසීය. "ඒ කුරුල්ලන් දහස් ගණනක් අත්තටු ගහන ශබ්දෙ. මොකක් හරි දේකින් උන් කලබල වෙලා. බලන්න වොට්සන්" මගේ මිත්‍රයා කීවේ මේබල් මහත්මියගේ අතින් අල්ලාගෙන ඇයට ඉදිරියට පා නැගීමට උදව් කරමිනි.

"මට නම් මොකුත් පෙනෙන්න නෑ" මා කීවේ ජනේලයෙන් එබී බලමිනි. "මොකක් හරි දේකින් උන් කලබල වෙලා බව ඇත්තයි.

නමුත් ගස් නිසා කිසි දෙයක් පෙනෙන්නෙ නෑ. ඔහොම ඉන්න! දෙවියනේ! අශ්ව කරත්තයක් එනවා! ඒ කැවෙන්ඩිෂ් තමා!" මට කෑගැසිණ.

"දැන් මොකක්ද කරන්නේ? අපි බලමු පිටතින් තියෙන පිටගැට පෙළෙන් යන්න පුළුවන්ද කියලා" හෝම්ස් කීවේ ඈතින් පිහිටි බිත්තියේ වූ දොර දෙසට දිව යමිනි. එහි සොයිබ එළියට ඇද ඒ දොර විවෘත කර ගැනීමට ඔහුට එතරම් වේලාවක් ගත නොවීය. මම ද වහා එතැනට ගොස් බැලුවෙමි. දොර අසලම පිටතින් තිබුණේ ලීයෙන් තැනූ කුඩා වේදිකාවකි. එහෙත් එහි ඇව දිරාගොස් පතුරු ගැලවුණු ඒවා බැව් පෙනිණ. එයට සම්බන්ධව මහ පොළොව දක්වා තිබූ පියගැට පෙළ ද ඉතා දුර්වල තත්ත්වයක තිබිණ.

"මේකෙ ගමන බොහොම අවදානම් එකක්. එහෙම නේද වොට්සන්?"

"ඇත්තෙන්ම ඔව්. අපට නම් උත්සාහ කර බලන්න තිබුණා. නමුත් මේබල් මහත්මිය සහ දරුවන් කැඳවාගෙන යන්න මේක කොහොමටවත් සුදුසු නෑ"

"එහෙනම් මොනවා කරන්නද? එන හැටියකට මුහුණ දෙමු" මගේ මිත්‍රයා කීය.

කිසිවෙකු තරප්පු පෙළේ ඉහළට නගින හඬ මුලින් ඇසිණ. මීළඟට එය නැවතුණු අතර ඉන්පසු ඇසුණේ පිරිමියෙකු කෝපාවිෂ්ඨව කළ කෑගැසීමකි.

"මෝඩ ගෑනි. අහකට වෙයං. මට යන්න දීපං" ඔහු කෑගසනු ඇසිණ. ඒ සමගම අසන්නට ලැබුණේ කිසිවෙකු භීතියෙන් නැගූ විලාපයක් හා පහළ තට්ටුවට බරින් වැඩි යමක් ඇද වැටුණු ශබ්දයයි. එය අවසන් වූයේ මර ළතෝනියකිනි.

මොහොතකින් ජෙරෝම් කැවෙන්ඩිෂ් අප සිටි තැනට කඩා වැදුණේ කපිතාන් ක්‍රෝලි සහ ඇම්බ්‍රෝස් මෙනෙවිය සමගය. කැවෙන්ඩිෂ් දුටු වහාම ළමෝ භීතියෙන් හඬ නැගූහ. ඔවුහු මේබල් මහත්මිය බදාගෙන තම මුහුණු සඟවා ගත්හ.

උසින් අඩි හයක් පමණ වූ කැවෙන්ඩිෂ්ට තිබුණේ, මල්ලව පොර ශූරයෙකුගේ වැනි හැඩිදැඩි ශරීරයකි. දරුණු පෙනුමක් තිබූ මුගුරක් අතින් ගෙන සිටි ඔහු කෝපයෙන් වෙව්ළමින් සිටියේය.





"මට අයිති ගෙවල්වලට නීති විරෝධීව ඇතුළු වෙලා මගේ පෞද්ගලික කාරණා වලට ඇඟිලි ගහන්න ආව තොපි කවුද?" ඔහු ගිගිරුවේ කෝපාවිෂ්ඨ හඬෙනි. "මං දන්නවා තෝ කවුද කියලා. අනුන්ගේ දේට ඇඟිලි ගහන කාලකණ්ණි තක්කඩියා. අද තමයි උඹ පාඩමක් ඉගෙන ගන්නේ. නමුත් ඒක උඹේ අන්තිම පාඩමත් වේවි" මෙසේ කී කැවෙන්ඩිෂ් අතේ තිබූ මුගුරේ කෙළවර විවෘත කොට එළියට ඇද ගත්තේ දිගු තියුණු තලයක් සහිත කඩුවකි. ඔහු එය ඉහළට එසවූයේ කපිතාන් ක්‍රෝලිට අණක් නිකුත් කරමිනි.

"ක්‍රෝලි! කෝ උඹේ පිස්තෝල? ඒවත් ඉක්මනට අරගෙන වරෙන් මෝඩයා. එල්ලුම්ගස් යන්න වුණත්, මූං හැම දෙනෙක්ම ඉවර කරල මිසක් මං අද පස්ස බලන්නේ නෑ"

ඒ අණ සමග ක්‍රෝලි යළිත් වරක් පහළ තට්ටුවට දිව ගියේය. ඔහු යන්නට ඇත්තේ ගිනි අවි රැගෙන ඒමට බැව් මම තේරුම් ගතිමි. ප්‍රමාද වීමට කාලයක් නොවීය. හෝම්ස්ට කඩුවෙන් පහර දීමට සූදානම් වූ කැවෙන්ඩිෂ් දෙසට මගේ රිවෝල්වරය එල්ල කොට මම ඔහුට අභියෝග කළෙමි.

"ඒයි කැවෙන්ඩිෂ්! දාපන් උඹේ අතේ තියන කඩුව බිමට! ඉක්මන් නොකොළොත් උඹේ ඔළුව කෑලි කෑලි යන්න වෙඩි තියනවා" මම ශබ්ද නගා කෑගැසීමි.

මෙවැන්නක් කිසිසේත් බලාපොරොත්තු නොවූ කැවෙන්ඩිෂ් කඩුව බිම නොදමා මොහොතක් බලා සිටියේය. මම අඩියක් ඉදිරියට ගෙන ඔහුගේ හිසට ඉලක්කය ගන්නා ආකාරයක් පෙන්වීමි.

"ඇත් උඩටම ඔසවාපන්. නැත්නම් දෙවියන් සිහිකර ගනිං!" මා සර්ජනා කරද්දී තිගැස්සී අසිපත බිම දැමූ ඔහු, දෑත් ඉහළට එසෙව්වේය. මේ අතර හෝම්ස් තම කකුලෙන් එය තමා වෙතට ළංකර ගෙන එය වමතට ගත්තේය. දකුණු අතින් තම කබා සාක්කුවෙන් ඔහු ගත්තේ රිවෝල්වරයයි.

"ඇම්බ්‍රෝස් නෝනා" හෝම්ස් කීය. "ඔහේ ඔය විදියට ඈතින් ඉන්න එකට මං කැමති නෑ. තව ටිකක් කැවෙන්ඩිෂ් මහත්මයා ළඟට කිට්ටු වෙන්න. එතකොට මට පහසුයි."

මේ අතර කපිතාන් ක්‍රෝලි උඩුමහලට නගින ශබ්දය ඇසිණ. පහළ තට්ටුවේ සිට ගිනි අවියක් රැගෙන එන ඔහු යටත්කර ගැනීමේ අරමුණෙන්, තරප්පු පෙළ මුදුනේ වූ දොර මුල්ලේ මම සැඟවුණෙමි. ඒ මගේ අතේ තිබූ රිවෝල්වරය අමෝරා ගෙනය.

අපේ අවධානය ක්ෂණිකව ක්‍රෝලි දෙසට යොමුවෙන බැව් දැන සිටි කැවෙන්ඩිෂ්, ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට උත්සාහ කළේය. ඔහු කළේ ඇම්බ්‍රෝස් මෙනෙවිය තමා වෙතට ඇදගෙන, හෝම්ස්ගේ වෙඩි පහරින් වැළකීමට ඇයගේ ආවරණය ලබමින් විවෘතව තිබූ දොර දෙසට දිව යාමය.

ඒ ස්වල්ප වේලාවකට පෙර පලායාමේ අරමුණෙන් අප විවෘත කළ ද්වාරයයි. එතැනින් ලෑලි වේදිකාවට පා තැබූ ඔහු පියගැට පෙළ දිගේ වේගයෙන් පහළට බැසීමට උත්සාහ කළේය. ඇම්බ්‍රෝස් මෙනෙවිය ඔහු පසුපස දිව ගියාය. ඔවුන් වෙත තව දුරටත් නෙත් යොමු නොකළ අප බලා සිටියේ ක්‍රෝලි පිළිගැනීමටයි. හමුදාවේ කපිතාන්වරයෙකුව සිටි ඔහු දක්ෂ වෙඩික්කාරයෙකු විය යුතු බැව් මම දැන සිටියෙමි. කිසිදු ශබ්දයක් නොනගා පියගැට පෙළේ ඉහළට පැමිණ සිටි ඔහු හෝම්ස් දෙසට එක් වරම වෙඩි තැබීය. නමුත් ක්‍රෝලි ගැන බලාපොරොත්තුවෙන් සිටි මගේ මිත්‍රයා ඒ වෙඩි පහරෙන් වැලකුණේ මට අවස්ථාව ලබා දෙමිනි. ක්‍රෝලි ගිනි අවිය අමෝරා ගෙන සිටි ඔහුගේ දකුණු අතට මම එක් ක්ෂණයකින් වෙඩි තැබීමි. ඉතා සමීපයේ සිට මා එල්ල කළ වෙඩි පහර සම්පූර්ණයෙන්ම සාර්ථක විය. ක්‍රෝලිගේ ගිනි අවිය ඔහුගේ අතින් ගිලිහුණු අතර ඔහු මරළතෝනි දෙමින් බිම ඇද වැටුණේය.

ඔහුගේ ගිනි අවිය තම භාරයට ගත් හෝම්ස් ක්‍රෝලි ගැන බැලීම මට භාරකොට සූදානම් වූයේ කැවෙන්ඩිෂ් හඹා යාමටයි. ඒ සමගම පිටත පියගැට පෙළ දෙසින් මරහඬින් කෑගසන ශබ්දයක් ඇසිණ. දිරාගිය පියගැට පෙළේ කලබලයෙන් පහළට දිවයාමට කළ උත්සාහයේදී දිරාගිය අත්වැලක් කැඩීයාම නිසා, කැවෙන්ඩිෂ් අඩි විස්සක් පමණ ඉහළ සිට පොළොවටම ඇද වැටී සිටියේය. ඔහුගේ අතක සහ කකුලක අස්ථි බිඳී යන්නට ඇතැයි මා සිතුවේ ඒවා විකෘති අයුරින් නැමී තිබූ ආකාරය නිසයි. කැවෙන්ඩිෂ් සිහි විසඥව සිටි අතර නිරුපද්‍රිතව පහළට බැස සිටි ඇම්බ්‍රෝස් මෙනෙවිය විලාප නගමින් සිටියාය.

"හොඳ වෙලාවට අපි මේකෙ පහළට බහින්න හැදුවෙ නැත්තෙ" හෝම්ස් කීවේ බිම ඇද වැටී කෑගසමින් සිටි ක්‍රෝලි එක් කකුලකින් අල්ලාගෙන මේබල් මහත්මියට වෙන්කොට තිබූ ඇඳ අසලට ඇදගෙන යමිනි. ඇයට විලංගු දමා තිබී වෙන් කළ





දම්වැල ක්‍රෝලිගේ එක් කකුලක වළලුකර ප්‍රදේශයේ එතූ හෝම්ස් එහි ගැට කිහිපයක් ඇම්මේය.

"දකුණු අතට වෙඩි වැදිල තියෙද්දි මේක ලිහාගැනීම අපහසුයි. ඔබව බේරාගන්න ඉක්මනටම පොලීසිය එවන්න මං පොරොන්දු වෙනවා කපිතාන් ක්‍රෝලි" හෝම්ස් කීය. "මං මෙහෙම කරන්නේ කැවෙන්ඩිෂ් මහත්මයා ඔහුගේ බිරිඳ හිරකර තැබුවා වගේ ඔබව සිර කරන්න නෙමෙයි. ඔබ ඉක්මනින් අප ලුහුබැඳ එන එක වළක්වන්න"

වේදනාවෙන් සිටි ක්‍රෝලි අපට ශාප කරන අතරේ අපි මේබල් මහත්මිය සහ දරු දෙදෙනා ළං කරගෙන පහළ තට්ටුවට බැස්සෙමු. "වොට්සන්. රිවෝල්වරය සූදානම් කරගෙන ඔබ ඉදිරියෙන් යන්න. ඉදිරියට එන එකා මොකා වුණත් වෙඩි තියන්න පමාවෙන්න එපා" හෝම්ස් කීය.

අප බිම් මහලට බැස්සත් අප වෙත කාගෙන්වත් ප්‍රහාරයක් එල්ල නොවිණි. කැවෙන්ඩිෂ්ගේ ගමනට බාධා කිරීම නිසා තරප්පු පෙළෙන් පහළට තල්ලු කර දමනු ලැබූ ඩේසි බාට්ලට් බිම් මහලේ වැටී සිටියාය. ඇය සිටියේ සම්පූර්ණයෙන්ම නිශ්චලවය. ඇය සිටියේ ජීවිතක්ෂයට පත්වද නැතිනම් සිහි විසඥවද යන්න නිශ්චිතව කීම අපහසු විය.

"මොවුන්ගේ සහචරයන් තවත් කවුරු හරි එන්න ඉඩ තියෙනවා. ඒ නිසා අපි වහාම පිටත්වෙමු" හෝම්ස් කීය. "ඒ අතරෙ යන ගමන් අපට හමුවෙන පළමුවැනි පොලිස් භටයාටම සිද්ධිය ගැන දැනුම් දීගෙන යමු"

එතැනින් වහා පිටත් වී ගිය අපි කිසිදු බාධාවකින් තොරව පැය භාගයකින් ලිට්ල් මැල්වර්න් වෙත ළඟාවූයෙමු. ලිට්ල් මැල්වර්න් නගරයේ පොලීසිය වෙත ගිය හෝම්ස් පැමිණිල්ලක් ඉදිරිපත් කළේ වැඩිදුර තොරතුරු ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය හරහා දැනුම් දෙන බැව් පවසමිනි.

"උදේ අපි දුම්රියෙන් බැස්සෙ මෙතැනදී බව ඇත්තයි." හෝම්ස් කීය. "නමුත් කවුරුත් ඉන්නේ හාමතේ. ප්‍රමාද වෙලා වුණත් දවල් කෑම වේලක් ගන්න ග්‍රේට් මැල්වර්න් වෙත යන්න වෙනවා. අපේ ආරක්ෂාව සඳහා ඒක වඩාත් හොඳයි."

ඒ අනුව ග්‍රේට් මැල්වර්න් වෙත ගොස් දහවල් ආහාරය ගෙන ලන්ඩනය බලා යාමට එතැනින් දුම්රියට නැගුණෙමු.

මෙතෙක් අපට කීමට නොහැකි වූ සිය කතාවේ ඉතිරි කොටස දුම්රියේ නැගී එන අතරමග මේබල් මහත්මිය අපට කීවාය. විඩාපත්ව සිටි ඔලිවියා සිය නැන්දණියගේ උකුළේ අවදියෙන් වැතිර සිටි අතර, කෙනත් මගේ උකුළ මත නිදාගත්තේය.

"මං මේ හිරගෙදර මාස අටක් ගතකළා" මේබල් මහත්මිය කීවාය. "පිටත ලෝකය එක්ක කිසිම සම්බන්ධ කමක් නැතුව, යාළුවෙක් නෑදෑයෙක් කිසිවෙක් නැතුව මං මාස අටක් ගතකළා. මේ ගොඩනැගිල්ලට හිටී අනික් එකම මනුෂ්‍යයා, මාව මුරකරන්න මගේ සැමියා රැඳවූ අර බාගෙට උමතු ගැහැනිය විතරයි. ඉතින් මාත් බාගෙට උමතුවෙලා, ජීවිතය නැතිකරගන්න හිතූ එකේ පුදුමයක් තියෙනවද?"

"ඒ වුණත් මේබල් නැන්දා" ඔලිවියා කීවේ සිය නැන්දණියගේ අතකින් අල්ලා ගනිමිනි.

"මාමා අපට කිව්වා ඔබ වින්ටර් මහත්මයාගෙ වත්තේ ගෙදරක පදිංචියට ගිහින් කියලා?"

"මොනවා? ඔහු එහෙම දෙයක් කිව්වද? මං වින්ටර්ලා පදිංචි පැත්ත පළාතක ගියේ නෑ. මේ සම්පූර්ණ කාලයම ඔහු මාව මේ ගෙදර හිරකරගෙන හිටියේ සිරකාරියක් විදියට"

"ඒ වුණාට මං නැන්දාට ලියුමකුත් එව්වා. නැන්දා ඒකට පිළිතුරු ලිපියකුත් එවල තිබුණා" දැරිය කීවාය.

"මගේ රත්තරන් දුවේ" මේබල් මහත්මිය කීවේ ඇගේ දැස් කඳුළෙන් පුරවාගෙනය. "මට ඔයාගෙන් වත් වෙන කාගෙන්වත් ලියුම් ආවෙත් නෑ. කාටවත් ලියුමක් යවන්න මට පුළුවන් කමක් තිබුණෙත් නෑ. මං ලියුමක් එව්වා කියල මාමා ඔබට කිව්වා නම් ඒ ලියුම ලියන්න ඇත්තෙ ඔහුමයි"

"මට ඒක තේරුම් ගන්න බැරිවුණා නේ" ඔලිවියා කීවාය. "මීට පස්සෙ ලියුම් එවන්න එපා කියල ඒකෙ ලියල තිබුණා. නැන්දා කවදාවත් එහෙම දෙයක් ලියන්නෙ නෑ නේද කියල මට කල්පනා කරන්න තිබුණා"

"මං කවදාවත් ඔයාට එහෙම ලියන්න හිතන්නෙ වත් නෑ. ඒකෙ යමක් තිබුණා නම්, ඒ ඔහු ගෙතූ පට්ටපල් බොරු විය යුතුයි"

"කොහොම වුණත් මාමාට ෂෙෆීල්ඩ් වලින් ලියුමක් ආවා" දැරිය කීවාය. "මට මතකයි ඒකෙ තිබුණා රෙක්ස්ටන් තැපැල් කාර්යාලයේ





මුද්‍රාව. ඔහු කිව්වා ඒක එවා තිබුණෙ වින්ටර් මහත්මයාලු. ඒ ඔබ ඔහුගේ වතුයායේ පදිංචි බව දැනුම් දීමටලු - මාමා ඒ ලියුම ගින්නට දමා පුලුස්සා දැමූ බව කිව්වා"

"කොහොමද එහෙම දෙයක් වුණේ?" මේබල් මහත්මිය විමසුවාය.

"සැකයක් නෑ රෙක්ස්ටන් තැපැල් මුද්‍රාව සහිත ලියුමක් වින්ටර් මහත්මයාගෙන් එන්න ඇති." හෝම්ස් කීය. "සමහරවිට ඒ ඔබ ගැන තොරතුරු විමසමින් විය යුතුයි. ඒක ගින්නට දමා පුලුස්සලා තමයි ඔබේ සැමියා අර කතාව ගොතන්න ඇත්තේ.

ඒක තෙමෙයි. පහුගිය ජනවාරි මාසයේ සිදුවුණේ මොකක්ද කියලා දැන් අපට කියන්න. අලුත් අවුරුදු උදාවෙන්න කලින් දවසේ ඔබ යන්න ගියානේ. ඔබ ලන්ඩනයේ හෝටලයක නැවතී ඉන්න බව ඔහුට ලියුමකින් දැනුම් දී ඇති බව ඔබේ සැමියා ඔලිවියාට කියල තිබුණා"

"ඒක නම් නිවැරදියි"

"ඉතින් ඔහු ආවා ඔබ නැවතී සිටි හෝටලයට. ඒ හැම්ඩන් මන්දිරය වෙත යාමට ඔබ කැමති කරවා ගන්න. නමුත් ඔබ ඊට කැමැති නොවුණු බව ඔහු කියා තිබුණා"

"එයත් ඇත්ත"

"නමුත් කොහොම හරි ඔබව බ්ලැක්විච් මෝලට ගෙන යන්න ඔහු සමත්වුණා. ඒ කොහොමද?"

"ඒක මං කියන්නම්. ඔහු දෙවැනි වාරයේ ලන්ඩනයේ හෝටලයට ආවාම මෙහෙම කිව්වා. මං ඔහු සමග හැම්ඩන් මන්දිරයේ ජීවත්වීමට කැමති නැත්නම්, කරුණාකරල ඇවිත් ළමයි දෙන්න අරගෙන යන්න කිව්වා. ළමයි දෙන්නා එහේ ඉඳීම ඔහුට හිරිහැරයක් කරදරයක් බවයි ඔහු කිව්වේ. මේක මට හොඳටම උවමනා වී තිබුණු මං ප්‍රාර්ථනා කරමින් සිටි දෙයක්. ඉතින් මං ඒකට වහාම කැමැති වුණා.

ඔහු ලන්ඩනයේ සිට ආපහු එද්දී මං ඔහු සමග ආපහු ආවා. ඒ ඔලිවියා සහ කෙනත් කැඳවාගෙන යාමේ එකම අරමුණෙන්. අපි ලන්ඩනයේ සිට දුම්රියෙන් ඇවිත් දුම්රියපොළෙන් බැස්සා. අප කැඳවාගෙන යාමට අශ්ව කරත්තය දුම්රියපොළට ගෙන ඇවිත් තිබුණේ සාමාන්‍ය රියැදුරා නෙමෙයි. එහි ඇවිත් තිබුණේ

ජෙරෝම්ගෙ අප්‍රසන්න මිත්‍රයා - කපිතාන් ක්‍රෝලි. මේක හරි අමුතුයි කියා මට හිතුණා. නමුත් මං ඒ ගැන වැඩිදුර කල්පනා කළේ නෑ.

හැම්ඩන් වතුයායට එන පාරට හැරුණත් මගේ ඔළුවේ තිබුණෙ ළමයි දෙන්නා ගැන. මගේ සැමියා සහ ඔහුගේ පිළිකුල් සහගත මිත්‍රයා, මේ වගේ තුච්ඡ සැලැස්මක් ක්‍රියාත්මක කරාවි කියා, මං කවදාවත් කොහොමටවත් හිතුවෙ නෑ. පාර බෙදෙන මංසන්ධියට ආවම, මැඳුර පැත්තට හරවනවා වෙනුවට ක්‍රෝලි කරත්තය දැක්කුවේ මෝලට යන පාරට. ඔවුන් කරන්න යන්නෙ මෙහෙම දෙයක්ද කියලා මගේ හිතේ සැකයක් ඇතිවුණා. මං උත්සාහ කළේ ගමන් කරමින් තිබූ රියෙන් බිමට පනින්න. නමුත් ඒක සාර්ථක වුණේ නෑ. එදා ඉඳල මං අර උමතු ගැහැනියගේ භාරයේ හිරකාරියක් වුණා. එදා ඉඳල මට කෙරුණු බලපෑම් හා තර්ජන වල ඉවරයක් තිබුණෙ නෑ."

"ඇය මෝලේ ඉඳල හැම්ඩන් මැඳුරට මොනවා හරි පණිවුඩ ගෙන ගියාද?"

"පණිවුඩ යවන්න කෙනෙක් මෝලෙ හිටියෙ නෑ. ඇයගේ කෑම ද්‍රව්‍ය හා මත්පැන්වල අඩුපාඩු තමයි, ඇය කොළයක ලියා ඊ කාලයට මන්දිරයට ගෙන ගියේ."

"ඇය රාත්‍රියට ඇවිත් එවැනි සටහන් සන්ඩයලය මත තබායන බව ළමයින් දැක තිබුණා. පසුව ඒ පණිවුඩ අරගෙන තිබුණේ කපිතන් ක්‍රෝලි"

"ඔහුයි මගේ සැමියයි එක්වෙලා තමා හැමදෙයක්ම සැලසුම් කළේ"

"මේබල් මහත්මිය. බලපෑම් හා තර්ජන ගැන ඔබ සඳහන් කළා. එහෙම දේවල් කරන්න ඇත්තේ ඔබේ නමට තිබෙන දේපළ ඔහුගේ නමට පවරන්න කියා වෙන්න ඇති?"

"ඔව්. ඔහු උත්සාහ කළේ මගේ නමට තිබූ දේපොළ පමණක් නෙමෙයි; ළමයින් ගැන මට තිබූ අයිතීන් වගකීම් හා ඔවුනට අයිති වත්කම් පවා තමන් නමට පවරා ගන්න"

"ඒ කාරණය මං තේරුම් ගත්තා" හෝම්ස් කීය. "මං ඔහුගේ කාර්යාල කාමරය පරීක්ෂා කළා. ඔබේ අත්සන හොරට යෙදීම සඳහා ඔහු එය කඩදාසිවල පුරුදු පුහුණු වී තිබුණා. තැපැල්





මගින් කඩදාසි යවන්නට වෙන සුළු කාරණයක් සම්බන්ධයෙන් නීතිඥ සමාගම ඔබේ අත්සන ඒ විදියට භාරගන්නා බව ඇත්තයි. නමුත් වැදගත් ප්‍රශ්නයකදී ඔබව පෞද්ගලිකව හමුවෙන්න නීතිඥවරුන්ට උවමනා වෙනවා. ඒ නිසයි ඔබේ සැමියා තර්ජන මගින් ඔබව නම්මා ගන්නට උත්සාහ කළේ"

"මං ඒවට කොහොමටවත් එකඟ වුණේ නෑ. මං කීවා මං ඊට වඩා මැරෙන්න කැමතියි කියලා. නමුත් මීට සති දෙකකට පමණ කලින් මා යටත් කරගත හැකි ක්‍රමයක් ඔහු සොයා ගත්තා. ඒ තමයි ළමයින්ට හිරිහැර කරන බවට තර්ජනය කිරීම"

"ඔව්. ඔහු ඒ අංශයෙන් මෑතකදී ක්‍රියාත්මක වුණා" කී හෝම්ස් කෙනත් ගුඩ්රිච් දරුවාට කැවෙන්ඩිෂ් දී තිබූ වධ හිංසා විස්තර කළේය.

"රයින්හාට් ගුරුතුමා අතුරුදන් වුණු බව මං ඔබට කිව්වා." හෝම්ස් කීය. "ඔහු තමන් දන්නා දේ හෙළි කිරීම වළක්වන්න මේ දුෂ්ඨයින් ඔහුව ඝාතනය කරන්න ඇති."

"දැන් මට මතකයි" මේබල් මහත්මිය කීවාය. "මට ඔහු දකින්න ලැබුණු දිනයේම නෙමෙයි; ඊට දවසකට හෝ දෙකකට පසුව වෙන්න ඇති. එදා මහා ඝන අන්ධකාර රාත්‍රියක්. අශ්ව කරත්තයක් මා රඳවා සිටි සිරගෙදර පැත්තට එනවා මට ඇහුණා. මං හිතුවේ මට තවත් වධ හිංසා කරන්න මගේ සැමියා එනවා කියලයි. නමුත් රියේ ආ කිසි කෙනෙක් මා හිටි ගොඩනැඟිල්ලට ඇතුළුවුණේ නෑ. දෙදෙනෙකුගේ කටහඬවල් එළියෙන් ඇහුණා. ඒ මගේ සැමියා සහ කපිතාන් ක්‍රෝලි කතාකළ හඬ. ඊළඟට මට අහන්න ලැබුණා. පොළොව හාරන ශබ්දයක්. ඒ මෝල කිට්ටුව කැලෑව දෙසින්. ඊටපසු අශ්ව කරත්තය පිටත් වී යන හඬ ඇහුණා"

"අවාසනාවන්ත රයින්හාට් ගුරුතුමා සාමදානයේ සැතපෙන තැන ඇත්තෙ ඒ කැලෑවේ කියල, එහෙනම් අපට නිගමනය කරන්න පුළුවනි" හෝම්ස් කීය. "මේ දුෂ්ඨ පුද්ගලයින් කළ අපරාධ වලට ඔවුන් නීතිය ඉදිරියට ගෙනෙන්න මං බලාපොරොත්තු වෙනවා."

"ඔබ සිතන්නේ ගුරුතුමා අවසානය දකින්න ඇත්තේ ඒ ආකාරයෙන් කියල නේ" මේබල් මහත්මිය කීවාය. "ඔවුන් ඒ ආකාරයට දැත්වල ලේ තවරාගත්තු පළමුවැනි අවස්ථාව ඒක

නෙමෙයි. මා හිරකාරයෙකු ලෙස මෝලට දමද්දී එතැන භාරකාරයා වුණේ ඔස්ටින් සයික්ස් නම් පුද්ගලයෙක්. ඔහු අන්ත බේබද්දෙක්. එක දවසක් රෑ ඔහු මගේ සැමියා සමග දරුණු සණ්ඩුවක් ඇතිවුණු ශබ්දය මට පහළ තට්ටුව දෙසින් ඇහුණා. ඉන්පසු සයික්ස් මරළතෝනි නගමින් කෑගැහුවා. එදායින් පසු කවදාවත් මට සයික්ස් දකින්න ලැබුණේ නෑ. ඔහුට කුමක් සිදුවුණාද කියන්න මං දන්නේ නෑ"

"දියේ පාවෙමින් තිබී ඔහුගේ මළසිරුර හමු වී තිබුණා. කවුරුත් හිතල තිබුණේ ඔහු අධික ලෙස බීමත්ව හිටි වෙලාවෙ ගඟට වැටිලා දියේ ගිලුණා කියලයි. තමන් දන්නා දේ පොලිසියට හෙළි කරනවා කියලා සයික්ස් ඔබේ සැමියාට තර්ජනය කරන්න ඇති. එහෙම හෙළි නොකර සිටින්න නම් ඔහු විශාල මුදල් ප්‍රමාණ කප්පම් ලෙස ඉල්ලන්න ඇති"

මේ වෙලාව වන විට ඔලීවියා මෙනෙවියට ද නින්ද ගොස් තිබිණි. ජෙරෝම් කැවෙන්ඩිෂ් පිළිබඳ තවත් තොරතුරු මේබල් කැවෙන්ඩිෂ් මහත්මිය අපට හෙළි කළාය.

තුවාල ලැබූ ජෙරෝම් කැවෙන්ඩිෂ්, ඔහුගේ සගයා කපිතාන් ක්‍රෝලි මෙන්ම ඇම්බ්‍රෝස් මෙනෙවිය පොලිස් අත් අඩංගුවට පත් වී තිබිණි. මගේ වෙඩි පහර නිසා ක්‍රෝලිගේ අතට සිදුවූ තුවාල ඉක්මනින් සනීප විය. එහෙත් තුන්වැනි තට්ටුවෙන් බිමට ඇද වැටුණු කැවෙන්ඩිෂ් ගේ කකුල් දෙකටම සහ එක් අතකට බරපතළ තුවාල සිදු වී තිබිණ. ඒ අස්ථි කිහිප තැනකින් බිඳී යාම නිසයි. මාස දෙකක පමණ කාලයක් ඔහු බන්ධනාගාර රෝහලේ ප්‍රතිකාර ලැබීය. ඔවුනට එරෙහි නඩු විභාගය ඇරඹුණේ ඉන් අනතුරුවය.

රෙක්ස්ටන් හි නයිජල් රයින්හාට් මහතා, බ්ලැක්විච්හි ඔස්ටින් සයික්ස්, දෙදෙනා ඝාතනය කිරීම, මේබල් කැවෙන්ඩිෂ් මහත්මිය සහ කෙනත් ගුඩ්රිච් දරුවා බලහත්කාරයෙන් රඳවා ගෙන දරුණු වධහිංසා කිරීම මගින් ඝාතනයට තැත්කිරීම යන චෝදනා යටතේ කැවෙන්ඩිෂ්, ක්‍රෝලි හා ඇම්බ්‍රෝස් මෙනෙවිය තිදෙනාට එරෙහිව නඩු පවරන ලදී.

ප්‍රමාණවත් තරම් සාක්ෂි නොතිබුණෙන් ඇම්බ්‍රෝස් මෙනෙවිය නඩු විභාගය මුලදීම නිදහස ලැබුවාය. සැලකිය යුතු තරම් සාක්ෂි නොමැති වීම නිසාම විත්තිකරුවනට එරෙහිව තිබූ ඝාතන





චෝදනා පසුව පැමිණිලිකාර පක්ෂය මගින් ඉවත් කරගන්නා ලදී. කෙසේ වෙතත් අනෙක් චෝදනා සම්බන්ධයෙන් වරදකරුවන් වූ ජෙරෝම් කැවෙන්ඩිෂ් හා කපිතාන් ඇන්ඩ්‍රූ ක්‍රෝලි දෙදෙනාට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම විණි. උඩුමහලෙන් ඇද වැටී සිහිවිසඥව සිටි ඩේසි බාට්ලට් ගේ හිසට සිදුවූ බරපතළ තුවාල නිසා ඇය සිහි නොලබාම මිය ගිය බැව් පුවත්පත් වල පළවිය.